280 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 280 - இல. 16
Volume 280 - No. 16

2020 දෙසැම්බර් 10වන බ්‍රහස්පතින්දා
2020 டிசம்பர் 10, வியாழக்கிழமை
Thursday, 10th December, 2020

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
කොවිඩ්-19 රෝගයෙන් මිය යන්නන්ගේ අවසන් කටයුතු සඳහා පැහැදිලි නිර්ණායක ලබා දීම

වරප්‍රසාද:
පාර්ලිමේන්තු නිල ට්විටර් ගිණුමේ පළ වූ පණිවුඩය

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

විසර්ජන පනත් කෙටුම්පත, 2021 –[විසිවන වෙන් කළ දිනය]:
[ශීර්ෂ 102, 237-240, 242-252, 296, 297, 323, 324, 329, 333 (මුදල්); ශීර්ෂ 413, 241, 280 (මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ); ශීර්ෂ 414, 331 (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී.
තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත:
නියෝග

විදේශ විනිමය පනත:
යෝජනා සම්මතය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
கொவிட்–19இனால் மரணமடைபவர்களை நல்லடக்கம் செய்வது பற்றிய தெளிவான வழிகாட்டுதல்களை வழங்குதல்

சிறப்புரிமை:
பாராளுமன்ற உத்தியோகபூர்வ டுவிட்டர் கணக்கில் வெளியான செய்தி

அரசாங்க நிதி பற்றிய குழு

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2021 - [ஒதுக்கப்பட்ட இருபதாம் நாள்]:
[தலைப்புக்கள் 102, 237 - 240, 242 - 252, 296, 297, 323, 324, 329, 333 (நிதி); தலைப்புக்கள் 413, 241, 280 (நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு); தலைப்புக்கள் 414, 331(சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி)] – குழுவில் ஆராயப்பட்டது.
மூன்றாம்முறை மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

காப்புறுதித் தொழிலை ஒழுங்குபடுத்தற் சட்டம் :
ஒழுங்குவிதிகள்

வெளிநாட்டுச் செலாவணிச் சட்டம்:
கட்டளை

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Provision of Clear Guidelines Regarding Last Rites of COVID-19 Victims

PRIVILEGE:
Message Appeared in Official Twitter Account of Parliament

COMMITTEE ON PUBLIC FINANCE

APPROPRIATION BILL, 2021 - [Twentieth Allotted Day]:
Considered in Committee - [Heads 102, 237-240, 242-252, 296, 297, 323, 324, 329, 333 (Finance); Heads 413, 241, 280 (Money and Capital Market and State Enterprise Reforms); Heads 414, 331 (Samurdhi Household Economy, Micro-finance, Self-Employment and Business Development)]
Read the Third time, and passed as amended

REGULATION OF INSURANCE INDUSTRY ACT:
Regulations

FOREIGN EXCHANGE ACT:
Resolution

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2020 දෙසැම්බර් 10වන බ්‍රහස්පතින්දා
2020 டிசம்பர் 10, வியாழக்கிழமை
Thursday, 10th December, 2020

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ "සාක්" පාර්ලිමේන්තු සංගමයේ ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම
பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம், அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் மற்றும் 'சார்க்' பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் என்பவற்றினது இணைந்த வருடாந்தப் பொதுக் கூட்டம்
JOINT ANNUAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION, INTER-PARLIAMENTARY UNION AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම අවසන් වීමෙන් පසුව පාර්ලිමේන්තුවේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාක්" පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වන ලෙස සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

අද අය වැය -විසර්ජන පනත් කෙටුම්පත- තුන්වන වර කියැවීමේ විවාදයේ ඡන්දය විමසීම පැවැත්වෙන අවසාන දිනයයි. එම නිසා සියලු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා, කරුණාකරලා තමන්ට නියමිත කාලය නාස්ති කරන්නේ නැතුව ඒකෙන් ප්‍රයෝජන ගන්න කියලා. කුමන හේතුවක් නිසාවත් සවස 5න් පසු සභාවේ කාලය දීර්ඝ කිරීමට තීරණය නොකළ බව මේ

අවස්ථාවේ ප්‍රකාශ කරනවා. හරියට සවස 5ට ඡන්දය විමසීම පැවැත්වීමට කටයුතු කරනවා. ඒ අතරතුර කිසියම් මන්ත්‍රීවරයකුට කථා කිරීමට අවස්ථාවක් නොලැබුණොත්, ඒ ගැන අපි කනගාටුව ප්‍රකාශ කරනවා. අපි කවුරුත් සහයෝගයෙන් සභාවේ කටයුතු අවසාන කරමු කියන ඉල්ලීම මා මේ අවස්ථාවේ කරනවා.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VI සහ VII වන කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම,

(i) 2017 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන;

(ii) 2017 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන;

(iii) 2019 වර්ෂය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන;

(iv) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

(v) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 02 දිනැති අංක 2191/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(vi) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 23 දිනැති අංක 2198/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(vii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2199/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(viii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 28 දිනැති අංක 2203/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(ix) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3(3) වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2020 අගෝස්තු 21 දිනැති අංක 2189/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(x) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3(3) වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2020 ඔක්තෝබර් 12 දිනැති අංක 2197/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ අපගමන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 21 දිනැති අංක 2194/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 10 දිනැති අංක 2201/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xiii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 16 දිනැති අංක 2202/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xiv) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 24 දිනැති අංක 2203/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

ඉදිරිපත් කරමි.

මෙම වාර්තා, නියෝග සහ නියම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - கல்வி அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(ii) 2019 වර්ෂය සඳහා රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iv) 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(v) 2019 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්.

මෙම වාර්තා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයේ තොරතුරු පද්ධති අධ්‍යයන අංශයක් සහ රසායන විද්‍යා අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 30 දිනැති අංක 2160/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තා පිළිගැන්වීම, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද "2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මහජන පෙත්සම් පිළිගැන්වීම, ගරු රංජිත් සියඹලාපිටිය මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කාලය පිළිබඳව -

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, මම වැඩිපුර කාලය ගන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අය වැය විවාදයේ අන්තිම දවසේ අය වැය විවාදය ඉවර වුණාම, ඔබතුමාගේ නිල නිවසේ පැවැත්වෙන භෝජන සංග්‍රහයට කලින් ජාත්‍යන්තර පාර්ලිමේන්තු සංසදයේ - IPU; පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංසදයේ - CPA; සහ සාර්ක් පාර්ලිමේන්තු සංසදයේ කියන ඒකාබද්ධ කමිටුව තිබෙනවා. දැනට සියලු මන්ත්‍රීතුමන්ලාට ඒ බව දන්වා ලියුම් එවා තිබෙනවා. ඒක හරි. නමුත් මීට කලින් නම් උදෑසන කථානායකතුමාගේ නිවේදනයක් විධියට සාමාන්‍ය සම්ප්‍රදාය විධියට එය දැනුම් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ දැනුම්දීම අහගෙන හිටපු නැති එක ගැන මම කනගාටු වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මම එන්න කලින් ඔබතුමා ඒ ගැන කිව්වාද, දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතින්, ඔබතුමා ප්‍රමාද වුණේ ඇයි?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිටියා, එතුමාට ඇහුණේ නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ විදියට කාලය ගත්තාම අද දවසේ කාලය නිකම්ම අවසන් වෙනවා. [බාධා කිරීමක්] - ඔව් ඉක්මනට කියන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91 යටතේ මතු වූ කාරණයක් පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නිල නිවසේ අද පැවැත්වෙන භෝජන සංග්‍රහයට අපට ආරාධනා කිරීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. හැබැයි, ගරු කථානායකතුමනි, මම මේ කියන්න යන කාරණය පුවත් පතකත් සඳහන් වෙලා තිබුණා, මේ වේලාවේ -quarantine කර තිබෙන මොහොතක- මන්ත්‍රීවරුන් 225ම කැඳවනවා; තවත් විශාල පිරිසක් එනවා කියලා.

රටේ ජනතාවට කන්න නැති මේ වේලාවේ මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ සඳහා වැයවන වියදම කොවිඩ් ප්‍රශ්නය විසඳීමට යොදවන්න පුළුවන් නම් හොඳයි කියලා. කරු ජයසූරිය කථානායකතුමාත් පාස්කු ප්‍රහාරය එල්ල වුණු අවුරුද්දේ එතුමාගේ නිල නිවසේ පවත්වන භෝජන සංග්‍රහය පැවැත්වූයේ නැහැ. ඒ නිසා මේ වෙලාවේ ඒ භෝජන සංග්‍රහය නැවැත්වීම සඳහා ඔබතුමා පියවරක් ගත්තොත් ආණ්ඩුවටත් හොඳයි, ඔබතුමාටත් හොඳයි කියලා මම හිතනවා. මේ භෝජන සංග්‍රහය සාම්ප්‍රදායිකව පවත්වන දෙයක්. මේ භෝජන සංග්‍රහය නැති කරන්න කියලා මම කියනවා නොවෙයි. මේ මොහොතේ ආණ්ඩුවක් හැටියට වාගේම, කථානායකවරයා හැටියටත් මෙම භෝජන සංග්‍රහය නවත්වන්න පුළුවන් නම් ඉතා හොඳයි. මොකද, මේ වියදම අපරාදේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ කාරණය පිළිබඳව මම කල්පනා කරලා බලන්නම්.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Deputy Speaker and Chairman of Committees)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

(1) රුවන්වැල්ල, කහටගස්තැන්න, අංක 332/20 දරන ස්ථානයෙහි පදිංචි ඥානා ප්‍රියදර්ශනී තෙබුලන්දගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) යටියන්තොට, කොළඹ පාර, අංක 20 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ.ඩී.එස්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) යටියන්තොට, වැලිහෙලතැන්න, වීරගල්ල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. ඒ. රණසිංහ පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, උඩුදුම්බර, පෝප්පිටිය, පනවැල්උල්ල, අංක 08 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. කුලතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா - உர உற்பத்தி மற்றும் வழங்கல்கள், இரசாயன உரங்கள் மற்றும் கிருமிநாசினிப் பாவனை ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva -State Minister of Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use)
ගරු කථානායකතුමනි, දොඩන්දූව, හෙන්නාතොට යන ලිපිනයෙහි පදිංචි සුනිල් ගංගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු කථානායකතුමනි, බදුල්ල, 02 කණුව, තෙල්බැද්ද පාර, පල්ලෙවත්ත යන ලිපිනයෙහි පදිංචි ආර්.ඩී. සිරිසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල, හම්පරාව, අංක 425 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්. නසීර් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පාසල් සහ දහම් පාසල්: බුද්ධ ධර්මයේ ප්‍රායෝගික ඉගැන්වීම
பாடசாலைகள் மற்றும் அறநெறிப் பாடசாலைகள்: பௌத்த தர்மத்தின் பிரயோகரீதியான போதனை
SCHOOLS AND DHAMMA SCHOOLS: PRACTICAL TEACHING OF BUDDHISM

262/2020

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
අග්‍රාමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බුද්ධ ධර්මය ප්‍රායෝගික විෂයයක් බවත්;

(ii) එය විභාග ඉලක්කගත විෂයයක් වශයෙන් මේ වන විට පාසල් හා දහම් පාසල් තුළ ඉගැන්වීම් කටයුතු කරන බවත්;

(iii) නමුත්, ඉහත ක්‍රමවේද තුළින් බුද්ධ දර්ශනය ඇසුරින් ජීවිතයට ලබාගත හැකි විනය, හික්මීම ඇතුළු යහපත් මානුෂීය ගුණධර්ම ප්‍රමාණවත් පරිදි සමාජගත නොවන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) බුද්ධ දර්ශනයේ ප්‍රායෝගික භාවිතය ඉගැන්වීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்தசாசன, சமய, மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பௌத்த தர்மம் நடைமுறைச் சாத்தியமுடைய தொரு தர்மம் என்பதையும்;

(ii) அது பரீட்சைகளை இலக்குவைத்ததொரு விடயமாக ஏற்கனவே பாடசாலைகளிலும் அறநெறிப் பாடசாலைகளிலும் கற்பிக்கப் படுகின்றதென்பதையும்;

(iii) ஆயினும், மேற்படி முறைமைகள் ஊடாகப் பௌத்த கோட்பாடுகளின் வாயிலாக வாழ்கையின்பால் உள்ளீர்த்துக்கொள்ளக்கூடிய ஒழுக்கம், பணிவு போன்ற உயரிய மானிடப் பண்புகள் போதியளவிற்கு சமூக நீரோட்டத்திற் குள்ளாவதில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) பௌத்த கோட்பாட்டின் நடைமுறைப் பயன் பாட்டினைப் போதிப்பதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதை யும்;

(ii) ஆமெனில், அந்நடவடிக்கை எவ்வகையில் மேற்கொள்ளப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he admit that -

(i) Buddhism is a practical subject;

(ii) it is taught as a subject targeting exams at Dhamma Schools and schools at present; and

(iii) human qualities including discipline and self-control that can be inculcated through Buddhist philosophy are not introduced to the society through the said methods nevertheless?

(b) Will he inform this House-

(i) whether steps will be taken to teach the practical application of Buddhist philosophy; and

(ii) if so, the manner in which such steps will be taken?

(c) If not, why?

ගරු විදුර වික්‍රමනායක මහතා (ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க - தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமியச் சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - State Minister of National Heritage, Performing Arts and Rural Arts Promotion)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නැත.

විභාග පමණක් ඉලක්ක කරගෙන දහම් පාසල් අධ්‍යාපනය සිදු නොවන අතර සාරධර්ම ප්‍රගුණ කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

(iii) නැත.

දරුවන්ට යහපත් ගුණධර්ම පුරුදු පුහුණු කිරීමට පහත (ආ) (ii) හි සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) මේ සඳහා පහත සඳහන් පියවර රැසක් ගනිමින් තිබේ.

1. සෑම සිසුවෙකුටම ප්‍රායෝගිකව බෞද්ධ දර්ශනයේ වත් පිළිවෙත් අධ්‍යයනය හා පුහුණුව උදෙසා දහම් පාසල විහාරස්ථානයක් ආශ්‍රිතව පැවැත්වීමට දිරිගැන්වීම.

2. සෑම සිසුවෙකුගේම ධර්මාවබෝධය මැන බැලීම සඳහා පමණක් විභාගයක් පැවැත්වීම.

3. දහම් පාසලක ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් බහුල කරලීමේ අදහසින්ම සකස් කර ඇති "දහම් පාසල් කළමනාකරණය" පොත සෑම දහම් පාසලකටම බෙදා දීම.

4. දහම් පාසල තුළ හා බාහිරව දරුවන්ගේ යහපත් චර්යා ප්‍රගුණ කරවීමට දිරිගැන්වීම උදෙසා ප්‍රායෝගික ප්‍රගති වාර්තාවක් ලෙස සෑම දහම් පාසල් දරුවෙකුටම "සාධුචර්යා පුස්තකය" නමින් ප්‍රගති සටහන් පොතක් නිකුත් කිරීම.

5. දහම් පාසලේ සෑම ශ්‍රේණියකම පෙළ පොත්වලට අදාළව ප්‍රායෝගිකව දහම් කරුණු ඉගැන්වීම පිළිබඳ උපදෙස් ඇතුළත් ගුරු අත්පොත් ලබා දීම.

6. දහම් පාසල් දරුවන්ට භාවනා පුහුණුව, බුදු දහම සම්බන්ධ නිර්මාණවලට අවස්ථාව සැලසීමට පුවත් පත්වල ඉඩ ප්‍රස්ථා ලබා දීම, ජනමාධ්‍ය ඔස්සේ බුදු දහම සම්බන්ධ දැනුම ලබා දීමේ වැඩසටහන් සංවිධානය, නිපුණතා ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.

7. දහම් පාසල් දරුවන් ප්‍රායෝගිකත්වයට හුරු කරවීම උදෙසා විවිධ අධ්‍යාපන මට්ටම්වල සිටින දහම් පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමට දිවයින පුරා ගුරු පුහුණු වැඩසටහන් අඛණ්ඩව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම. අධ්‍යයන පාඨමාලා හා දැනුම ඇගයීමට වාර්ෂිකව විභාග පැවැත්වීම.

8. දහම් පාසල් ගුරු භවතුන් නිස්සරණාධ්‍යාශයෙන් සේවය කරන අතර ගුරු භවතුන් දහම් පාසල් සේවයේ රඳවාගැනීම සඳහා සේවය ඇගයීම, සාමදාන විනිශ්චයකාර පදවි ප්‍රදානය, වෛද්‍යාධාර ලබා දීම, නිල ඇඳුම් ලබා දීම, වර්ෂයකට එක් වතාවක් රුපියල් 5,000ක දීමනාවක් ලබා දීම.

දහම් පාසල්වල ගුරු භවතුන් දිරි ගැන්වීම හා සේවයේ රඳවාගැනීම සඳහා තවදුරටත් වැඩ පිළිවෙළ සකස් කිරීමට යෝජිත අතර දහම් අධ්‍යාපනයට ජාතික මට්ටමේදී ඇගයීම් අවස්ථා ලබා දී දහම් අධ්‍යාපනය ධෛර්යවත් හා ශක්තිමත් කළ යුතු බව පිළිගනිමි.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමාට, සවිස්තරාත්මක, සාරගර්භ, දීර්ඝ පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන්.

[ගරු බුද්ධික පතිරණ මහතා]

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. දහම් පාසල් විෂය, බුද්ධශාසන අමාත්‍යාංශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරීමේ තත්ත්වයක් තුළ යම්කිසි ඒකාබද්ධ වැඩ පිළිවෙළක් දියත් වීමේදී බොහොම සාධනීය අංශ වාගේම යම් යම් ගැටලුත් ඇති වනවා. සාධනීය අංශයක් තමයි, දහම් පාසල් අධ්‍යාපනය ද අධ්‍යාපන රාමුව තුළට ගන්න පුළුවන් වීම; එනම් වඩා විධිමත් තත්ත්වයට ගන්න පුළුවන් වීම. දහම් පාසල් බුද්ධශාසන අමාත්‍යාංශය යටතේ තිබෙන විට ආගමික ඌරුව ගන්න පුළුවන්. ඒ නිසා මේ අමාත්‍යාංශ දෙක අතර ඒකාබද්ධ වැඩසටහනක් විධියට ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් හදාගෙන තිබෙනවාද? මගේ පළමුවන අතුරු ප්‍රශ්නය එයයි.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පමණක් නොවෙයි, සියලු අමාත්‍යාංශ සමඟ අපි අලුත් වැඩ පිළිවෙළකට යනවා. එහි සුවිශේෂී එකක් තමයි අධ්‍යාපන අමාත්‍යාංශය. ඒ අනුව ඒකාබද්ධ වැඩ පිළිවෙළක් තමයි ඉදිරියට ක්‍රියාත්මක වන්නේ. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හැටියට තිබුණාට, සංස්කෘතික කටයුතු වෙනම නේ යන්නේ. අපි ඒවාත් ඒකාබද්ධ කරගෙන තමයි ඒ අලුත් වැඩසටහන කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

දහම් පාසල් ක්ෂේත්‍රයේ ප්‍රධානාචාර්යවරයකු විධියට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහ පරිපාලනයට සම්බන්ධ වෙලා සිටි නිසා මා මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. විශේෂයෙන්ම දහම් පාසල් අධ්‍යාපනයේ තිබෙන බරපතළම ගැටලු අතර එක ගැටලුවක් තමයි, ප්‍රාථමික ශ්‍රේණිවල හා 6, 7, 8 ශ්‍රේණිවල වැඩි ශිෂ්‍ය ප්‍රමාණයක් දකින්නට ලැබීම සහ 8, 9, 10 ශ්‍රේණිවලට, දහම් අවසාන හා ධර්මාචාර්ය ශ්‍රේණිවලට යනකොට අතේ ඇඟිලි 5ටත් වඩා අඩු දරුවන් සංඛ්‍යාවක් දකින්නට ලැබීම. එයට හේතුව තමයි, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) සාම්ප්‍රදායික විභාග පද්ධතිය. ඒ විභාග පද්ධතිය තුළ දහම් අවසාන සහ ධර්මාචාර්ය සහතිකයට -ධර්මාචාර්ය ගුරුවරුන් බඳවාගැනීමේ කාර්යයට අමතරව- විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සහ අනිකුත් කාරණාවලදී යම්කිසි ලකුණු ප්‍රමාණයක් එකතු කරන වැඩ පිළිවෙළකට සහ යම්කිසි විධියකට පාසලේ අධ්‍යාපනයත් එක්ක බද්ධ කරලා ලකුණු එකතු කරන ක්‍රමයකට ගියොත්, එවැනි ක්‍රමවේදයකින් ඒ ශිෂ්‍ය පිරිස වැඩි කරගන්න පුළුවන් වේවි. හැබැයි ඒකම නොවෙයි, තව කළ යුතු බොහෝ දේවල් තිබෙනවා. දහම් පාසල්වලට භෞතික යටිතල පහසුකම් ද ලබා දිය යුතුයි. දහම් පාසල් රාශියක් ගස් යටත් පැවැත්වෙනවා. මේ කාරණා දෙක සම්බන්ධයෙන් අමාත්‍යාංශය ලබන වර්ෂය සඳහා විශේෂ මැදිහත්වීමකට සූදානම්ද?

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, කෙටියෙන්ම දෙන්න පුළුවන් උත්තරය තමයි, "ඔව්" කියන එක. අපි සූදානම් ඒ වැඩසටහනට. දැනටමත් අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. ඔබතුමා ඔය කියන ආකාරයේ වැඩ පිළිවෙළක් දැනටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් එක්ක කරගෙන යනවා. නමුත්, ඊට වඩා සක්‍රිය කළ යුතුයි; ශක්තිමත් කළ යුතුයි. ඔබතුමාට තුන්වැනි අතුරු ප්‍රශ්නයක් අහන්න තිබුණා නම් අහන්නේ, "ඉරිදා දිනයේ අමතර පන්ති පවත්වන්නේ ඇයි" කියලා. ඒක තමයි දහම් පාසලට දරුවන් එන්නේ නැති ප්‍රධාන හේතුවක් වෙලා තිබෙන කාරණය. ගරු කථානායකතුමනි, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුව්‍යවස්ථාවක් තිබෙනවා, කණ්ඩායමකට පමණක් විශේෂ වෙච්ච තීන්දු ගන්න බැහැ කියලා. මෙන්න මේ ගැටලුව අපට තිබෙනවා. නමුත් අපි ඒ කඩඉමත් පුළුවන් තරම් පහුකරගෙන අලුත් ප්‍රතිසංස්කරණත් එක්ක ගමන් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රශ්න අංක 2 - 424/2020 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 522/2020 - (1), ගරු අමරකීර්ති අතුකෝරළ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 - 567/2020 - (1), ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සෞඛ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - சுகாதார அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Health)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 579/2020 - (1), ගරු චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 - 602/2020 - (1), ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 - 760/2020 - (1), ගරු වඩිවෙල් සුරේෂ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

"ගම්පෙරළිය" වැඩසටහන: විස්තර
"கம்பெரலிய" வேலைத்திட்டம்: விபரம்
"GAMPERALIYA" PROGRAMME: DETAILS

880/2020

8. ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)

අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී තිබුණේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

(iii) එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද කාල පරිච්ඡේදය කවරේද;

(iv) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම වැඩසටහන මඟින් ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vii) "ගම්පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කළ කාලසීමාව තුළදී එම වැඩසටහනට අදාළව, අදාළ විෂය භාර අමාත්‍යවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) "ගම්පෙරළිය" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද එක් එක් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු වූ බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහතික විය හැකිද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் நிதி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) "கம்பெரலிய" என்ற பெயரில் வேலைத்திட்ட மொன்றை நடைமுறைப்படுத்துவது தொடர்பில் அமைச்சரவை தீர்மானமொன்றை மேற்கொண்டி ருந்ததா என்பதையும்;

(ii) மேற்படி வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப் பட்டதன் நோக்கங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப் பட்ட காலப்பகுதி யாதென்பதையும்;

(iv) மேற்படி வேலைத்திட்டத்திற்காக ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(v) அத்திட்டத்தின் மூலம் நடைமுறைப்படுத்தப்பட்ட கருத்திட்டங்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(vi) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்திற்காகவும் செலவிடப்பட்ட தொகை எவ்வளவென்பதை யும்;

(vii) "கம்பெரலிய" திட்டம் நடைமுறைப்படுத்தப்பட்ட காலப்பகுதியில் அத்திட்டத்திற்குரியதாக சம்பந்தப்பட்ட விடயத்திற்குப் பொறுப்பான அமைச்சருக்கும் அவரது பணியாட்டொகுதிக்கும் மேற்கொள்ளப்பட்ட செலவினம் எவ்வள வென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) "கம்பெரலிய" திட்டத்தின் கீழ் நடைமுறைப்படுத்தப் பட்ட ஒவ்வொரு கருத்திட்டத்தின் மூலமும் எதிர்பார்க்கப்பட்ட நோக்கங்கள் நிறைவேறியுள்ளன என்பதை தொடர்புடைய பிரதேச செயலாளர்களால் உறுதிப்படுத்த முடியுமா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Finance:

(a) Will he inform this House-

(i) whether a Cabinet decision had been taken to implement a programme called "Gamperaliya";

(ii) the objectives of the aforesaid programme;

(iii) the period it was implemented;

(iv) the amount allocated for the programme;

(v) the total number of projects implemented under the programme;

(vi) the amount spent for each project; and

(vii) the total expenses incurred for the subject Minister and his staff with regard to the "Gamperaliya" programme during the period it was implemented ?

(b) Will he also inform this House, whether the relevant Divisional Secretaries can guarantee that each project implemented under the "Gamperaliya" programme had delivered the expected outcome?

(c) If not, why?

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) රටෙහි යටිතල පහසුකම්වල ගුණාත්මක තත්ත්වය දියුණු කරමින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා උපකාර කිරීම සහ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම.

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

(iii) 2018/ 2019 (2018 වර්ෂයේ ජූලි මාසයේ සිට 2019 වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා)

(iv) 2018 - රුපියල් මිලියන 20,003.05

2019 - රුපියල් මිලියන 48,000

(v) 2018 - ව්‍යාපෘති 7,308

2019 - ව්‍යාපෘති 105,203

(vi) 2018

2018 වර්ෂයේ අනුමත කරන ලද 51,509ක් වූ මුළු ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 7,237ක් සම්පූර්ණයෙන් නිම කරන ලද අතර, ව්‍යාපෘති 171ක් අර්ධ වශයෙන් නිම කරන ලදි. ඒ අනුව, අවසන් කර ඇති සමස්ත වැඩ වටිනාකම රුපියල් මිලියන 5,068ක් වේ.

2019

2019.12.31 දින වන විට රුපියල් මිලියන 43,338.30ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 105,203ක් ක්‍රියාත්මක කොට ඇති අතර, රුපියල් මිලියන 41,494.21ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 101,391ක සම්පූර්ණයෙන් වැඩ අවසන් කොට ඇත.

(vii) ඔව්.

2019 .01.29 දින සිට 2019.11.19 දින දක්වා ගම්පෙරළිය ව්‍යාපෘතියට අනුයුක්තව කටයුතු කළ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ගෙවන ලද වැටුප් හා දීමනා පහත පරිදි වේ.

මාසය	මූලික වැටුප(රු.)	ඉන්ධන දීමනාව (රු.) (පෙට්‍රල් 140Lක් සඳහා)	දුරකථන දීමනාව (රු.)
2019 පෙබරවාරි	109,677.42 (2019.01.29 දින සිට හිඟ වැටුප ද පෙබරවාරි මසට ගළපා ඇත)	-	-
මාර්තු	100,000.00	35,844.51 (2019.01.31 දින සිට හිමි හිඟ දීමනාව ද මාර්තු මසට ගළපා ඇත)	10,483.87 (2019.01.29 දින සිට හිමි හිඟ දීමනාව ද මාර්තු මසට ගළපා ඇත)
අප්‍රේල්	100,000.00	18,480.00	5,000.00
මැයි	100,000.00	18,480.00	5,000.00
ජූනි	100,000.00	18,900.00	5,000.00
ජූලි	100,000.00	19,320.00	5,000.00
අගෝස්තු	100,000.00	19,040.00	5,000.00
සැප්තැම්බර්	100,000.00	19,320.00	5,000.00
ඔක්තෝබර්	100,000.00	19,180.00	5,000.00
නොවැම්බර් (2019.11.19 දින දක්වා)	63,333.33	12,147.33	3,166.66
එකතුව	973,010.75	180,711.84	48,650.53

(ආ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සඳහන් කර ඇති අරමුණු ළඟා කර ගැනීම සඳහා නිකුත් කළ චක්‍රලේඛ අනුව දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

ඒ පිළිබඳ සමාලෝචනයක් මා හට දැනට ලැබී නැත. අවශ්‍ය නම් එවැනි සමාලෝචනයක් කළ හැකි බව මා එතුමාට දන්වන්නම්.

(ඇ) පැන නොනඟී.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අසන්න තිබෙන මිනිත්තුවක කාලය සහ ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න තිබෙන මිනිත්තුවක කාලය -මිනිත්තු දෙකක කාලය- තුළ ප්‍රකාශයක් කිරීම සඳහා මා ඔබතුමාගෙන් විශේෂ අවසරයක් ඉල්ලා සිටිනවා. ඒ සඳහා අවසර ලැබෙයි කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, අද 2020 වසරේ පාර්ලිමේන්තුව රැස් වන අවසාන දිනය. පසුගිය අගෝස්තු 20 වැනි දා නව වැනි පාර්ලිමේන්තුව රැස්වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට මේ අවස්ථාවේදී ප්‍රකාශයක් කරන්න බැහැ. ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)

මා ඔබතුමාගෙන් අවසර ඉල්ලුවේ ඒකයි. එහෙම බැරි නම් මා වාඩි වෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ අවස්ථාවේ බැහැ. ඒක වෙනත් අවස්ථාවක ඉදිරිපත් කරන්න.

දෙවන වටය.

කුරුණෑගල-හබරණ දුම්රිය මාර්ගය: අවම හානි යටතේ ඉදිකිරීම

குருநாகல் - ஹபரணை புகையிரதப் பாதை: குறைந்தபட்ச சேதங்களுடன் நிர்மாணித்தல்

KURUNEGALA-HABARANA RAILWAY LINE: CONSTRUCTION WITH MINIMUM DAMAGES

424/2020

2. **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී එම මාර්ගය නිශ්චය කර ගැනීම සඳහා මැනුම් 3ක් සිදුකර ඇති අතර ඉන් 3 වැනි මැනුමට අදාළව, මාර්ගය ඉදිකිරීමට තීරණය කර ඇති අතර බෙලිගමුව - ගලේවෙල - දඹුල්ල කොටසේ

ඉදිකිරීම්, ඉහළ ආර්ථික වටිනාකමකින් යුක්ත ඉඩම් හරහා සිදු වන නිසා වැඩි වන්දි ප්‍රමාණයක් ගෙවීමට සිදු නොවන්නේද;

(ii) ඉහත දුම්රිය මාර්ගය ඉදිකිරීම නිශ්චය කර ගැනීම සඳහා කරන ලද තුන්වන මැනුම අනුව මෙම දුම්රිය මාර්ගය ඉදිකිරීමට තීරණයකර තිබුණද එහි පළමු මැනුම අනුව ඉහත දුම්රිය මාර්ගය ඉදිකිරීමෙන් මෙම මාර්ගය ඉදිකිරීමේදී සිදු වන හානි අවම වී වන්දි ගෙවීමත් අවම නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் - ஹபரணை புகையிரதப் பாதை நிர்மாணிக்கப்படும்போது குறிபிட்ட பாதையை நிச்சயித்துக்கொள்வதற்காக 3 தடவைகள் அளவிடல் பணிகள் மேற்கொள்ளப்பட்டுள்ள தோடு, 3ஆவது அளவிடலுக்கு அமைவாகப் பாதையை நிர்மாணிப்பதற்குத் தீர்மானிக்கப் பட்டுள்ளதுடன், பெலிகமுவ - கலேவல - தம்புள்ள பகுதியின் நிர்மாணப் பணிகள் பொருளாதாரரீதியில் அதிக பெறுமதிவாய்ந்த காணிகள் ஊடாக மேற்கொள்ளப்படுவதால் அதிக நட்ட ஈட்டுத் தொகை செலுத்த வேண்டியேற்படாதா என்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட புகையிரதப் பாதைக்கான நிர்மாணத்தினை நிச்சயிப்பதற்காக மேற்கொள்ளப்பட்ட மூன்றாவது அளவிடலுக்கு அமைவாக இப்புகையிரதப் பாதையை நிர்மாணிப்பதற்குத் தீர்மானிக்கப்பட்டிருப்பினும், அதன் முதலாவது அளவிடலுக்கு அமைவாக இப்பாதையை நிர்மாணிப்பதன்மூலம் ஏற்படக் கூடிய பாதிப்புக்கள் குறைவடைந்து, செலுத்த வேண்டிய நட்ட ஈடும் குறைவடையாதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House -

(i) whether a higher amount of compensation will not have to be paid owing to constructing the Kurunegala-Habarana Railway Line through lands with a higher economic value in Beligamuwa-Galewela-Dambulla section subsequent to the third survey which was carried out to decide the specific route; and

(ii) whether the damages would not be less and whether a lesser amount of compensation will not have to be paid if it is decided to construct the above railway line as per the first survey, instead of deciding to construct this railway line based on the third survey constructing the above railway line?

(b) If not, why?

ගරු ගාමිණී ලොකුගේ මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி லொக்குகே - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Transport)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දුම්රිය මාර්ගය නිශ්චය කර ගැනීම සඳහා මැනුම් තුනක් සිදු කර නොමැත. සිදු කර ඇත්තේ ශක්‍යතා අධ්‍යයනය, පරිසරය අධ්‍යයනය සහ මූලික සැලසුම් සකස් කිරීම සඳහා අධ්‍යයනය යන අධ්‍යයන තුනක් පමණි. ක්ෂේත්‍රයේ මිනින්දෝරු මැනුමක් සිදුකර ඇත්තේ එක් වතාවක් පමණක් වන අතර, එම මැනුම සිදු කර ඇත්තේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසිනි.

එම මැනුමට අදාළව ඉඩම් අත්පත් කරගෙන ඇති අතර, විශේෂයෙන් බෙලිගමුව, ගලේවෙල හා දඹුල්ල යෝජිත දුම්රිය මාර්ග කොටසේ දැනට රජයට අත්පත් කර ගත් ඉඩම්වලින් සියයට 80ක ප්‍රමාණයක් කුඹුරු හා වතු ඉඩම් වේ. එබැවින් එම ඉඩම් කොටස් සාපේක්ෂ වශයෙන් වැඩි ආර්ථික වටිනාකමකින් යුත් ඉඩම් ලෙස සැලකිය නොහැකි බැවින් වැඩි වන්දි ප්‍රමාණයක් ගෙවීමට සිදු නොවේ.

(ii) මෙම මාර්ගය ඉදිකිරීම නිශ්චය කර ගැනීම සඳහා මැනුම් තුනක් සිදු කර නොමැති අතර, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත්තේ එක් මැනුමක් පමණි. එම මැනුමට අනුව දුම්රිය මාර්ගය ඉදි කිරීමට ඉඩම් අත්පත් කර ගැනීම සිදු කර ඇති බැවින්, වන්දි ගෙවීම රජයේ තක්සේරු වාර්තා අනුව සිදු කෙරේ.

(ආ) අදාළ නොවේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය: විස්තර

பொலன்னறுவை மாவட்டப் பாலுற்பத்தி: விபரம்
MILK PRODUCTION IN POLONNARUWA DISTRICT: DETAILS

522/2020

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අමරකීර්ති අතුකෝරළ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு அமரகீர்த்தி அத்துகோரல சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Amarakeerthi Athukorala)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව හා ඔවුන් විසින් ඇතිකරනු ලබන එළ හා මී ගවයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දිස්ත්‍රික්කයේ වැඩිම කිරි ගොවීන් සිටින ප්‍රදේශ කවරේද;

(ii) ඔවුන්ට රජයෙන් කිරි ගවයන් ලබා දී ඇත්නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) අවසන් වරට එසේ, කිරි ගවයන් ලබා දුන් දිනය සහ ඔවුන් අතරින් මේ වනවිට ජීවත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iv) කිරි ගවයන් පෝෂණය සඳහා රජයෙන් තෘණ භූමි ලබා දී තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) කිරි ගොවීන්ට ලබා දීමට තෘණ භූමි හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ඇ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත දෛනික කිරි නිෂ්පාදනයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගොවීන්ගේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(ii) දිස්ත්‍රික්කයේ කිරි ගවයන්ගෙන් දෛනිකව ගන්නා කිරි ප්‍රමාණය කොපමණද;

(iii) එම කිරිවලින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය / මිල්කෝ (පුයිවට්) ලිමිටඩ් මිලදී ගනු ලබන දෛනික කිරි ප්‍රමාණය සහ ලීටරයකට ගෙවන මිල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) பொலன்னறுவை மாவட்டத்தில் உள்ள பாற்பண்ணை யாளர்கள், பசு மாடுகள், கறவைப் பசுக்கள், எருமை மாடுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பொலன்னறுவை மாவட்டத்தில் அதிகளவான பாற்பண்ணையாளர்களைக் கொண்டுள்ள பிரதேசம் யாது என்பதையும் ;

(ii) அவர்களுக்கு அரசாங்கம் பசு மாடுகளை வழங்கியிருப்பின் அந்த எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இறுதியாக அவ்வாறு பசு மாடுகள் வழங்கப்பட்டுள்ள திகதியும் அவற்றில் தற்போது உயிர் வாழ்பவற்றின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) பசு மாடுகளைப் போஷிப்பதற்காக அரசாங்கம் புற்தரைகளை வழங்கியிருப்பின் அவற்றின் அளவு யாது என்பதையும்;

(v) எதிர்காலத்தில் பற்பண்ணையாளர்களுக்கு வழங்குவதற்காகப் புற்தரைகள் அடையாளம் காணப்பட்டுள்ளனவா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இலங்கையின் நாளொன்றுக்கான மொத்தப் பால் உற்பத்தியில் பொலன்னறுவை மாவட்டப் பாலுற்பத்தியாளர்களின் பங்களிப்பின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) பொலன்னறுவை மாவட்டத்தில் நாளொன்றுக்கு பசுக்களிலிருந்து எவ்வளவு பால் பெறப்படுகின்றது என்பதையும்;

(iii) தேசிய கால்நடை அபிவிருத்தி சபை / மில்க்கோ தனியார் நிறுவனம்மூலம் நாள்தோறும் கொள்வனவு செய்யப்படும் பாலின் அளவு எவ்வளவென்பதையும்; ஒரு லீற்றர் பாலின் விலை எவ்வளவு என்பதையும்

அவர் மேலும் இச்சபைக்கு அறிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform the House of the number of milk farmers, milk cows, cattle and buffalos in the Polonnaruwa District, separately?

(b) Will he also inform the House -

(i) the densest areas in terms of the number of milk farmers within the Polonnaruwa District;

(ii) whether the Government has provided them with milk cows and the number;

(iii) the date on which milk cows were last provided in that District and how many of them survive to this day;

(iv) whether the Government have made available grass lands for feeding milk cows, if so, what extent; and

(v) whether grass lands have been identified to be made available to milk farmers in future?

(c) Will he further inform this House -

(i) the percentage of the contribution by milk farmers of the Polonnaruwa District to Sri Lanka's overall daily milk production;

(ii) what amount of milk is extracted every day from the milk cows in the District; and

(iii) what amount of that milk is purchased daily by the National Livestock Development Board/Milco Private Limited and the price paid per litre for the milk?

(d) If not, why?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරි ගොවීන් සංඛ්‍යාව 11,859ක් පමණ වේ.

එළ ගවයින් 69,580කි. එළ ගව ගොවිපොළ සංඛ්‍යාව 11,073කි.

මී ගවයින් සංඛ්‍යාව 28,465කි. මී ගව ගොවිපොළ සංඛ්‍යාව 786කි.

	ගොවිපොළ සංඛ්‍යාව	සතුන් සංඛ්‍යාව
එළ ගව	**11,073**	**69,580**
මී ගව	**786**	**28,465**

(ආ) (i) වැලිකන්ද, දිඹුලාගල, මැදිරිගිරිය, ලංකාපුර ප්‍රදේශ දිස්ත්‍රික්කයේ වැඩිම කිරි ගොවීන් පිරිසක් සිටින ප්‍රදේශ වේ.

(ii) රජයේ සියයට 50ක දායකත්වය යටතේ පසුගිය වර්ෂවල කිරි ගවයන් ලබා දී ඇත.

ලබා දුන් වර්ෂය	ලබා දුන් සතුන් සංඛ්‍යාව
2018	43
2019	37
2020	21

(iii) 2018, 2019, 2020 වර්ෂවල සියයට 50ක රජයේ දායකත්වය යටතේ ලබා දුන් කිරි ගවයින්ගෙන් 2019 වර්ෂයේදී ලබා දුන් එක් කිරි ගවයෙකු පමණක් මිය ගිය අතර, අනෙක් කිරි ගවයින් සියදෙනාම (100) ජීවත්ව සිටී.

ලබා දුන් වර්ෂය	දැනට සිටින සතුන් සංඛ්‍යාව
2018	43
2019	36
2020	21

(iv) රජයෙන් තෘණ භූමි ලබා දී නොමැත.

(v) කිරි ගොවීන් වෙත ලබා දීමට තෘණ භූමි හඳුනා ගෙන තිබේ.

ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාසයේ සංඝබෝධිගම අක්කර 10ක භූමි ප්‍රමාණයක් තෘණ භූමි ලෙස ලබා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාසයේ ඕනෑගම අක්කර 100ක භූමියක් ලබා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාසයේ විලයාමඩු (තඹාල) ප්‍රදේශයෙන් අක්කර 586ක් ලබා දෙන ලෙස ගොවීන් විසින් යෝජනා කර ඇත.

වැලිකන්ද පශු වෛද්‍ය කොට්ඨාසයේ කන්දකඩුව ප්‍රදේශයේ අක්කර 1,814ක භූමියක් තෘණ භූමි ලෙස භාවිතා කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර ඇත.

පොළොන්නරුව පශු වෛද්‍ය කොට්ඨාසයේ අඹන් ගහ, කළහගල, අළුත්වැව, බැදිවැව ප්‍රදේශයේ අක්කර 200ක ප්‍රමාණයක් තෘණ භූමි ලෙස ලබා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

දිඹුලාගල පශු වෛද්‍ය කොට්ඨාසයේ මහදමන, ඉහළ ඇල්ල වැව, වලස්ගල, බඳනාගල හා 11 ඇළ ප්‍රදේශයේ ද සැලකිය යුතු භූමි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත.

පශු වෛද්‍ය කොට්ඨාසය	හඳුනාගත් ප්‍රදේශ	ප්‍රමාණය අක්කර	නිර්දේශය
ලංකාපුර	සංඝබෝධිගම	10	ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
	ඕනෑගම	100	ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.
	විලයාඩිමඩු (තඹාල)	586	ගොවීන් විසින් යෝජනා කර ඇත.
වැලිකන්ද	කන්දකඩුව	1,814	ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර ඇත.
පොළොන්නරුව	අඹන් ගහ, කළහගල, අළුත්වැව, බැදිවැව	200	ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.
දිඹුලාගල	මහදමන, ඉහළ ඇල්ල වැව, වලස්ගල, බඳනාගල හා 11 ඇළ		හඳුනාගෙන පමණක් ඇත.

(ඇ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත කිරි නිෂ්පාදනයෙන් 2018 වර්ෂයේදී සියයට 4.14ක දායකත්වයක්ද, 2019 වර්ෂයේදී සියයට සියයට 4.95ක දායකත්වයක්ද පොළොන්නරු දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

(ii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගවයින්ගේ දෛනික කිරි නිෂ්පාදන සාමාන්‍යය ලීටර 40,000ක් වේ.

(iii) එම කිරිවලින් නදෛනිකව ලීටර 8,790ක් පමණ මිල්කෝ ආයතනය විසින් මිලදී ගනී. ලීටරයක මිල රු.75.00ත් 80.00ත් අතර මිලක් කිරි ගොවියාට ගෙවනු ලැබේ. නෙස්ලේ, කාගිල්ස් වැනි කිරි සැකසුම් ආයතනයද ප්‍රාදේශීය කිරි සැකසුම් ආයතනද කිරි මිලදී ගැනීම් සිදු කරන බැවින්, දෛනිකව නිෂ්පාදනය කෙරෙන සියලුම කිරි අලෙවි කිරීම ක්‍රමවත්ව සිදු වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ගොවීන්ගෙන් කිරි මිලදී ගැනීම සිදු නොකරයි.

(ඈ) පැන නොනඟී.

දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව වූ විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව: නිර්දේශ

ஊழல்கள் மற்றும் முறைகேடுகள் குறித்த விசேட சனாதிபதி விசாரணை ஆணைக்குழு அறிக்கை: விதப்புரைகள்

REPORT OF SPECIAL PRESIDENTIAL COMMISSION OF INQUIRY TO INVESTIGATE INTO FRAUD AND CORRUPTION: RECOMMENDATIONS

602/2020

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Dr.) Upul Galappaththi)

සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පසුගිය "යහපාලන" රජය සමයේ රාජ්‍ය ආයතන තුළ සිදුවූ දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව සිදුවූ බරපතල දූෂණ හා අක්‍රමිකතා ගණනාවක් පිළිබඳව විමර්ශනය කළ බව ජනමාධ්‍ය මඟින් වාර්තා වූ බවත්;

(ii) එම විමර්ශන අතර පිළිකා නාශක ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර, ෆ්ලුක්ලොක්සයිලින් (flucloxacillin) නම් ප්‍රතිජීවක ඖෂධය මිලදී ගැනීමේ ටෙන්ඩරය හා මාලඹේ නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගැනීමට අදාළව රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ විමර්ශන පැවති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) එම විමර්ශනවලදී හෙළිදරව් වූ තොරතුරු හා ඉහත සඳහන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ කවරේද යන්න පිළිබඳව සොයා බැලීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ජනාධිපති කොමිෂන් සභා වාර්තා අනුව ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) එහිදී කවර පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබේද;

(iv) එම නිර්දේශ පිළිබඳව අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த நல்லாட்சி அரசாங்கத்தின் காலப் பகுதியில் அரசாங்க நிறுவனங்களில் இடம் பெற்றுள்ள ஊழல்கள் மற்றும் முறைகேடுகள் குறித்து ஆராய்ந்து பார்ப்பதற்காக நியமிக்கப் பட்ட விசேட சனாதிபதி விசாரணை ஆணைக் குழுவில் சுகாதார அமைச்சு சார்ந்ததாக இடம் பெற்றுள்ள பாராதூரமான ஊழல்கள் மற்றும் ஏராளமான முறைகேடுகள் தொடர்பில் விசாரணை மேற்கொள்ளப்பட்டதாக ஊடகங் களில் வெளியானது என்பதையும்;

(ii) மேற்படி விசாரணைகளில் புற்றுநோய் எதிர்ப்பு ஔடதங்களைக் கொள்வனவு செய்யும் கேள்விப்பத்திரம், புலுக்லொக்சிலின் (Flucloxacillin) எனும் நுண்ணுயிர்க் கொல்லி ஔடதங்களைக் கொள்வனவு செய்யும் கேள்விப்பத்திரம் மற்றும் நெவில் பர்னாந்து வைத்தியசாலையை அரசாங்கத்துக்கு பொறுப் பேற்றது தொடர்பிலான அரச நிதி துஷ்பிரயோகம் தொடர்பில் விசாரணைகள் மேற்கொள்ளப்பட்டது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி விசாரணைகளில் வெளியான தகவல்கள் மற்றும் மேற்குறிப்பிட்ட சனாதிபதி விசாரணை ஆணைக்குழுவின் விதப்புரைகள் யாதென்பது தொடர்பில் ஆராய்ந்து பார்க்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், குறிப்பிட்ட சனாதிபதி ஆணைக்குழு அறிக்கைக்கு ஏற்ப வழங்கப்பட்டுள்ள விதப்புரைகள் யாவை ;

(iii) அதன்போது எத்தகைய நபர்களுக்கு எதிராகச் சட்டத்தைச் செயற்படுத்துவதற்கு விதப்புரை செய்யப்பட்டுள்ளது;

(iv) மேற்படி விதப்புரைகள் தொடர்பில் அமைச்சினால் மேற்கொள்ளப்படவுள்ள எதிர்கால நடவடிக்கைகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is she aware that -

(i) media reported that a number of serious acts of fraud and corruption that had been taken place in the Ministry of Health were investigated by the Special Presidential Commission of Inquiry to Investigate into Fraud and Corruption in the public sector institutes during the previous “Good Governance” Government; and

(ii) the aforesaid investigations included awarding of tenders to purchase anti-cancer drugs, awarding of the tender to purchase the antibiotic named ‘flucloxacillin’, and misuse of public funds in acquiring the Nevil Fernando Hospital in Malabe to the Government?

(b) Will she inform this House -

(i) whether the information that have been discovered through those investigations and the recommendations of the aforesaid Presidential Commission have been looked for;

(ii) if so, the recommendations that have been made as per the reports of the aforesaid Presidential Commission;

(iii) the names of persons against whom recommendations have been made to take legal action; and

(iv) the steps that will be taken by the Ministry in future regarding those recommendations?

(c) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය ඇමතිතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i), (ii), (iii), (iv) සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී නොමැති ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට අදාළ ප්‍රශ්න සම්බන්ධව පිළිතුරු ලබා දීමට හැකියාවක් නොමැත.

(ඇ) පැන නොනඟී.

බදුල්ල-මහනුවර විකල්ප මාර්ගය: වැඩ අවසන් කිරීම

பதுளை - கண்டி மாற்று வீதி : நிர்மாணத்தை நிறைவுசெய்தல்

ALTERNATIVE ROAD FROM BADULLA TO KANDY: COMPLETION OF CONSTRUCTION

760/2020

7.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු වඩිවේල් සුරේෂ් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு வடிவேல் சுரேஷ் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Vadivel Suresh)

මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) බදුල්ල සිට මහනුවර දක්වා දිවෙන දැනට පවතින මාර්ගයට විකල්පයක් ලෙස කි.මී. 20 - 30 ක අඩු දුරකින් යුත් බදුල්ල සිට මහනුවර දක්වා නව මහාමාර්ගයක් ඉදිකිරීම යන මැයෙන් එවකට මහාමාර්ග අමාත්‍යතුමා විසින් 2004.10.29 දිනැති අංක 2004/10 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ බව එතුමා දන්නේද?

(ආ) (i) එම මාර්ගය අදියර දෙකක් යටතේ ඉදිකිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමැතිය ලබා දී තිබේද;

(ii) මේ වනවිට එම මාර්ගයේ වැඩ අවසන් කර ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) දැනට එම මාර්ගයේ වැඩ කටයුතු නවතා ඇති බව එතුමා දන්නේද?

(ඈ) (i) එවකට සංවර්ධන සංග්‍රාමය යටතේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබූ මෙම මාර්ගයේ වැඩ කටයුතු මේ වනතෙක් අවසන් කර නොතිබීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) විශේෂ ව්‍යාපෘතියක් යටතේ හෝ මාර්ගයේ වැඩ කටයුතු අවසන් කර ජනතාවට මාර්ග පහසුකම් සැලසීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தற்போது பதுளையிலிருந்து கண்டி வரை காணப்படுகின்ற வீதிக்கான மாற்று வழியாக பதுளையிலிருந்து கண்டி வரை 20 - 30 கி.மீ. குறைவான தூரத்தைக் கொண்ட புதிய வீதியொன்றை நிர்மாணித்தல் எனும் தலைப்பில் முன்னாள் நெடுஞ்சாலைகள் அமைச்சரினால் 2004.10.29 ஆம் திகதியும் 2004/10 ஆம் இலக்கமும் கொண்ட அமைச்சரவை விஞ்ஞாபனம் சமர்ப்பிக்கப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியை இரண்டு கட்டங்களின் கீழ் நிர்மாணிப்பதற்கு குறித்த அமைச்சரவை விஞ்ஞாபனம்மூலம் அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இதுவரை மேற்படி வீதியின் வேலைகள் பூர்த்தி செய்யப்பட்டுள்ள தூரத்தின் அளவு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) தற்போது மேற்படி வீதியின் வேலைகள் நிறுத்தப்பட்டுள்ளன என்பதை அவர் அறிவாரா?

(ஈ) (i) அப்போதைய அபிவிருத்திப் புரட்சியின்கீழ் பிரதான அபிவிருத்திக் கருத்திட்டமொன்றாக இனங்காணப்பட்டிருந்த இந்த வீதியின் வேலைகள் இதுவரை நிறைவு செய்யப்படாதுள்ளமை தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது என்பதையும்;

(ii) விசேட கருத்திட்டமொன்றின் கீழேனும் வீதியின் வேலைகளை நிறைவுசெய்து பொதுமக்களுக்கு வீதி வசதிகளைச் செய்துகொடுக்க மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Highways:

(a) Is he aware that the then Minister of Highways submitted the Cabinet Memorandum No. 2004/10 dated 29.10.2004 titled, "Construction of a New Road from Badulla to Kandy", which is shorter than the existing road by 20 - 30 km, as an alternative to the existing Badulla - Kandy Road?

(b) Will he inform this House-

(i) whether approval has been granted through the aforesaid Cabinet Memorandum to construct the aforesaid road in two phases;

(ii) the extent of the aforesaid road of which the construction work has been completed by now; and

(c) is he aware that the construction work of the aforesaid road has been halted at present?

(d) Will he also inform this House -

(i) the action that will be taken regarding non-completion of the construction work of the aforesaid road, which had been identified as a major development project under the then development drive named 'Sanwardana Sangramaya'; and

(ii) the steps that will be taken to provide road facilities to people by completing construction work of this road at least under a special project?

(e) If not, why?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) එම මාර්ගය අදියර දෙකක් යටතේ ඉදි කිරීමට අනුමැතිය ලබා දී ඇත.

පළමු අදියර - මස්පන්න සිට ඌව කැටවල හරහා හලාබ දක්වා කි.මී. 13ක කොටස

දෙවන අදියර - කීර්ති බණ්ඩාරපුර සිට මස්පන්න දක්වා කි.මී. 33 සහ ඌව කැටවල සිට හාලි ඇල දක්වා කි.මී. 12ක පවත්නා මාර්ගය වැඩි දියුණු කිරීම.

(ii) මේ වන විට එම මාර්ගයේ කැටවල සිට කි.මී. 7.00ක් දක්වා මාර්ග කොටසේ පස් කැපීම් (මාර්ග තලය සැකසීම) සිදු කර ඇත. හලාබ සිට මහවෙල හන්දිය දක්වා කි.මී. 6.9 දුර මාර්ග කොටසේ පසු කැපීම් සිදු කරමින් පවතී.

(ඇ) එම මාර්ගයේ වැඩ කටයුතු නවතා නැත. වැඩ සිදු කරමින් පවතී.

(ඈ) (i) සංවර්ධන සංග්‍රාමය යටතේ සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබුණත්, ප්‍රතිපාදන සොයා ගැනීමේ ගැටලු මත ඉදිකිරීම් 2014 වසරෙන් පසු නතර විය.

(ii) කි.මී. 100,00 විකල්ප මාර්ග පද්ධතියක් ඉදිකිරීම වැඩසටහන යටතේ දැනට පහත අයුරින් වැඩ ආරම්භ කර ඇත.

1. කැටවල සිට ජංගුල්ල දක්වා (කි.මී.2.0) මාර්ග කොටස කාපට් ඇතිරීමට කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ ආරම්භ කර ඇත.

2. ජංගුල්ල සිට හලාබ දක්වා (කි.මී. 5.6) මාර්ග කොටස කාපට් ඇතිරීමට වැඩ නියෝග පතක් මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ප්‍රදානය කර දැනට වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

3. හලාබ සිට මහවෙන හන්දිය දක්වා (කි.මී. 6.7) මාර්ග කොටස කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට එම මාර්ග කොටසේ මාර්ග තලය සැකසීම සෘජු ශ්‍රමය යටතේ දැනට සිදු කරමින් පවතී.
4. මහවෙල හන්දියේ සිට මස්පන්න දක්වා (කි.මී.4) මාර්ගය සංවර්ධනය කිරීමට පළාත් මාර්ග දෙපාර්තමේන්තුව (ඌව) මඟින් කටයුතු කරමින් පවතී.
5. හාලිඇල සිට කැටවල දක්වා (කි.මී. 6.6) මාර්ග කොටස සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු සකසමින් පවතී.

(ඉ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, Question under Standing Order 27(2) to be raised by the Hon. G.G. Ponnambalam. Hon. Member, you can raise the Question, but it has not been notified by you in advance to the Hon. Leader of the House. So, you would not get a reply today.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, yesterday when the Hon. Dinesh Gunawardena was in the Chamber, I had it hand-delivered to him. But, the Table Office contacted me this morning saying that the Leader of the House had not received it. I find that quite remarkable because it was hand-delivered. In fact, the Hon. Dinesh Gunawardena acknowledged and waved at me when I hand-delivered it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Leader of the House will reply to you in this regard.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, there is a procedure to follow on this. That procedure has not been followed. Just because I get a document addressed to the Hon. Prime Minister, I cannot act on it unless the procedure is followed. Sir, if you want, you could give a Ruling on it, but the Hon. Member cannot just distribute a Question and expect an Answer. There is a procedure to be followed under Standing Order 27(2). - [*Interruption.*] No, it has to go through the procedure.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can raise the Question, but the Reply will be given later.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, you made the point that I had not followed the procedure because the Hon. Leader of the House had not received it. I got it hand-delivered to the Hon. Leader of the House in this Chamber and he acknowledged it. Not only that, I personally went to the Prime Minister's Office because I have addressed the Question to the Hon. Prime Minister and delivered it. There is nothing in the Standing Orders that tells me to do any of that. In fact, all I have to do is to deliver it to the Secretary-General, which I did in the morning personally. On top of that, to keep the Hon. Leader of the House informed, I hand-delivered it to him also. So, I cannot understand how much more I can do. If the point that is being made is that I should not be giving it to the Hon. Leader of the House, but rather to his Office, I find that quite preposterous. Anyway, I will raise the Question. I think it is quite obvious that the Government does not want to respect me in answering the Question today, but that is quite all right. Let me at least raise the Question. - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, we respect any Hon. Member raising a Question, if the correct procedure is followed. This letter has been addressed to the Secretary-General. If the Hon. Speaker gives a Ruling allowing the Hon. Member to raise the Question, that is a different matter, but please follow the correct procedure.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
What is the correct procedure, Hon. Dinesh Gunawardena?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It has to be handed over to the Hon. Leader of the House in advance.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is what I told him. Hon. Member, you raise the Question and the Reply would be given later.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
It is quite disrespectful to say that the Hon. Leader of the House -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is how I was informed.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
The Hon. Speaker is making an allegation that I have not followed the procedure.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is not an allegation.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, let me just tell you what Standing Order No. 27 (2) states. I quote:

> "The Secretary-General shall, upon receipt of any notice in respect of any question, unless the Speaker rules any question out of order,..."

So, I only have to hand it over to the Secretary-General. Standing Order No. 27(1) also states that it has to be handed over to the Secretary-General. There is nothing here that states that I have to do anything towards the Leader of the House.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You have not read the second part of Standing Order No. 27(2) which states, I quote:

> "Provided that, any question relating to a matter of urgent public importance may be asked by the Leader of the Opposition or a leader of a recognized political party at the conclusion of the questions after due notice has been given to the Minister concerned."

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
To whom?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you read it - Standing Order No. 27(2) - further, the second paragraph.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
That is why I say, Sir, that I hand-delivered the Question under Standing Order No. 27(2) to the Prime Minister's Office because it is from the Prime Minister that I am asking the Question.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is okay, Hon. Member. We need not waste time. So, you had better raise your Question. Then later, the Hon. Minister concerned will give the Answer.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
But, then, those statements must not be made, Hon. Speaker. We also can understand how to do this.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, the fact remains that it had not been handed over yesterday. That is all.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
It was handed over in the morning.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is right.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
It was handed over in the morning. I personally handed it over. How can you say that I did not hand it over, Hon. Speaker? It is incredible!

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
Hon. Speaker, the Leader of the Opposition and the Leaders of other parties are allowed to raise Questions under Standing Order No. 27(2). There are two ways of channelling a Question. One way is to send it through the Office of the Leader of the Opposition. The second is, the individual Party Leaders have the right to forward their Questions themselves. The Question that has to be raised and replied today has to be handed over the previous day, before 12 noon. That is the procedure. So, I believe the Hon. Ponnambalam had taken the liberty of handing over the Question by himself, which he has a right to do. So, I do not think we need to waste time on this. Now that we are quite aware of the relevant procedure, let him raise the Question and then, the Government can decide on providing the Answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is exactly what I said. So, Hon. Ponnambalam, go ahead with it.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

කොවිඩ්-19 රෝගයෙන් මියයන්නන්ගේ අවසන් කටයුතු සඳහා පැහැදිලි නිර්ණායක ලබාදීම
கொவிட்-19 இனால் மரணமடைபவர்களை நல்லடக்கம் செய்வது பற்றிய தெளிவான வழிகாட்டுதல்களை வழங்குதல்
PROVISION OF CLEAR GUIDELINES REGARDING LAST RITES OF COVID-19 VICTIMS

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Thank you, Hon. Speaker.

Whereas the World Health Organization's advice dated 24.03.2020 on "Infection prevention and control for the safe management of a dead body in the context of COVID-19" clearly noted "People who have died from COVID-19 can be buried or cremated" and specifically stressed that the dignity of the dead, their cultural and religious traditions and their families should be respected and protected during the pandemic crisis;

And whereas adhering to the said advice of the WHO, the Ministry of Health Guidelines of 27th of March, 2020 allowed relatives to see the bodies at the hospital and also permitted burial of the dead bodies;

And whereas the said Government Guidelines were amended and the "Provisional Clinical Guidelines on COVID-19 and Confirmed Patients" dated 31st of March, 2020 instruct that the bodies of those dead by COVID-19 "should be cremated within 24 hours (preferably within 12 hours)" without providing adequate or reasonable justification for departing from the WHO Guidelines;

And whereas in a letter to His Excellency President Gotabaya Rajapaksa on the 08th of April, 2020, four UN Special Rapporteurs urged to reconsider the provisions in the Ministry of Health Guidelines by taking into account the key considerations provided by WHO Guidelines for the disposal of the bodies of human beings deceased from COVID-19 and revise the circular accordingly in view of the challenges posed by the pandemic, it is important that the Government avoids any unnecessary measures that are likely to raise tension and are running contrary to the respect of the fundamental human rights of the persons belonging to different communities that exist in Sri Lanka. Arbitrary decisions concerning the disposal of bodies of victims of COVID-19 may also have the opposite effect, provoking reluctance of families and communities to report COVID-19 cases in fear that they may be unable to ensure proper funeral or burial rites for their loved ones. Ideally, such provisions should be revised in consultation with all concerned ethnic and religious communities and other relevant health experts and stakeholders.

Whereas though the Constitution of Sri Lanka does not explicitly recognize the right to life, it has been held in the case of Rathnayake Tharanga Lakmali Vs Niroshan Abeykoon that Article 11 of the Constitution, which is freedom from torture read with Article 13(4), which is freedom from arbitrary punishment, recognizes, by necessary implication, the right to life. The court advanced this argument in the said case stating that the Constitution is a "living document" and should not be construed in a narrow and pedantic manner. The court referred to the values embodied in the Constitution, one of which is the dignity and well-being of the people, as well as Sri Lanka's obligations under various international treaties in reinforcing the right to life.

Whereas in the same breath, Article 21 of the Indian Constitution has ensured right to life and a dignified life under Article 21 as a fundamental right and the Supreme Court, through various cases, has held that the right to dignity and fair treatment under Article 21 is not only available to a living man but also his body after his death. The Apex Court had in Parmanand Katara (Pt) v. Union of India held, "the word and expression 'person' in Article 21, would include a dead person in a limited sense and that his right to his life which includes his right to live with human dignity, to have an extended meaning to treat his dead body with respect, which he would have deserved had he been alive subject to his tradition, culture and the religion which he professed. The State must respect a dead person by allowing the body of that dead person to be treated with dignity…"

Whereas in the recent case of Pradeep Gandhy Vs. State of Maharashtra, the Court, by giving reference to the said decision in the earlier quoted case, held that the right to dignity and fair treatment under Article 21 of the Constitution is not only available to a living man, but also to his body after his death. The Court, in its order, said, "Right to a decent burial, commensurate with the dignity of the individual, is recognized as a facet of the right to life guaranteed by Article 21 of the Constitution. There is, thus, no reason as to why an individual who dies during this period of crisis because of suspected/ confirmed COVID-19 infection would not be entitled to the facilities he/she would have otherwise been entitled to but for the crisis,…"

Whereas the new Interim Guideline for infection prevention and safe management of dead bodies in the context of COVID-19 released by the World Health Organization on September 04th, 2020 notes that based on current knowledge of the symptoms of COVID-19 and its main modes of transmission, droplet/contact, the likelihood of transmission when handling human remains is low, and that families can hold funerals in accordance with local customs and standards and bodies can be buried or cremated according to family preferences.

Whereas the UN Resident Coordinator in Sri Lanka in her letter to the Hon. Prime Minister urged the Sri Lankan Government to allow the safe and dignified burial of COVID-19 victims on this basis that "The common assumption that people who died of a communicable disease should be cremated to prevent spread is not supported by evidence. Instead, cremation is a matter of cultural choice and available resources. According to the

World Health Organization guidance, people who have died from COVID-19 can therefore be buried or cremated according to local standards and family preferences with appropriate protocols for handling the body."

Whereas Muslim religious norms do not permit cremation, the amended regulation has caused great distress within the community. As in Islam, fire is connected with Hell and burning the dead is seen as punishment, it is of utmost importance that the bereaved families are treated with sensitivity, dignity and respect. Recognizing the grieving process and related formal and informal rituals, through which the bereaved mourn the passing of loved ones, is important for the health and well -being of the bereaved, especially for Sri Lanka's Muslim and Christian communities.

In these circumstances,

1. we ask the Hon. Prime Minister, who has stood unflinchingly for the rights of the global Muslim population from his most formative years in politics to date and who has taken great pride in identifying himself with the Christian religion in the past, why is it that his Government is acting in this most arbitrary manner on this most sensitive matter faced by these very same religious minorities of this country?
2. we ask the Hon. Prime Minister what is it that prevents this Government, even at this late hour, from changing its present course and doing the right thing by Sri Lanka's religious minorities in allowing burials as being practised by over 190 countries in the world?

Thank you.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Rauff Hakeem?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Speaker, while thanking the Hon. Ponnambalam for raising this matter, I wish to point out, the Government must also take note of this, that there was a small news item under the caption "Cremation of unclaimed bodies begin" in the "Daily Mirror" this morning. There are 20 bodies which have been unclaimed by the Muslim relatives, the next of kin. This is a civic resistance programme that the community has started. This has far-reaching implications not only for the Government, but for the country as a whole. This is a civic resistance that is going to have serious implications despite the fact that the families affected are suffering severe trauma because of not accepting these bodies. But, this is a civic resistance movement against the injustice that has been caused to the Muslim community.

So, for God's sake, please have this draconian policy revised because this has no scientific basis! There are so-called scientific groups; there are so many epidemiologists and virologists like the Hon. (Prof.) Tissa Vitarana. Two or three epidemiologists have said that this is unfair. Therefore, this must be revised. I am pleading on the Floor of this House that this be done without any further delay because this is a charade that is being carried out to satisfy some extremist elements.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, in the course of raising my Question, I referred to various judgments and guidelines. I wish to **table*** those. Thank you.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Harin Fernando?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Hon. Speaker, I gave you a letter yesterday with regard to a Privilege matter. Can I raise it now?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You will get the opportunity.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න ගරු කථානායකතුමනි. මෙතැන තියෙන බරපතළ ප්‍රශ්නය මේකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි ඒ ප්‍රශ්නය දැන් -

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මහර බන්ධනාගාරයේ මිය ගිය 11දෙනාගෙන් 10දෙනෙකුට කොවිඩ් -

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

19 වයිරසය ආසාදනය වෙලා තිබෙන බව. එතකොට ඒ අයත් පුච්චනවා. හැබැයි ඒ මරණ පරීක්ෂණ සිදු වුණාද නැද්ද කියලා ප්‍රශ්නයක් තියෙනවා. මේ කාරණයට මුවා වෙලා බොර දියේ මාළු බානවා. මේකට මුවා වෙලා ආණ්ඩුව වෙනත් අවශ්‍යතා ඉෂ්ට කර ගන්නවා. මේ මිනී පුච්චන එක හරහා වෙන වැඩ කර ගන්නවා. රටේ තිබෙන කොවිඩ් - 19 නීතියට අනුව නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, 'ද ෆිනෑන්ස්' පිළිබඳ ප්‍රශ්නයට අද පිළිතුරු ලබා දෙනවා කියලා අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා ලිඛිතව මා දැනුවත් කළා. මම හිතන්නේ සියල්ලටම ඉස්සෙල්ලා ඒ පිළිතුර ලැබෙන්න ඕනෑ.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I rise to a point of Order.

Sir, will the Government indicate a date when I would have a reply?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, this matter has been debated in Parliament even yesterday. The Hon. Rauff Hakeem repeated the same thing he said last evening. In the course of the day, we will give a short reply. But, we will answer your Question on the first day of Parliament next year.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අද පත්තරයේ තිබුණා, මෘත දේහ 20ක් ගැන. මරණ පරීක්ෂණයක් කරන්නේ නැතුව මෙහෙම මෘත දේහ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is exactly what the Hon. Rauff Hakeem raised. So, it is being repeated by you.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Without a postmortem, bodies cannot be disposed of; මරණ පරීක්ෂණයක් නැතුව මෘත දේහ ආදාහනය කරන්න බැහැ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ඊයේ සිද්ධ වූ ඉතා කනගාටුදායක දෙයක් ගැනයි මම කියන්නේ. තාත්තාටයි, අම්මාටයි කොරෝනා වයිරසය ආසාදනය වෙලා නැහැ. ඒත් දවස් 20 දරුවකුට කොරෝනා වයිරසය ආසාදානය වෙලා තියෙනවා. ඒ දරුවා දිහා ලෝකයම බලාගෙන ඉද්දී, ලෝකයම කඳුළු සලද්දී එම දවස් 20 මුස්ලිම් ජාතික දරුවා පුච්චලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා දරුවන් වෙනුවෙන්වත් අපට සහනයක් දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි.

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, බෞද්ධ රාජ්‍යයක් විධියට බෞද්ධකමට ඉතා ගරු කරන අපේ රටේ රත්ගම ප්‍රදේශයේ ඩෙන්මාර්කයේ ඉඳලා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම ප්‍රශ්නය වෙනම ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] මේ ප්‍රශ්නයට උත්තර දෙන්න මුදල් රාජ්‍ය අමාත්‍යතුමාට අවස්ථාව දෙන්න. කාලය ඉතුරු කර ගන්න අවශ්‍යයි. අද උදේ ඉඳලා මම කිව්වේ අපි කාලය ඉතිරි කර ගනිමු කියලා. ඔබතුමා මතු කරන්නේ වෙනම ප්‍රශ්නයක් නේ. ඒක ඔබතුමා වෙන අවස්ථාවක අහන්න. ඒ ගැන ඔබතුමා යෝජනාවක් ගෙනෙන්න.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දෙන්න.

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
Hon. Speaker, I wanted to reply to the Question raised by the Hon. Leader of the Opposition. However, some information that I requested for has still not been received by me. So, I will reply to him on the next day of Parliament.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. Next, the Hon. Harin Fernando to raise the matter of Privilege.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I was informed in writing that the reply would be given today. So, once I am informed in writing that the reply would be given, I have to receive the reply.

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

Sir, however, the information that has been received by me was not complete. Therefore, I do not want to give the Hon. Leader of the Opposition an incomplete Answer. I will give you a complete Answer the next time the Parliament sits.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Thank you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් මතු කරන්න අවස්ථාව දෙන්න. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය අදයි. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සමරන අද දවසේ විශේෂයෙන් භාෂණයේ නිදහස තිබෙනවා. සිවිල් අයිතිවාසිකම්, ආර්ථික, සමාජයීය, සංස්කෘතික අයිතිවාසිකම් තිබෙනවා. මෙම අවස්ථාවේදී මම ඔබතුමාගේ අවධානයට වැදගත් කාරණයක් යොමු කරන්න කැමැතියි. මහර බන්ධනාගාරයේ ඒ මිනීමැරුම් පිළිබඳ මේ වාර්තාව ඊයේ මා වෙත ලබා දුන්නා; සභාගත කළා. මේ වාර්තාව කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කර සිටිනවා. අද දවස ලෝක මානව හිමිකම් දිනය නිසා මේ කාරණය කියන්න ඕනෑ. මේ වාර්තාවේ කියන විධියට, සිටිය යුතු රැඳැවියන්ගේ ප්‍රමාණයට වැඩිය තුන් ගුණයක් එතැන ඉඳලා තිබෙනවා. එතකොට ඒ රැඳැවියන්ගේ ප්‍රධාන ඉල්ලීම වෙලා තිබෙන්නේ "PCR" පරීක්ෂණ කිරීම, කොවිඩ්-19 රෝගීන් ඉවත් කිරීම, අනුභව කරන්න පුළුවන් ආහාර ලබා දීම කියන කාරණායි. මේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙන විධියට නිලධාරීන් ජීව උණ්ඩ පාවිච්චි කරලා තිබෙනවා; වෙඩි තියලා තිබෙනවා.

එතකොට නිරීක්ෂණවල තිබෙනවා, තදබදය, උණ රෝගය පැතිරීම නිසා මේ කරපු උද්ඝෝෂණය සාධාරණයි කියලා. එතකොට, සාධාරණ උද්ඝෝෂණයකට, ආහාර ඉල්ලපු උද්ඝෝෂණයකට තමයි වෙඩි තබා තිබෙන්නේ. ඒ වාගේම, වාර්තාවේ නිර්දේශවලින් කියන්නේ මොනවාද? කියන්නේ, ඉක්මනින් PCR පරීක්ෂණ කරන්න, නිලධාරීන් වැඩි කරන්න, අනුභව කරන්න පුළුවන් ආහාර ලබා දෙන්න, ඒ වාගේම බෙහෙත් ලබා දීම යථා තත්ත්වයට පත් කරන්න කියලායි.

ගරු කථානායකතුමනි, අද වැනි දවසක, එනම් ලෝක මානව අයිතිවාසිකම් දිනයේ අපි පැහැදිලිව මෙය කියන්න ඕනෑ. මේ වාර්තාවෙන් පෙන්නුම් කරලා තිබෙනවා, මහර බන්ධනාගාර සිද්ධිය තුළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවා, මිනිස් ජීවිත නැතිවෙලා තිබෙනවා, මිනිස් ඝාතන සිද්ධවෙලා තිබෙනවා කියලා. එම නිසා ඔබතුමාටත්, මේ සභාවටත් මම අවධාරණය කරනවා, එම වරද සිදු කළ සියලුදෙනාම නීතිය හමුවට ගෙනෙන්න කියලා. අනිවාර්යයෙන්ම යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන්නට ඕනෑ. රැඳැවියන් වුණත්, ඒ රැඳැවියන්ටත් මානව අයිතිවාසිකම් තිබෙනවාය කියන එක මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු හරින් ප්‍රනාන්දු මහතා.

වරප්‍රසාද: පාර්ලිමේන්තු නිල ට්විටර් ගිණුමේ පළ වූ පණිවුඩය

சிறப்புரிமை: பாராளுமன்ற உத்தியோகபூர்வ டுவிட்டர் கணக்கில் வெளியான செய்தி

PRIVILEGE: MESSAGE APPEARED IN OFFICIAL TWITTER ACCOUNT OF PARLIAMENT

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

Hon. Speaker, I would like to raise this matter of Privilege on something which happened at the COPE with regard to the Google Loon Project. I would like to make my remarks with regard to the COPE findings, what the Hon. (Prof.) Charitha Herath had put in his Twitter account and the Parliament of Sri Lanka's tweet on the incident. It is completely misleading, Sir. I would like to say this in Sinhalese also because a lot of people do not understand what the Google Loon is and the technology of it. Many of them believe that it is just a balloon you blow at your parties.

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය මම කියන්නම්. මේ video එක විනාඩි 21ක් යනකොට Auditor-General's Department එකට දීපු උත්තරය පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් එම ICTA නිලධාරින් කරන බව පෙනෙනවා. එම නිලධාරින් කියනවා, මේකේ ඉංග්‍රීසි වචනයේයි, සිංහල වචනයේයි වෙනසක් තිබෙනවා කියලා. Auditor-General's Department එකේ තිබෙනවා, මේ Rs. 6.4 million ගත්තේ Google Loon Project එකකට නොවෙයි කියලා. හැබැයි, Parliament of Sri Lanka හි ට්විටර් ගිණුමේ තිබෙන්නේ මොකක්ද? මම එය කියවන්නම්. ගරු කථානායකතුමනි, මේක විශාල වරදක්. වහාම Committee on Ethics and Privileges එකට ගෙන්වලා මේ සම්බන්ධයෙන් හොයලා බලන්න. Official Twitter Account of Parliament of Sri Lanka states, I quote:

> "Though the Google Loon project by @icta_srilanka aimed at providing internet access island wide wasn't executed, #COPE revealed that Rs. 1.8 mn have been spent to release Google Loon equipment from the customs & Rs. 6.4 mn have been spent for project promotions".

Sir, this is absolute untruth. ගරු කථානායකතුමනි, "හිරු" නාලිකාවේයි, "දෙරණ" නාලිකාවේයි මේක කියනවා. ගරු කථානායකතුමනි, කොහොමද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මෙච්චර අසත්‍ය කියන්නේ? ඒ නිලධාරින් පව්! මහින්ද හේරත් කියන CEO - දැන් ඉන්න CEO - මම පත් කරපු කෙනෙක් නොවෙයි. ඒ CEO පැහැදිලිව කියනවා, මෙහි එහෙම එකක් වුණේ නැහැ, අපි Auditor-General's Department එකට යැව්වා, මෙන්න ඒ රුපියල් හැටහතර ලක්ෂයට අදාළ වියදම් කියලා. ඒ කොටස තියෙන කොට, Official Twitter Account of Parliament of Sri Lankaහි කොහොමද මෙහෙම දමන්නේ? චරිත හේරත් මැතිතුමා tag කරනවා. මොකක්ද මේ විහිළුව? එහෙම tag කරන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, Official Twitter Account of Parliament of Sri Lanka කාගේ යටතේ ද තිබෙන්නේ? චරිත හේරත් මැතිතුමා යටතේ ද? ගරු කථානායකතුමනි, මේ බලන්න. මේ මොන තරම් අපහාසයක්ද? මෙච්චර හොඳ project එකක් අපට -ලංකාවට- නැති වුණා. අපි කිව්වා, රුපියලක්වත් ගෙනාවේ නැහැ කියලා. Rs. 1.8 million දීලා තිබෙනවා Customs Duty හැටියට. ආණ්ඩුවෙන් කිව්වා, මේ රුපියල් ලක්ෂ හැටහතරම වියදම් කර

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

තිබෙන්නේ "Digital Unimaginable" කියන launch එකට බව. එය දින 100 කාලය තුළයි සිදු වුණේ. එතකොට මම ඇමතිත් නොවෙයි. ඒ කාලයේ අපේ මංගල සමරවීර මැතිතුමා තමයි ඇමති විධියට හිටියේ. අගමැතිතුමා විධියට හිටියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමාගේ අල්ලපු කාමරයේ තිබිලා තියෙනවා වෙනත් event එකක්. ඒකට වියදම් කළ වියදම් ඇස්තමේන්තුවක් තිබෙනවා. එය COPE එකට දෙනවා; COPE එකට වාර්තා කරනවා. ඉතින් මෙහෙම අසත්‍යයක් කොහොමද කියන්නේ? Committee on Ethics and Privileges එකට කරුණාකර "දෙරණ" ආයතනයත්, "හිරු" ආයතනයත්, පාර්ලිමේන්තුවේ අදාළ නිලධාරිනුත් ගේන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ පූර්වාදර්ශය වැරැදියි. COPE එකේ සාකච්ඡා වුණේ වෙනත් දෙයක්.

ගරු කථානායකතුමනි, ඇත්තටම Twitter Account එක කවුද කරන්නේ? පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාත් මෙතැන ඉන්න නිසායි මා අහන්නේ. කොහොමද මෙහෙම tweet එකක් ගහන්නේ? මම ඔබතුමාට ඒ video එක දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳ සොයා බලා ඕනෑ, උත්තරයක් දෙන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මම මේ video එක ඔබතුමාට දෙන්නම්. මේ අසත්‍යයක් කියනවා නොවෙයි. Project එකක් නැති කළාට පසුවත්, මිනිසුන්ට අපහාස කරන්න- [බාධා කිරීමක්] මේ බලන්න, Official Twitter Account of Parliament of Sri Lanka කියන එකේ පළ කර තිබෙන Twitter message එක! මේක සම්පූර්ණ වැරැදියි, ගරු කථානායකතුමනි. අපගේ මුරදේවතාවා හැටියට ඔබතුමා අප ආරක්ෂා කරාවි කියා මම විශ්වාස කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, බොහොම වැදගත් ප්‍රශ්නයක් ඇහුවා, Parliament එකේ ලාංඡනය යොදාගෙන පාර්ලිමේන්තුවේ නමින් කවුද tweet කරන්නේ කියලා. එය සොයා බලන්න දෙයක් නොවෙයි නේ. ඒකට මේ මොහොතේ උත්තරයක් ඕනෑ. මේ Parliament එක - අපේ මහ ලේකම්තුමා, ගරු කථානායකතුමා - දන්නේ නැද්ද, පාර්ලිමේන්තුවේ නාමයෙන් පාර්ලිමේන්තු ලාංඡනය උපයෝගී කරගෙන tweet කරන්නේ කවුද කියන එක? ඒකත් සොයා බලන්න ඕනෑද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
COPE සභාපතිතුමා සභා ගර්භයේ දැන් ඉන්නවා. එතුමාගේ නමත් දැන් කිව්වා. එතුමාට අනියම් මාර්ගයෙන් මේ ගැන කරුණු ප්‍රකාශ කළා. ඒ සභාපතිතුමාට අවස්ථාවක් දෙන්න පැහැදිලි කරන්න. එතකොට මේ ප්‍රශ්නය දැන් ඉවරයි. නැත්නම් මුළු දවස පුරාම- [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කථා කරන්නේ COPE එකේ රැස්වීමේ අන්තර්ගතය පිළිබඳ හෝ එතැන සිදු වුණු දේවල් පිළිබඳ කතන්දරය නොවෙයි. මම අහන්නේ බොහොම වැදගත් ප්‍රශ්නයක්. මොකද, ගරු කථානායකතුමාත්, මහ ලේකම්තුමාත් දැනගෙන ඉන්න ඕනෑ, පාර්ලිමේන්තු ලාංඡනය උපයෝගී කරගෙන, පාර්ලිමේන්තුවේ මේ උත්තරීතර සභාවේ නම උපයෝගී කරගෙන tweet කරන්නේ කවුද කියලා. ඒකට උත්තරයක් දෙන්න බැරිද? මොන විහිළුවක්ද? ඒකත් ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්ද කියලා මම අහන්න කැමැතියි. මේකත් ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්ද? [බාධා කිරීමක්] We need an answer for this. Who is responsible for this? කවුද, responsible?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Chairman of COPE should be given a chance to answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
COPE එකේ සභාපතිවරයා මේ සභාවේ ඉන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
This is a matter for Parliament. - [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Chairman of the COPE should be given a chance. - [*Interruption.*]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, මම tweet එකක් කළොත්, ගරු සභානායකතුමා tweet එකක් කළොත්, ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා tweet එකක් කළොත් අපි-අපි ඒ වගකීම දරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, the Chairman of the COPE is there.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, no. You cannot shout us out. එහෙම- [බාධා කිරීම්] නැහැ, නැහැ. එතුමා දන්නවාද, කවුද tweet කළේ කියලා? ඒක නොවෙයි, ගරු කථානායකතුමනි. කවුද, පාර්ලිමේන්තුවේ කටයුතු tweet කරන එකේ වගකීම භාරගන්නේ? කවුද, තීන්දු කරන්නේ, tag කරනවා කියලා?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපේ මාධ්‍ය අංශය, Chairmanගේ authority එක යටතේ news release කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද, ගරු කථානායකතුමනි? ඇහෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මාධ්‍ය අංශය, Chairmanගේ supervision එක යටතේ මේවා නිකුත් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ මාධ්‍ය අංශය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක බොහොම භයානක දෙයක්. [බාධා කිරීම්] මේක බොහොම භයානක දෙයක්. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව කියන ආයතනය සහ ඒ ලාංඡනය යටතේ එම නාමයෙන් tweet එකක් කරනවා නම්, ගරු කථානායකතුමා ඒක දැනගන්නට ඕනෑ; මහ ලේකම්තුමා ඒක දැනගන්නට ඕනෑ. ගරු කථානායකතුමාත්, මහ ලේකම්තුමාත් දැනගන්නට ඕනෑ, මේක tag කළා කියලා. මේක බොහොම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා, මේ ගැන විනිවිදභාවයෙන් යුක්ත වූ පරීක්ෂණයක් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ද සහභාගි කරවාගෙන කරන්න කියලා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මම කථා කරන්නේ COPE එකේ අන්තර්ගතය ගැන නොවෙයි. [බාධා කිරීම්] මේක අවබෝධ කරගන්න. [බාධා කිරීම්] හරි, හරි. [බාධා කිරීම්] නැහැ, නැහැ. [බාධා කිරීම්] මම අහන ප්‍රශ්නය මේකයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ගරු කථානායකතුමාගේ අනුදැනුම නැතිව, මහ ලේකම්තුමාගේ අනුදැනුම නැතිව කොහොමද, tweet කරන්නේ? කවුද තීන්දු ගන්නේ, tag කරන්න? ඒකට උත්තරයක් ඕනෑ දැන්. ඒකට උත්තරයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි විභාග කරලා බලන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
COPE එකේ සභාපතිතුමාට ඒ ගැන උත්තරයක් දෙන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චරිත හේරත් මැතිතුමාට උත්තර දෙන්න ඉඩ හරින්න. [බාධා කිරීම්] ගරු චරිත හේරත් මැතිතුමා, උත්තර දෙන්න.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ වරප්‍රසාද ප්‍රශ්න නැඟීමේ අයිතිය මන්ත්‍රීවරයකු විධියට මා මුලින්ම පිළිගන්නවා. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට වරප්‍රසාද සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගැන අපට concerns තිබෙනවාය කියන එක මූලික වශයෙන් ප්‍රකාශ කරමින් මම කෙටි කරුණු කීපයක් විතරක් කියන්නම්.

පළමුවැනි කාරණය මෙයයි. COPE එක විසින් කරනු ලබන සියලු සාකච්ඡා එදිනම රාත්‍රියේ විකාශනය වනවා. එම නිසා ඒ ඔක්කොම ඕනෑම channel එකකට - එළියේ තිබෙන channelsවලට - බාගත කරගන්න පුළුවන්. අපේ විශේෂ දැනුම් දීමක් නැත්නම් අප කරන සියලු සාකච්ඡා කිසිම edit කිරීමක් නැතිව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා යටතේ තිබෙන මාධ්‍ය අංශය විසින් මාධ්‍යවලට නිකුත් කරනු ලබනවා. ඒ අනුව ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා සම්බන්ධව ඊයේ පළ වුණු මාධ්‍ය වාර්තාවත් ඒකෙන් කපා ගත් එකක්. පෞද්ගලිකව අප විසින් edit කරලා, කාටවත් මොකුත් දෙන්නේ නැහැ. ඒක, පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මෙයයි. Auditor-General කාර්යාලයෙන් ඉදිරිපත් කරපු වාර්තාව තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන සාකච්ඡාවේදී ඔබතුමා කියන පරිදිම අපි ඒ ගැන බොහොම පැහැදිලිව සාකච්ඡා කළා. TRC එකට ගෙවපු 1.8 million මුදලක් තිබුණා. තවත් 6.4 million තිබුණා. ඒ පිළිබඳ ICTA එකත්, Auditor -General's Department එකත් අතර තවම මත දෙකක් තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳුණේ නැහැ. එහෙම මත දෙකක් තිබෙනවා. ICTA එක කියනවා, ඒක වෙන එකකට වියදම් කළා කියලා. Auditor -General's Department එක කියනවා, වෙනත් එකක්.

ගරු මන්ත්‍රීතුමනි, එම සංවාදයේ කොටසක් ගැන තමයි ඔබතුමා ඔය කියන්නේ. ඒ සංවාදය ඉදිරියට කරගෙන ගියා. යම් එකඟතාවකට ඇවිල්ලා, අපි ඒ සංවාදය නිමා කළා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා එතැන හිටියා. හැබැයි, අපි පොදු ප්‍රතිපත්තියක් ඇතිව පිළිගත්තා, ඒ සමස්තය මාධ්‍යයට යවනවා කියලා. ඒ ඒ මාධ්‍ය ඒ ඒ අයගේ අදහස් පරිදි එහි කොටස් කපලා විකාශනය කරනවා. ඒක දෙවන කාරණය.

තුන්වැනි කාරණය තිබෙන්නේ tweet සම්බන්ධවයි. මම මගේ පෞද්ගලික Tweeter account එක තමයි පාවිච්චි කරන්නේ. ඒක පාර්ලිමේන්තුවේ account එකක් නොවෙයි. ඕනෑම කෙනෙකු tag කරන්න, ඉවත් කරන්න, share කරන්න, re-tweet කරන්න මට පුළුවන්.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ Tweeter account එක පාර්ලිමේන්තුව යටතේ ක්‍රියාත්මක වනවා. ඒ Tweeter account එක හැම තිස්සේම පාර්ලිමේන්තු සංවාද update කරන්න යොදාගන්නවා. එය විතරක් නොවෙයි අද පාර්ලිමේන්තුවේ සංවාද පවා ඒගොල්ලන් tweet කරනවා. මම COPE එකේ සභාපති නිසා මා tag කරලා ඇති. හැබැයි, ඒක නොසිදුවිය යුත්තක් නම්, අප ඒ ආකාරයට නොකළ යුතුයි. ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. ඒක නොකළ යුත්තක් නම් මා tag කළ යුතු නැහැ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, එහෙම නම්, COPE එක තුළින් නිගමනයකට එළඹිලා නැති දෙයක් tweet කරන්නේ කොහොමද? ගරු චරිත හේරත් මැතිතුමාගේ කථාවේම කියපු විධියට ඒ කාරණය සම්පූර්ණ වශයෙන් සාකච්ඡා කරලා අවසන් වෙලා නැහැ. මගේ ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, එතුමා කියපු දේ මම පිළිගන්නවා. මාධ්‍යයට ඕනෑ දේයි ඒ ගොල්ලන් බාගත කරගන්නේ. මාධ්‍යයට මාත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කාරණය සම්පූර්ණයෙන් විකෘති කරලා-

මේ video clip එක මෙතැන දමන්න බැහැ. ඒක ස්ථාවර නියෝගවලට පටහැනියි. ඒ video එකේ පැහැදිලිව ඒ අය කියනවා, මේ Auditor-General ගේ සටහනේ සිංහල එකයි, ඉංග්‍රීසි එකයි අතර පටලැවිල්ලක් තිබෙනවා කියලා. එහෙම කිව්වේ නැද්ද? එහෙම පටලැවිල්ලක් තිබෙනවා. ඒ නිසා මේ tweet කරපු දේ සම්පූර්ණ අසත්‍යයක් නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒක තමයි, විභාග කරන්න ඕනෑ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මම මේක සභාගත කරන්නම්. Auditor-Generalට යැවූ cost එකේ ඔක්කෝම සඳහන්ව තිබෙනවා. ඒකට ලක්ෂ 64ක් ගියා කියලා මේ තුළ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක තමයි දැන් අපට විභාග කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ. ඒක කරන්න කියලා තමයි ගරු විපක්ෂ නායකතුමා යෝජනා කළේ. අපි ඒක කරමු.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුවේ Twitter Account එක handle කරන්නේ කොහොමද කියන එක ගැන පාර්ලිමේන්තුවේ ඉහළ සාකච්ඡාවක් කිරීමේ ප්‍රශ්නයක් නැහැ. ඒක හරි. ඒ වාගේම පක්ෂ නායකයන්ගේ රැස්වීමට යටත්ව COPE එකේදී අපි තීරණය කර තිබෙනවා, සියලු contents එදා හවසම 7.30 ඉඳලා විකාශය කරන්න. ඒ අනුව ඒක ඒ ආකාරයෙන් කරනවා. Twitter Account එකක් පාර්ලිමේන්තුවට අවශ්‍ය ද, එය කළ යුත්තේ කොහොමද කියලා අපි තීරණය කරන්න ඕනෑ. මම විශ්වාස කරනවා, ගරු විපක්ෂ නායකතුමා කියපු විධියට tweet කරන්න බැහැ කියලා. Tweet එකක් කියන එකේ අදහසම, ඉතා ඉක්මනින් තොරතුර එළියට දමන එකයි. නමුත්, ඒ ගැන තීරණය කිරීම පාර්ලිමේන්තුවේ Committee on Parliamentary Business එකට අයිති එකක්. ඒ ගැන ඔබතුමන්ලා තීරණය කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කියපු කාරණය අනුව ඇත්තටම ඒ සාකච්ඡාවල කොටස් ගණනාවක් තිබෙනවා. මාධ්‍ය කපා ගන්නේ තමන් කැමැති කොටස. හැබැයි අපි ඉතාම මධ්‍යස්ථවයි ඒ සාකච්ඡාව අරගෙන යන්නේ කියන එක ඒ සාකච්ඡාවලට හිටපු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාත් දන්නවා. බොහොම ස්තුතියි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මමත් COPE එකේ සාමාජිකයෙක්. පෙරේදා ICTA එක සම්බන්ධව අපි විමර්ශනය කළේ, Google Loon Project එකක් ගැන නොවෙයි. COPE එකේ සභාපතිතුමා මා සමඟ එකඟ වේවි. මේ ආයතනය පෞද්ගලික අංශයේ ආයතනයක් වාගේ රජයේ නියාමනයට පටහැනිවයි run වෙන්නේ. එතකොට රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණවලට යටත් වෙලා මේ කටයුතු regularize කරන්නේ කොහොමද කියලායි අපි විමර්ශනය කළේ. ඇත්තටම මේ කියන කාරණය විනාඩි තුනක්වත් කථා කළේ නැහැ. හැබැයි, ඊයේ එක්තරා මාධ්‍ය ආයතනයක් ඒ ගොල්ලන්ගේ න්‍යාය පත්‍රයට අවශ්‍ය විධියට වෙනම ම කථාවක් විකාශය කරනවා මම බලාගෙන හිටියා. COPE සභාවේ අපේ අරමුණට අනුව විමර්ශනය කරපු එක නොවෙයි ඔවුන් විකාශය කළේ. ඒ ගොල්ලන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය අනුවයි එය කළේ. ඒකට හේතුව මොකක්ද? Rapid Antigen Test එකට විරුද්ධව ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා කථා කළ නිසා පළිගැනීමේ න්‍යාය පත්‍රය තමයි ඒ. මේකට හේතුව තමයි, ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේකට හේතුව තමයි, delayed transmissions යෑම.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සියලු දෙනාගේ භාරකරුවා ඔබතුමායි. මේ ප්‍රශ්නය හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි, අපි දැන් -

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
පොඩ්ඩක් ඉන්න කෝ. මම මේ විස්තරය ෆෝන් එකේ තියාගෙන කථා කරන්නේ. ඔබතුමාගෙන් ඇහුවා, මේ ප්‍රශ්නය ගැන. ඔබතුමා මේ ගැන සොයා බලා කියන්නම් කිව්වාට පස්සේ වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. එතුමාට සහ ඒ නිලධාරින්ට චෝදනා තිබෙනවා. ඔබතුමා ඉන්න වෙලාවේ මේ ගැන බලන්න. විපක්ෂයට ගහන ටික සහ ආණ්ඩුවට credit එක එන ටික පාර්ලිමේන්තුවේ logo එක පාවිච්චි කරමින් දේශපාලනය කරන තැනට වැටිලා තිබෙනවා. අපි කවදාවත් දැකලා නැහැ, ඉතිහාසයේ කිසිම කථානායකතුමෙකුගේ කාලයක මෙහෙම වෙනවා. ඒක නිසා ඔබතුමා කරුණාකරලා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කරුණ අපි සාකච්ඡා කරලා බලමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ලාංඡනය සහ පාර්ලිමේන්තු නාමයෙන් යන tweet එකේ වගකීම ඔබතුමාගේ සහ මහ ලේකම්තුමාගේ. කෝප් සභාව තුළ සිදුවුණු දෙයක් විකෘති කරලා, ඒ සංඛ්‍යා ලේඛන වැරදි ආකාරයට දාලා, පාර්ලිමේන්තු ලාංඡනය යටතේ tweet කරන කොට ඒ අපහාසය එන්නේ, අගෞරවය එන්නේ ඔබතුමාටයි; මහ ලේකම්තුමාටයි. වැරදි සංඛ්‍යා ලේඛන උපයෝගී කරගෙන පාර්ලිමේන්තු ලාංඡනය පාර්ලිමේන්තු නාමය සහිතව ඒ tweet කළේ කවුද කියලා අද දවස ඇතුළත මේ සභාවට හෙළි කරන්න ඕනෑ. ඒ tweet කරපු පණිවුඩය නිර්මාණය කරන්න උපදෙස් දුන්නේ කවුද කියලා අද දිනය තුළ මේ සභාවට හෙළි කරන්න ඕනෑ. ඒ බොරු පණිවුඩය, ඒ විකෘති කරපු සංඛ්‍යා ලේඛන නිර්මාණය කරන්නට හවුල් වුණේ කවුද? ඒ නම මෙතැනට reveal කරන්න ඕනෑ. හොඳට මතක තියා ගන්න. මේකට සම්බන්ධ පාර්ලිමේන්තුවේ නිලධාරින් කොට්ඨාසයක් ඉන්නවා. ඒ සියලුදෙනාට විරුද්ධව පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. කරුණාකරලා අද දවස තුළ ඒ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු මොහමඩ් මුසම්මිල් මහතා
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, අපි කලින් දිගින් දිගටම මේ කාරණය ප්‍රකාශ කළා. පාර්ලිමේන්තුවේ අවස්ථාව යොදාගෙන අපි දැක්කා සමහර මන්ත්‍රීවරු ඉතා පහත් විධියට නිලධාරින්ටත් ඒ වාගේම මන්ත්‍රීවරුන්ටත් අපහාස කරන ආකාරයේ කථා පවත්වනවා. ඒ අවස්ථාවේ අපි ප්‍රකාශ කළා, මේක යම්කිසි පාලනයකට නතු කරන්න ඕනෑ කියලා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. මේක අහගෙන ඉන්න කෝ. නමුත් ඒ වෙලාවේ ඔහේ බලාගෙන හිටියා. මහා ලොකුවට ඒ වෙලාවේ ඉල්ලීම කළේ මාධ්‍යයට අවස්ථාව දෙන්න කියලා. එතකොට මේ මාධ්‍යවල තමන්ට අවාසිදායක දෙයක් ගියාම මේ සභාවේ මර ලතෝනි දෙනවා

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, අපේ ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, -[බාධා කිරීම්] පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්නකෝ. ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "දෙරණ" නාළිකාව සහ අනික් නාළිකා තමන්ට කැමැති කෑල්ල තමයි කපාගෙන තිබෙන්නේ කියලා. එතකොට ඒ කපපු කෑල්ලම Parliament tweet එකේත් කැපුණේ කොහොමද? එතකොට Parliament tweet එකේත් ඒ news එකමයි, "දෙරණ" නාළිකාවේත් ඒ news එකමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි දැන් සොයන්න ඕනෑ.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මෙය හිතාමතා කරපු දෙයක්. මේක මේ වැරදිලා වෙච්ච දෙයක් නොවෙයි. මේක plan කරලා විකාශනය කරපු news එකක්.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, මෙතැන වැරැද්දක් වෙනවා. ඒ සාකච්ඡාවට ඉදිරිපත්ව තිබුණු දත්ත තමයි ඒ තිබෙන්නේ. ඒවා කවුරුවත් හදපු දත්ත නොවෙයි. සභාව ඇතුළේ ගිය සම්පූර්ණ සාකච්ඡාවයි, මාධ්‍යවල ගිය කථාවයි අතර වෙනසක් තිබෙන්න පුළුවන්. මා කියන්නේ නැහැ, කවුරුවත් පෞද්ගලිකව ඒ කොටස් කැපුවාය කියලා. මා කියන්නේ, ඕනෑම නාළිකාවක් ගන්නේ ඒ අය කැමැති කොටස කියලායි. ඒක තමයි මා කිව්වේ. ඒ වාගේම - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දැන් මේ ප්‍රශ්නය මෙතැනින් නතර කරමු. [බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, එතුමා කියපු එක මා පිළිගන්න කැමැතියි. හැබැයි, මා නැවත වතාවක් කියන්නේ, ගරු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගරු චරිත හේරත් මන්ත්‍රීතුමාගේ tweet එකයි, පාර්ලිමේන්තුවේ tweet එකයි, 'දෙරණ' නාළිකාවේ news එකයි, 'හිරු' නාළිකාවේ news එකයි ඔක්කොම එක සමාන වෙන්න බැහැ කියලායි. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ අය කමිටුවට කැඳවා සාධාරණ පරීක්ෂණයක් කරලා මේ ප්‍රශ්නය සාධාරණව විසඳන්න කියලායි. එතැනින් එහාට ඉල්ලීමක් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි දැන් කරන්නේ. [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, අපේ ගරු විපක්ෂ නායකතුමාත්, ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු පක්ෂ නායකතුමන්ලාත්, අපිත් මේ පිළිබඳව සාකච්ඡා කළාය කියලා. මේවා මාධ්‍යයට යන එක වැරැදියි කියලා ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මා පැහැදිලිව කිව්වා. පසුගිය අවුරුදු පහේත් මේ දෙයමයි සිද්ධ වුණේ. සජීව - live - දෙනවා වාගේ නොවෙයි. සමහර වෙලාවට මාධ්‍යයේ යන්නේ සම්පූර්ණයෙන් බොරු කතන්දර. මා කිව්වා, මේක කරන්න එපා කියලා. මා කිව්වා, COPE එකේ විස්තරත් දෙන්න එපා, අනික් කාරක සභාවේ විස්තරත් දෙන්න එපා කියලා. Party Leaders' Meeting එකේදී මා එහෙම කිව්වාද, නැද්ද? ඒකට ඔබතුමාත් සාක්ෂි. ඒ වෙලාවේ මට විරුද්ධවයි කථා කළේ. මා කිව්වා, "නිලධාරින් කැඳවා ඔවුන්ගෙන් ප්‍රශ්න කරනවා, නිලධාරින් අසරණ කරනවා. ඊට පස්සේ ඔවුන්ට මාධ්‍යයෙන් ගහනවා. මේක අපි නතර කරමු. ඇත්ත report එක විතරක් එළියට දමමු"යි කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැන් එහෙම කිව්වාද?

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
දැන් නොවෙයි මා කිව්වේ. එදා මා කිව්ව දෙයට තමුන්නාන්සේලා විරුද්ධවෙලා, තමුන්නාන්සේලාම කිව්වා, මේවා මාධ්‍යයට යන්න ඕනෑය කියලා. මම දන්නේ නැහැ මේක ඇත්ත ද, නැද්ද කියන එක. මම එතැන හිටියේත් නැහැ.

ගරු කථානායකතුමනි, දැන් හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ පැමිණිල්ලක් තිබෙනවා. එතකොට, මේ මාධ්‍ය යුනිට් එක කවුද හැදුවේ? කරු ජයසූරිය හිටපු කථානායකතුමා තමයි මේක හැදුවේ. අපට පහර දෙන්න තමයි ඒ කාලයේ මේක හැදුවේ. ඒක තමයි ඇත්ත කතන්දරය. ගරු කථානායකතුමනි, මේ ගැන ඔබතුමා පරීක්ෂණයක් කරන්න. හැබැයි, තවදුරටත් අද දවසේ කාලය නාස්ති කරන්නේ නැතිව අපි මේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයට යමු. අපි අද සවස 5 වෙද්දී මේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය අවසන් කරන්න ඕනෑ. අද ගරු අගමැතිතුමාත් කථා කරන්න ඉන්නවා. මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මමත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඉල්ලනවා. ඒ වාගේම කියන්න ඕනෑ, මාධ්‍ය ආයතන ඔවුන්ට ඕනෑ දේ තමයි දාන්නේ කියන එක. "සිරස" දාන්නේ සිරසට ඕනෑ දේ. ඔබතුමන්ලා කියපු "හිරු" සහ "දෙරණ" ස්වාධීන මාධ්‍ය ආයතන. "දෙරණ" මාධ්‍ය ආයතනයට විතරක් ගහන්න හදන්න එපා. ඇන්ටිජන් ගැනයි, අරවා, මේවා ගැන කිය කියා මේ කාරණය වෙන පැත්තකට හරවන්න එපා. මෙවැනි සිදුවීම් පසුගිය අවුරුදු පහේම අපි දැක්කා. ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන එක වඩා හොඳයි. පරීක්ෂණයක් කරන්න. අපිත් ඒකට එකඟයි. ඒක ගැන අපට ගැටලුවක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දැන් යන්නේ වෙන පැත්තක. කවුරු හොරකම් කළත් ඒක මාධ්‍යයෙන් දකින්න රටේ බදු ගෙවන ජනතාව ආසයි. ඒ නිසා හොරකම් කරන එක පිළිබඳව නොවෙයි බරපතළ ගැටලුව තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ logo එක පාවිච්චි කරලා පාර්ලිමේන්තු ඉතිහාසය වැරැදි විධියට දේශපාලනීකරණය කරපු, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය තමයි ගරු විපක්ෂ නායකතුමා මතු කළේ. ඒ ගැන තමයි දැන් විභාග කරන්න තිබෙන්නේ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ කාලයේ මේවා පෙනුණේ නැහැ.

ගරු කථානායකතුමනි, මම ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට මේ ගැනත් මතක් කරන්න ඕනෑ. මේවා ඔබතුමන්ලාට ඒ කාලයේ පෙනුණේ නැහැ. මේවාට අනුමැතිය දුන්නේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා තමයි එක එක යුනිට් හදලා අපට ගහන්න හැදුවේ. දැන් ගුටි කද්දී තමයි තමුන්නාන්සේලාට සාධාරණත්වය පෙනෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ logo එක, ඔබතුමාගේ ලාංඡනය උපයෝගී කරගෙන tweet කරපු එක ගැන තමයි අපි කථා කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි හොයන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතැනින් අපි අදහස් කරන්නේ නැහැ, පාර්ලිමේන්තුව තුළ තිබෙන coverage එක අහිමි විය යුතුයි කියලා. මොකද, අපි දැක්කා පසුගිය කාලය තුළ විශේෂයෙන්ම ඔක්තෝබර් 26වැනි දා ඉඳලා දින 52 සිද්ධියේදී මේ පාර්ලිමේන්තුව ඇතුළේ කවුද බයිබලය විසි කළේ; කවුද වතුර බෝතල් විසි කළේ; කවුද කථානායකතුමාට හානි කරන්න ආවේ; කවුද ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කළේ කියලා. ඒක රටේ ජනතාව දැක්කා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඊයේත් මේ ගැන කථා වුණාම මම උත්තර දෙන්න ගියේ නැහැ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා, බයිබලයෙන් පාර්ලිමේන්තුවේදී පහර දුන්නා කියලා. අද අපේ ගරු විපක්ෂ නායකතුමාත් ඒ කථාවම කියනවා. ගරු විපක්ෂ නායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ බයිබලයක් නැහැ. ඔබතුමන්ලා කතෝලික ආගමට අගෞරව කරන්න එපා. ඒ වැඩේ රනිල් වික්‍රමසිංහ මහත්මයාත් කළා. තමුන්නාන්සේලා කාදිනල් හිමිපාණන්ට අගෞරව කළා; බෞද්ධ ආගමට අගෞරව කළා. විපක්ෂ නායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ සභාවේ බයිබලයක් තිබෙනවා කියලා පුළුවන් නම් ඔප්පු කරන්න. අගෞරව කරන්න එපා. නිකම් පොතකට බයිබලය කියලා අගෞරව කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. මම ඉතා ගෞරවයෙන් තමුන්නාන්සේගෙන් ඒ ඉල්ලීම කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම මොහොතකටවත් ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගේ නම සඳහන් කළේ නැහැ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මම අහන්නේ, ඇයි නිකම් තොප්පිය දා ගන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට පටලැවෙන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, තොප්පි දා ගන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇති.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ කාරක සභාවල තොරතුරු වාර්තා කරනකොට, ඒවා edit කරලා වාර්තා කරන්න කියන්න. නැත්නම් අසාධාරණයක් වෙන්න පුළුවන්. එහෙම වෙන්න දෙන්න හොඳ නැහැ. [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කිව්වා, තොප්පිය හරි නම් දා ගන්න කියලා. මම කතෝලිකයෙක්. මම ඒක හය නැතුව හැම තැනම කියන දෙයක්. පාර්ලිමේන්තුව ඇතුළේ බයිබලයක් නැහැ. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි නිකම් පොතකට බයිබලය කියලා ඒ වැඩේ කළේ. කතෝලික ආගමට අගෞරව කරන්න එපා කියලා මා ඉල්ලනවා. අගෞරව කරන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

මම අදහස් ඉදිරිපත් කරනකොට මීට මොහොතකට කලිනුත් මගේ mike එක off කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, - [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මට කථා කරන්න - [බාධා කිරීම්] අද ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් දිනය. භාෂණයේ නිදහසට ඉඩ දෙන්න.

ගරු කථානායකතුමනි, මම කිසිම මොහොතක ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා මේ දේ කළා, අර දේ කළා කියලා සඳහන් කළේ නැහැ. එතුමා තොප්පිය දා ගන්න එක වෙනම කථාවක්. මම එතුමාගේ නම සඳහන් කළේ නැහැ.

ඊළඟ කාරණාව, මේ පාර්ලිමේන්තුව තුළ සිදු වන වාද විවාද මාධ්‍ය තුළින් ප්‍රචාරය වන එකේ කිසි වරදක් නැහැ කියලා ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාට මම කියන්න කැමැතියි. එය සිදු වෙන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තුව තුළ සිදු වන ක්‍රියාදාමය රටේ ජනතාව දැන ගන්නට ඕනෑ. එතකොට රටේ ජනතාවට පුළුවන්, ඒවා පිළිබඳව නිගමනවලට එළඹෙන්න. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ලාංඡනය, ඔබතුමාගේ ලාංඡනය උපයෝගී කරගෙන එක එක්කෙනා තම තමන්ගේ පෞද්ගලික මතිමතාන්තර tweet කරන එක වැරැදියි කියන එකයි මම සඳහන් කළේ. වෙන මොනවත් කිව්වේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අපි සොයන්න ඕනෑ. බොහොම ස්තුතියි, විපක්ෂ නායකතුමා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු විපක්ෂ නායකතුමනි, මේ මම කියන්නේ තොප්පියක් දා ගත්ත කථාවක් නොවෙයි. ඔබතුමා කිව්වා නේ, "දවස් 52 ආණ්ඩුව කාලයේ මේ පාර්ලිමේන්තුවේදී බයිබලයෙන් ගැහුවා" කියලා. ඔබතුමා කිව්වා. ඔබතුමා නොවෙයි, ඔබතුමන්ලාගේ හිටපු අගමැතිතුමා ඇතුළු මන්ත්‍රීවරු කීපදෙනෙක් මාධ්‍යයට ඇවිත් කිව්වා. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මගේ නම කිව්වේ නැහැ. නමුත්, එතුමාත් කිව්වා, "බයිබලයකින් ගැහුවා" කියලා. මම දන්නවා, මට තමයි කිව්වේ කියලා. මාධ්‍යයෙනුත් ගැහුවා. මීගමුව පැත්තේ බැනර් ගැහුවා. [බාධා කිරීම්] ඉන්න, මම කියනතෙක්. ඔබතුමා කිව්වා කියලා මම කිව්වේ නැහැ නේ. ඒ නිසා තොප්පිය දා ගන්න යන්න එපා. හැබැයි, දැන් ඔබතුමාත් නම නොකියා කිව්වා. මට තොප්පිය දාගන්න දෙයක් නැහැ. මා ඉලක්ක කරලා තමයි ඒ කිව්වේ. ඉස්සෙල්ලාම එය Facebook දාපු රෝසි සේනානායක මහත්මියට සුමාන දෙකක් යන්න කලින් වෙච්ච දේ අපි මාධ්‍යයෙන් දැක්කා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, නිකම් පොතකට බයිබලය කියලා කියන්න එපා කියලා. ඒකයි මම කියන්නේ. මේ ගරු සභාවේ බයිබලයක් තිබෙනවාද කියලා ගරු කථානායකතුමාගෙන් අහන්න; මහ ලේකම්තුමාගෙන් අහන්න. ඔබතුමන්ලා ඒ තත්ත්වයට වැටෙන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම කථා කරලා අවසන් වනතෙක් ඔබතුමා ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඒ නිසා මම තව දුරටත් කියනවා, මේ ගැන argue කරන්න දෙයක් නැහැ කියලා. ඔබතුමා දින 52 ආණ්ඩුව කාලයේ මේ සභාවේ තිබුණු බයිබලයක් ගැන කථා කළා. මේ ගරු සභාවේ බයිබලයක් තිබුණා නම් ඔප්පු කරන්න කියලා මා අභියෝග කළා. පාර්ලිමේන්තුවේ බයිබලයක් තිබෙනවාද, නැද්ද කියන්න කියලා මා කිව්වා. මේ ගරු සභාව තුළ බයිබලයක් නැහැ. ඒ නිසා අගෞරව කරන්න එපා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කරපු දේ තමුන්නාන්සේත් කරන්න යන්න එපා. අපිත් කියනවා, මාධ්‍යයට හැම දෙයක්ම යන්න ඕනෑ කියලා. මම කිව්වේ COPE එකේ යන ඒවා ගැන. පසුගිය කාලයේ නිලධාරීන් ගෙන්වලා පහර දෙනවා, අපහාස කරනවා, නින්දා කරනවා අපි දැක්කා. අපි කිව්වේ නිවැරදි වාර්තාව එළියට දමන්න කියලායි. ඒක ඉතාම සාධාරණ ඉල්ලීමක්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි අද ප්‍රශ්නය. අද ප්‍රශ්නය ඒකයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය මෙතැනින් නතර කරමු විපක්ෂ නායකතුමා. නැත්නම්, අද දවසේම මේ රණ්ඩුව යනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, මාධ්‍යයට මේ දේවල් යනවාට අපි විරුද්ධයි කියලා වැරදි මතයක් යවන්න හදයි. අපි එහෙම නැහැ. මම කිව්වේ COPE එකේ සහ COPA එකේ යන ඒවා හරියට බලලා නිවැරදි වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. ඒක බොහොම සාධාරණයි කියලා මම හිතනවා. ගරු කථානායකතුමනි, මෙය තවදුරටත් ඇද ගෙන යන්න එපා. ගරු විපක්ෂ නායකතුමාගෙනුත් මා ඉල්ලනවා, බාල තත්ත්වයට වැටෙන්න එපා කියලා. මොකද, ඔබතුමා අද විපක්ෂනායක. ඒ නිසා බොහොම සමබර ලෙස අපි වැඩකටයුතු කරගෙන යමු. තවත් කාලය නාස්ති කරන්න එපා. ගරු කථානායකතුමනි, මේ හොඳටම ඇති. අද අය වැය විවාදයේ අවසාන දවස. අද මේ පාර්ලිමේන්තුවේ පස්වරු 5.00ට අය වැය විවාදයේ වැඩකටයුතු අවසාන කළ යුතුව තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ වැඩකටයුතු කටයුතු ඉදිරියට කරගෙන යන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

චුවමනාවටත් වඩා කාලය බොහෝ නාස්ති කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, කියලා ඉවර කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හොඳයි, ගරු කථානායකතුමනි. කියලා ඉවර කරන්නම්.

ගරු කථානායකතුමනි, බාල වැඩද උසස් වැඩද කියන එක ඔප්පු වෙන්නේ ක්‍රියාවෙන්. ඒක ඒ ක්‍රියාවෙන් තමයි ඔප්පු කර ගන්න වෙන්නේ. ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා කිව්වා, අපි කතෝලික ප්‍රජාවට නිග්‍රහ කළා කියලා. ගරු කාදිනල්තුමාගෙන් අහන්න, අද වර්තමාන රජයද, විපක්ෂයේ අපිද කතෝලික ප්‍රජාවට නිග්‍රහ කරන්නේ කියලා. ඒක කාදිනල්තුමාගෙන්ම අහන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක මෙතැනට අදාළ වෙන්නේ නැහැ නේ.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භය, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1, 2 සහ 3 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 නොවැම්බර් 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව
அரசாங்க நிதி பற்றிய குழு
COMMITTEE ON PUBLIC FINANCE

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(1)හි විධිවිධානවල සහ 2020 සැප්තැම්බර් මස 08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙ හි කුමක් සඳහන්ව තිබුණ ද, 2020 දෙසැම්බර් මස 08 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් විසි එක් දෙනෙකුගෙන් (21) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2021 ජනවාරි 05 වැනි අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින ප්‍රධාන වැඩකටයුතු. විසර්ජන පනත් කෙටුම්පත - 2021, කාරක සභා අවස්ථාව.

විසර්ජන පනත් කෙටුම්පත, 2021
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2021
APPROPRIATION BILL, 2021

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: දෙසැම්බර් 09]
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 09]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered further in Committee.- [Progress: 09th December]
[HON. SPEAKER in the Chair.]

102 වන ශීර්ෂය.- මුදල් අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.1,652,840,000

தலைப்பு 102.- நிதி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,652,840,000

HEAD 102.- MINISTER OF FINANCE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,652,840,000

413 වන ශීර්ෂය.- මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.88,815,000

தலைப்பு 413.- நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 88,815,000

HEAD 413.- STATE MINISTER OF MONEY AND CAPITAL MARKET AND STATE ENTERPRISE REFORMS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 88,815,000

414 වන ශීර්ෂය.- සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.514,100,000

தலைப்பு 414. - சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில் மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 514,100,000

HEAD 414.- STATE MINISTER OF SAMURDHI HOUSEHOLD ECONOMY, MICRO-FINANCE, SELF-EMPLOYMENT AND BUSINESS DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 514,100,000

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මුදල් අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 102, 237 සිට 240 දක්වා, වැය ශීර්ෂ අංක 242 සිට 252 දක්වා, වැය ශීර්ෂ අංක 296, 297, 323, 324, 329 සහ 333. මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 413, 241 සහ 280. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 414 සහ 331.

සලකා බැලීම, පූර්ව භාග 10.00 සිට 12.30 දක්වා සහ අපර භාග 1.00 සිට 5.00 දක්වා. කපා හැරීමේ යෝජනාව, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා.

[පූ.භා. 10.52]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටට පත් වෙනවා.

ගරු සභාපතිතුමනි, "2021 විසර්ජන පනත් කෙටුම්පත කාරක සභා අවස්ථාවේ අද දින විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 102, 237, 238, 239, 240, 242 සිට 252 දක්වා, 296, 297, 323, 324, 329, 333, 413, 241, 280, 414 සහ 331 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනෙන් සියලු පුනරාවර්ථන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, මට ලැබී තිබෙන කෙටි කාලය තුළ ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කර තිබෙන විකල්ප චින්තනය හරහා ඒ ආර්ථික න්‍යායෙන්, එතුමන්ලා යන ගමනෙන් අපේ රටේ පුරවැසියන්ට සෙතක් වෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. මොකද, සියලු ආදායම් එකතු කර ගන්නේ, සියලු වියදම් තීරණය වන්නේ මේ අලුත් චින්තනය හරහා. ඒකට තමයි එතුමන්ලා කියන්නේ,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

"සෞභාග්‍යයේ දැක්ම" කියලා. එතකොට මොකක්ද මේ ආර්ථික න්‍යාය? ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශය හරහා මුළු ආර්ථිකයම මෙහෙයවනකොට මොකක් හෝ ප්‍රතිපත්තියක් මත එය පදනම් වෙන්න එපා යැ. ජනාධිපතිතුමාට 69 ලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නේ system change එකක් කරන්නයි. මේ වෙනස මොකක්ද? ගරු සභාපතිතුමනි, විවේචනයකට වඩා, මට අවශ්‍ය වෙන්නේ මේ වෙනස පිළිබඳව තාර්කිකව අදහස් දක්වන්නයි; මම කලින් කිව්වා වාගේ, ජනතාවට සෙතක් වෙන්නේ කොහොමද කියන එක ගැන කථා කරන්නයි.

ගරු සභාපතිතුමනි, ඊට කලින්, මට කාරණා දෙකක් පැහැදිලි කරන්න තිබෙනවා. පසුගිය නොවැම්බර් 18වන දා අය වැය විවාදය පටන් ගන්නකොට මම මේ ගරු සභාවට කිව්වා, ඉලක්කම් විජ්ජාවක් සිද්ධ වෙලා තිබෙනවා කියලා. එි යටතේ පළමු කාරණය තමයි, දළ දේශීය නිෂ්පාදනය ධන මූර්ත අගයක් ගන්නේ කොහොමද කියන එක. මේ වනවිට අපට මුදල් අමාත්‍යාංශයෙන් ලැබී තිබෙන වාර්තාවලට අනුව ඔප්පු වෙනවා, කිසි විධියකටත් එදා ගරු අගමැතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ඉදිරිපත් කළ ඉලක්කම් සත්‍ය නොවන බව. ඒ නිසා අද විවාදය අවසන් වෙන්න කලින් ඒ කාරණා නිවැරදි කරන මෙන් අපි ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණාව තමයි, අය වැය පරතරය. 2020ට වියදම් කළ මුදල් 2019ට එකතු කරලා, 2019 අය වැය පරතරය තිබුණාට වඩා විශාල කරලා, 2020 අය වැය පරතරය තිබුණාට වඩා කුඩා කරලා පෙන්වා තිබෙනවා. විගණකාධිපතිතුමා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඔවුන්ගේ නිගමනය එවා තිබෙනවා; නිරීක්ෂණ එවා තිබෙනවා. ඒ අනුව මුදල් අමාත්‍යාංශය පිළිගෙන තිබෙනවා, ඒ කරන්න හදලා තිබෙන්නේ වැරදි ක්‍රියාවක් බව. ඔවුන් ඒක ඉදිරියට අරගෙන යන්නේ නැහැ කියලා කියා තිබෙනවා. ඒ නිසා අද විවාදය අවසන් වෙන්න කලින් 2019 අය වැය පරතරය කීයද, 2020 අය වැය පරතරය කීයද කියන එක මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කියලා මම නැවතත් කාරුණිකව ඉල්ලනවා.

'විකල්ප ආර්ථික ප්‍රතිපත්තියක්' කියන කාරණය පිළිබඳව අපි දැන් නැවතත් අවධානය යොමු කරමු. 2021 අය වැය කථාවත්, ආර්ථිකය හසුරුවන රජයේ ප්‍රධානින් කළ කථා පිළිබඳවත් මම අධ්‍යයනයක් කළා. මොන වාගේ ප්‍රතිපත්තිද තිබෙන්නේ, අදහස් මොනවාද, මුදල් කොහොමද වෙන් කර තිබෙන්නේ කියලා මම ඒ කරුණු සියල්ල සංසන්දනය කළා. එහෙම කළාම තමයි මේ චිත්‍රය පැහැදිලි වෙන්නේ. මොකද, අය වැය කථාවෙන් විතරක් අපට මුළු චිත්‍රයම පෙනෙන්නේ නැහැ.

අපි කවුරුත් ගරු කරන, මහ බැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මැතිතුමා ගිය සතියේ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ආර්ථික සමුළුවේදී කළ කථාව ඉතාම වැදගත්. එදා ජනාධිපතිතුමාත් කථා කළා; අගමැතිතුමාත් කථා කළා; අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා ඇතුළු රටේ ආර්ථිකය හසුරුවන සියලුදෙනා තමන්ගේ අදහස් ඉදිරිපත් කළා. එතුමාගේ පැහැදිලි කිරීම හරහා, මේ විකල්ප ආර්ථික න්‍යාය මොකක්ද කියන එක යම් විධියකට තේරුම් ගන්න පුළුවන්. මම ඒක පැහැදිලි කරන්න කැමැතියි. එතුමා මෙසේ කියනවා, I quote:

> ".that a government elected to power on an 'alternative policy platform' ".

ඒ සම්පූර්ණ කථාව publish කර තිබෙනවා. මම ඒක කියවන්නම්:

> "The policy framework highlighted in the Budget statement points towards several novel alternative features. Domestic 'production economy' has taken the centre stage."
>
> Domestic production activities are promoted, with directed attention paid to selected economic sectors, with a clear focus on export as well as domestic markets".

ඊට පස්සේ කියනවා, සාම්ප්‍රදායිකව හිතන අයට මේක තේරෙන්නේ නැහැ; තේරුම් ගන්න ඔවුන් උත්සාහ කරන්නේත් නැහැ කියලා. මම කියන්නම්:

> "We are not surprised that most international organizations, rating agencies, as well as certain domestic quarters, which are so used to certain traditional ways of thinking, remain sceptical about these alternative policy stances without making the effort to understand the new framework..".

You see, there is a theoretical conflict here. හරිද? එතකොට, මේ අය කියන්නේ සාමාන්‍ය මිනිසුන්ට අපේ චින්තනය, අපේ න්‍යාය තේරෙන්නේ නැහැ කියලා. ඊයේ Citibank එකෙන් ඉදිරිපත් කර තිබෙන "Sri Lanka Economics and Strategy View" කියන වාර්තාව සභාගත කරන්න මම බලාපොරොත්තු වනවා. මේ පළමුවැනි වාර්තාව නොවෙයි. ලෝකයේ තිබෙන ප්‍රධාන ආයතන මෙවැනි වාර්තා කිහිපයක්ම ඉදිරිපත් කළා. ශ්‍රේණිගත කිරීමේ ආයතන සියල්ලම අප පහළට දැම්මා. ඊයේ ඉදිරිපත් කළ වාර්තාවේ "Denial is not a Strategy - Assessing Debt Restructuring Scenarios" යටතේ මොකක්ද කියන්නේ? I quote:

> "Sri Lanka's debt is on an unsustainable path, but the government appears to be in denial".

මොකක්ද මේ කියන්නේ? ඔවුන් කියනවා, ආණ්ඩුව මේ ඇත්ත තත්ත්වය තේරුම් ගන්නේ නැතිව, - [බාධා කිරීමක්] ඒ අය කියනවා, “ප්‍රශ්නයක් නැහැ” කියලා. ඊට පස්සේ ඔවුන් කියනවා, “ඔය ගොල්ලන්ට තේරෙන්නේ නැහැ අපි කියන දේ, අපට තිබෙන්නේ විකල්ප න්‍යායක්” කියලා. ඒ නිසා මෙසේ කියනවා:

> "But we do not see a credible strategy from the goverment to achieve sustained debt repayment capacity despite their verbal 'willingness'."

මෙය වැදගත්. අපේ අජිත් කබ්රාල් මැතිතුමාටත් ඇහෙන්න මේක කියන්න ඕනෑ. ඒ ගොල්ලන් තවදුරටත් මෙසේ කියනවා:

> “We see government actions to date as acting more as though they are in a liquidity and not a solvency crisis, and have the same flexibility to pursue MMT as developed economies…”

මේ MMT කියන වචනය වැදගත්. මේක සාමාන්‍යයෙන් අපි අහලා තිබෙන වචනයක් නොවෙයි. ඉදිරියේදී මම ඒක පැහැදිලි කරන්නම්. එම ලේඛනයත් මම **සභාගත*** කරනවා, ගරු සභාපතිතුමනි.

අපි මේ සභාව ඇතුළේ ඉඳගෙන මේ රටේ විකල්ප න්‍යායක් ගැන කථා කරනවා. ඊයේ, ද්විතීයික වෙළෙඳ පොළේ අපේ බැඳුම්කරවල මිල ඉහළ ගිහින් තිබෙනවා. සියයට 27යි, 2021.07.27 දිනට කල් පිරෙන බැඳුම්කරය. ඒ වාගේ, අනෙක් ඒවාත් ඉහළ අගයක් ගෙන තිබෙනවා. ඒ විස්තර ඇතුළත් ලේඛනයත් මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙතැන න්‍යායාත්මක ගැටලුවක් තිබෙනවා. සාමාන්‍යයෙන්, "traditional" කියන අය විශ්වාස කරන දෙය සහ "alternative" කියන අය විශ්වාස කරන දෙය අතර ගැටුමක් තිබෙනවා. ඒ ගැටුම නිර්මාණය වෙලා තිබෙන නිසා තමයි ලංකාවේ ආර්ථික වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න පුළුවන්ද, බැරිද කියන එක පිළිබඳ සෘණාත්මක අදහස් මතු වෙන්නේ.

මොකක්ද මේ කියන්නේ? මේ ගොල්ලන් කියනවා, "කොවිඩ් වසංගතය නිසා අලුතින් හිතන්න වෙලා තිබෙනවා. අපි කවුරුත් එය පිළිගන්නවා. අපට එදා සිට අවශ්‍ය වුණේ, ආනයන සීමා කරලා රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්නයි" කියලා. මේ නිෂ්පාදන ආර්ථිකය ඇති කරන්න 2019 වර්ෂයේ නව රජය පටන් ගත්තා කියලා කියනවා. ගරු සභාපතිතුමනි, මේක දේශපාලන වශයෙන් සුන්දර කථාවක්. අපේ රටේ හදන්න පුළුවන් භාණ්ඩ පිටරටින් ගෙනෙන්න ඕනෑ නැහැ නේ. අපි අපේ රට වටේටම බදු තාප්පයක් බැඳලා දේශීය නිෂ්පාදනයට ඒ අවස්ථාව ලබා දෙමු. ඒ කියන්නේ, විශේෂීකරණය හා ජාත්‍යන්තර වෙළෙඳාම - specialization and international trade - වෙනුවට අපි අර ආනයන බදු සීමා තුළ මේ නිෂ්පාදනය කරමු කියන එක. මේ අදහස රජයට එන්න කලින් දිගින් දිගටම මොවුන්ගෙන් ඉදිරිපත් වුණා. එදා අපේ රජයේ ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් තිබුණු ඒ වැඩ පිළවෙළට ඔවුන් විරුද්ධ වුණා. GSP Plus පවා අවශ්‍ය නැහැ කිව්වා. එදා, සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම අහෝසි කරන්න GMOA එක්ක සම්බන්ධ වුණු වේලාවේ ලක්ෂ්මන් මැතිතුමා කිව්වා, මෙය රටට අතිශයින් අවාසියි කියලා. ඔහුගේ වාර්තාවෙන් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබුණා. මම ඒ වාර්තාවත් **සභාගත*** කරනවා.

මම එහි තිබෙන කරුණු කිහිපයක් කියවන්නම්:

"The draft Trade Policy appears to be over-whelmed by the desire to augment export earnings, in which the positive role that import substitution could play has not been given its due place. While appreciating the limitations imposed by the market size of the local economy, complete neglect of the potential developmental impetus of import substitution is deplorable."

"Therefore, SLAPE opines that any national trade policy without an adequate emphasis of import substitution possibilities would not be pragmatic or sustainable."

"Sri Lanka has been more or less following free market economic policies ever since 1977."

"It is the position of SLAPE that free-market prescription itself was a cause for present economic ills of our nation. Further increased dosages of the same medicine could yield catastrophic outcomes."

මේ ගමන්මඟ වෙනස් කරන්න යන ක්‍රියාව දැන් අපට පැහැදිලියි.

හැබැයි, මේ ගැන අලුතින් කියන්න අවශ්‍යතාවක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේ ඉන්න කවුරුවත් එදා 1970දී සිටියා කියලා මම හිතන්නේ නැහැ. United Front Government එකේ පළමුවැනි අය වැය ලේඛනය. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා මුදල් ඇමති හැටියට මෙසේ සඳහන් කරනවා:

"-the people of this country endorsed the programme of the United Front placed before them -"

එතුමාගේ කථාව අතරතුර එතුමා මෙසේද සඳහන් කරනවා.

"The reorganization of the existing industrial set up in Ceylon is based on the premise that the State should adopt a socialist oriented approach both to the development and regulation of industry. In more precise terms, this would mean that heavy, basic and essential industry shall be under State management, if not under direct State-ownership."

මේ කථාව එතුමා දිගටම කරගෙන යනවා. ඉතාම සුන්දරයි, ගරු සභාපතිතුමනි. තුන්හතර වතාවක් මෙය කියවන්න පුළුවන්. එදා අපි කවුරුත් දන්නවා, there were large-scale import restrictions and foreign exchange restrictions. So, in terms of import tariffs, this is what he says, I quote:

"The need to nationalize and simplify the tariff has therefore become an urgent one."

"The proposed tariff provides free or nominal rates of duty for basic consumer items that enter into the cost of living and for basic industrial raw materials as well as most important items of machinery for agriculture and industry. Above these rate bands would be fixed the 'standard' rate of 60 per cent."

එතකොට මේ උත්සාහ කරන්නේ මොකටද? මේ උත්සාහ කරන්නේ industriesවලට, කාර්මීකකරණය සඳහා රේගු බදු අඩු කරලා luxury items කියන ඒවායේ රේගු බදු වැඩි කරලා ඒ වැඩ පිළිවෙළ අරගෙන යන්නයි. එදා නිෂ්පාදන ආර්ථිකය සමාජවාදී දේශපාලන ව්‍යුහයකින් දැක්කේ. මේ ආණ්ඩුවේ සමාජවාදය ගැන අපට කථා කරන්න හැකියාවක් නැහැ. නමුත් 1977 වෙනකොට ඒ ප්‍රතිපත්තිය රටට ඉතා අහිතකර බව පෙනුණා. රොනි ද මැල් මැතිතුමා 1977 නොවැම්බර් මාසයේ 15වැනි දින අනෙක් සභා ගැබේ කරපු කථාව මම කියෙව්වා. එදා ඔබතුමන්ලා හිටියා. එදා දමපු සම්බාධක නිසා දේශීය නිෂ්පාදනයක් කරන්න ඕනෑ කියලා හිතේ තියාගෙන රට වටේට බදු තාප්ප බැඳලා වෙච්ච දෙයින් ජනතාවට වුණේ මොකක්ද කියන එක පිළිබඳව එතුමා ඉතාම අගනා ලෙස සඳහන් කරනවා. මට වේලාව නැති නිසා මම ඒක කියවන්නේ නැහැ. හැබැයි, එතුමා එදා ඉදිරිපත් කළේ ආනයන ආදේශන වෙනුවට අපනයනයට නැඹුරු වුණු වැඩ පිළිවෙළක්. අපි කොයි වේලාවේත් එක එක දේවල් කියනවා වෙනුවට පොඩ්ඩක් ගැඹුරින් සාකච්ඡා කරලා සොයලා බලන්න ඕනෑ, ලෝකයේ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මම මේ විද්වත් ලිපිය **සභාගත*** කරන්න කැමැතියි.

මෙය පළවෙන්නේ 2020 නොවැම්බර් මාසයේ "World Development" කියන පිළිගත් විද්වත් සඟරාවේ. මෙහි තිබෙන්නේ ආනයන ආදේශන - import substitution - කර්මාන්ත ගැනයි. මෙහි නම "The rise and fall of import substitution". මෙය ලියලා තිබෙන්නේ Douglas A. Irwin. He states, I quote:

"Broadly speaking, advocates of import substitution argued that developing countries should discourage imports of manufactured goods in order to promote domestic industries and reduce their dependence on foreign trade. By the mid-1960s, as a result of the policies and outcomes observed in countries pursuing a policy of import substitution, skepticism about the idea grew and its support faded."

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මේ සම්බන්ධව මෙහෙම දිගට කථාවක් තිබෙනවා. එදා මේ සම්බන්ධයෙන් කථා කරපු Raúl Prebisch, Gunnar Myrdal, W. Arthur Lewis, Albert Hirschman, Ragnar Nurkse කියන පුද්ගලයන් මේ විවාදයට සම්බන්ධ වෙලා ලතින් ඇමෙරිකාවේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ගිහින් ඔවුන් වැටුණු අගාධය පිළිබඳ දත්ත පෙන්නුවේ කොහොමද? එක තැනක මෙන්න මෙහෙම තිබෙනවා:

> "Import substitution in watertight compartments," as he put it, would diminish competition and prevent firms from achieving scale economies. Therefore, Prebisch proposed that this type of import substitution be pursued not within national markets but within a larger Latin American common market. 'Without a common market, there will be a tendency by each country to try to produce everything .... under the sheltering wing of high protection .... without the benefit of specialization and economies of scale. Even so, this regional trade bloc should not be autarkic: "

මේ කියන්න උත්සාහ කරන්නේ මොකක්ද? දකුණු ඇමෙරිකාවේ ලොකු රටවලට පවා බැරි වුණා කියනවා ඒ වැඩ පිළිවෙළ හරහා දියුණු වෙන්න. ඔවුන් කිව්වා, "හැම රටේම හැම දේම නිෂ්පාදනය කරන්නට උත්සාහ ගත්තොත් අවසානයේදී කිසි දෙයක් හරියට කර ගන්නට බැරි වෙනවා" කියලා. ඒ නිසා තමයි මම ඒ ගැන මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්නේ. ලතින් ඇමෙරිකාවේ ලොකු රටවලටත් බැරි වුණා නම්, ඉන්දියාවටත් බැරි වුණා නම් ලංකාව වාගේ කුඩා රටකට මේ විකල්ප ප්‍රතිපත්තියට මුහුණ දෙන්නට බැහැ. මේ විකල්ප ප්‍රතිපත්තියෙන් වෙන්නේ 1970 ආචාර්ය එන්.එම්. පෙරේරාගේ යෝජනාවලටත්, 1977 අයටත් වෙච්ච වැඩේම තමයි. දේශපාලනයට වඩා එය රටේ මිනිසුන්ට බලපෑ ආකාරය තමයි අපි කල්පනා කරන්නට ඕනෑ. Previously, I referred to the speech that was made by the Governor at the Sri Lanka Economic Summit. Again, I will read the relevant section now.

> "COVID-19 has made us gain first-hand experience about the gravity of what Ian Goldin and Mike Mariathasan call the butterfly defect of globalization in their recent book titled 'The Butterfly Defect: How Globalization Creates Systemic Risks', showing how a virus, having gained pandemic proportions, could keep on crippling economies across the world for over a year.
>
> This butterfly defect has paved the way for us to engage in introspection about our economy and economic policy."

මේ අදහස ගැන අපි ගැඹුරින් කතා කරමු. "Butterfly defect" is a play on butterfly effect, හැබැයි, මෙතැන කියන්නේ කුඩා තැනකින් මොකක් හෝ දෙයක් පටන් ගත්තා නම් ඒක spread වෙන්න පුළුවන් කියලා. අද වයිරස් එක airportsවලින් spread වෙනවා, වයිරස් එක computersවලින් spread වෙනවා යනාදි වශයෙන්. චීනයේ වූහාන්වලින් පටන් ගත්ත වයිරස් එක මුළු ලෝකයටම පැතිරිලා ගිහින් තිබෙනවා. ඒ අදහස තමයි මෙකෙන් කියන්නේ. මේ කියන්න අදහස් කරන්නේ අපි ලෝකයත් එක්ක තිබෙන සම්බන්ධතාව ගැන සෘණාත්මකව දකිනවා කියන එකයි. ඒ නිසා තමයි ඔහු කියන්නේත්, ඔබලා කියන්නේත් ගෘහ කර්මාන්ත, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත වාගේම විශාල ප්‍රමාණයේ වාහන සහ නැව් සියලු දේ මේ රටේ නිෂ්පාදනය කරන්නට අපට පුළුවන් කියලායි. එහෙම වුණොත් දියුණු රටකට, economic success story එකක් ලබා ගන්න පුළුවන් කියලායි.

පසු ගිය මාසයේ Ian Goldin කියන මම කලින් කියපු පුද්ගලයා, ඔහුගේම පොත ගැන ඔහු ඉදිරිපත් කරලා තිබෙන වචන කිහිපයක් මම කියන්නම්.

> "My book 'The Butterfly Defect' shows why globalization created systemic risks."

That is correct. ඒක තමයි මම කිව්වේ.

> "It also shows why stopping globalization will not stop global threats but rather will amplify them."

එහෙම දිගට කියාගෙන ගිහිල්ලා මෙහෙම කියනවා:

> "But high walls undermines the potential for cooperation required to manage our shared risks. Protectionism reduces investment, trade, tourism and technological advances, which create jobs and higher incomes, reducing the capacity of countries to build resilience. The solution is in working together to make globalization safe and sustainable, not in working against each other."

එතකොට මේ පොත ලියපු පුද්ගලයාම, ඔහු මොකක්ද කිව්වේ කියන එක පිළිබඳව ඔහුගේ අදහස මෙසේ ඉදිරිපත් කරලා තිබෙනවා. One must consider the evidence before plunging in. Publicly, there is so much evidence available. එතකොට සියලු සාක්ෂි අභිභවා, යථාර්ථයට පිටුපාලා මුදල් අමාත්‍යාංශය සහ අදාළ ආයතන එකතුවෙලා ආර්ථිකය වැරදි දිශානතියකට යොමු කරන්නට හදනවාද? මේ ක්‍රියාවලියට මුදල් අවශ්‍ය වෙනවා නේ. මේ කරන්න යන වැඩේ තිබෙනවා නේ තාප්ප ගහලා, butterfly defect එක ගැන කථා කරලා, ISI ගැන කථා කරලා, Prebisch ගැන කථා කරලා, Hirschman ගැන කථා කරලා. හැබැයි, මේවා කරන්න මුදල් කෝ? රාජ්‍ය අනුග්‍රහය තිබෙන නිසා රාජ්‍ය සංස්ථාවලටත්, පෞද්ගලික අංශයටත් මේවාට එකතුවෙන්න පුළුවන් කියලා අපි දකිනවා. රාජ්‍ය සංස්ථා අලුතින් හදනවා. ගරු විමල් වීරවංශ ඇමතිතුමා කිව්වා කඩදාසි කම්හල නැවත විවෘත කරනවා කියලා. ඒවාට මුදල් යොදවනවා. හැබැයි, මහ විශාල අය වැය පරතරයක් තිබෙනවා.

ඒ මහා විශාල අය වැය පරතරය තියෙන නිසා අපි කොහොමද මේ මුදල් යොදවන්නේ? අපි කවුරුත් දන්නවා, මෙවර ණය වාරිකයයි, පොලියයි ගෙවන්න අපට ලැබෙන ආදායම මදි කියන කාරණය. එහෙම නම් අපට තව ණය ගන්න වෙනවා. අනෙක් පැත්තෙන් කියනවා, අපි ණය ලබාගෙන ව්‍යාපෘති කරන්නේ නැහැ කියලා. අපි දැක්කා, කැබිනට් මණ්ඩලයේ spokesperson කියනවා, ජනාධිපතිතුමාත් -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You have only two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Can I have five minutes extra, Sir?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Do not ask for extensions, please.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නමුත් විකල්ප න්‍යාය නොදන්න අය මේක නිකම් ප්‍රශ්නයක් කරගෙන අපට budget deficit එකක් තියෙන නිසා මුදල් හොයා ගන්න බැහැ කියලා කියනවා. මම කලින් කියෙව්වා නේ, අද

ඉදිරිපත් කරපු Citibank එකේ වාර්තාවේ තිබෙන 'MMT' කියලා වචනයක් ගැන. මම එතැනට එන්නම්. මේ විකල්ප න්‍යායයෙහි ප්‍රශ්නයක් නැහැ. ඇමෙරිකානු ඩොලර් ණය තමයි එහි තිබෙන ප්‍රශ්නය. අපට ඇමෙරිකානු ඩොලර් ණය වෙනුවට රුපියල් ණය තියෙනවා නම් මේ ප්‍රශ්නයට විසඳුමක් තිබෙනවා. අපි කවුරුත් ගරු කරන හිටපු මහ බැංකු අධිපතිතුමා කියනවා, "There is no need for so-called debt restructuring and debt reprofiling" කියලා. මම දැක්කා, අපේ ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා දිගටම කියනවා, "කලබල වෙන්න දෙයක් නැහැ. අපි මේවා ගෙවනවා. අපට ප්‍රශ්නයක් නැහැ. එම නිසා IMF එකට කථා කරන්න ඕනෑ නැහැ" කියලා. එහෙම නම් මේ මහා විශාල ණය අර්බුදයෙන් එළියට එන්න තියෙන වැඩ පිළිවෙළ මොකක්ද?

මම තව දෙයක් කියන්න කැමැතියි. Fitch Ratings වාර්තාව කියවලා, සජිත් ප්‍රේමදාස විරුද්ධ පාර්ශ්ව නායකතුමාගේ ප්‍රශ්නයට අපේ ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා කියනවා, "The Government's strategy in foreign debt management is to avoid total rolling over of the upcoming maturities" කියලා. ඒ කියන්නේ අවම වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 34ක් විතර තිබෙනවා. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 14ක් විතර ISB තිබෙනවා; ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක් විතර SLDB තිබෙනවා. Restructuring වාගේ ඒවා වැඩක් නැහැ කියලා කියනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක්, 18ක් විතර ගෙවන්න එතුමන්ලා සූදානම් වෙලා ඉන්න බව. දැන් ප්‍රශ්නය තියෙන්නේ -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, please wind up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I got five minutes. Please give me the five minutes.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
From where did you got the five minutes? Then, some other Member will be handicapped.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, please give me two more minutes.

එතකොට Treasury එකෙන් ඇහෙන කථාව තමයි "MMT" කියන්නේ අපට මුදල් අච්චු ගහන්න පුළුවන් කියන එක. මම ඒක පැහැදිලි කරන්නම්. ඒකට එතුමන්ලා කියනවා, "Modern Monetary Theory" කියලා. හැබැයි Modern Monetary Theory කියන එකෙන් කියන්නේ, like I said, that it is a liquidity issue, not a solvency issue කියන එක හිතේ තියාගෙන මහ බැංකුවෙන් ඕනෑ තරම් මුදල් අච්චු ගහලා මේ සියලුදේට මුදල් වියදම් කරන්න අපට පුළුවන් කියන එකයි. මේක අපභ්‍රංශ න්‍යායක්. මේ ළඟදී අප කවුරුත් දන්න ඉන්දියාවේ හිටපු මහ බැංකු අධිපති රගුරාම් රාජන් මේ පිළිබඳව සාකච්ඡා කරනකොට මෙන්න මෙහෙම කථාවක් කියනවා: "...MMT has become the go-to idea for politicians advocating Government spending to alleviate every problem". "After all the Central Bank can simply print money to pay off ...debt." "......Public spending, however, must be sensible, not based on magical monetary theory".

මම නම් කියන්නේ "MMT" කියන එක ඔබතුමන්ලා අර්ථ කථනය කරන්නේ "Magic Money Tree" කියලා බවයි. එහෙම "Magic Money Tree" එකක් මේ රටේ නැහැ. අපි ඒවා ගැන හොයලා තියෙනවා. මේවා කියෙව්වොත් ඕනෑ කෙනෙකුට පෙනෙනවා, මුදල් මැව්මේ කර්තව්‍ය දේශපාලනඥයාට දුන්නොත් - we call it Fiscal Dominance of Monetary Policy - ආණ්ඩුව ඕනෑ ඕනෑ විධියට අවශ්‍යතා සඳහා වියදම් කරන්න මහ බැංකුව හරහා මුදල් අච්චු ගහන්න උත්සාහ කළොත් ඒකෙන් වෙන්නේ උද්ධමනය වැඩි වෙලා, රුපියලේ අගය කඩාගෙන වැටිලා, මේ ඉන්න වළෙන් තවත් පහළට වැටෙන එක බව.

I know that I am running out of time. ගරු ඇමතිතුමනි, මට ලැබී තිබෙන ඉතා කෙටි කාලයෙන් මම කියන්න උත්සාහ කළේ ඔබතුමන්ලාගේ මේ විකල්ප චින්තනය, මේ විකල්ප ආර්ථික න්‍යාය ඇත්තවශයෙන්ම මේ ලෝකයේ කොහේවත් සාර්ථක වෙලා නැහැ කියන එකයි. ඒ පිළිබඳව විද්වත් ලිපි ඕනෑතරම් තිබෙනවා. එම නිසා මම කියන්නේ මෙපමණයි. මේ රටේ, ජනතාවගේ උන්නතිය සඳහා තමයි ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මේ මුදල් හැම දේකටම වෙන් කරන්නේ. එම නිසා traditional economic thinking එකට හිනහ වෙන්න එපා. අපට අවශ්‍ය වෙන්නේ මේ රට වටේට තාප්ප නොවෙයි, පාලම් කියන එක මතක තියාගන්න. එහෙම කළොත් විතරයි මේ රට දියුණු කරන්න පුළුවන්. බොහොම ස්තුතියි.

[අ.භා. 11.20]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Deputy Speaker and Chairman of Committees)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනෙන අද දවස ඉතාම වැදගත් දවසක්. ඉතාම සරලව කථා කළොත්, විසර්ජන පනත් කෙටුම්පත තුළින් අපි ඉදිරිපත් කරන්නේ, ඉදිරි වර්ෂය සඳහා රජයේ අය සහ වැය යෝජනා මෙන්ම අඩු පාඩු සපුරා ගන්නේ කෙසේද කියන කාරණායි.

මම කැමැතියි, ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා 1970 කරපු ප්‍රකාශයක් ගැන කථා කරන්න. එතුමා ගැන කථා කරන්න අපට වැඩි අයිතියක් තිබෙනවා. මොකද, එතුමා නිර්මාණය කරපු ලංකා සමසමාජ පක්ෂය දැනටත් ආණ්ඩුවත් එක්ක ඉන්න ප්‍රගතිශීලි පක්ෂයක් වන නිසා.

1971 කැරැල්ලෙන් පස්සේ රට යම්කිසි අභියෝගයකට මුහුණ දීලා තිබෙන අවස්ථාවක 1972 අය වැය කථාවේදී ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා මෙසේ කියා තිබෙනවා.

"මා සූදානම් වෙන්නේ ඉදිරි වසර සඳහා රජයේ ආදායම උපයා ගැනීමට බලාපොරොත්තු වන ආකාරයත්, ඒවා වියදම් කිරීමට බලාපොරොත්තු වන ආකාරයත්, හිඟය පියවා ගැනීමට බලාපොරොත්තු වන ආකාරයත් මේ ගරු සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීමටයි. රජයේ වියදම් උපකල්පන ආරක්ෂක, සුබසාධන හා සංවර්ධන ලෙස බෙදී යයි. මෙම අවස්ථා තුනටම එක සේ යම් අවස්ථාවක අවධානය යොමු කළ හැකි නම් එය ඉතා විශිෂ්ට වැයමකි. එහෙත්, බොහෝ විට කළ හැකි වනුයේ මින් එකකට හෝ දෙකකට ප්‍රමුඛතාව ලබා දීමයි."

අය වැය ලේඛනයකින් ආරක්ෂක, සුබසාධන සහ සංවර්ධන ලෙස වියදම් බෙදා හැරීමේදී මේ තුනටම එක වාගේ අවධානයක්

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

යොමු කරන්න රජයට, මුදල් අමාත්‍යාංශයට පුළුවන් නම් ඒක ඉතා විශිෂ්ටයි කියලා එතුමා කියනවා. මම විශ්වාස කරනවා, මේ 2021 සඳහා ඉදිරිපත් කරපු අය වැය ලේඛනය තුළ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා කියපු ඒ අභියෝගය මුදල් අමාත්‍යාංශය විසින් ජය ගෙන තිබෙනවා කියලා, ගරු සභාපතිතුමනි.

විශේෂයෙන් අය වැය ලේඛනයක් සකස් කිරීමේදී මුදල් අමාත්‍යාංශයට සිද්ධ වෙන්නේ අසීමිත අවශ්‍යතා අතර සීමිත සම්පත් හරියාකාරව පෙළ ගස්වා බෙදා හැරීමයි. ඒක කොයි තරම් දුරට හරියට කරලා තිබෙනවාද කියන එක තමයි අපි බලන්න ඕනෑ. කවදාවත් කොයිම රජයකටවත්, මුදල් අමාත්‍යාංශයකටවත් ඒක සියයට 100ක් හරියාකාරව කරන්න ක්‍රමයක් නැහැ. හැබැයි, උපරිම විධියට ඒ සඳහා උත්සාහ කර තිබෙනවා නම් එය සාර්ථකයි කියලා අපි කල්පනා කරනවා.

මේ රජය ආරක්ෂාව පැත්තෙන් ගත්තාම කිසිම අඩුවක් කර නැහැ. රජයක ප්‍රධාන වගකීම බාහිර සහ අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ සම්බන්ධයෙන් කිසිදු අඩුවක් කර නැහැ. ඒ සම්බන්ධ අලුත් වියදම් එකතු කර තිබෙනවා, මේ අභියෝගාත්මක වෙලාවේ. මහජන ආරක්ෂාව සම්බන්ධ නව යෝජනා සඳහා රුපියල් මිලියන 2,500ක් වෙන් කරන්න මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. අපි කියනවා, සාමය පවතින සමයේ ආරක්ෂාව ගැන වැඩියෙන් හිතන්න කියලා. කෙනෙකු අහන්න පුළුවන්, ඇයි මේ වෙලාවේ ආරක්ෂාව ගැන වැඩිපුර හිතන්නේ කියලා. මේ වෙලාවේ තමයි ආරක්ෂාව ගැන හිතන්න ඕනෑ ගරු සභාපතිතුමනි.

ඊළඟට, සුබසාධනය පැත්තෙන් බැලුවොත්, සමෘද්ධිලාභී පවුල් සඳහා නිවාස වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක් වෙන් කරන්න රජය මේ අභියෝගාත්මක අවස්ථාවේ කටයුතු කර තිබෙනවා. ඒ වාගේම රැකියා ලක්ෂයේ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනවා. විවිධ ක්ෂේත්‍ර කෙරෙහි දක්ෂතා තිබෙන රැකියා විරහිත තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. ප්‍රශ්නයකට තිබෙන්නේ, ඒ අය අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සමත් නොවීමයි. ඒ අය කෙරෙහි කාගේවත් අවධානය යොමු වුණේ නැහැ. රජයට පුළුවන් වුණා, මේ අභියෝගාත්මක අවස්ථාවේ ඔවුන් කෙරෙහි අවධානය යොමු කරන්න. ඒ වාගේම, උපාධිධාරීන් හැටදහසකට රැකියා දීමේ වැඩ පිළිවෙළත් මේ රජය යටතේ ක්‍රියාත්මක වනවා.

ඒ විතරක් නොවෙයි, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000ක් කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා. ඒ ගැන විවිධ මත තිබෙනවා. හාම්පුතුන් මේකට කියන්නේ මොකක්ද, එකඟතා ගිවිසුම්වල මොනවාද තිබෙන්නේ කියන කාරණා තිබෙනවා. හැබැයි, මේ රජයට වුවමනාවක් තිබුණා, රුපියල් 700ක පඩියෙන් ජීවත් වෙන්න බැරි, අවධානයට ලක් විය යුතුම, හඬක් නැති මේ මිනිස්සු ගැන රජයේ ප්‍රධානතම මූල්‍ය පනත තුළින් කථා කරන්න. සුබසාධනය පැත්තෙන් බැලුවොත්, මෙය ඉතාම අභියෝගාත්මක යෝජනාවක්. නමුත්, ඒ ගැන අවධානය යොමු කරන්න රජයට වුවමනාවක් තිබුණා.

ගරු සභාපතිතුමනි, හැම දාම සුබසාධනය සැලසීම පිළිබඳ ඒ අභියෝගය භාර ගත්තේ අපේ ආණ්ඩුවන් තුළින්. 1953 අය වැය හිඟය රුපියල් මිලියන 35යි. ඒ කාලයේ හිටපු මුදල් අමාත්‍ය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒ රුපියල් මිලියන 35 පියවා ගන්න, සහල් සඳහා එතෙක් දීලා තිබූ සහනාධාරය ඉවත් කළා. එහි අවසන් ප්‍රතිඵලය ප්‍රසිද්ධ හර්තාලයයි. ඒ නිසා ඩඩ්ලි සේනානායක අගමැතිතුමාට ඉවත් වෙන්න සිද්ධ වුණා. නමුත්, අපේ ආණ්ඩුව හැම දාමත් "වැලේ ගෙඩි වැලට බර නැහැ" කියන න්‍යායෙන් කටයුතු කළා. ජනතාවගේ අවශ්‍යතා ගැන හැම දාමත් සිතමින් කටයුතු කළා. මුදල් අමාත්‍යතුමා හැටියට අග්‍රාමාත්‍යතුමා මේ අය වැය ලේඛනය තුළත් ඒ න්‍යාය ඉතාම හොඳින් ක්‍රියාත්මක කර තිබෙනවාය කියා අපට සතුටු වෙන්න පුළුවන්.

ඒ වාගේම, අනෙක් කොටස තමයි සංවර්ධනය. ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 100,000ක් ඉදි කිරීමට ද, අඩු ආදායම්ලාභී නිවාස 100,000කට කිලෝවොට් 5 බැගින් සූර්ය ජනන පද්ධති සැපයීම සඳහා සියයට 4 පොලියට ණය සැපයීමට ද යෝජනා කරනවා. ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 200ක්, ග්‍රාමීය පාලම් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 7,000ක් වෙන් කර තිබෙනවා. කාලය මදි නිසා අය වැය යෝජනා අතරින් කිහිපයක් විතරයි මා මේ කියන්නේ. මේ සියල්ල එක්ක බලන කොට, ආචාර්ය එන්.එම්. පෙරේරා කියපු ආරක්ෂාව, සංවර්ධනය සහ සුබසාධනය කියන සියලු අංශ කෙරෙහි මේ අය වැය ලේඛනයෙන් අවධානය යොමු කර තිබෙනවා, ගරු සභාපතිතුමනි.

අනිත් අභියෝගය තමයි, මේ කියන ආදායම් උපයාගැනීම. ගරු සභාපතිතුමනි, අපේ රටේ ආදායමින් සියයට 95ක් ම බදුවලින් තමයි අපි උපයාගන්නේ. කවුද, බදු ගෙවන්නේ? රටේ සමස්ත ජනතාව. ඉතින්, අපට ඒක ඕනෑම විධියකට අර්ථ නිරූපණය කරන්න පුළුවන්. ජනතාවට බර පටවනවා කියලා කියන්න පුළුවන්. හැබැයි, අපේ රටේ සියයට 95ක් වූ බදුවලින් සෘජු බදු සියයට 20යි. තවමත් වක්‍ර බදු සියයට 80යි. ඒ කියන්නේ, කෙළින්ම ආදායම් උපයන්නකු ගෙවන බදු සියයට 20ක් වන කොට, වක්‍ර බදු සියයට 80 යි. මේක බැරෑරුම් තත්ත්වයක්. අපි ඒක වෙනස් කරගත යුතුයි.

හැබැයි, මේ අය වැය ලේඛනය තුළින් උපයාගන්න සුදානම් බදු ආදායම රුපියල් බිලියන 366කින් වැඩි කරගන්න 2021 වර්ෂයේදී අපි බලාපොරොත්තු වෙනවා. නමුත්, අපි බදුවල තිබිය යුතු රීති, නීති සහ සම්ප්‍රදායයන් ආරක්ෂා කර තිබෙනවාද, බදු උපයාගැනීම ආදායම් විෂමතාවට පිළියමක් කරගන්න අපි උත්සාහ කර තිබෙනවාද, ගරු සභාපතිතුමනි? ඇත්තෙන්ම, සෘජු බදු ආදායම සියයට 15කින් වැඩි කරගන්න අපි උත්සාහ කර තිබෙනවා. ඒක පැහැදිලිවම ආදායම් විෂමතාවට පිළියමක්. ඒ වාගේම, සමාජ මඟ පෙන්වන්නෙකු බවට බද්ද පත් කරගන්න අපි කටයුතු කර තිබෙනවා. අපි පිළිගන්නවා, මේ රටේ සියලු ආගම්වල මත්පැන් පානය අනුමත කරන්නේ නැහැ කියලා. නමුත් අපි සමහර අවස්ථාවල බියර්වල බද්ද අඩු කරලා බියර් බොන්න උනන්දු කරන්න උත්සාහ කළා. බද්දක් එහෙම වෙන්න බැහැ. බද්ද සමාජ මඟ පෙන්වන්නෙකු වෙන්න ඕනෑ.

ඒ වාගේම වැදගත්, බද්ද සාධාරණ ද, සරල ද කියන එක. සරල බවයි, සාධාරණ බවයි දෙකම තිබෙන්න ඕනෑ. මට මතකයි, 2004 වර්ෂයේදී බද්ද සරල කළා. "වැට්" එක අත්‍යවශ්‍ය භාණ්ඩවලට සියයට 8ක් සහ සුඛෝපභෝගී භාණ්ඩවලට සියයට 20ක් ලෙසයි තිබුණේ. එවකට -2004 වර්ෂයේ- සිටි මුදල් අමාත්‍යවරයා කිව්වා, බද්ද සරල කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා වන බද්ද සියයට 15ක් කරමු කියලා. ඒ අනුව, අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා වන බද්ද සියයට 8 සිට සියයට 15 දක්වා වැඩි කළා. සුඛෝපභෝගී භාණ්ඩ සඳහා වන බද්ද සියයට 20 සිට සියයට 15 දක්වා අඩු කළා. ඒ බද්දේ සාධාරණත්වයක් නැහැ. මම දකිනවා, මෙවර එහෙම ඇඟිල්ල දිගු කරන්න අවස්ථාවක් මුදල් අමාත්‍යාංශය කාටවත් දීලා නැහැ කියලා. ඒ වාගේම අලුතින් බදු බර පැටවීමක් ගැන කියමින් කෑ ගහන්න, පාරට බහින්න සමාජයට අවශ්‍යතාවක් ඇති කරලා නැහැ. බොහොම ප්‍රවේශමෙන් තමයි බදු ආදායම රුපියල් බිලියන 366කින් වැඩි කරගන්න මුදල් අමාත්‍යාංශය මේ අය වැය ලේඛනය තුළින් කටයුතු කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපි ආර්ථික මිනුම් දඬු ගණනාවක් ගැන නිතර කථා කරනවා. නමුත්, මුදල් අමාත්‍යාංශයටවත්, මහා භාණ්ඩාගාරයටවත් කවදාවත් මැජික් පෙන්වන්න බැහැ. මුදල අවප්‍රමාණ වීම වෙන්න පුළුවන්, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය වෙනස් වෙන්න පුළුවන්. මේ හැම දෙයකදීම අප කලබල විය යුතු ප්‍රශ්නයක් රටේ තිබෙනවාද?

මම ගත්තා, අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තොරතුරු කිහිපයක්. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව වැඩියෙන්ම ණය අරගෙන තිබෙන්නේ ජපානය. එම අගය, සියයට 266.2 යි. එම අගය, ඇමෙරිකා එක්සත් ජනපදයේ සියයට 131.2 යි; ඉතාලියේ සියයට 161.8 යි. අපි තවමත් ඉන්නේ සියයට 90 මට්ටමේ. අපි මේ කාරණා දිහා පුළුල්ව බලන්න ඕනෑ. මේ දිහා බලන්න ඕනෑ මෙය එක කාරණයක් හැටියට අරගෙන නොවෙයි. ලෝකයත් එක්ක බලද්දී ඉතාම පැහැදිලිව අපි ඉතාම ශක්තිමත් තැනක ඉන්නවා. ඒ වාගේමයි බැංකු පොලී අනුපාතය අතින් වුණත්. අපේ රටේ එය තනි ඉලක්කමක තිබෙනවා. අපි හැම දාම කෑ ගැහුවා, ඒක තනි ඉලක්කමකට ගේන්න. මේ අමාරු වෙලාවේත් ඒ තත්ත්වයේ තිබෙනවා.

ආර්ථික වර්ධන වේගය ගැන කතා කළත් තත්ත්වය එයමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල උපකල්පනය කරලා තිබෙනවා, ලෝකයේ බොහෝ රටවල ආර්ථික වර්ධන වේගය ඉලක්කම් දෙකේ සෘණ අගයකට යන්න පුළුවන් කියලා. එම අගය, ඉන්දියාවේ සෘණ සියයට 10.3 යි; ඉතාලියේ සෘණ සියයට 10.6 යි. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිමින් මෙම තොරතුරු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

ඒ සියල්ල ගෙන බැලුවාම -ලෝකයත් එක්ක බැලුවාම- මේ කියන මහා භයානක තත්ත්වයකට අපි වැටිලා නැහැ, ගරු සභාපතිතුමනි. අපි තවමත් යම්කිසි තැනක අපේ ආර්ථිකය රඳවාගෙන ඉන්නවා.

ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම කල්පනා කළ යුතුයි, අප නඟන තර්ක කොතෙක් දුරට සාපේක්ෂ ද, නිරපේක්ෂ ද කියලා. ගරු සභාපතිතුමනි, අපට ඕනෑම තර්කයක් නඟන්න පුළුවන් නිරපේක්ෂව, "මේක වුණේ නැත්නම් හොඳයි, කොවිඩ් ආවේම නැත්නම් හොඳයි" ආදි වශයෙන්. හැබැයි, අපි සාපේක්ෂ තර්ක තමයි නඟන්න ඕනෑ, "අනෙක් රටවල් එක්ක බැලුවාම අපේ රටේ තත්ත්වය මොකක්ද, අනෙක් යුගයන් එක්ක බැලුවාම තත්ත්වය මොකක්ද" ආදි වශයෙන්. එහෙම බලා අද අප මේ හැම තර්කයක්ම නඟන්න ඕනෑ.

අය වැය ලේඛනයක් පිළිබඳ අපි දවස් 20ක්, 25ක් කථා කරනවා. මාධ්‍යයක කියා තිබෙනවා මම දැක්කා, මේ අවුරුද්දේ ලෝකයේ වැඩියෙන්ම කථා වෙච්ච වචන වන්නේ, "COVID-19" සහ "PCR" කියන වචන බව. මම හිතනවා, අපිත් වැඩිපුරම කථා කළේ මේ වචනමයි කියලා. මේ වචන දෙක නොතිබුණා නම්, අපට කථා කරන්න මාතෘකාවක් නැති වෙයි කියන තරමට අපි එතැනට ළඟා වෙලා ඉන්නවා. හැබැයි, අපි කොතැනකදීවත් සාපේක්ෂව මේ ගැන කථා කරලා නැහැ.

ගරු සභාපතිතුමනි, අපි කොවිඩ්- 19 සම්බන්ධ දත්ත ඇතුළත් අද දවසේ වාර්තාව ගෙන මේ සාපේක්ෂ තත්ත්වය විමසා බලමු. මගේ වෙලාව ගතවන නිසා මම ඒ ගැන දිගින් දිගට කථා කරන්න යන්නේ නැහැ. නමුත් මා ඉතාම කෙටියෙන් ඒ ගැන කියන්නම්. ඇමෙරිකාවේ මිලියන එකකට රෝගීන් 47,671ක් ඉන්නවා. මරණ 894 යි. ඉන්දියාවේ මිලියන එකකට රෝගීන් 7,049 යි. මරණ 102 යි. ප්‍රංශයේ දසලක්ෂයකට රෝගීන් 35,572 යි. මරණ 872 යි. ශ්‍රී ලංකාවේ තත්ත්වය මොකක්ද? අපි තවම දියුණු වෙමින් පවතින, පහසුකම් අඩු රටක්. අපේ මිලියන එකකට රෝගීන් 1,402 යි. මරණ 7යි. මා කියන්නේ මේ තත්ත්වයත් හොඳ නැහැ කියලායි. හැබැයි අප සැබෑ තර්කයක් ගොඩනඟන්න හදනවා නම්, අප රටට ආදරෙයි නම්, රට ගැන අපට අභිමානයක් තිබෙනවා නම්, අපේ තර්ක හැම දාමත් නිරපේක්ෂ තර්ක නොවිය යුතුයි. සාපේක්ෂ තර්ක ගොඩනඟලා අපි ලෝකයත් එක්ක, යුගයත් එක්ක විමසා බලන්න ඕනෑ. එහෙම බලද්දී අප හුඟක් පහළට වැටිලා තිබෙනවා නම්, අපට ඒ ගැන කථා කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අපේ තර්ක හැම විටම දේශපාලනයට වඩා එහා ගිය තර්ක වෙනවා නම්, ඉතාම හොඳයි. අපි VAT එක අඩු කිරීම ගැන කථා කළා. මට මතකයි, මේ පාර්ලිමේන්තුවේම ඉදිරිපත් වෙච්ච බදු සමා පනත ගැන. මම නවක මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා, බදු සමා පනත කියවා බලන්න කියලා. මොකක්ද, එහි යෝජනා කර තිබෙන්නේ? මොකක්ද, එයින් ඇති වූ සමාජ සාධාරණය? මොකක්ද, මේ රටේ අඩු ආදායම්ලාභියාට එයින් වෙච්ච සාධාරණය? එම යෝජනාව දිගට ක්‍රියාත්මක කරගෙන යන්න බැරි වුණා. 2004 වසරේදී ආණ්ඩුව වෙනස් වුණා. නමුත්, අද ඒ කිසිම දෙයක් මතක නැති විධියට විවිධාකාරයේ කථා කියනවා; යෝජනා ගෙන එනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ 1972 අය වැය ලේඛනය අවසන් කර තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි.

"මෙය අසීරු අය වැයක් විය. එය මට ප්‍රසන්න හෝ පහසු කාර්යයක් නොවිණි. මාහට අනාගත දැක්මක් ඇතිව කටයුතු කිරීමට සිදුව ඇත. වර්තමානයේ දොම්නස හා අඳුර අතරින් අප ගමන් කරමින් සිටින විට පවා දුර ඈතක උදාවන ආලෝකය මට පෙනේ. අපි හොඳ ආරම්භයක් ගෙන සිටින්නෙමු. අපගේ සිඳී නොයන ශක්තියෙන් හා පරාර්ථකාමී කැපවීමෙන් අපි සියල්ලන්ටම සෞභාග්‍යය උදා කරගනිමු"

මෙහෙම කියා තිබෙන්නේ, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා.

ගරු සභාපතිතුමනි, රොනී ද මැල් මහත්මයාත් එවකට පැවැති ආණ්ඩුවේ පළමුවැනි අය වැය ලේඛනය -1978 අය වැය ලේඛනය - ඉදිරිපත් කරලා ඒ වාගේම දෙයක් කියා තිබෙනවා. මට මේ කියන්න ඕනෑ වුණේ, එතුමන්ලා හැම කෙනෙකුගේම අවශ්‍යතාව එකක් වන බවයි. නමුත්, යන්න හදන මාර්ගය වෙනස්. සමහර විට දැන දැන වෙනත් මාර්ගවල යන්න හදනවා. රෝනී ද මැල් මහත්මයා එතුමාගේ අය වැය කථාව අවසානයේ කියන්නේ මොකක්ද? එතුමා එම අය වැය ඉදිරිපත් කළ වෙලාව, අපේ ආර්ථිකය සම්පූර්ණයෙන් -අංශක 360ට ම- හැරුණු වෙලාවක්. මොකද, 1971 වර්ෂයේ ඉඳලා 1977 වර්ෂය දක්වා අපේ රට ආපු ගමන 1978 වර්ෂයේදී සම්පූර්ණයෙන් අනෙක් පැත්තට හැරෙව්වා. එහෙම හරවපු වෙලාවේ ඉදිරිපත් කරපු අය වැය කථාව අවසානයේදී එතුමා කියා තිබෙන්නේත් කලින් සඳහන් කළ කාරණයමයි. ගරු සභාපතිතුමනි, එතුමා මෙහෙම කියා තිබෙනවා.

"ඇත්ත වශයෙන්ම පාලකයාට ඔහුගේ රටේ ඇති විශාලතම ධන නිධානය වන්නේ එරට මහ ජනතාවයි. එබැවින් ඥානවන්ත පාලකතෙමේ නිරන්තරයෙන්ම තම ජනතාවගේ සුබ සිද්ධිය ගැන මැනවින් මෙනෙහි කරයි. එක් මොහොතකටවත් ඔවුන් අමතක නොකරයි. ඔහු මහ ජනයාගේ දුක් ගැහැට ගැන සිතයි. ඔවුන්ට සමෘද්ධිය උදා කර දිය හැකි මාර්ග ගැන කල්පනා කරයි. මහ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ජනතාවත්, ඔවුන්ගේ දුක් ගැහැට ගැනත් සිතමින් ඔවුන්ට සමෘද්ධිය හා සෞභාග්‍යය උදා කර දිය හැකි ක්‍රම සැලසුම් කරමින් අපි ඉදිරියට පා තබන්නෙමු."

මාර්ග දෙකක ගියත් සමහර විට මේ දෙදෙනාටම කරන්න අවශ්‍ය වෙලා තිබුණේ එක දෙයක්. ප්‍රශ්නය තිබෙන්නේ, මේ කණ්ඩායම ඒ ගමන ගියාද කියන එකයි, ඔවුන්ට ඒ ගමන යන්න පුළුවන් වුණාද කියන එකයි. මිනිසුන්ට ඒ ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ, ගරු සභාපතිතුමනි. මේ කථා කරන බොහෝ අයගේ රාමුව එකක්. හැබැයි, පාරවල් දෙකක්. ගරු සභාපතිතුමනි, සමහර විට පාර දැන දැන ඒ පාරේ නොයන එකත් ප්‍රශ්නයක් යැයි අපට කියන්න පුළුවන්.

අපි හැම දාම ඉතිහාසය ගැන කථා කරනවා. අපි කවුරුත් පිළිගන්නවා මෙය අමාරු වෙලාවක් බව. මා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන අනුව, මෙය ශ්‍රී ලංකාවට පමණක් නොවෙයි, සමස්ත ලෝකයටම, එනම් දියුණු රටවලටත්, නොදියුණු රටවලටත් - කාහටත්- අමාරු වෙලාවක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මම කථාව අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි. මට ඔබතුමාගෙන් වෙලාව ඉල්ලන්න බැහැ නේ. ගරු සභාපතිතුමනි, මම තවත් එක විනාඩියයි ගන්නේ.

2005-2015 යුගයේ තමයි මේ වාගේ ඉතාම අමාරු අභියෝගවලට අප මුහුණ දුන්නේ. ඒවා තමයි, රටේ අභ්‍යන්තර යුද්ධය, 2008 ලෝක ආර්ථික අවපාතය, ලෝක තෙල් මිල ඉහළ යෑම, දේශපාලන අස්ථාවරභාවය ආදිය. 2004 අවුරුද්දේ සුනාමි ව්‍යසනය සහ ඉන් පසුව ඇති වූ නියඟයත් අභියෝග බවට පත් වුණා. හැබැයි, මේ සියල්ල ජය ගනිමින් ඉදිරියට යන්න අපට හැකි වුණා. යුද්ධය ජයගන්න, ආර්ථික වර්ධන වේගය සියයට 5ක මට්ටමේ දිගටම පවත්වාගන්න, ණය අනුපාතය සියයට 70ක් දක්වා පහළට ගෙන එන්න, විදේශ වත්කම් වාර්තාගත තැනකට ගෙන එන්න පුළුවන් වුණා, යම්කිසි ක්‍රමයක්, යම්කිසි දර්ශනයක් එක්ක යම්කිසි කණ්ඩායමක් ඉදිරියට ගිය නිසා.

ගරු සභාපතිතුමනි, අද අප සතුටු වන්නේ එදා ඒ ජනපති පුටුවේ ඉඳිමින් රටට නායකත්වය දුන් ජනාධිපතිවරයා අද අගමැති සහ මුදල් ඇමති ලෙසත්, එදා ඒ යුද්ධය ජයගත් කාලයේ හිටපු ආරක්ෂක ලේකම්වරයා අද ජනපති ලෙසත්, එදා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා අද ජනාධිපති ලේකම් ලෙසත්, එදා මහ බැංකුවේ අධිපතිතුමා අද මුදල් රාජ්‍ය අමාත්‍යතුමා ලෙසත් කටයුතු කරන නිසායි. ඒ වාගේම තරුණ රාජ්‍ය ඇමතිවරයෙකු වන ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාගේත් සම්පූර්ණ සහාය ඊට ලැබී තිබෙනවා. එදා මුදල් නියෝජ්‍ය ලේකම්තුමා ලෙස අපිත් එක්ක සැහැල්ලුවෙන් මේ හැම දේටම මුහුණ දුන් එස්.ආර්. ආටිගල මැතිතුමා අද මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමායි. ඒ නිසා මේ අභියෝග ජය ගනිමින් මේ සියලුදෙනා එක්ක ඉදිරියට යන්න පුළුවන් කියන විශ්වාසය අපට පමණක් නොවෙයි, මේ රටේ සමස්ත ජනතාවට තිබෙනවා. හැම කෙනෙක්ම බලනවා, ඉතිහාසයේ කළ කී දෑ; ඉතිහාසයේ ලබාගත් ප්‍රතිඵල.

අපේ ආණ්ඩුවට තිබෙනවා, ධනාත්මක උපකල්පන. ලබන වර්ෂයේ අය වැය පරතරය සියයට 9ක තබාගැනීම, ආර්ථික වර්ධන වේගය සියයට 5.5 සහ 6 අතර තබාගැනීම, රාජ්‍ය ආදායම් වර්ධනය සියයට 14.1ක තබාගැනීම යනාදිය ඉන් කීපයක්. මේ සියල්ල ධනාත්මක උපකල්පන මිස හිස් උපකල්පන නොවෙයි කියන විශ්වාසය මේ රටේ සමස්ත ජනතාවට තිබෙනවා.

මා විපක්ෂයට ආරාධනාවක් කරන්න කැමැතියි. ඔබතුමන්ලාගේ යහපත් වූ, සැබෑ වූ, සාපේක්ෂ වූ විවේචනත් එක්ක අපි එකඟ වෙනවා. මුදල් අමාත්‍යවරයා හැටියට ගරු අගමැතිතුමාටත්, රට මෙහෙය වන අතිගරු ජනාධිපතිතුමාටත් මේ අභියෝගයත් ජය ගෙන මේ ගමන ඉස්සරහට යන්න හැකියාව ලැබේවි කියලා මා විශ්වාස කරනවා. අපි එතුමන්ලාට සුබ පතනවා. ඒ සඳහා අපි සියලුදෙනා එක්ව සද්භාවයෙන් කටයුතු කරමු, අප සියලුදෙනාගේ සහයෝගය ලබා දෙමු කියන ආරාධනාව කරමින්, ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි. The next speaker is the Hon. Dharmalingam Sithadthan. Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

[මු.ප. 11.37]

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
கௌரவ தவிசாளர் அவர்களே, கௌரவ பிரதம அமைச்சரின்கீழ் வரக்கூடிய நிதி அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்வடைகின்றேன். வடக்கு, கிழக்கைப் பொருத்தமட்டில், அவற்றின் அபிவிருத்திக்கென்று ஒதுக்கப்பட்டிருக்கக்கூடிய நிதி மிகக் குறைவாக இருக்கின்றது. அதுமாத்திரமல்ல, இப்போது அங்கு நடைபெறக்கூடிய அபிவிருத்தி வேலைகளில் வீதி அபிவிருத்தி வேலைகளே கூடுதலாக இருக்கின்றன. அங்கு வேலைவாய்ப்புக்கள் மிகக் குறைவாக இருக்கின்ற காரணத்தினால், இளைஞர், யுவதிகள் வேலையற்று மிகவும் கஷ்டமான நிலையிலே வாழுகின்றார்கள். எனவே, வேலைவாய்ப்புக்களை உருவாக்கக்கூடிய விதத்திலே அபிவிருத்தி நடைபெறக்கூடியவாறு முதலீடுகள் செய்யப்பட வேண்டும். அப்போதுதான் அந்த இளைஞர், யுவதிகள் வேலைவாய்ப்புக்களைப் பெறமுடியும்.

அடுத்து, வீதி திருத்தத்தின்போது ஏற்படக்கூடிய பிரச்சினை ஒன்றிருக்கின்றது. உதாரணமாக, கோப்பாய் பிரதேச சபைக்குட்பட்ட அச்சுவேலிக் கிராமத்திலுள்ள அம்மன் வீதியைப் புனரமைப்பதற்காக அரசு RDA ஊடாக ஒரு திட்டத்தைப் போட்டு, அதற்கு அடிக்கல்லையும் நாட்டியது. அந்த அடிக்கலானது யாழ்ப்பாண மாவட்ட அபிவிருத்திக்

குழுவின் தலைவரால் - DDC Chairman அவர்களால் நாட்டப்பட்டது. அது ஓர் உள்ளூராட்சிச் சபையின்கீழ் வருகின்ற வீதியாக இருக்கின்றபடியால், முதலில் அந்த உள்ளூராட்சிச் சபையின் தலைவரிடம் - அங்கே தலைவராக இருப்பவர் நிரோஷ் என்பவர் - அல்லது அந்தச் சபையிடம் அனுமதியைப் பெற்றிருக்க வேண்டும். அதனைச் செய்யாமல் அவர்கள் அடிக்கல் நாட்டியது மாத்திரமல்ல, அதற்கு ஒரு பெயர்ப்பலகையும் போட்டிருக்கிறார்கள். இதனால், அச்சபையின் தலைவர் அந்தப் பெயர்ப் பலகையைக் கழற்றியிருக்கின்றார். அது ஒரு மிகப்பெரும் பிரச்சினையாக மாறி அவரைக் கைதுசெய்கின்ற நிலைமைக்கு இட்டுச்சென்றிருக்கிறது; அவரை anticipatory bail இல் எடுக்கின்ற நிலைமைக்குக் இட்டுச்சென்றிருக்கின்றது. இது உள்ளூராட்சி சபைத் தலைவருக்கும் DDCஇன் Chairmanக்கும் இடையிலே ஏற்பட்டிருக்கின்ற ஒரு தனிப்பட்ட பிரச்சினையல்ல. மத்திய அரசு தன்னுடைய அதிகாரங்க ளூடாக அதாவது, தன்னுடைய நிர்வாகத்தின்கீழ் வருகின்ற RDA மூலம் உள்ளூராட்சிச் சபையின் அலுவல்களில் தலையிடுகின்றது என்ற அடிப்படையிலேயே நாங்கள் இந்தப் பிரச்சினையைப் பார்க்க வேண்டியிருக்கிறது. இது மிகத் தவறான ஒரு செயற்பாடாகும். நிச்சயமாக இதைக் கவனத்தில் எடுத்து சீர்திருத்த வேண்டும். ஏனென்றால், இப்படியாக ஒவ்வோர் விடயத்திலும் தேவையற்ற தலையீடுகள் இருக்கின்றன.

கடந்த அரசாங்க காலத்திலே "கம்பெறலிய" என்ற திட்டத்தின்கீழ் உள்ளூராட்சி சபைகளின்கீழ் வருகின்ற வீதிகள் புனரமைக்கப்பட்ட சந்தர்ப்பத்தில், அந்தந்த உள்ளூராட்சிச் சபைகளின் அனுமதி பெற்றுத்தான் அவை திருத்தப்பட்டன என்பது உங்களுக்குத் தெரியும். ஆகவே, இந்த முறையைக் கட்டாயம் கடைப்பிடிக்க வேண்டும்; அப்போதுதான் உள்ளூராட்சி சபைகளுடைய அதிகார எல்லைக்குள் மத்திய அரசு தலையிட முடியாத ஒரு நிலைமை ஏற்படும். இவ்விடயம் கௌரவ பிரதமர் அவர்களுடைய பொறுப்பின்கீழ் வருகின்ற ஒரு விடயம் என்றபடியால், இதனை நாங்கள் கூறவேண்டியிருக்கின்றது. இதனை அவர் தெரிந்து கொண்டால்தான் இது தொடர்பில் ஏதாவது நடவடிக்கை எடுப்பதற்கு அவருக்கு வசதியாக இருக்கும் என்று நினைக்கின்றேன்.

கடந்த 25 வருட காலமாகப் புனர்வாழ்வு, மீள்குடியேற்றம் - resettlement சார்ந்த ஓர் அமைச்சு இருந்துவந்தது. ஆனால், இப்போது அது இல்லாமல் செய்யப்பட்டிருக்கிறது. இதனுடன் தொடர்புடைய விடயதானங்கள் வேறு ஏதாவது ஓர் அமைச்சின்கீழ் இருக்கின்றதா? என்று நான் 'அமைச்சர்களுக்கான விடயங்களும் பணிகளும்' தொடர்பான வர்த்தமானி அறிவித்தலைப் பார்த்தேன். ஆனால், அதிலே எங்குமே அதனைக் காண முடியாமல் இருந்தது. ஆகவே, நிச்சயமாக இந்த விடயதானங்கள் எல்லாம் பிரதம அமைச்சருடைய விடயங்களும் பணிகளும் என்ற விடயத்தின் கீழ் வருவதாக இருக்கும் என்று நான் நினைக்கின்றேன். மீள்குடியேற்றத்தைப் பொறுத்தமட்டில், இன்றும் பல குடும்பங்கள் உறவினர் வீடுகளிலும் அகதி முகாம்களிலும் இருக்கின்றனர். அவர்களுடைய மீள்குடியேற்றப் பணி அல்லது புனருத்தாரணப் பணி முழுமை பெறாமல் இருக்கின்றது. இந்த விடயங்களை நிச்சயமாகச் செய்யவேண்டிய ஒரு தேவை இருக்கின்றது. எனவே, அது தொடர்பில் கவனம் செலுத்துமாறு கேட்டுக்கொள்கின்றேன்.

அதுமாத்திரமல்ல, இங்கிருந்து இடம்பெயர்ந்தவர்களில் ஏறக்குறைய ஓரிலட்சத்திற்குக் கூடுதலானோர் தமிழ்நாட்டிலே அகதிமுகாம்களிலே வாழுகின்றார்கள். நான் அங்கு வீடு எடுத்திருப்பவர்களைப் பற்றிக் கூறவில்லை; அகதி முகாம்களிலே வாழுகின்றவர்களின் எண்ணிக்கையினை மாத்திரமே குறிப்பிட்டேன். இந்திய அரசாங்கம் தமிழ்நாட்டிலே அவர்களை ஓரளவுக்கு நன்றாகப் பார்த்துக்கொண்டாலும், பலர் இங்கு வந்து தங்களுடைய சொந்த இடங்களிலே வாழ்வதற்கு விரும்புகின்றார்கள். ஆனாலும், அவர்களது மீள்குடியேற்றத்துக்குத் தேவையான வசதிகள் செய்து கொடுக்கப்படாதபடியால், அவர்கள் இங்கு வருவதற்குத் தயங்கிக்கொண்டிருக்கின்றார்கள். இந்த விடயத்தையும் நிச்சயமாக அரசாங்கம் கவனத்தில் எடுக்கவேண்டும்.

அத்துடன், அண்மையிலே ஏற்பட்ட புரவி புயல் மற்றும் சீரற்ற காலநிலைகளால், வடக்கு மாகாணத்திலும் கிழக்கில் சில பகுதிகளிலும் மிகப்பெரியளவிலே எங்களுடைய மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். வெள்ளத்தினால் பாதிக்கப் பட்ட மக்களுக்கு வீடமைப்பு அதிகாரசபையினுடைய வீட்டுத் திட்டத்திலே வீடு கட்டிக்கொள்ள உதவிகள் கொடுக்கப் பட்டன. ஆனால், அவற்றை முழுமையாகக் கட்டி முடிப்பதற்குரிய பணம் கொடுக்கப்படாத காரணத்தினால், அந்த வீடுகள் அரைகுறை நிலையில் இருக்கின்றன. இதனால், சிலர் கடன் வாங்கி, தங்களுடைய நகைகளை அடகுவைத்து அந்த வீட்டை முழுமையாகக் கட்டிய நிலையில், தற்போது அவர்கள் அந்தக் கடனிலிருந்து மீளமுடியாமல் தவிக்கின்றார் கள். ஏனையவர்கள் அரைகுறை நிலையிலிருந்த வீடுகளிலே தங்கியிருந்த காரணத்தினால், இந்த வெள்ளத்தால் மிகப்பாரியளவிலே பாதிக்கப்பட்டு, அங்கிருந்து குடிபெயர்கின்ற ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. கரையோரங்களிலும், பல கிராமப்புறங்களிலும் ஏறக்குறையத் தொண்ணூறாயிரம் பேர் இவ்வாறு வெள்ளத்தாலும், புயலாலும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆகவே, அவர்களுக்கு அந்த வீட்டுத் திட்டத்திற்கான மிகுதிப் பணத்தைக் கொடுத்து அதனை முழுமையாக முடித்துக் கொடுக்கவேண்டும் அல்லது அவர்களுக்கு வாழுவதற்கு வழி இல்லாத நிலை ஏற்படும். ஆகவே, அது தொடர்பில் நிச்சயமாக அரசாங்கம் கவனத்தில் எடுக்கவேண்டும். அதுமாத்திரமல்ல, வாழைகள் மற்றும் பயிர்களின் அழிவுகள் அதிகளவிலே நடந்திருக்கின்றது. அதில் முக்கியமாக யாழ்ப்பாணத்திலே நீர்வேலி, சிறுப்பிட்டி, சுன்னாகம் போன்ற பகுதிகளைக் குறிப்பிடலாம்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
எட்டு நிமிடங்கள் குறைக்கப்பட்டிருக்கிறதா?

அங்கெல்லாம் பல அழிவுகள் ஏற்பட்டிருக்கின்றது. கட்டாயமாக அரசாங்கம் அதற்கு நேர்மையான முறையில் compensation கொடுக்கப்படவேண்டும். ஏனென்றால், அவர்கள் அதனையே நம்பி வாழ்க்கை நடத்துபவர்கள்.

அதுமாத்திரமல்ல, இரணைமடுக் குளத்து நீரைக்கொண்டு வடக்கிற்கான நீர்த் தேவை பூர்த்திசெய்யப்பட வேண்டும். அந்தக் குளத்தின் மூலமாக முழுமையாக் கொடுக்க முடியாவிட்டால், உப்புநீரை - கடல்நீரை நன்னீராக்கி வழங்குகின்ற திட்டத்தை நிச்சயமாகச் செய்வதாகப் பிரதமர்

[ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා]

அவர்கள் ஏற்றுக்கொண்டிருக்கின்றார். அதேபோல, அமைச்சர் வாசுதேவ நாணயக்கார அவர்களும் அதனைச் செய்யவெண்டு மென்று அக்கறை காட்டுகின்றார். இதனை நீங்கள் எவ்வளவு விரைவாகச் செய்யமுடியுமோ அவ்வளவு விரைவாகச் செய்ய வேண்டும்.

சுகாதாரத்துறையிலே பல சுகாதாரத் தொழிலாளர்கள் - தொண்டர் தொழிலாளர்கள் மிக நீண்டகாலமாக வேலை செய்துவருகின்ற நிலையில், அவர்கள் நிரந்தரமாக்கப்படாமல் இருக்கின்றார்கள். இதிலே 2004ஆம் ஆண்டு கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானாந்தா அவர்களுடைய தலையீட்டில் அல்லது அவருடைய முயற்சியால் ஒரு பகுதியினருக்கு நிரந்தர நியமனம் வழங்கப்பட்டது. மிகுதியானோரையும் நிரந்தரமாக்குவதற்குக் கௌரவ அமைச்சர் அவர்கள் முயற்சி எடுக்கின்றார் என்று நான் அறிந்திருக்கின்றேன். ஆகவே, அவருடைய அந்த முயற்சிக்கு அரசாங்கம் முழுமையான ஆதரவைக் கொடுக்கவேண்டும். ஏனென்றால், அவர்கள் 15 - 20 வருடங்களாக எந்தவித வேதனமும் இல்லாமல் வேலை செய்கின்றார்கள். நான் நினைக்கின்றேன், அவர்களுக்கு அந்த வேலையை நிரந்தரமாகக் கொடுக்காதுவிட்டால் அவர்கள் 55 வயதைத் தாண்டிவிடுவார்கள். ஆகவே, அவர்களுடைய அந்த வேலையை நிரந்தரமாக்கிக் கொடுப்பதற்கு அரசாங்கம் நிச்சயமாக முயற்சியெடுக்கவேண்டும்.

அடுத்ததாக, வெளிநாடுகளிலே பட்டப்படிப்பைப் படித்துவிட்டு இந்த நாட்டிற்குக் கிட்டத்தட்ட 30 ஆயிரம் பேர் வந்திருக்கின்றார்கள். அவர்கள் எவருக்குமே வேலை கொடுப்பதில்லை என்று ஒரு முடிவில் அரசாங்கம் இருக்கின்றது.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
அவர்கள் இந்த நாட்டைச் சேர்ந்தவர்கள்; பெருந்தொகை யான பணத்தைச் செலவழித்து வெளிநாடுகளுக்குச் சென்று கற்றுவிட்டு வந்திருக்கின்றார்கள். ஆகவே, அவர்களுக்கு அந்த வேலையைக் கொடுப்பதற்கான முழு முயற்சியினையும் எடுக்கவேண்டும். நான் இன்னும் பல விடயங்களைச் சொல்ல எண்ணியிருந்தாலும், நேரம் போதாதபடியால் என்னுடைய பேச்சை முடித்துக்கொள்ளுகின்றேன். நன்றி.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඩග්ලස් දේවානන්දා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.46]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
கௌரவ தவிசாளர் அவர்களே, இன்று இடம்பெறுகின்ற 2021ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தின் இறுதி நாள் அமர்வில் எனது கருத்துக்களையும் பதிவுசெய்து கொள்வதற்கு வாய்ப்பு வழங்கப்பட்டமை தொடர்பில் முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று எமது மக்கள் மிகவும் நெருக்கடிமிக்க வாழ்க்கையின் சவால்களுக்கு முகங்கொடுத்துள்ளனர். கடந்த ஆட்சியின் தீர்க்கதரிசனமற்ற நிர்வாகத்தின்மூலமாகத் திணிக்கப்பட்டுள்ள பொருளாதார வீழ்ச்சி நிலைமைக்கு மத்தியில், ஒரு பக்கம் கொவிட்-19 கொரோனா தொற்று அனர்த்தம் காரணமாகவும், மறுபக்கத்தில் புரவி புயல் காரணமாகவும், தொடர்ந்த மழை வெள்ளம் காரணமாகவும் எமது மக்கள் வாழ்வாதார, சுகாதார, பொருளாதார ரீதியாகப் பெரும் பாதிப்புக்களுக்கு முகங்கொடுத்து வருகின்றனர்; இதுதான் யதார்த்த நிலையாக இருக்கின்றது. இத்தகைய நிலையில், மக்கள் அடைந்துவருகின்ற துன்ப துயரங்களைக் கண்டுகொள்ளாமல், மக்களின் அவலங்களை வெளிப்படையாக மூடிமறைக்கின்ற வகையில், மக்களது உண்மையான பிரச்சினைகளை வேறு திசைகள் நோக்கியதாகக் கொண்டுசெல்கின்ற நடவடிக்கைகளிலேயே கடந்தகால அரசாங்கம் செயற்பட்டு வந்திருந்தது. இன்று அந்த நிலைமை மாற்றப்பட்டுள்ளதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேன்மைதங்கிய ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களது தலைமையின்கீழ், கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களது வழிகாட்டலில் இந்த அரசு மக்களின் பிரச்சினைகள் தொடர்பில் உள்ளதை உள்ளவாறு எடுத்துக்கூறுவதுடன், இக்கட்டான பொருளாதார நிலைமையிலும் மக்களது பிரச்சினைகளைத் தீர்த்துவைப்பதில் அக்கறைகாட்டி வருகின்றது. ஆனால், இங்கே மக்களது பிரச்சினைகளை வேறு திசை நோக்கித் திருப்பிவிடுகின்ற செயல்களில் போலித் தமிழ்த் தேசியம் பேசுகின்றவர்களும் அதிதீவிர போலித் தமிழ்த் தேசியம் பேசுகின்றவர்களும் ஈடுபட்டு வருகின்ற அதேவேளை, இவர்களது இச்செயற்பாடுகள் எமது மக்களை மீண்டும் ஒரு காரிருள் சூழ்ந்த சூனியத்திற்குள் தள்ளிவிடுகின்ற அபாயத்தை ஏற்படுத்தக்கூடியதாக இருக்கின்றன என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்தத் தமிழ்த் தரப்புப் போலித் தமிழ்த் தேசியவாதிகள் பேரினவாதத் தீக்கு எண்ணெய் வார்க்கின்ற செயற்பாடுகளைக் குத்தகைக்கு எடுத்துள்ளனர். எமது மக்கள் முகங்கொடுத்துள்ள உண்மையான பிரச்சினைகளைத் தீர்ப்பதற்கு முன்வராமல், அந்தப் பிரச்சினைகளை மேலும் வளரவிடுவதும், அதனோடு மேலும் பல பிரச்சினைகளைக் கோர்த்துவிடுவதும் இவர்களது வரலாற்றுச் செயற்பாடுகளாகவே தொடர்கின்றன. எமது மக்களின் பிரச்சினைகள் அனைத்தையும் தீர்த்துவைப்பதாக இவர்கள் எமது மக்களிடம் பொய்யான வாக்குறுதிகளை அளித்து, வாக்குகளை அபகரித்துக்கொண்ட பின்னர், மக்களின் பிரச்சினைகளைத் தீர்க்கமாமல், அந்தப் பிரச்சினைகளுடன் மேலும் பிரச்சினைகளைச் சேகரித்துக் கொடுக்கின்ற அட்டூழியங்களால், எமது மக்கள் பிரச்சினைகளின் கடனாளிகளாகவே வாழ்க்கையைத் தொடர வேண்டிய நிலைமைக்குத் தள்ளப்பட்டுள்ளனர். புரவி புயல் வந்துவிட்டுப் போய்விட்டது. ஆனால், இந்தப் போலித் தமிழ்த் தேசியவாதிகளின் பிறவிக் குணங்களில் எந்தவித மாற்றமும் இல்லை. ஆயிரம் புரவி புயல்கள் வந்தாலும் இவர்களது பிறவிக் குணங்கள் மாறுமா? என்பது சந்தேகமாகவே இருக்கின்றது.

இறுதி யுத்தத்தின்போது யார், யார் எங்கெங்கிருந்தார்கள் என்பதுபற்றி இப்போது அறிக்கைப் பட்டிமன்றம் நடத்தப்பட்டுக்கொண்டிருக்கின்றது. அந்த அழிவு ஏற்படக்கூடாது என்ற எனது மனிதாபிமான நோக்குக் காரணமாக, அதனை நிறுத்துவதற்கு அப்போதைய ஜனாதிபதி மேன்மைதங்கிய மஹிந்த ராஜபக்ஷ அவர்களுடன் பேசுவோம் வாருங்கள்! என அப்போது நாடாளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தியிருந்த ஏனைய தமிழ்த் தரப்பினரை அழைத்தபோது, அவர்கள் அதற்கு இணங்கியிருக்கவில்லை. புலிகள் இயக்கத்தினர் அழியவேண்டுமென்ற மனோநிலை யிலேயே இருந்தார்கள். இதை வெளிப்படையாகக் காட்டாமல், "புலிகள் நின்றடிப்பார்கள்; விட்டடிப்பார்கள். 40 ஆயிரம் சவப்பெட்டிகளைத் தயார் செய்யுங்கள்!" என்றெல்லாம் கதைவிட்டுக்கொண்டு, அழிவுக்குத் துணைபோனார்கள். அன்று ஆடு நனைய ஓநாயாக அழுதுவிட்டு, இன்று முதலைக் கண்ணீர் வடிக்கிறார்கள். 'ஏட்டுச் சுரைக்காய் கறிக்கு உதவாது' என்ற பழமொழிக்கு உதாரணமாகவே இருக்கின்றது இவர்களது செயற்பாடுகள். எமது மக்களின் தலையாய பிரச்சினைகளை எல்லாம் தள்ளிவிட்டுவிட்டு, எமது மக்களுக்கு ஒருபோதும் உதவியிராத தமிழ்த் தேசியக் கூட்டமைப்பைத் தடை செய்வதா, தடை செய்யக்கூடாதா? என்ற தலைப்பினை இந்தப் பேரிடர்க் காலத்தில் எடுத்துக்கொண்டு, வாய்ப்பாட்டுப் போர் நடத்திக்கொண்டிருக்கிறார்கள்.

இந்த நாட்டில் பேரினவாதம் என்பது குறிப்பிட்ட தரப்பினரிடையே சலூன் கதவுபோல் பொருத்தப்பட்டிருக் கின்றது. அதனை தமிழ் இனவாதக் கருத்துக்கள் அடிக்கடி திறக்கச் செய்வதால், மொட்டையடிக்கப்படுவது எமது சமூகமாகவே இருக்கின்றது. இந்த நாட்டில் பேரினவாதத்திற்கும் குறிப்பிட்ட தமிழ் அரசியல்வாதிகளின் இனவாதத்திற்குமிடையில் ஒப்பந்தங்கள் இருக்கக்கூடாது என்பதையே நான் வலியுறுத்த விரும்புகின்றேன்.

எமது மக்களுக்கு அன்றாட அபிவிருத்தி மற்றும் அரசியல் ரீதியிலான பிரச்சினைகள் உண்டு. அதேபோன்று, முஸ்லிம் மக்களுக்கும் இதே பிரச்சினைகளுடன் மத ரீதியிலான பிரச்சினைகளும் உண்டு. கடந்த வருட உயிர்த்த ஞாயிறு தாக்குதலின் பின்னர் கிறிஸ்தவ மக்களுக்கு வாழ்க்கைப் பாதுகாப்பு தொடர்பான பிரச்சினை எழுந்திருந்தது. முஸ்லிம் மக்களுக்கு மத உணர்வு ரீதியிலான வாழ்க்கைப் பிரச்சினை ஏற்பட்டு, கொவிட்-19 - கொரோனா தொற்று அனர்த்தத்தின் பின்னரும் அது தொடர்கின்றது. இவை அனைத்தும் அரசியல் ரீதியாக அல்லது குறைந்தபட்சம் மனிதாபிமானரீதியாகத் தீர்க்கப்பட வேண்டும். அதற்கென நாங்கள்தான் அரச தரப்புடன் பேசும் முயற்சிகளைத் தொடர்ந்து மேற்கொள்ள வேண்டியுள்ளது. பெரும்பான்மைப் பலத்துடன், பெரும் பான்மையினரின் பலத்துடன் இந்த அரசு இருக்கின்றது. அதற்காக எம்மை நாம் இந்த அரசுக்கு அடகுவைக்க வேண்டியதில்லை. அடம்பிடிக்காமல் 'நாமும் இலங்கையர்' என்ற உரிமையுடன் பேச்சுவார்த்தைகளை மேற்கொண்டு, எமது பிரச்சினைகளைத் தீர்ப்பதற்கான வாய்ப்புகள் இருக்கின்றன.

அரசுடன் பேசுவதென்பது தங்களது சுயநலன்கள் சார்ந்ததாக இருக்கக்கூடாது. அது, எமது மக்கள் நலன் சார்ந்ததாக இருக்க வேண்டும். அப்படி இருந்திருந்தால் எமது அனைத்து மக்களினதும் பிரச்சினைகள் எப்போதோ தீர்க்கப்பட்டிருக்கும் என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே 13 பேர் சேர்ந்து எமது மக்களைத் தொடர்ந்தும் மிதித்துக்கொண்டிருக்கின்ற நிலைமையை ஏற்படுத்தாமல், எமது மக்களை மதித்துக் கொண்டிருக்கின்ற நிலைமையை இந்த நாட்டில் ஏற்படுத்துவதற்கு முன்வருமாறு கேட்டுக்கொள்கின்றேன்.

பாதை தெளிவாகவே இருக்கின்றது. அதில் உங்களது பயணங்கள்தான் எமது மக்களுக்கான அழிவைத் தேடியே தொடர்ந்தும் நகர்கின்றன. அழிவு சுலபமானது, ஆக்கம் கடினமானது. அழிவைத் தவிர்த்து, ஆக்கத்தை நோக்கிய செயற்பாட்டில் நகரும் எங்களுக்கு அதனது கஷ்டங்கள் தெரியும். எனவே, இறுதி யுத்த தறுவாயில் அதனைத் தடுத்து நிறுத்துவதற்கு நான் விடுத்த அழைப்பைப்போல் மீண்டும் மீண்டும் நான் அழைப்பு விடுக்கின்றேன். வாருங்கள், அரசுடன் பேசுவோம்! எமது மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு முன்வாருங்கள்! என பகிரங்க அழைப்பினை விடுக்கின்றேன். எமது மக்களின் நலன் கருதி, இந்த அழைப்பையும் உங்களது சுய இலாபங்களுக்காகக் கோட்டைவிட்டுவிடாது, கைகோர்த்து வரும்படி கேட்டுக்கொள்கின்றேன். நன்றி.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.55]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ සහ තවත් රාජ්‍ය අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මෙම විවාදයේදී, සංඛ්‍යා, දත්ත විකෘති කිරීම් සහ ඉටු නොවන ඉලක්ක ගැනත්, අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන කොට කාලාන්තරයක් තිස්සේ ලබා දුන් පොරොන්දු පිළිබඳවත් බොහෝ කරුණු කියන්න තිබුණත්, මම ඒ ගැන අද අවධානය යොමු කරන්නේ නැහැ. මොකද, පසු ගිය දිනක වෙළෙඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙන වෙලාවේදී, සීනි සඳහාවූ ආනයනික බදු ඉවත් කිරීම සහ ඒ හරහා සිදු වූ මහා පරිමාණ ගනුදෙනුවක් පිළිබඳව මම පාර්ලිමේන්තුවේදී කරුණු ඉදිරිපත් කළ නිසා. එදා වෙළෙඳ අමාත්‍යවරයා හෝ එතුමාගේ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හෝ ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරයි කියා මා බලාපොරොත්තු වුණා. ඒ මොහොතේත් රාජ්‍ය නිලධාරින්ගේ නිල මැදිරියේ සතොස සභාපති නුෂාඩ් පෙරේරා සිටියා. ඔහුට හැකියාව තිබුණා, මම ඉදිරිපත් කළ කරුණු වැරදි නම්, ඒ පිළිබඳව වෙළෙඳ අමාත්‍යවරයා හරහා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න. ඒ වෙනුවට නුෂාඩ් පෙරේරා කළේ මොකක්ද? මම පාර්ලිමේන්තුවේ කරුණු කිව්වාට පසුව ඔහු එළියට ගොස් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා එයට පිළිතුරු ලබා දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම අද නැවතත් මේ ආනයනික සීනි ගනුදෙනුව පිළිබඳව කරුණු ඉදිරිපත් කරනවා. වෙළෙඳ අමාත්‍යාංශයට වාගේම මුදල් අමාත්‍යාංශයටත් මෙයට සම්බන්ධතාවක් තිබෙන නිසා ඒ කරුණු එකින් එක මම ඉදිරිපත් කරන්නම්. පසු ගිය මැයි මාසයේ 23වන දා, එතෙක් අපේ රටේ සීනි කිලෝග්‍රෑම් එකකට පනවා තිබුණු රුපියල් 33ක බද්ද රුපියල් 50 දක්වා වැඩි කළා, ගරු සභාපතිතුමනි. ඒ බද්ද රුපියල් 50 දක්වා වැඩි කරන කොට ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ කරුණු කීපයක් තිබුණා. ඉන් පළමු කාරණය තමයි, අපේ රටේ සීනි විශාල ප්‍රමාණයෙන් නීති විරෝධී මත්පැන් පෙරීමට යනවා, එය වැළැක්විය යුතුයි කියන එක. අපේ රටේ සීනි කර්මාන්තය දියුණු කරන්න නම්, මේ බද්ද පැනවිය යුතුයි කියන එක තමයි දෙවැනි කාරණය වශයෙන් කිව්වේ. සැබැවින්ම, අපේ රට මුහුණ දී තිබෙන ඩොලර් හිඟය මෙන්ම ආනයන වියදම පාලනය කිරීම සඳහා මෙම බදු පැනවිය යුතුයි කියලාත් කිව්වා. එම නිසා ආණ්ඩුව පසු ගිය

[ගරු අනුර දිසානායක මහතා]

කාලය පුරාවටම ආනයන වියදම් අවම කිරීම වෙනුවෙන් තීන්දු ගනු ලැබුවා. සමහර භාණ්ඩ ආනයනය සම්පූර්ණයෙන් නතර කළා. කහ වැනි දේවල් ආනයනය සම්පූර්ණයෙන් නතර කළා. වාහන ආනයනය, ඒ හා යැපුණු වෙළෙඳ ප්‍රජාව විශාල අසීරුතාවකට පත්වී තිබියදීත් නතර කළා. සමහර භාණ්ඩවල ආනයන බද්ද වැඩි කළා. සමහර භාණ්ඩවලට යම් බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දුන්නා, ආනයනය කරන්න.

මේ අර්බුදයට ආණ්ඩුවේ පිළියම බවට පත්වී තිබුණේ, ආනයන පාලනය කිරීම සඳහා බදු ඉහළ නැංවීම, ආනයනය තහනම් කිරීම සහ යම් බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම වැනි ක්‍රම. එසේ තිබියදී, සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා මැයි මාසයේ 23වන දා රුපියල් 50 දක්වා වැඩි කරන ලද බද්ද පසුගිය ඔක්තෝබර් මාසයේ 13වන දා ශත 25 දක්වා අඩු කළා. මම ඒක පැහැදිලි කරන්න ඕනෑ. සියලු භාණ්ඩවල බදු වැඩි කර තිබියදී, බොහෝ භාණ්ඩ ආනයන සීමා කර තිබියදී, සීනිවල බද්ද රුපියල් 50 සිට ශත 25 දක්වා අඩු කළා. ඒ කියන්නේ, සීනිවල බද්ද මුළුමනින්ම පාහේ ඉවත් කළා.

එම බද්ද ඉවත් කරලා, ජනාධිපති මාධ්‍ය ඒකකය -අපේ රටේ අද බඩු මිල තීරණය කරන්නා- නිවේදනයක් නිකුත් කරලා කිව්වා, එතැන් සිට -13වන දා රාත්‍රියේ සිට- අපේ රටේ සීනි කිලෝග්‍රෑම් එකක් රුපියල් 85යි, සැමන් ටින් එකක් රුපියල් 200යි කියලා. ඒ අවස්ථාවේ පරිප්පුවලට සහ ලොකු ලූනුවලටත් මිලක් නියම කළා. මේ බදු අඩු කිරීම සම්බන්ධයෙන් පැවති ඒ සාකච්ඡාවට මුදල් අමාත්‍යතුමාත් සම්බන්ධ වුණාද කියලා මම දැනගන්න කැමතියි.

ඉන් අනතුරුව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැසට් එකක් සකස් කොට, මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කර එයට අත්සන් අරගෙන සීනිවල බද්ද ශත 25 දක්වා අඩු කළා. සීනිවල බද්ද ශත 25 දක්වා අඩු කරන විට, ඒ වනවිටත් පාරිභෝගික අධිකාරිය රුපියල් පනහේ බද්දට යටත්ව ලංකාවට කොච්චර සීනි ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙනවාද කියලා තොග ආනයනය කරන්නන් ළඟට ගිහිල්ලා අපි සමීක්ෂණයක් කළා, ගරු සභාපතිතුමනි. ඒ සමීක්ෂණය කරන කොට, රුපියල් 50ක බද්ද තිබුණු කාලයේ ගෙනාපු සීනි මෙට්‍රික්ටොන් 90,000ක් ගබඩාවල තිබුණා. ඒ කියන්නේ, ඔක්තෝබර් 14වන දා වනකොට සීනි මෙට්‍රික්ටොන් 90,000ක් තිබෙනවා. හැබැයි, ඒ සීනි කිලෝග්‍රෑම් එකකට රුපියල් 50ක බද්දක් ගහලා තිබෙන්නේ. රුපියල් 85ට සීනි දෙන්න කියලා දැන් ආණ්ඩුව කියනවා. හැබැයි, රුපියල් 50කම බද්දක් ගහලා ගෙනාපු සීනි මෙට්‍රික්ටොන් 90,000ක් තිබුණා. එම නිසා එතැන වියවුලක් නිර්මාණය වුණා. ඒ නිසා කිසිසේත්ම රුපියල් 85ට සීනි දෙන්න බැරි වුණා. රුපියල් 85ට කොහේවත් සීනි නැහැ. අන්තිමට සතොස සීනි කිලෝග්‍රෑම් එක රුපියල් 85 ගණනේ දෙන්න පටන් ගත්තා. වෙළෙඳ අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කිව්වා, ගෙදරට මාසයකට සීනි කිලෝග්‍රෑම් එකක් ඇති කියලා. එහෙම නේ, වුණේ.

ඊට පස්සේ, ඔක්තෝබර් මාසයේ 27වන දා නැවත ජනාධිපතිවරයාත්, නුෂාඩ් පෙරේරාත්, භාණ්ඩාගාර ලේකම් ආටිගල මහත්මයාත්, ආනයනකරුවනුත් අතර සාකච්ඡාවක් පැවැත්වුණා. ඒ සාකච්ඡාවේදී මේ අර්බුදය පෙන්වා දෙනු ලැබුවා. රුපියල් පනහේ බද්ද යටතේ ගෙනාපු සීනි තිබෙනවා; ශත 25 බද්ද යටතේ සීනි එමින් තිබෙනවා. මේ අර්බුදයට විසඳුම මොකක්ද කියලා එතැනදී සාකච්ඡා කළා. ඒ අනුව, නැවත රුපියල් 40ක බද්දක් සීනිවලට පනවන්න එදා තීරණය කළා. ඒ අනුව, පසුව දා වෙළෙඳ අමාත්‍යවරයා හමු වෙලා, මේ රුපියල් 40 බද්ද පැනවීම ගැන සාකච්ඡා කළා. වෙළෙඳ අමාත්‍යවරයා විසින් පෙන්වා දෙනු ලැබුවා, වෙළෙඳ බද්දක් ගැහුවාට පස්සේ මාසයක් යනතුරු වෙනස් කරන්න බැහැ කියලා. මේ ශත විසිපහේ බද්ද ඔක්තෝබර් මාසයේ 13වන දා තමයි පැනෙව්වේ. නොවැම්බර් මාසයේ 13වන දා දක්වා එය වෙනස් කරන්න බැහැ.

ඊට පස්සේ, ආනයන - අපනයන පාලක හරහා සීනි නිකුත් කිරීම සඳහා වරායෙන් යම් බලපත්‍ර ක්‍රමයක්, ලයිසන් එකක් හඳුන්වා දෙන්න වෙළෙඳ අමාත්‍යාංශය තීරණයක් ගත්තා. ඒ ලයිසන් එක දීම තුළින් සිද්ධ වුණේ මොකක්ද? ශත 25ක බද්දට ගෙනාපු සීනි, ඔක්තෝබර් මාසයේ 30වන දා සිට නොවැම්බර් මාසයේ 22වන දා දක්වා වරායෙන් නිකුත් කරන්න දුන්නේ නැහැ. නොවැම්බර් මාසයේ 13වන දාට පස්සේ නැවත රුපියල් 40 බද්ද ගහනවා කියලා ආණ්ඩුව කිව්වා. හැබැයි, රුපියල් 40ක ඒ බද්ද ගැහුවේ නැහැ. නොවැම්බර් මාසයේ 22වන දායින් පස්සේ බලපත්‍ර හරහා නැවත ශත 25ක බද්දට සීනි ආවා. ඒකයි, කථාව. මේ කථාවට අනුව, ගනුදෙනුව සිදු වී තිබෙන්නේ කොහොමද කියලා බලන්න.

ගරු සභාපතිතුමනි, මේකට සතොස සභාපති නුෂාඩ් පෙරේරාගේ සම්බන්ධය කුමක්ද? ඔබතුමා දන්නවා, වෙළෙඳ අමාත්‍යවරයාටත් ජනාධිපතිවරයා හම්බ වෙන්න නොහැකි බව. හැබැයි, මේ නුෂාඩ් පෙරේරා ජනාධිපතිවරයාගේ 'වියත් මග' කවයේ කෙනෙක්. අමාත්‍ය මණ්ඩලය හිටියාට තීන්දු ගන්නේ ඒ ගොල්ලන්. රුපියල් 85ට සීනි දෙන්න කියා තිබියදී, ඔක්තෝබර් මාසයේ 13වන දා සතොස රුපියල් 127.49ට සීනි මෙට්‍රික්ටොන් 700ක් ගත්තා. රුපියල් 127.49ට අරගෙන සතොස රුපියල් 85ට සීනි දෙනවා. ඔක්තෝබර් මාසයේ 15වන දා තවත් මෙට්‍රික් ටොන් 700ක් රුපියල් 121.50ට ගන්නවා. සතොස රුපියල් 121.50ට සීනි අරගෙන රුපියල් 85ට පාරිභෝගිකයන්ට දෙනවා.

ඔක්තෝබර් මාසයේ 20වන දා රුපියල් 92ට සජාඩ් මවුසුන්ගෙන් -ෂැන්ග්‍රි-ලා සමාගමේ සභාපතිවරයාගෙන්- සීනි මෙට්‍රික්ටොන් 750ක් ගන්නවා. ඊළඟට, ඔක්තෝම්බර් මාසයේ 22වන දා සතොස රුපියල් 110ට තවත් සීනි මෙට්‍රික්ටොන් 600ක් ගන්නවා. බදු අඩු කරලා, රුපියල් 85ට සීනි දෙන්න කියනවා. රුපියල් 85ට සීනි දෙන්න නම් අඩුම තරමින් රුපියල් 80ටවත් තොග මිලදී ගන්න ඕනෑ, ගරු සභාපතිතුමනි.

හැබැයි, රුපියල් 80ට ගන්න ඕනෑ සීනි, සභාපතිවරයා රුපියල් 121ට ගන්නවා; 127ට ගන්නවා; 110ට ගන්නවා. අරගෙන, රුපියල් 85ට සතොසෙන් දෙනවා. එහෙම වෙන්නේ කොහොමද? ආණ්ඩුව, සීනිවල පාලන මිල රුපියල් 85යි කියනවා. හැබැයි, සතොස සීනි මිලදී ගන්නේම රුපියල් 121ට. ආණ්ඩුව සීනි පාලන මිල රුපියල් 85යි කියනවා; සතොස මිලදී ගන්නේම රුපියල් 127.50ට. කොහොමද එහෙම වෙන්නේ?

ගරු සභාපතිතුමනි, අවුරුදු 30කින් ලංකාවට සීනි නැවක් ඇවිල්ලා නැහැ. හැබැයි, පසුගිය නොවැම්බර් මාසයේ 02වන දා මෙට්‍රික්ටොන් 26,000ක සීනි නැවක් ආවා. කවුද, ඒක ගෙනාවේ? සජාඩ් මවුසුන්. ශත 25 බද්දට සීනි මෙට්‍රික්ටොන් 26,000ක් ආවා. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි, ඔවුන් ශත 25 බද්දට මේ වෙනකොට සීනි මෙට්‍රික්ටොන් 37,000ක් ගෙනැවිත් තිබෙනවා. ලබන 12වන දා තවත් සීනි මෙට්‍රික්ටොන් 22,500ක නැවක් වරායට එනවා. ඒ, සජාඩ් මවුසුන්ගේ Wilmar Trading Pte. Ltd. එකෙන් ගෙනෙන සීනි. මේ වෙනකොටත් ඉන්දියාවේ තවත් නැවකට සීනි මෙට්‍රික් ටොන් 13,500ක් පටවනවා, සජාඩ් මවුසුන්ගේ Wilmar Trading Pte. Ltd. එකෙන්. ආසන්න වශයෙන් ගත්තොත්, ශත 25 බද්දට සීනි මෙට්‍රික් ටොන් 73,000ක් ගේනවා. මේ වෙනකොට එයින් මෙට්‍රික්ටොන් 37,000ක් ගෙනැවිත් තිබෙනවා. තවත් මෙට්‍රික්ටොන් 38,000ක් ගේන්න

තිබෙනවා. ලබන 12වන දා වෙනකොට එයින් තවත් මෙට්‍රික්ටොන් 22,500ක් එනවා. තව ප්‍රමාණයක් තව සතියකින් එනවා.

මේ, ශත 25 බද්ද හොඳයි. තමුන්නාන්සේලා හිතුවා, පාරිභෝගිකයාට අඩු මිලට සීනි දෙන්න ඕනෑ කියලා. දැන් අඩු මිලට සීනි දෙනවාද? රුපියල් 85ට සීනි තිබෙන්නේ කොහේද? සතොස රුපියල් 85ට කිලෝ එකක් දෙනවා. හැබැයි, ඒ 127ට ගත්තු සීනි; 121ට ගත්තු සීනි; 110ට ගත්තු සීනි. සීනි කිලෝග්‍රෑම් එක රුපියල් 135කට තිබුණේ. රුපියල් 50ක බද්ද අඩු වුණාම සීනි කිලෝ එක රුපියල් 85ට දෙන්න පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, සීනි කිලෝ එක රුපියල් 85ට දෙන්නේ නැහැ. අදත් වෙළෙඳ පොළේ සීනි කිලෝ එකක් රුපියල් 115යි; 120යි. දැන් කවුද මේ ලාභය උපයන්නේ? මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආටිගල කලබලේ ගිහිල්ලා, මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයාගෙන් අත්සන් ගත්තා. මුදල් ඇමතිවරයා හැටියට මේ ගැසට් එක අත්සන් කරන්න ඔහුටයි බලය තිබෙන්නේ. මේ අත්සන ගන්න කොට රුපියල් 85ට සීනි ලබා දීම සඳහා තිබුණු වැඩ පිළිවෙළ මොකක්ද? මේකෙන් විතරක් විල්මා ආයතනය මෙට්‍රික්ටොන් 73,000කින් අතිරේක ලාභයක් උපයනවා. 73,000 වැඩි කිරීම 50. ගණන් හදලා බලන්න. සීනි මෙට්‍රික්ටොන් 90,000ක් මේ වෙන කොට ඇවිල්ලා තිබෙනවා. ඒ මෙට්‍රික්ටොන් 90,000න් ආණ්ඩුවට බදු කෝටි 450ක් අහිමි වෙලා තිබෙනවා. ආණ්ඩුව බදු අහිමි කරගෙන, ජනතාවට සහනයක් දුන්නා වෙන්න පුළුවන්. හැබැයි, ජනතාවට රුපියල් 85ට සීනි නැහැ! එක්කෝ ආණ්ඩුවට රුපියල් 50 බද්ද යන්න ඕනෑ. එහෙම නැත්නම් පාරිභෝගිකයන්ට රුපියල් 85ට සීනි දෙන්න ඕනෑ. නමුත් රුපියල් 85ට සීනිත් නැහැ, ආණ්ඩුවට බද්දත් නැහැ.

ගරු සභාපතිතුමනි, වසරකට අපි සීනි ආනයනය කරන්නේ සාමාන්‍යයෙන් මෙට්‍රික්ටොන් ලක්ෂ හයහමාරක් විතර. හැබැයි, මේ ඔක්තෝබර් මාසයේ 13වැනි දා ශත 25 දක්වා සීනි බද්ද අඩු කිරීමේ සිට මේ මාස දෙක ඇතුළත වෙන කොට දැනට මෙට්‍රික්ටොන් ලක්ෂ දෙකකට ආසන්න සීනි ආනයනය කරමින් තිබෙනවා; නැව්වලට පටවමින් තිබෙනවා. කවුරු වෙනුවෙන්ද? සජාඩ් මව්සුඩ් වෙනුවෙන්. ෂැන්ග්‍රි ලා ආයතනය දුන්නා, "වියත්මඟ"ට අඩු මිලට රැස්වීම් තියන්න. ඒවායේ ගෙවීම් තමයි භාණ්ඩාගාරය මේ ගෙවමින් තිබෙන්නේ. ආණ්ඩුව සත 25 දක්වා බද්ද අඩු කළා නම්, රුපියල් 85ට සීනි දෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් රුපියල් 85ට සීනි දෙන්න තොග වෙළෙන්දාට රුපියල් 80ටවත් දෙන්න ඕනෑ. ආනයනකරුවා රුපියල් 75ටවත් තොග වෙළෙන්දාට දෙන්න ඕනෑ. තොග වෙළෙන්දා දෙන්න ඕනෑ, රුපියල් 80ට. රුපියල් 80ට සීනි දුන්නොත් තමයි සිල්ලර වෙළෙන්දාට රුපියල් 85ට විකුණන්න පුළුවන්කම තිබෙන්නේ. දැන් එහෙම දෙයක් වෙලා තිබෙනවාද? මේ 90,000න් විතරක් ආණ්ඩුවට බදු අහිමි වී තිබෙනවා, කෝටි 450ක්. ලක්ෂ දෙකක් වුණොත් කෝටි 1,000ක් බදු අහිමි වෙනවා. රුපියල් බිලියන 10ක බද්දක් ආණ්ඩුවට අහිමි වෙනවා.

ආණ්ඩුව ජනතාව වෙනුවෙන් කල්පනා කරලා බද්ද අහිමි කරගෙන ජනතාවට අඩු මිලට සීනි දෙන්න ඕනෑ නම්, අඩු මිලට සීනි දෙන්න. හැබැයි, අද ආණ්ඩුවට බද්දත් නැහැ; ජනතාවට අඩු මිලට සීනිත් නැහැ. සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ජාවාරම්කාර කුප්‍රකට කණ්ඩායමක් ආණ්ඩුවේ භාණ්ඩාගාරයට ලැබෙන්න ඕනෑ ධනය වෙන පාරවලින් තමන්ගේ ව්‍යාපාරවලට හරවා ගෙන තිබෙනවා. මෙන්න මේක තමයි මම එදා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කළේ. මේකට උත්තර දෙන්න ඕනෑ කවුද? මේ කාරක සභා අවස්ථාවේ ඒකට උත්තර දෙන්න ඕනෑ, බන්දුල ගුණවර්ධන වෙළෙඳ අමාත්‍යවරයා. අද නම් උත්තර දෙන්න ඕනෑ කවුද? මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ අගමැතිවරයා හෝ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල්. එහෙම නැත්නම් ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. හැබැයි, මට උත්තර දුන්නේ කවුද? මට උත්තර දුන්නේ, නුෂාඩ් පෙරේරා මාධ්‍ය සාකච්ඡාවක් තියලා. පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහනවා, ඇමතිගෙන්. මට හොරුන්ගේ මාධ්‍ය සාකච්ඡා වැඩක් නැහැ. සත 25ට බදු අඩු කරන්න කියන යෝජනාව ජනාධිපතිවරයාට කළේ, නුෂාඩ් පෙරේරා. මේක තමයි ඇත්ත කථාව. මුදල් ඇමතිතුමා ඒක දන්නවාද අහන්න. එතුමා ඒ සාකච්ඡාවක හිටියාද අහන්න. මුදල් රාජ්‍ය අමාත්‍යවරයා ඒ සාකච්ඡාවේ හිටියාද අහන්න? මුදල් අමාත්‍යවරු ඒ සාකච්ඡාවල ඉන්නේ රූකඩ විධියට. තීන්දුව ගත්තේ නුෂාඩ් පෙරේරායි, ජනාධිපතිවරයායි, තව නිලධාරින් දෙන්නෙකුයි.

මේ මාස දෙක ඇතුළත රජයට බිලියන 10කට ආසන්න බදු ප්‍රමාණයක් අහිමි වෙනවා. මම තමුන්නාන්සේලාගෙන් එක් කාරණයයි අහන්නේ. සියලු භාණ්ඩවල බදු වැඩි කරන කොට, සමහර භාණ්ඩ ආනයන සීමාකරන කොට, සමහර භාණ්ඩ ආනයන නතර කරන කොට මේවායේ බදු අඩු කළේ ඇයි? වාහන ගෙනෙන්න දෙන්නේ නැහැ. කහ කුඩු ගෙනෙන්න දෙන්නේ නැහැ. මෝටර් සයිකල් ගෙනෙන්න දෙන්නේ නැහැ. සුවඳ විලවුන් වර්ග ගෙනෙන්න දෙන්නේ නැහැ. ඒ සමහර භාණ්ඩවල බදු වැඩි කළා. සමහර භාණ්ඩවලට බලපත්‍ර ඉල්ලුවා. හැබැයි, ඔක්කෝම අස්සේ සීනිවල බද්ද විතරක් සත 25ට විතරක් අඩු කළේ ඇයි? ඒක පැහැදිලි කරන්න. ඒ ඔක්කෝම අස්සේ සීනිවල බද්ද අඩු කළේ ඇයි? ඒක පැහැදිලි කරන්න. මේ ගනුදෙනුවට තමයි ඒ අඩු කළේ. මම දැක්කා, ජනාධිපතිවරයා දූෂණ විරෝධී දිනයේ ප්‍රකාශ කරලා තිබුණා, අපේ රටේ සිදුවන දූෂණ ජනතාව ඉවසන්නේ නැහැ කියලා. අන්න ඒ ඉවසන්න බැරි එකේ කෝපය තමයි මේ ප්‍රකාශ කරන්නේ. ඒක මතක තබා ගන්න. දූෂණයට අනුබල දෙමින්, එතුමා දූෂිතයාට රැකවරණය දෙමින්, දූෂණය සඳහා ඉඩකඩ ලබන තීන්දු තීරණ ගැනීම සඳහා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැදිහත් වෙමින්, දූෂණ විරෝධී දිනයේදී කියනවා, දූෂණයට ජනතාව විරුද්ධයි කියලා. ඒක දැනගෙන ඉන්න එක හොඳයි කියලායි, මා එතුමාට කියන්නේ.

ඊළඟ ගනුදෙනුව කොහොමද සිද්ධ වෙන්නේ? ඊළඟ කාරණය තමයි, මහජන උපයෝගිතා කොමිසම අහෝසි කිරීම. මහජන උපයෝගිතා කොමිසම කොහොමද අහෝසි කරන්නේ? ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර මහත්මයා 2010 දෙසැම්බර් මාසයේ 01 දා මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආටිගල මහත්මයාට ලිපියක් යවනවා. ගරු සභාපතිතුමනි, මම ඒ ලිපිය හැන්සාඩ්ගත කිරීම සඳහා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ ලිපිය යවලා මොකක්ද කියන්නේ? මහජන උපයෝගිතා කොමිසම අකර්මණ්‍ය කරන්න කියනවා. ජනාධිපති ලේකම්වරයකුට පුළුවන්ද, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආටිගල මහත්මයාට ලියුමක් යවා මහජන උපයෝගිතා කොමිසම අඩාළ කරන්න? මහජන උපයෝගිතා කොමිසම පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කළ ආයතනයක්.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු සභාපතිතුමනි, පසු ගිය ආණ්ඩුවේ හිටපු ගරු රවි කරුණානායක මහත්මයා මෙගාවොට් 200ක barges දෙකක් ගෙනෙන්න හැදුවා. Barges දෙකක් ගෙනැවිත්, ඒකකයක් රුපියල් 26 බැගින් විදුලිය මිලදී ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කරන්න හැදුවා. කැබිනට් මණ්ඩලය එය අනුමත කළා. ඒක මිලදී ගන්න කැබිනට් මණ්ඩලය කැබිනට් පත්‍රිකා 7ක් සම්මත කළා. හැබැයි, මහජන උපයෝගිතා කොමිසම කිව්වා, එය රටට බරක් කියලා. රවි කරුණානායක මහත්මයා කිව්වා, විශාල නියඟයක් එනවා. ජල හිඟයක් ඇති වෙනවා. විශාල විදුලි අර්බුදයක් නිර්මාණය වෙනවා. එම නිසා barges දෙකක් ගෙනැවිත්, මෙගාවොට් 200 එකක් කොළඹ වරායේත්, අනික් මෙගාවොට් 200 එක ගාලු වරායේත් ස්ථාපිත කරන්න ඕනෑ කියලා. ඒ සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය දුන්නා. හැබැයි මහජන උපයෝගිතා කොමිසම ඒක නතර කළා. මහජන උපයෝගිතා කොමිසම හැම වෙලාවේම ජනතාව වෙනුවෙන් පෙනී හිටපු කොමිසමක්. එය අහෝසි කරන්න මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට තිබෙන බලය මොකක්ද?

අමාත්‍යාංශ විෂයයන් බෙදීමේදී එම ආයතනය ගැසට් කර තිබෙන්නේ මුදල් ඇමතිවරයා යටතටයි. මුදල් ඇමතිවරයා යටතට ගැසට් කර තිබෙන එම ආයතනය වසා දමන්න කියලා පී.බී. ජයසුන්දර මහත්මයා ලියුමක් යවනවා. පී.බී. ජයසුන්දර මහත්මයා එම ආයතනය එහෙම වහන්නේ කොහොමද කියලා මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් මා දැනගන්න කැමැතියි.

ආටිගල මහත්මයාගේ දැනුවත්කමට, එතුමාගේ අධ්‍යාපනයට මා ගරු කරනවා. එතුමා අපේ රටේ දරා තිබෙන නිලතලවලට මගේ ගරු කිරීමක් තිබෙනවා. හැබැයි, මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිවරයා ඇතුළු කණ්ඩායමට එතුමා දුරකථනවලින් කථා කරලා, ඔවුන්ට අස්වෙන්න කියන්නේ කොහොමද? මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිවරයා පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරයා. එහි එක සාමාජිකයෙක් මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිවරයා. එවැනි ඉතා වැදගත් නිලධාරින් කණ්ඩායමක් මහජන උපයෝගිතා කොමිසමේ ඉන්නවා. ඔවුන් ඉවත් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි, ගරු සභාපතිතුමනි. අමාත්‍යවරයා විසින් ඔවුන්ට විරුද්ධව චෝදනා පත්‍ර ඉදිරිපත් කරලා, ඒ චෝදනාවලට පිළිතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ පිළිබඳ වාර්තාවක් ඇමතිවරයා ඉදිරිපත් කරලා, ඊට පස්සේ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා, පාර්ලිමේන්තුවේ බහුතර අනුමැතියකින් විතරයි කොමිසමේ සාමාජිකයෙක් ඉවත් කරන්න පුළුවන්. නමුත් අද මහ ජනයා වෙනුවෙන් ගොඩනඟන ඒ කොමිෂන් සභා අහෝසි කරනවා. ගරු සභාපතිතුමනි, මෙගාවොට් 300ක බලාගාරයක් පිළිබඳ තිබෙන ගනුදෙනුවේ ඊළඟ පියවර මහජන උපයෝගිතා කොමිසම අහෝසි කිරීමයි. වංචාවට, දූෂණයට තිත තබනවාය කියන්නේ, දූෂණ විරෝධී දිනයේදී නිවේදන නිකුත් කිරීම නොවෙයි. තමන්ට පැවරී තිබෙන ජනාධිපති බලතල පාවිච්චි කරලා, දූෂණ ක්‍රියාමාර්ග වැළැක්වීම සඳහා තීන්දු ගැනීම තමයි ඒ වගකීම වෙන්නේ කියා ප්‍රකාශ කරමින් මා නතර වෙනවා.

මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ගරු ජගත් කුමාර මහතා
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
ගරු සභාපතිතුමනි, මට කිව්වේ විනාඩි 10ක් තිබෙනවාය කියලායි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, උදේ වරුවේ ගතවුණු කාලය අනුව තමයි කාලය කළමනාකරණය කරලා තිබෙන්නේ. අද නියමිත වෙලාවට සභාවේ කටයුතු අවසන් කරන්න අවශ්‍ය වෙනවා. ඒ නිසා හැම කෙනකුගේම වෙලාව අඩු වුණා.

[අ.භා. 12.15]

ගරු ජගත් කුමාර මහතා
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා 2021 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කරමින්, මේ රටේ සියලු අංශ සංවර්ධනය කරන බවත්, ජාතිය අලුත් ගමනක් කරා ගෙනයන බවත් ප්‍රකාශ කළා වාගේම ඒ සඳහා වැඩ පිළිවෙළකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මෙවර අය වැයේ අපි දකින සාධනීය ලක්ෂණ ගණනාවක් තිබෙනවා. පසුගිය කාලයේ මේ රටේ දරුණු ත්‍රස්තවාදයක්, යුද්ධයක් තිබුණා. ඒ යුද්ධය අවසන් කළේත් වෙන කිසිවෙක් නොවෙයි. මේ රටේ විවිධ රාජ්‍ය නායකයන් සිටියා, විවිධ ආණ්ඩු තිබුණා, විවිධ හමුදාපතිවරුන් සිටියා.

මේ සියල්ල මැද්දේ ඒ ත්‍රස්තවාදී යුද්ධය අවසන් කරන්න නායකත්වය දුන්නේත් එදා ජනාධිපති හැටියට හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එවකට ආරක්ෂක ලේකම් හැටියට හිටපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යි.

අද අපේ රට ගම් මට්ටමින් ආර්ථික පරිහානියකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඊළඟ ප්‍රශ්නය හැටියට අපට තිබෙන්නේ මේ රටේ දුප්පත්කම නැති කිරීම සහ මේ රටින් මත් ද්‍රව්‍ය උවදුර නැති කිරීමයි. අපි ආර්ථික වශයෙන් මේ රට ස්වයංපෝෂිත තැනකට, සංවර්ධනීය තැනකට ගෙන යා යුතුයි. ඒ යුගමය යුතුකම ඉටු කරන්නත් නායකත්වය දෙන්න පුළුවන්කම තිබෙන්නේ අද වෙන කාටවත් නොවෙයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට සහ මහින්ද රාජපක්ෂ අගමැතිතුමාටයි. එතුමන්ලාගේ නායකත්වය තුළ අද රටේ ජනතාවට විශාල විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා, එතුමන්ලා මේ රට ඉදිරියට ගෙන යයි කියලා.

පසුගිය කාලයේ යහ පාලන ආණ්ඩුව දිනෙන් දින මේ රට අගාධයකට ගෙනගියා. එතුමන්ලාගේ පසුගිය ආණ්ඩු කාලයේ කථාවලදී කිව්වා, මේ රට වඩාත් ශක්තිමත් හොඳ තැනකට ගෙනයනවා කියලා. හැබැයි, ඒ ආණ්ඩුව මේ රටේ ජනතාව ගෙන ගියේ මිනී සොහොන් කරායි. හැබැයි, මේ රට නැවත මුදවා ගන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒ පුළුවන්කම තිබෙන්නේත් එදා වාගේම අදත් මේ අපේ ආණ්ඩුවටයි.

අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි, යුද්ධයෙන් පස්සේ මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය වන දිළිඳුකම නැති කිරීම. ඒ සඳහා මේ රටේ තිබෙන ප්‍රධාන සාධනීය වැඩ පිළිවෙළ තමයි සමෘද්ධි ව්‍යාපාරය. සමෘද්ධි ව්‍යාපාරය තුළින් මේ රටේ දුප්පතුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ගෘහ ඒකක ශක්තිමත් කරන්න, ඔවුන්ගේ ජීවිතය වඩාත් හොඳ තැනකට ගේන්න අද මේ අය වැය තුළින් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. එක් පැත්තකින් පවුල් ලක්ෂ දෙකක්

වෙන් වෙන්ව හඳුනාගෙන ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න රුපියල් මිලියන 10,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, පවුල් 25,000ක් වෙනම සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක තවත් මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, අපි ආණ්ඩුව පිහිටුවනකොට මේ රටේ ජනතාවට බලාපොරොත්තුවක් දුන්නා. මොකද, පසුගිය යහ පාලන ආණ්ඩුව දිගින් දිගටම කළේ සමෘද්ධි සහනාධාර තමන්ගේ හිතවතුන්ට පමණක් ලබාදීමයි. නමුත් ඒ වැඩ පිළිවෙළ නවත්වලා ජාති, වර්ග, කුල මල බලන්නේ නැතිව, පක්ෂ පාට බලන්නේ නැතිව සියලුදෙනාටම සාධාරණය ඉෂ්ට කරනවා කියලා අපි පොරොන්දු වුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉදිරි කාලපරිච්ඡේදය තුළ මේ රටේ සහනාධාර ලැබිය යුතු අනෙකුත් සුදුසුසන්ට සහනාධාර ලබාදීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියලා.

සමෘද්ධි ව්‍යාපාරය තුළ විශාල සේවාවක් කරන සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න පසුගිය ආණ්ඩුව ඇතුළේ වසර ගණනාවක් දික් ගැහුණා. හිඟන්නාගේ තුවාලය වාගේ සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න විසඳන්නේ නැතිව ඉතා කුහක විධියට කටයුතු කළා, පහුගිය යහ පාලන ආණ්ඩුව. ඒ නිසා අද අතිගරු ජනාධිපතුමාගේ සහ අගමැතිතුමාගේ නායකත්වය යටතේ ගරු ශෙහාන් සේමසිංහ අමාත්‍යතුමා සහ අපි සියලුදෙනා එකතු වෙලා සමෘද්ධි නිලධාරින්ගේ ප්‍රශ්න ටික විසඳන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ නිලධාරින්ගේ අවශ්‍යතා විසඳන්න, ඕනෑකම් ඉෂ්ට කරන්න, ඔවුන්ගේ රාජ්‍ය සේවයේ සුරක්ෂිතතාව ලබාදීමේ කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා. අපි හිතනවා, ඊළඟ අය වැය වෙනකොට කිසිදු ගැටලුවක් නැතිව ඔවුන්ට යහපත් හෙටක් හදන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා. අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ රටේ සමෘද්ධි ව්‍යාපාරයෙන් රට සංවර්ධනය කරන්න විශාල බලාපොරොත්තු රාශියක් තිබුණු මේ ආණ්ඩුව සමෘද්ධි ව්‍යාපාරයේ සියලු නිලධාරින්ගේ ශක්තිය එකතු කර ගන්නා බව. රජයෙන් අපි ඉල්ලන්නේ මේ රටේ දුප්පත්කම මැඩලීමේ යුතුකම ඉටු කරන මේ නිලධාරින්ගේ අයිතිවාසිකම් ඉක්මනින් විසඳන්න කියලායි.

මෙතැන කථා කරපු යහ පාලන ආණ්ඩුවේ හිටපු බොහෝ දෙනා අද අලුත් විපක්ෂයක් හැටියට පෙනී සිටිමින් කථා කරනවා. විපක්ෂය ඇතුළේ ඉන්න සමහර අය ආරක්ෂා කරන්නයි ඔවුන් එසේ කථා කරන්නේ. ශානි අබේසේකර ගැන ඊයේ දවසේම කථාබහ වුණා; ශානිගේ අයිතිවාසිකම් ගැන කථා වුණා. හැබැයි, ඒ ශානිම තමයි මේ රටේ රාජ්‍ය සේවය තුට්ටුවට දාලා, මේ රටේ නීතිය නමලා මේ රටේ ජනතාවට විහිළු සැපයුවේ.

අනෙක් පැත්තෙන් දූෂණ විරෝධී කමිටුව. දූෂණ විරෝධී කමිටුව කළේ එවකට සිටි විපක්ෂයට විරුද්ධව ගිහිල්ලා එවකට ආණ්ඩුවේ කටයුතු ඉෂ්ට කරපු එකයි. ඒ වාගේම, ශානිලා වැනි උදවිය රාජ්‍ය සේවකයන් නින්දාවට පත් වෙන විධියට රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ ගෙදර වළං සෝදන්නම් කියලා කියපු අය. එහෙම වළං සෝදන නිලධාරින් තමයි නීතියේ ඉහළ තැන්වල එදා වැජඹුණේ.

ඒ විතරක් නොවෙයි, එදා ආරක්ෂක ලේකම් විධියට හිටපු අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව පසුගිය ආණ්ඩුව ඇවිල්ලා ශානිලා, රන්ජන් රාමනායක යන සියලුදෙනාම එකතු වෙලා නඩු හැදුවා. ඒ නඩුවලදී එතුමා අල්ලස් කොමිසමට ගෙනියන්න අවශ්‍ය වැඩ කටයුතු සිද්ධ කරනකොට, අපිත් ඒ සමඟ එකතු වුණා. අනේ, දෙවියනේ! ඒ කොමිසමට ගියා කියලා අපටත් නඩු දැම්මා. ඒ අවස්ථාවට සහභාගි වුණා කියලා අපටත් නඩු දැම්මා. එහෙමයි නීතියේ සාධාරණය තිබුණේ. FCID එක ගැන කියනවා, දූෂණ මර්දන කමිටුව ගැන කියනවා. හැබැයි, ඔය කමිටුවල නීතියේ සාධාරණය තිබුණේ නැහැ.

මාත් අද සිටින විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට විරුද්ධව එදා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළා. ඒ විතරක් නොවෙයි, අපි එදා FCID එකට පැමිණිලි කළා. හැබැයි, ඒවා එකක්වත් විභාග වුණේ නැහැ, ගරු සභාපතිතුමනි. එදා නීතිය ක්‍රියාත්මක වුණා නම් ක්‍රියාත්මක වුණේ හරස් පැත්තට යමින්. එදා නීතිය වල් වදින තැනට පත් වුණා. ඒ විතරක් නොවෙයි, එදා නීතිය තමන්ට ඕනෑ ඕනෑ විධියට නවන්න පටන් ගත්තා.

එදා රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ හඬ පට ඇසුවාම අපට පෙනුණා, නීතිය කොතැනටද ගෙනිහින් තිබෙන්නේ කියලා. එතුමා එදා පත්මිණි රණවක විනිශ්චයකාරතුමියට කථා කරලා කියන්නේ, තමන්ට ඕනෑ විධියට විපක්ෂයේ අයගෙන් පළිගන්න කියලා. රන්ජන් රාමනායක මැතිතුමා විටෙක කියනවා, "මම වැඳලා කියන්නම් අපේ ආණ්ඩුව බේරා දෙන්න. විපක්ෂයේ අයට විරුද්ධව නඩු දාන්න" කියලා. එහෙම අය තමයි, අද නීතියේ සාධාරණය ගැන කථා කරන්නේ. එහෙම අය තමයි, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්නේ. පසුගිය කාලය පුරාවටම ඒ ආණ්ඩුවේ ඇත්තෝ කළේ, දිගින් දිගටම මේ රටේ ජනතාවගේ සහන කපපු එක සහ විපක්ෂයෙන් පළිගන්න එක.

පසුගිය දවස්වල විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනො සංශෝධනය ගෙරම ව්‍යවස්ථා සංෙන විට විපක්ෂ නායකතුමා ඇතුළු අය කිව්වේ මොකක්ද? "ගරු අගමැතිතුමාගේ අයිතිවාසිකම් වෙනුවෙන් තමයි අපි පෙනී සිටින්නේ" කියලා කිව්වා. හැබැයි, ගරු අගමැතිතුමා විතරක් නොවෙයි, ඒ පවුලේ සියලුදෙනා දේශපාලනය කරන එක නවත්වන්නයි ඔවුන් උත්සාහ කළේ. එතුමන්ලා දිගින් දිගට විවිධ නඩු කටයුතුවලට පැටලෙව්වා. සිරගෙවල්වලට ගෙන යන්න උත්සාහ කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ඇතුළු විවිධ කොමිෂන් සභා ඉදිරියට ගෙනියලා එතුමාට හිරිහැර කළා. ඒ විතරක් නොවෙයි, එතුමා දේශපාලනයෙන් ඉවත් කරන්න උත්සාහ දැරුවා. හැබැයි, මේ රටේ ජනතාව මේ රට රකින්න ඉන්න නායකයා එතුමා කියන විශ්වාසය තැබුවා. කිසිදු නායකයෙක් නොලබපු ආකාරයේ ජයග්‍රහණයක් එතුමා ලැබුවා. මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් එතුමා බලයට ගෙනැල්ලා, අද මේ ආණ්ඩුව හදලා තිබෙනවා.

ඒ වාගේම අපි මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, බැසිල් රාජපක්ෂ මැතිතුමාත්. එතුමාටත් විරුද්ධව නඩු දැම්මා. එතුමාට නඩු වැටුණේ මේ රටේ සමෘද්ධි ලබන ජනතාවට සහන දෙන්න ගිහිල්ලායි. එහෙම නැතිව සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් පෞද්ගලික පරිහරණයට අරගෙන නොවෙයි. පොදු දේපළ පනත යටතේ තමයි එතුමාට නඩු දැම්මේ. එතුමා ඒ සියල්ල කළේ, දුප්පතුන්ට යම් යම් සහන දෙන්න සහ නිවාස හදන්නයි. හැබැයි, දයා ගමගේ, සජිත් ප්‍රේමදාස මහත්මයලා එදා කළේ මොකක්ද? එතුමන්ලා සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් ගත්තේ, තමන්ගේ හිතවතුන්ට උදවු කිරීම සහ තමන්ගේ දේශපාලන ප්‍රතිරූප හදා ගන්නයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ජගත් කුමාර මහතා
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
සජිත් ප්‍රේමදාස මැතිතුමා සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අරගෙන, සමෘධි ව්‍යාපාරයේවත් නොවන එක්සත් ජාතික පාක්ෂිකයන්ට දුන්නා. ඒ අයට මුදල් දීලා, එතුමාට ඕනෑ විධියට

[ගරු ජගත් කුමාර මහතා]

දේශපාලන ප්‍රතිරූපය හදා ගත්තා. හැබැයි බැසිල් රාජපක්ෂ මැතිතුමා කළේ, එතුමාගේ ප්‍රතිරූපය හදා ගන්න එක නොවෙයි, දුප්පතුන්ට සහන දෙන එක.

ඒ විතරක් නොවෙයි, එදා දයා ගමගේ සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අරගෙන දිගින් දිගටම කළේ මේ රටේ දුප්පතුන්ට සහන දෙනවා වෙනුවට, තමන්ගේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

ගරු ජගත් කුමාර මහතා
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ සියලු දේ අරගෙන ඔවුන් කළේ මේ රටේ ජනතාවට අවශ්‍ය-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න. දිවා ආහාරය සඳහා සභාවේ වැඩකටයුතු නවත්වන්න පෙර තවත් ගරු මන්ත්‍රීතිබෙනවා. අනෙතුතු නවත්වන්න තිබෙ©වරයෙක් කථා කරන්න ඉන්නවා.

ගරු ජගත් කුමාර මහතා
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
ගරු සභාපතිතුමනි, එතුමන්ලා දිගින් දිගටම කළේ, සමෘද්ධි ව්‍යාපාරයේ මුදල් තමන්ගේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමයි. හරියට දුප්පතුන්ගේ කෑම පිඟානට හෙනහුරා වැටුණා වාගේ වැඩක්. දැන් කෑම ගැන කථා කළාට වැඩක් නැහැ. දුප්පතුන්ගේ කෑම පිඟානට හෙනහුරා වැටුණා වාගේ, දුප්පතුන්ගේ අරමුදල්වලින් තමයි යූඑන්පී එක එදා ඡන්ද කළේ. සජිත් ප්‍රේමදාස මහත්මයලා එදා මැතිවරණ ජයග්‍රහණය කරන්න ගියේ ඒ අරමුදල් අරගෙන. ඒ නිසා අද නිකම් බුදු වෙලා වාගේ කථා කළාට වැඩක් නැහැ. අද කථා කරනවා,- [බාධා කිරීම්] හක්කේ බුදු රැස්, මේ විපක්ෂයේ බොක්කෙ දඩමස්. ඒ නිසා අපි කියනවා, තමුන්නාන්සේලාගේ මේ දුක්ගන්නා රාළ න්‍යාය, කන්න ඕනෑ වුණාම කබරගොයත් තලගොයා කර ගන්නා න්‍යායක් බව. මේ රටේ ජනතාව ඒකට රැවටෙන්නේ නැහැ. රටේ ජනතාවට අවශ්‍ය නිවැරදි අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව රට සංවර්ධනය කරන්න අපේ ආණ්ඩුව කටයුතු කරනවා කියන කාරණාව මතක් කරමින් කථාව අවසන් කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 12.24]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු සභාපතිතුමනි, මට නියමිත වෙලාව දෙන්න. ඒ මන්ත්‍රීතුමා බොහෝ වෙලාවක් කථා කළා.

ගරු සභාපතිතුමනි, අද විශේෂ දවසක්. අන්තර්ජාතක මානව හිමිකම් දිනය අදයි. හැබැයි, අපට අන්තර්ජාතික මානව හිමිකම් දිනය සමරන්න වෙලා තිබෙන්නේ හිරගෙදර 11දෙනෙක් වෙඩි තබා මැරිලා, ඒ වාගේම ස්වාමීන් වහන්සේ නමක් ම්ලේච්ඡ ලෙස ඝාතනය කර තිබෙන පුවතක ආරංචිත් සමඟ.

ඊයේ දූෂණ විරෝධී දිනය යි. දූෂණ විරෝධී දිනයේ අතිගරු ජනාධිපතිතුමා කියනවා, "දූෂණය පිටුදකින්න ඕනෑ. මේ රටින් දූෂණය නැති කරන්න ඕනෑ" කියලා. අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, සීනි ආනයනයේදී කොහොමද දූෂණය හා වංචාව වුණේ කියලා. අපි ජනාධිපතිතුමාට කියනවා, පටන් ගන්න එතුමාගේ පැත්තෙන්ම කියලා; "ඔවා දෙනු පර හට - තමා සම්මතයේ පිහිටා සිට" කියන එක ඔළුවට ගෙන ඒ පැත්තෙන් ම ඒ කටයුතු පටන් ගන්න කියලා. ඒ පැත්තෙන් පටන් ගත්තොත් දූෂණය නැති කරන්න පුළුවන්; දූෂණයට තිත තබන්න පුළුවන්. ඒවා නැති කරන්නේ නැති නිසා තමයි අපි කියන්නේ, "සර් ෆේල්" කියලා. එතුමාට ඒක පටන් ගන්න පුළුවන්, දූෂණ විරෝධී දිනයෙන් ම. ප්‍රවෘත්ති සාකච්ඡා පමණක් පවත්වන්නේ නැතුව ඒක කරලා පෙන්වන්න කියලා, විශේෂයෙන්ම අපි ඉල්ලා සිටිනවා.

මෙවර අය වැයෙන් ණය වාරිකවල පොලිය ගෙවන්න පමණක්, එනම් ණය සේවාකරණයට පමණක් රුපියල් බිලියන 2,240ක් වෙන් කර තිබෙනවා. අපේ ආදායම හැටියට 2021 වසරට පෙන්වා තිබෙන්නේ රුපියල් බිලියන 2,000යි. ණය සේවාකරණයට විතරක් රුපියල් බිලියන 2,240ක් -රුපියල් කෝටි 224,000ක්- යනවා. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා, "අපි විදේශ ණය ගන්නේ නැහැ. අපි ආයෝජන පමණයි ගෙනෙන්නේ" කියලා. විදේශ ණය ගන්නේ නැතිව ආයෝජන පමණයි නම් ගෙනෙන්නේ, විදේශයෙන් මේ රටේ ආයෝජනය කරන්න එන්නේ මොළය අමාරුකාරයන් වෙන්න ඕනෑ කියා මම හිතනවා. මොකද, අන්තර්ජාතික ratings සමාගම් අපේ රට 'CCC' තත්ත්වයට ඇද දාලා තිබෙද්දීත්, අපේ රටට ණය ගෙවීමේ අපහසුතාවක් තිබෙන බව පෙන්වා දී තිබෙද්දීත් කොයි රටින් ද අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරන්නේ? ඉතියෝපියාව, ඇංගෝලාව ආදි රටවලින් නම් ඇවිල්ලා ආයෝජනය කරයි. එහෙම නැත්නම් සාමාන්‍යයෙන් ව්‍යාපාරයක් තිබෙන කෙනෙකු මේ වාගේ රටක ආයෝජනය කරයිද? ඊයේ වන විට ලංකා බැංකුව 'B' තත්ත්වයෙන් 'CCC' තත්ත්වයට -තවත් පහතට- දාලා තිබෙනවා.

විදේශ ණය ගන්නේ නැතිව ආයෝජන පමණක් ගන්නවා කියලා ආණ්ඩුව කියනවා. නමුත් ලංකා ඉතිහාසයේ වැඩිම ණය ගැනීම මේ වසර සහ ලබන වසරේ සිදු වනවා. මේ වසරේ ණය ගැනීම රුපියල් බිලියන 2,830 යි. ඒ කියන්නේ මාසයකට රුපියල් බිලියන 230 යි. 2020 වර්ෂයේ ආදායම බිලියන 1,550ක් පමණ පෙන්වා තිබෙනවා. ඒ කියන්නේ, මාසයක ආදායම රුපියල් බිලියන 130 යි; රුපියල් කෝටි 13,000 යි. හැබැයි, ණය ගැනීම මාසයකට රුපියල් බිලියන 230ක් වෙලා තිබෙනවා. රුපියල් කෝටි 23,000ක් ණය ගන්නවා. ආදායම රුපියල් කෝටි 13,000ක්ව තිබියදී, මාසයකට රුපියල් කෝටි 23,000ක් ණය ගන්නා තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

2021 වසරේ ආදායම වශයෙන් පෙන්වා තිබෙනවා, රුපියල් බිලියන 2,000ක්. මේ කියන රුපියල් බිලියන 2,000 කවදාවත් ලැබෙන්නේ නැහැ. මේ වන විට ලංකා ඉතිහාසයේ වැඩිම ආදායම ලැබිලා තිබෙන්නේ 2019 වසරේයි. ඒ රුපියල් බිලියන 1991 යි. එනම්, රුපියල් කෝටි 190,000 යි. එහෙම වෙලා තිබියදී තිබෙන වර්තමාන තත්ත්වය අනුව රුපියල් බිලියන 2,000ක ආදායමක් එයිද? එහෙම වුණා කියා හිතුවත්, රුපියල් බිලියන 2,000ක්

කියන්නේ සාමාන්‍යයෙන් මාසික ආදායම රුපියල් බිලියන 150ක්, 160ක් විතර ප්‍රමාණයක්. රුපියල් බිලියන 150ක් කියලා කියන්නේ, රුපියල් කෝටි 15,000ක්. රුපියල් කෝටි 15,000ක මාසික ආදායමක් 2021 වසරට එද්දී, මාසයකට ණය ගෙවන්න තිබෙනවා රුපියල් බිලියන 250ක් -රුපියල් කෝටි 25,000ක්- පමණ. එවැනි රටක් තමයි මේ තිබෙන්නේ. එහෙම තත්ත්වයක් තිබියදීත් වැඩිම ණය ගන්නා වසර දෙක බවට පත් වෙලා තිබෙනවා, 2020 වසර සහ 2021 වසර. ඉතින් මේ තත්ත්වය තුළ මේ රට ඉදිරියට යෑම පිළිබඳ අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ ශ්‍රම බලකාය අසූපන් ලක්ෂයක් වනවා. ඒ අසූපන් ලක්ෂයෙන් දසලක්ෂයකට ආසන්න පිරිසකට රැකියා අහිමි වෙලා තිබෙනවා, ආනයන පාලනය සහ කොවිඩ් වසංගතය නිසා. රැකියා අහිමි වෙච්ච අයට ජීවන මාර්ගයක්, ආදායම් මාර්ගයක් ඇති කරන්න සලසා තිබෙන ක්‍රමවේදය මොකක්ද? මෙවර අය වැයෙන් එවැනි කිසිම ක්‍රමවේදයක් සලසා තිබෙනවාද? ඒක විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

මුදල් මණ්ඩලයෙන් දුෂ්නි වීරකෝන් මහත්මිය අයින් වුණා. නිහාල් ෆොන්සේකා මහත්මයා, කරුණාරත්න මහත්මයා, වීරසිංහ මහත්මයා ඒවා බලාගෙන ඉන්න බැරි නිසා තමයි අයින් වෙලා තිබෙන්නේ. 2020 පළමුවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සෘණ. දැන් දෙවන කාර්තුව ඉවරයි; තුන්වන කාර්තුව ඉවරයි; හතරවෙනි කාර්තුවත් ඉවර වෙන්න යනවා. තවමත් ආර්ථික වර්ධනය පිළිබඳ දත්ත දීලා නැහැ. ඇයි දීලා නැත්තේ? ගරු සභාපතිතුමනි, 2020 පළමු කාර්තුවේ ආර්ථික වර්ධනය පිළිබඳ දත්ත දුන්නේ අගෝස්තු 4වන දා. ඇයි? අගෝස්තු 5වන දා ඡන්දය පවත්වන දිනය තින්දා අගෝස්තු 4වන දා එම දත්ත දුන්නාම ඡන්දයට කලින් ඒ ගැන කතා කරන්න කාලයක් නැහැ. 2020 අවුරුද්දේ දෙවන කාර්තුවේ සෘණ ආර්ථික වර්ධන වේගයක් තිබෙන බව දන්නවා. නමුත් ඒ සංඛ්‍යා ලේඛන දෙන්නේ නැහැ. ඒවා සැප්තැම්බර් 15වන දා දෙන්න ඕනෑ. සැප්තැම්බර් 15 දුන්නේත් නැහැ. දෙසැම්බර් 15 දෙනවා කියනවා. ඇයි ඒ? එතකොට අය වැය විවාදය ඉවරයි. එතකොට අය වැය විවාදයේදී ඒ ගැන කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අය වැය විවාදයේ දී ඒ ගැන කතා කරයි කියලා තමයි ආර්ථික වර්ධන වේගය පිළිබඳ සංඛ්‍යා ලේඛන දෙන්නේ නැත්තේ. මේ තිබෙන සංඛ්‍යා ලේඛන සියල්ල වැරැදියි. අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා වාගේ මේ සංඛ්‍යාලේඛන සම්පූර්ණයෙන් වැරැදි සංඛ්‍යා ලේඛන. අපට දෙවැනි කාර්තුවේ ආර්ථික වර්ධනය ගැන සංඛ්‍යා ලේඛන දුන්නා නම්, මේ කතා කරන දේවල් මීට වඩා වෙනස් වෙනවා. එහෙම විස්තර දෙන්නේ නැතිව මොකක්ද මේ කරන්නේ? හැම වෙලාවේම රටේ ජනතාව රවටනවා. රටේ ජනතාව රවටමින් තමයි මේ සියලු දේ කරන්නේ. ඒ නිසා අපි රජයට විශේෂයෙන්ම කියනවා, මේ දත්ත වෙනස් කිරීම වහාම නවත්වන්න කියලා.

මේ වන විට රජය කියනවා පෞද්ගලික අංශයට ණය දෙන්න කියලා. ජනතාවගෙන් තැන්පතු වශයෙන් ගන්නා ඒවා තමයි බැංකුවලින් ණය වශයෙන් දෙන්නේ. දැන් ලංකා බැංකුවේ ratings පහළට දාලා තිබෙනවා. ලංකා බැංකුව කොහොමද, ණය දෙන්නේ? ලංකා බැංකුවට කියනවා සියයට 4 පොලියට ණය දෙන්න කියලා. බැංකු ජනතාවගෙන් ඉතුරුම් ගන්නේ සියයට 6 පොලියට. සියයට 6 පොලියට ඉතුරුම් අරගෙන සියයට 4 පොලියට ණය දෙන්නේ කොහොමද? එහෙම දෙන්න ගියාම ප්‍රශ්නයක් ඇති වෙනවා. එහෙම නම් රජයෙන් දෙන්න ඕනෑ ඒ පොලී සහනය. රජය පොලී සහනය දෙන්නේ කොහොමද, රජයටත් ණය දෙන්න සිදු වෙලා තිබෙන විට. මේ තත්ත්වය තුළ සිදු වන්නේ බැංකු කඩාගෙන වැටීමයි.

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා වාගේ 2020 වසරේ රුපියල් බිලියන 550ක් -රුපියල් කෝටි 55,000ක්- සල්ලි අච්චු ගහලා තිබෙනවා. එසේ සල්ලි අච්චු ගහමින් උද්ධමනය තවත් වැඩි කරන්න යන ගමනක් තමයි මේ තිබෙන්නේ. ඒ නිසා මා විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාට කියනවා, මුදල් රාජ්‍ය ඇමතිතුමාට කියනවා, මේ සංඛ්‍යා ලේඛන, දත්ත වෙනස් කිරීම කරන්න එපා කියලා. දළ දේශීය නිෂ්පාදනය, රුපියල් කෝටි දහසයලක්ෂයක් බව කියනවා. ඒක සම්පූර්ණ වැරැදියි. රුපියල් කෝටි දහහත්ලක්ෂ පනස්දහසක දළ දේශීය නිෂ්පාදනයකට තමයි 2021 අය වැය හදලා තිබෙන්නේ. ඉතින් ඒක එනවාද?

රටේ ජනතාව ජීවත් කරවීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න. දසලක්ෂයකට රැකියා නැති වෙලා තිබෙනවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න ශක්තිය ලැබේවා කියා මා විශේෂයෙන් ප්‍රාර්ථනා කරනවා. දත්ත වෙනස් කිරීම කරන්න එපා. ග්‍රීසියට වුණු දේ අපටත් වෙයි. දත්ත වෙනස් කිරීම නිසා තමයි ග්‍රීසිය ලෝකයේ ආර්ථිකය කඩා වැටුණු රටක් බවට පත් වුණේ. ඒ නිසා ඒක කරන්න දෙන්න එපා. අද ටීඑන්ඒ එකේ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ කරන අපරාධය නිසා රටේ ජනතාව පව්! ඒ නිසා දත්ත වෙනස් කිරීම වහාම නවත්වන්න කියලා මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දිවා භෝජනය සඳහා ප. ව. 1.00 දක්වා රැස්වීමේ කටයුතු අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] ගේ සභාපතිත්වයෙන් අ.භා 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப.1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The Hon. Shehan Semasinghe, please. You have 14 minutes.

[අ.භා. 1.00]

ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපේ රටේ ජනාධිපතිවරයා බවට පත් වීමෙන් පසුව පූර්ණ බලය සහිත පාර්ලිමේන්තුවක් යටතේ ඉදිරිපත් කරන පළමුවැනි අය වැය ලේඛනයේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාද කරන අවස්ථාවේ අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. මා හිතන විධියට මෙය ඉතාම පැහැදිලි දිශානතියකට අපේ රට මෙහෙයවන අය වැයක්. ඒක අද විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් දැක්වූ අදහස්වලිනුත් පෙනී යනවා. ඒ වාගේම මේ ආණ්ඩුව රටේ ජනතාව දීපු ජනවරමට ගරු කරන ආණ්ඩුවක් හැටියට හඳුන්වන්න පුළුවන්. අතිගරු ජනාධිපතිතුමාට ඉතා පැහැදිලිව ලැබුණු ජනවරම

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

අනුව, සෞභාග්‍යයේ දැක්මට අනුව අපි ලබා දීපු පොරොන්දුවක් තමයි, අපේ රටේ ආර්ථික පුනර්ජීවනයක් ඇති කරලා දිළිඳු බව පිටු දකින අය වැයක් ඉදිරිපත් කරලා මේ රට මෙහෙයවනවා කියන එක. ඒ සඳහා අවශ්‍ය වැඩසටහන කඩිනම් කරන, වේගවත් කරන, ශක්තිමත් කරන අය වැය තමයි 2021 අවුරුද්ද සඳහා අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි සුවිශේෂී ලක්ෂණයක් වෙන්නේ සියලු අමාත්‍යාංශ ආවරණය කරමින් ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් බිලියන 959ක මුදලක් මුදල් ඇමතිවරයා හැටියට මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා වෙන් කර තිබීමයි. ඊට අමතරව මේ අය වැය කථාව සිදු කරන අවස්ථාවේ විශේෂ ව්‍යාපෘති සඳහා තවත් රුපියල් බිලියන 140ක ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ අනුව සමස්තයක් හැටියට 2021 අවුරුද්දේ අපේ රටේ ආර්ථිකයට ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් බිලියන 1,099ක මුදලක් එක් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ගරු අගමැතිතුමා, මුදල් ඇමතිවරයා හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය ශක්තිමත් වෙලා තිබෙන අවස්ථාවක, ශක්තිමත් අය වැයක් එක්ක රටේ නිෂ්පාදනය වැඩි කරලා, අය වැය හිඟය - පරතරය- අඩු කරලා, ආනයන අපනයන අතර පරතරය අඩු කරලා, රටේ නිෂ්පාදනය කළ හැකි දේ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වාතාවරණය ගොඩ නඟද්දී, අද විරුද්ධ පක්ෂය දරන මතය තමයි මේ රටේ කිසිම නිෂ්පාදනයක් කරන්න ඕනෑ නැහැ කියන මතය. අද උදේ හර්ෂ ද සිල්වා හිටපු ඇමතිතුමාගේ කථාව තුළ ගැබ්වෙලා තිබුණු කාරණාව තමයි, තමන්ගේ රටේ නිෂ්පාදනය කරලා සාර්ථක වුණු කිසිම රටක් නැහැ කියන එක. නමුත් අපි මේ කරන්නේ මෙතෙක් නිෂ්පාදනය කළ හැකිව තිබූ දේවල් ආනයනය කිරීම සීමා කරලා ඒ දේවල්වල නිෂ්පාදනය වැඩි කිරීමයි. මෙය අද වාගේ අර්බුද තත්ත්වයක් තුළ අත්‍යවශ්‍ය කාරණයක් කියලායි මම හිතන්නේ. අපි ලෝකයේ අනෙක් රටවල්වලින් විතැන් වෙලා, ලෝකයේ අනෙක් රටවල් සමඟ ගනුදෙනු නොකර ඉන්න තීන්දුවක් අරගෙන නැහැ කියන එක නැවතත් මතක් කරන්න ඕනෑ. ආනයනය කිරීමට කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ කියන විපක්ෂයේ මතය කොහෙන් ගත්ත මතයක්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, අපි එකක් කියන්න ඕනෑ. අපි ආනයනයට ඉඩ දීලා තිබෙනවා. අපි ඉදිරියේදීත් ආනයනයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරනවා. අපි ආනයන නවත්වන්න සූදානම් නැහැ. හැබැයි, අපි රටේ නිෂ්පාදනය වැඩි කරන්න සීමා පනවලා තිබෙනවා. මොකක්ද එහි තිබෙන වැරැද්ද කියලා මම අහන්න කැමතියි. රටට අලුත් ආයෝජන ගෙනෙන්න, රටේ නිෂ්පාදය වැඩි කරන්න, නිෂ්පාදනය වැඩි කරලා අපේ රටේ ආර්ථිකයට තිබෙන පීඩනය අඩු කරන්න තීන්දු ගනිද්දී මොකක්ද තිබෙන වැරැද්ද? අපි දැක්කා රටේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම, නිෂ්පාදනය වැඩි කිරීම වැරදියි කියන කණ්ඩායම්වල එක වේලාවක ප්‍රධාන මාතෘකාව වුණේ වොක්ස්වැගන් කර්මාන්තශාලාව ගෙනැත් රැකියා දසලක්ෂයක් රටේ නිර්මාණය කරනවා කියන එකයි. ඇයි එතැනට ගියේ? ඒක බොරුවක් වුණු එක වෙනම දෙයක්. ඒක මේ රටේ යථාර්ථයක් නොවුණු කාරණය වෙනම එකක්. රටේ නිෂ්පාදනය වැඩි කිරීමට ආණ්ඩුව තීන්දු අරගෙන කටයුතු කරද්දී, එයට විරුද්ධව විපක්ෂය අදහස් ප්‍රකාශ කරන නිසායි මම අද කනගාටු වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ආණ්ඩුවක් හැටියට ඉතාම වගකීමෙන් නැවතත් කියනවා, සංඛ්‍යා ලේඛන වෙනස් කරලා අපට අය වැයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් නැහැ කියලා.

අපි කිසිම අවස්ථාවක සංඛ්‍යාලේඛන වෙනස් කිරීමක් සිදු කරලාත් නැහැ. මේ අද කියන වාර්තා ගැන කතා කරද්දී, දැන් කියනවා විගණකාධිපතිතුමා විසින් කියා තිබෙනවා කියලා මේ ආණ්ඩුව අරගෙන ගිය වැඩ පිළිවෙළ වැරදියි කියලා; ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය වැරදියි කියලා. හැබැයි, ඒ වාර්තාවේ අවසානයේ සාරාංශ කරලා තිබෙන්නේ කොහොමද? "2019 වර්ෂයේ බැරකම් සඳහා ප්‍රතිපාදන ඉහත සඳහන් පරිදි සලසා තිබුණු අතර, ඒ අනුව 2019-2020 අය වැය සාරාංශයේදී 2019 වර්ෂයේ වියදම් මුදල් පදනම මත ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව මුදල් අමාත්‍යාංශය දන්වා තිබේ." මේක තමයි මුදල් අමාත්‍යාංශයේ වාර්තාව සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා අවසාන වශයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දීලා තිබෙන වාර්තාවේ සාරාංශය. මේ සඳහන් කරන සංඛ්‍යාලේඛන වැරදියි කියලා විගණකාධිපතිතුමා සඳහන් කර තිබෙන්නේ කොතැනද? අද මේ බොරු සමාජගත කරනවා. තමුන්නාන්සේලා ඒක කොතැනින්ද පටන් ගත්තේ? ඉස්සරවෙලාම කිව්වේ ඒකාබද්ධ අරමුදලින් මුදල් වියදම් කරන්න ජනාධිපතිතුමාට බලයක් නැහැ කියලායි. අපේ ඒ කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වුණාට පස්සේ, දෙවැනිවරට ජනවරම ලැබුණාට පස්සේ ඒ බොරුව කියන එක නැවැත්වුවා. ඊළඟට කියන්න පටන් ගත්තා සංඛ්‍යාලේඛන විජ්ජාවක් තියෙනවාය කියන කාරණාව. දැන් එතනින් එහාට ගිහිල්ලා කියනවා, විගණකාධිපතිතුමා තහවුරු කිරීමක් සිදුකරලා තිබෙනවාය කියන වාර්තාවක් ගැන. දැන් අපට පෙනෙන්න තිබෙන ලිඛිත සාක්ෂිවල ඔවුන් කියන, විගණකාධිපතිමාගේ එහෙම වාර්තාවක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය-වැය සම්බන්ධයෙන් 2020 වර්ෂයේ ගිණුම් වාර්තා සියල්ල අපේ මේසය උඩ තිබෙනවා. ඒවා සභාගත වෙලා තිබුණා. මේ සියලු වාර්තා අපි මේ කියන කාරණා ඇතුළත් කරලා හදපු වාර්තා. මුදල් අමාත්‍යාංශය පාර්ලිමේන්තුවට මේ ලබා දීපු වාර්තා පරිශීලනය නොකර ඒ සංඛ්‍යාලේඛන වැරදියි කියලා කියන්නේ කොහොමද? මේ ලබා දීලා තිබෙන Budget Estimates, මේ ලබා දීලා තිබෙන අය වැය වාර්තාව පදනම් කරගෙන කියනවා ඒක වැරදියි කියලා. හැබැයි, කොතැනද මේක වැරදිලා තිබෙන්නේ කියන කාරණාව කියන්න බැහැ. මේක තමයි විගණකාධිපතිතුමාට යන වාර්තාව. මේ විගණකාධිපතිතුමාට යන වාර්තාව කොහොමද වෙනස් කරන්නේ? එහෙම වෙනස් කරලා තිබුණා නම්, කොහොමද මුදල් අමාත්‍යාංශය විසින් ලබා දීපු වාර්තා වැරදියි කියලා විගණකාධිපතිතුමා කියලා තිබෙන්නේ? මේ අර 2015 වර්ෂයට කලින් කළ බොරුව නැවතත් කරන්න තමයි පටන්ගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ නිෂ්පාදනය වැඩි කරද්දි අපි සතුටු වෙනවා. මුදල් ඇමතිතුමා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා අපේ රටේ අලුතින් වී වගාව හැර අනෙකුත් භෝග වගා සඳහා හෙක්ටෙයාර 211,703ක් වගා කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සිදු කරලා තිබෙනවා. බඩ ඉරිඟු, අර්තාපල්, බී ලූනු, රතු ලූනු, උඳු, මුං ඇට, රටකජු, කුරක්කන්, කවුපි ආදී සියල්ල වගා කිරීම සඳහා අවශ්‍ය සහයෝගය දෙන්න රුපියල් මිලියන 7,000කට ආසන්න ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. මේක වැරදිද? අපි විරුද්ධ පක්ෂයෙන් අහන්නේ මේ කරන ක්‍රමවේදය වැරදිද කියලායි. අපි දැක්කා, යහපාලන ආණ්ඩුව තිබියදී වී මිලදී ගැනීමට මොකක්ද කළේ කියලා. වී මිලදී ගන්නවා වෙනුවට අස්වැන්න නෙළන කාලයේ තමන්ගේ ගජමිතුරන්ට ඕනෑ විධියට කුණු කොල්ලයට වී ටික ගන්න අවශ්‍ය වාතාවරණය හදලා, අස්වැන්න නෙළලා ගොවියාගෙන් රුපියල් 25ට වී ටික අරගෙන තමන්ගේ ගජමිතුරෝ ටික ශක්තිමත් වුණාට පස්සේ, සහතික මිලකට වී මිලදී ගැනීමට යහ පාලනය කටයුතු කළා. හැබැයි, එතකොට මොකද වුණේ? ගොවීන්ගෙන් රුපියල් 25ට වී ගත්ත මුදලාලිලා ආණ්ඩුවට වී දෙන්න පටන් ගත්තා රුපියල් 40ට, 44ට. මෙන්න මේ ක්‍රමවේදය තමයි ගෙන ගියේ. හැබැයි, අපි මේ අය වැය ලේඛනය තුළම රුපියල් මිලියන 800ක මුදලක් මේ සියයට 8ත්, 10ත් අතර වී ප්‍රමාණය මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සඳහා වෙන්කර තිබෙනවා.

ඒ විතරයි නොවෙයි, කුඩා වැව් ටික හදන්න, අමුණු ටික, ඇළ වේලි පද්ධතිය හදන්න රුපියල් මිලියන 10,000කට ආසන්න ප්‍රමාණයක් මේ අය වැය ලේඛනය හරහා වෙන් කර තිබෙනවා. මේකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? හෙක්ටෙයාර 150,000ක වගාව සඳහා අවශ්‍ය ජල අවශ්‍යතාව සපුරා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ සිදු කරන්නේ. මේක වැරදිද? මේ බලාපොරොත්තු වෙන්නේ, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය අනුව හැමදේම පිටරටින් ගෙනැල්ලා පිටරටට ඕනෑ විධියට මේ රටේ මිලත් තීරණය කරලා, අපේ ගොවියාගේ ආදායමත් නැති කරලා, පිටරට ගොවියා ශක්තිමත් කරන්නද? ඒ ක්‍රමවේදයද මේ කරන්න හදන්නේ?

ඒ නිසා අපි ගෙන යන ක්‍රමවේදය හරියි කියලා අපි විශ්වාස කරනවා. මේක තමයි ලංකාවේ සිදු විය යුතු පරිවර්තනය. අද මේ පරිවර්තනය සිදු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවතත් කියන්නේ අපි නිවැරදිව වැඩ කටයුතු කරද්දී, ඒක නිවැරදි නොවන මාර්ගයක් කියලා පෙන්වන්න බොරුව සමාජගත කිරීම තමයි යහ පාලනය කළේ. මේ ගොල්ලන් 2015දී ඒක සාර්ථකව කළා. එයින් ඒ ගොල්ලන් ජයග්‍රහණයක් ලැබුවා. හැබැයි, ඒ ලබපු ජයග්‍රහණයට මොකද වුණේ? ඒ බොරුවම සමාජගත කරගෙන පාලනය කරන්නට ගිහිල්ලා, බලයට ඇවිල්ලා අවුරුදු එකහමාරකින් පසුව තිබුණු ඡන්දයකින් පසුව ඒ ගොල්ලන් කඩා වැටෙන්නට පටන් ගත්තා. අවසානයේ අවුරුදු හතරහමාරක් යනකොට ජනතාව ඔවුන්ට ලබා දුන් බලය නැතිවෙලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 50කට සීමා වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආර්ථිකය තුළ මේ රටේ අඩු ආදායම් ලබන කණ්ඩායම් ශක්තිමත් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි සමෘද්ධි ව්‍යාපාරය ශක්තිමත් කරනවා. සමෘද්ධි ව්‍යාපාරයෙන් ප්‍රතිලාභ ලබන පවුල් ලක්ෂ දෙකක් සවිබල ගැන්වීම සඳහා රුපියල් මිලියන 10,000ක් මුදල් ඇමතිතුමා හැටියට ගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා වෙන් කරලා තිබෙනවා. මෙයින් අපි බලාපොරොත්තු වෙන්නේ රටේ දිළිඳුම ජනතාව ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමයි. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී තමයි අපි දැක්කේ, පසු ගිය ආණ්ඩුව සමෘද්ධි ව්‍යාපාරයත් එක්ක මොකක්ද කළේ කියලා. ඒ අය සමෘද්ධිය සමඟ දේශපාලනය කළා. දේශපාලන පක්ෂය බලලා 450,000කට සමෘද්ධි සහනාධාර ලබා දුන්නා. අපි මේ සමෘද්ධි සහනාධාර ලබන කණ්ඩායමේ ලැයිස්තුව සංශෝධනය කිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද, මේක දේශපාලනීකරණය කර තිබෙන බව අපි දැක්ක නිසා. සමෘද්ධිය දුප්පත් ජනතාවට සහනාධාර ලබාදෙන ව්‍යාපාරයක් වුණත්, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව මේ සමෘද්ධිය පාවිච්චි කළේ මොකටද? දේශපාලන වශයෙන් ඔවුන්ට සවිබල ගැන්වෙන්න තමයි මෙය පාවිච්චි කළේ. ජනතාව සවිබල ගන්වනවා වෙනුවට දේශපාලන නායකයන්ගේ ප්‍රතිරූපය සවිබල ගැන්වීම තමයි ඔවුන්ගේ අරමුණ වුණේ. එම නිසා අපි මේ ඉදිරිපත් කරලා තිබෙන අය වැය ලබන අවුරුද්දේ ක්‍රියාත්මක වන විට අපේ රටේ ජනතාවට ඒ වෙනස දැක බලා ගන්නට පුළුවන් වෙයි කියන එක අපි ඉතාම වගකීමෙන් සහ විශ්වාසයෙන් කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. State Minister, please wind up now.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තත්පර 30ක් දෙන්න, අවසන් කරන්නම්.

බදු නිදහස ලබා දීම ගැන, බදු අඩු කිරීම ගැන විපක්ෂය අද අපට චෝදනා කළාට මේ අයහපත් ආර්ථික තත්ත්වය තුළත්, ලෝක වසංගත තත්ත්වය තුළත් රට ඉස්සරහට අරගෙන යන්නට අපට පුළුවන් වුණා. කිසිම අර්බුදයක් ලෝකයේ නැති අවස්ථාවක, රටේ කිසිම අර්බුදයක් නැති අවස්ථාවක යහ පාලන ආණ්ඩුව යටතේ ආර්ථිකය කඩා වැටුණු හැටි අපි දැක්කා. කිසිම අර්බුදයක් නැති අවස්ථාවක යහ පාලනය රටේ ආර්ථිකය කඩා බිඳ දමලා කුඩු පට්ටම් කළාට, අර්බුදයක් ඇති තත්ත්වක් තුළ පවා නිවැරදි නායකත්වය දෙන්නට අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමටත්, රජයටත් පුළුවන්වීම නිසා අද රටේ ජනතාවත් වාසනාවන්ත වෙලා තිබෙනවා. ඒ නිසා 2021 අවුරුද්ද අවසාන වන විට මේ රටේ ජනතාව ලබා දුන් ජනවරමේ යහපත් ප්‍රතිලාභ ඔවුන්ට ගලායෑම සිදුවෙයි කියන කාරණය ප්‍රකාශ කරමින්, මේ අය වැය ලේඛනය සුබවාදීව දකින්න, විශ්වාසයෙන් දකින්න කියා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මේ අය වැය ලේඛනය සකස් කළ නිලධාරින් ඇතුළු සියලුදෙනාට මාගේ ගෞරවය පුද කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Eran Wickramaratne. You have 16 minutes.

[අ.භා. 1.14]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ දුගී දුප්පත් ජනතාවට, සමෘද්ධිලාභීන්ට, ස්ථිර ආදායම් නොමැති අයට, දෛනික කුලී කම්කරු රැකියාවල නිරතවූවන්ට, සුව කළ නොහැකි බරපතළ රෝගවලින් පෙළෙන අයට රජයෙන් රුපියල් 3,000ක පෝෂණ මල්ලක් දෙනවා කිව්වා. මාසික ජල බිල්පත් සඳහා සියයට 15ක සහනයක්, ඒකක 30ට අඩු විදුලි බිල්පත් සඳහා සියයට 25ක සහනයක් දෙනවා කිව්වා. ගෑස් සිලින්ඩරයක් ගන්නා විට රුපියල් 100ක වට්ටමක්, ගෑස් ලිපක් සහ rice cooker එකක් ගන්න සියයට 25ක වට්ටමක්, දුරකථන බිලේ බදු මුදල් සියයට 50කට අඩු කිරීමක්, අඩු ආදායම්ලාභී පවුල්වල ගර්භිණී මව්වරුන්ට රුපියල් 2,000ක දීමනාවක්, වසරකට පාසල් නිල ඇඳුම් කට්ටල 2ක්, ආදායම් නැති අවුරුදු 12ට අඩු ළමයින් සිටින පවුල්වලට රුපියල් 5,000ක දීමනාවක් දෙනවා කිව්වා. මේ ගරු සභාවට මේ පොරොන්දු මතකද? කාගේද මේ පොරොන්දු? මේවා සෞභාග්‍යයේ දැක්ම තුළින් දුන් පොරොන්දු. මෙන්න මේ පොරොන්දු තමයි තිබුණේ. නමුත්, ආණ්ඩුව දැන් වැඩ කරගෙන යන හැටි කොහොමද කියලා මම අහන්නට කැමැතියි.

සෞභාග්‍යයේ දැක්ම තුළ දෙවැනි වසරේ අය වැයයි මේ ඉදිරිපත් කරන්නේ. පළමුවැනි වසරට අය වැයක් ඉදිරිපත් කළේ නැහැ. නමුත් කියන්න කනගාටුයි, රජයකට අය වැයක් සම්බන්ධව විශ්වාසයක් තිබෙන්නට ඕනෑ. නමුත් මේ වාගේ අය වැය වාර්තා නිසා ඒ විශ්වාසය කෙළෙසෙනවා; ගිලිහී යනවා. අද දුප්පත් අහිංසක ජනතාවට මේ ආණ්ඩුව දුන් පොරොන්දු ඉටු කරන්න බැරිවීම පමණක් නොවෙයි, හරි විධියට අය වැය ඉදිරිපත් කරන්නත් බැරි වෙලා තිබෙනවා. දිගින් දිගටම පෙන්නුම් කළ අසාර්ථකත්වය, හංගලා ගැහිලි, නොහැකියාව වාගේ හේතු රැසක් විසින් අවිනිශ්චිත බව සහ සැකය පුරවලා විශ්වාසය පළවා හැරලා තිබෙනවා. අපි එහෙම කියන්නේ ඇයි? දැන් බලන්න, අගමැතිතුමා මුදල් ඇමති විධියට ඉදිරිපත් කරපු අය වැය කථාවේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

රජයේ වියදම් දත්ත බැලුවොත්, වියදම රුපියල් බිලියන 3,594ක් කියලා කිව්වා. නමුත් ඇස්තමේන්තුවේ සඳහන් වෙන්නේ රුපියල් බිලියන 3,649ක්. රාජ්‍ය ආදායම අරගෙන බලන්න. අය වැය කථාවේ කියන්නේ ආදායම රුපියල් බිලියන 1,997ක් කියලා. ඇස්තමේන්තුවේ කියන්නේ රුපියල් බිලියන 2,029ක් කියලා. ඒ වාගේම අය වැය කථාවේ කියන්නේ අය වැය හිඟය රුපියල් බිලියන 1,575ක් කියලා. නමුත් ඇස්තමේන්තුව රුපියල් බිලියන 1,662යි. රුපියල් බිලියන 97ක වෙනසක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති රාජ්‍ය බදු ආදායම් හා වියදම ගැන අය වැය තුළ එක එක පිටුවේ, එක එක ඉලක්කම් සඳහන් කරලා තිබෙනවා. මම ඒක විස්තරාත්මකව කියන්න යන්නේ නැහැ, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා. නමුත් අපි දන්නවා, රාජ්‍ය මූල්‍ය වගකීම් කියලා පනතක් තිබෙන බව. 2006 සිට රාජ්‍ය අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5ක් වෙන්න ඕනෑ. 2016, 2017, 2018 වසරවලත් මේක සියයට පහකට කිට්ටු වුණා කියලා සඳහන් කරන්න අවශ්‍යයි. එයයි නීතිය. නමුත් අය වැය තුළ ඒ රාජ්‍ය මූල්‍ය වගකීම් පනත නොතකා තමයි මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරගෙන යන්නේ. විධායකයකට හෝ වෙනත් පාර්ශ්වයකට අවශ්‍ය ආකාරයට නීති වෙනස් කරන්නට බැහැ. හැම තිස්සේම නීතිය නොසලකා නම් කටයුතු කරන්නේ, එවැනි රටක් පත්විය හැකි තත්ත්වය හිතා ගැනීම දුෂ්කර නැහැ.

ඊයේ මහර බන්ධනාගාරයේ සිදුවීම ගැන කථා කරනකොට මම කිව්වා, බන්ධනාගාර ආඥා පනතේ රැඳවියන් මරන්න බැහැ කියලා සඳහන් කරලා තිබෙනවා කියලා. ඒ අවස්ථාවේ රාජ්‍ය ඇමතිතුමා උත්තර දෙමින්, T56 තුවක්කු තියාගෙන ඉන්නේ පොල් ගාන්නද කියලා ඇහුවා. බන්ධානාගාර තුළ T56 තියා ගන්නත් බැහැ කියන එක, හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මැතිතුමා අපට මතක් කළා. මම ඒ කථාව කියන්න හේතුව මෙයයි. නීතියට තිබෙන ගරු කිරීම ගැන ඇමතිවරුන්ගේ ප්‍රකාශවලින්ම අපි අහන්නට ඕනෑ. හිතලා බලන්න, යම් පවුලක අයෙක් බන්ධනාගාරයක රැඳවියකු විධියට සිටිනවා නම්, මේ වාගේ ප්‍රතිචාරයක් ලැබුණාම ඒ අයට නීතිය ගැන ඇති වෙන හැඟීම මොකක්ද? ඒක නීතියට පමණක් සීමා වෙන්නත් බැහැයි කියලා මම කියනවා. ආචාර ධර්ම, සාරධර්ම මේ කොයිකත් එහෙමයි.

දැන් බලන්න, මේ අය වැයේ කියන විධියට අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය 2020 වසරේදී ධන 1.5ක් වෙනවා කියලා තිබෙනවා. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF - කියන්නේ රට තුළ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය සෘණ 4.6ක් වෙන බවයි. ලෝක බැංකුව කියන්නේ සෘණ 6.7ක් වෙනවා කියලා. හරි, අපට පුරුදු පරිදි කියන්න පුළුවන්, ඒ ඔක්කෝම විදේශ බලපෑම්, අධිරාජ්‍යවාදී බලපෑම් කියලා. ඒ විධියේ එක එක ලේබල් ගහලා පැත්තකට දමන්න පුළුවන්. නමුත් ශ්‍රී ලංකාවේ මහ බැංකුව කියන්නේ මොකක්ද? දැන් මහ බැංකුවද හරි, මුදල් අමාත්‍යාංශයද හරි, අය වැය කථාවද හරි? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කාගේ දත්තද ගන්නේ? අපි ධන කිව්වොත්, දේශප්‍රේමීයි; සෘණ කිව්වොත්, දේශද්‍රෝහීයි.

එතැනට තමයි විවාදය ඇවිල්ලා තිබෙන්නේ. එහෙමද ඉස්සරහට යන්න හදන්නේ? සෞභාග්‍යයේ දැක්ම ඒකද? ඒකද වැඩ පිළිවෙළ? System change කියන්නේ ඒකටද? අංක සෙල්ලම් දාලා, හංගලා ගහලා, හිත හදාගන්න අපි මෙහෙම වැඩ කරලා තේරුමක් නැහැ. අපට මේ ගෝලීය මූල්‍ය දාමයෙන් මිදෙන්න, හුදෙකලා වෙන්න බැහැ. අද උදේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ ගැන කථා කළා. බිත්ති බඳිනවා වෙනුවට අපි පාලම් තමයි හදන්න ඕනෑ.

මේ වෙනකොට ජාත්‍යන්තර Fitch ශ්‍රේණිගත කිරීම්වලිනුත් ශ්‍රී ලංකාව "CC" කාණ්ඩය දක්වා පහත දමා තිබෙනවා. අපි තවත් පහළට වැටුණොත් එම ආයතන ලැයිස්තුවට අපි ගණන් ගන්නේත් නැතිව යනවා. "මූඩීස්" කියන ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය කියා තිබෙනවා, "ආර්ථිකය වර්ධනය කරන ආණ්ඩුවේ උපක්‍රම සාර්ථක නැහැ" කියලා. ඒ වාගේම 2021 වසරේ අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9ක් ඉක්මවා යන බවටත් පුරෝකථනය කර තිබෙනවා.

Yesterday, Citibank - probably the most globalized bank in the world - issued its statement on the Sri Lankan economy. I had the fortune as a young banker to work for it before I went on to head the country's National Development Bank.

They surfaced an issue. The issue they surfaced was this. Sri Lanka's problem is not a liquidity problem. It is a solvency problem that the country is going to face. Denial is not a strategy. What you need is a debt restructuring. It is clearly stated. All international organizations and banks which are lending to this country are saying something and you are trying to live in denial.

ඒ කියන්නේ මොකක්ද? අපට ඒක හරිම පැහැදිලියි. සෘජු බදු ප්‍රතිපත්තියක් ගැනත් මම මෙතැනදී කථා කරන්න ඕනෑ. ආණ්ඩුව ගැන මම මේ සඳහන් කරන්නේ. අද පනත් උල්ලංඝනය කරනවා විතරක් නොවෙයි, ආණ්ඩුව අසාර්ථකයි. ආණ්ඩුවේ උත්සාහය ණය මඟින් ඉදිරියට යෑමයි. නමුත් මේ ජාත්‍යන්තර වර්ගීකරණ ආයතනයට රට ලබා දී ඇති සහතිකය හදා ගන්නේ නැතිව ණය ගන්න ලැබෙන්නේ නැහැ. ඔන්න, ජනතාවට දුන්නු පොරොන්දුවලට වෙන දේ. රාජ්‍ය ආදායම වැඩි කර ගන්න යනකොට, ඒ වෙලාවේ ජනතාව මතක් වෙලා තිබෙනවා.

ඒ දුන්න දත්ත පරිදි, රාජ්‍ය ආදායම -2020, 2021 වර්ෂවලට සාපේක්ෂව- සියයට 14.5කින් වර්ධනය වෙනවා. ආණ්ඩුව එහිදී corporate tax එක වර්ධනය කරන්නේ සියයට 17.7කින්. නමුත් corporate නොවන tax එක සියයට 52කින් වැඩි කරනවා. මොකක්ද මෙතැනින් කරන්නේ? සෘජු බදු වැඩි කරන්නේ නැහැ. වක්‍ර බදු වැඩි කරනවා. දුප්පත් මිනිහාට ගහනවා. ඒකයි fiscal consolidation එක තමුන්නාන්සේලා හරියටම කරන්නේ නැත්තේ. ඒකෙන් කියන්නේ මොකක්ද? අපට මේ කාරණය හරිම පැහැදිලියි. ලොකු ලොකු සමාගම්වලින් බදු අය කරන්නේ නැහැ, නැත්නම් සෘජු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බලන්නේ නැහැ. වක්‍ර බදුවලින් තමයි ආණ්ඩුව එදා වේල පිරිමහගන්න සූදානම් වෙන්නේ. 2021 අය වැය ලේඛනයෙන්, එම මුදල් නැවත සෘජුවම පාරිභෝගිකයාගෙන් අය කිරීම සඳහා භාණ්ඩ 2,574කට සෙස් බද්ද සහ අනෙක් භාණ්ඩ සඳහා භාණ්ඩ සහ සේවා බද්ද පැනවීමට කටයුතු කරමින් සිටිනවා. නමුත් ඒ ගැන අය වැය කථාවේ විස්තරයක්වත් දීලා නැහැ. 2019 දෙසැම්බර් මස සිට සියලු ව්‍යාපාරිකයන් විසින් ගෙවන ලද විවිධ වර්ගයේ බදු මුදල් කපා හැරීම නිසා රජයට අහිමි වන මුදල රුපියල් බිලියන 600ක් කියලා අපි ඇස්තමේන්තු කරනවා.

සීනි ගැන මෑතකදී රටේ මහත් ආන්දෝලනයක් ඇති වුණා. අද අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා. ගජ මිතුරු සමාගම් නිසා රුපියල් පනහේ බද්ද එක රැයකින් ශත 25ට අඩු කළා. සීනිවලින් පමණක් රුපියල් බිලියන 4ක් අහිමි වුණා. ප්‍රධාන භාණ්ඩ හතෙන් රුපියල් බිලියන 7ක් රජයට අහිමි වුණා. ඔක්තෝබර් 13වන දා සිට ගත්තොත්, සමස්ත පාඩුව රුපියල් බිලියන 7ක් විතර වෙනවා. මේ වාසිය ජනතාවට ලැබුණාද, රජයට ලැබුණාද කියන එකයි අපි අහන්නේ. සෞභාග්‍යයේ ගජ මිතුරන්ට පමණයි මේ වාසිය ලැබුණේ.

ඒ විතරක් නොවෙයි, අපට දැනගන්න ලැබුණා, මේ වන විට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් අස්වීමේ ලිපි අරගෙන එම කොමිසම අක්‍රිය කරන්න වැඩ කරගෙන යනවා කියලා. නියාමන ආයතනයක් විධියට පනතකින් තමයි 2002දී පැවති ආණ්ඩුව මේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව ඇති කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you have two more minutes.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2009දී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විදුලිබල පනත සංශෝධනය කරලා, මේ මහජන උපයෝගිතා කොමිසමට නැවත පණ දුන්නා. ඇයි, එතුමා එහෙම කළේ? මේ රටේ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු වෙන්න ඕනෑ නිසායි එහෙම කළේ. මේ කොමිසම නැති කිරීමෙන් දූෂණයට ඉඩ ලැබෙනවා.

ඔබතුමන්ලාට මතක ඇති, පළමුවැනි කොරෝනා රැල්ල අවස්ථාවේ නිවෙස්වල විදුලි බිල් සාමාන්‍ය ගණනට වඩා තුන් හතර ගුණයකින් වැඩි වෙලා තිබුණු බව. ඒ වෙන්න ගිය අසාධාරණයෙන් ජනතාවට බේරෙන්න තිබුණු එකම ක්‍රමය තමයි ඒ කොමිසමට යන එක, කොමිසමට කථා කරන එක. ඒ වාගේම විදුලිය ඒකකයක මිල අසාධාරණ ලෙස ඉහළ දැමීමටත් නොහැකියි මේ කොමිසම නිසා. ඒ කියන්නේ, විදුලි මාෆියාවට, විදුලි ගනු දෙනු ආශ්‍රිත දූෂණවලට මේ කොමිසම බාධාවක්. ඒ කොමිසමේ සාමාජිකයන්ගෙන් ඉල්ලා අස්වීමේ ලියුම් අරගෙන තිබෙනවා. දැන් ඒ ආයතනය අක්‍රිය කරගෙන යනවා. මේ වාගේ ආයතන අක්‍රිය කරන්නේ ගජ මිතුරු සමාගම්වලට වාසනාව ගෙන ඒමටයි.

බොරුවට ආයුෂ කොටයි. ඔබලාට ජනතාව හැම දාමත් රවටන්න ලැබෙන්නේ නැහැ. මේ රට දශමයක්වත් ඉස්සරහට ගෙන යන්න නොහැකි තරමට ආණ්ඩුව අසමත්. ඡන්ද පොරොන්දුවල සිට අය වැය දක්වාත්, අනෙක් සෑම අවස්ථාවකදීත් ආණ්ඩුව එය ඔප්පු කර තිබෙනවා. ඒ අසමත් වන තරමට, ජනතාවගේ බඩට ගහන තැනට ආණ්ඩුව වැටී තිබෙනවා.

I want to remind that President Mahinda Rajapaksa gave leadership to end terrorism in this country. As a result, he was reelected as the President of this country. He had an economic team which mislead him and basically because of the corruption in this country, he went out of office subsequently. I beseech the new President, what you need is not a system change, you need a team change.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
රට බේරා ගන්න, සෞභාග්‍යය උදා කරන්න කියලා බලයට ඇවිත් දැන් යන ගමන තුළ පෙන්නුම් කරන්නේ මොකක්ද? "නටපු නැටුමකුත් නැහැ, බෙරේ පලුවකුත් නැහැ" කියන කථාවයි අපට මතක් වෙන්නේ. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you. The next speaker is Hon. Dilan Perera. You have seven minutes.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Seven minutes? I had ten minutes.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
With the time delay, you have only seven minutes.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
කැපිල්ල, කැපිල්ල.

[අ.භා. 1.28]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම ඒ ගැන බලා ගන්නම්. ඔබතුමා වද වෙන්න එපා, ඒ ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මම සහභාගි වන 26වන අය වැය විවාදයයි. මේ පාර්ලිමේන්තුවේ අය වැය විවාද 26කට මම අඛණ්ඩව සහභාගි වෙලා තිබෙනවා. මම මුලින්ම කියන්න ඕනෑ, මේ අය වැය විවාදය තුළ තරම් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින්, අධිකරණයට පහර ගසමින්, මේ සභාවේ නැති අයට මඩ ගසමින්, සභාවේ ඉන්න අයටත් මඩ ගසමින්, බොරු කෙප්ප ඇද බාමින් වෙනත් කිසිදු අය වැය විවාදයකදී කථා කළේ නැති බව. අපි වාගේ ප්‍රජාතන්ත්‍රවාදී රටක විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන ලිප් ගල් තුන උඩ තමයි රටක සශ්‍රීකභාවය කියන කිරි කලය උතුරවන්නේ. අද අපේ රටේ ශක්තිමත් විධායකයක් තිබෙනවා. පාර්ලිමේන්තු බලයක් නැති වෙලාවක, පළාත් සභා බලයක්වත් නැති වෙලාවක ආපු කොරෝනා පළමු රැල්ල, සෞඛ්‍ය අංශ, හමුදා අංශ එකතු කරගෙන සංවිධිතව මැඩ පවත්වන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හැකියාව ලැබුණේ ඒ නිසායි.

අධිකරණයට මඩ ගසමින්, telephone calls දෙමින්, දුමින්ද සිල්වා වාගේ උදවිය හිරේ දාන්න කියලා අධිකරණයේ විනිශ්චයකාරවරුන්ට යම් කිසි ආකාරයක බලපෑම් කරමින්, බැසිල් රාජපක්ෂ මහත්මයාට ඇප දෙන්න එපා කියලා බලපෑම් කරමින්, ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා හිරේ දාන්න කියමින්, පොලිසියෙන් පැමිණිලි කරනවා වෙනුවට අරලියගහ මන්දිරයේ ඉඳගෙන, අද මේ ගරු සභාවේ විපක්ෂය පැත්තේ ඉස්සරහ පේළියේ ඉඳගෙන උජාරුවට දඟලන හිටපු සමහර උදවිය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අත්අඩංගුවට ගන්න කියලා නියෝග දෙමින්, FCID වාගේ වැරදි ආයතන පස්සා දොරෙන් ඇති කරමින්, අධිකරණයට කොයි ආකාරයෙන් බලපෑම් කළත්, මේ රටේ ජනතාවට තවමත් අධිකරණය කෙරෙහි විශ්වාසයක් තිබෙනවා.

මේ ව්‍යවස්ථාදායකයේ සිටින අපි 225දෙනාටම යුතුකමක් තිබෙනවා, මේ ව්‍යවස්ථාදායකයත් ශක්තිමත් කියන පණිවුඩය ලෝකයට දෙන්න, රටට දෙන්න. හැබැයි, මොකක්ද අපි

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

කරන්නේ? පටු දේශපාලන පරමාර්ථ මත කටයුතු කරනවා. ඉස්සර නම් ගොබෙල්ස්ගේ න්‍යාය හරියනවා. ගොබෙල්ස්ගේ න්‍යාය එකම බොරුව දහපාරක්, විසිපාරක්, තිස්පාරක්, සියපාරක් කිව්වාම ඒක ඇත්ත වෙනවා. එම නිසා මේ ව්‍යවස්ථාදායකයේ සිටින අපේ සමහර උදවිය -සමහර අය ආචාර්යවරු, සමහර අය මහාචාර්යවරු- මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඉතාම අමාරුවෙන් හදාගත් මෙවර අය වැය ඉදිරිපත් කිරීමේදී ආර්ථික කෝණයකින් බලපු දත්ත ඉදිරිපත් කිරීමත්, ගිණුම් ආකාරයේ දත්ත ඉදිරිපත් කිරීමත් යන අංශ දෙකෙන් ඉදිරිපත් කළ දත්ත දෙවිධියකට බලලා මුදල් අමාත්‍යාංශයට චෝදනා කරනවා, ඉලක්කම් වෙනස් කළා කියලා. නමුත් එවැනි වෙනස් කිරීමක් කරලා නැහැ. ඒ ඉලක්කම් විවිධ කෝණවලින් බැලීමේදී එන දත්ත ප්‍රමාණය තමයි එළියට දාන්නේ. හැබැයි, ඉලක්කම් වෙනස් කළා කියන එතුමන්ලාට අමතක වෙනවා, මෙහෙම අපහාස කරන්නේ මේ රටේ ව්‍යවස්ථාදායකටයි කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you have two more minutes.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා, ආණ්ඩුවක් වැඩ කරන ආකාරයට තමයි ජනතාව පිළිතුරු දෙන්නේ කියලා. එතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය දිනුවා. ඒ නිසා ජනතාව එතුමා නැවත පත් කළා කියලා. ඊළඟට එතුමා කිව්වා, ආර්ථිකය හසුවන්න හදපු උත්සාහය හරි ගියේ නැහැ. එම නිසා ජනතාව ඔහු ගෙදර යැව්වා කියලා. මම හිතන්නේ එතුමා කිව්වේ, එතුමා රාජ්‍ය ඇමතිකම දරපු රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව ගැන වෙන්න ඕනෑ. මොකද, ඒ ආණ්ඩුව 2015දී බලයට ඇවිල්ලා කරපු විගඩම්, හොරකම්, ජඩකම්, කොමිස් ගැහිලි වාගේම වැරදි "ටීම්" එකක් එක්ක කටයුතු කළ නිසාම අවසානයේදී ඉතිහාසයේ දරුණුතම පරාජය ගෙනාවා. පෙරියදොරේ ගෙදරම ගියා; සින්නදොරේ පෙරියදොරේට වඩා ෆේල් වුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? පළමුවැනි දේශපාලන "PCR" පරීක්ෂණය වන ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය පරාදයි. ඊළඟට, "antigen test" එක ආවා. ඒ කියන්නේ, මහ මැතිවරණය. අලුතින් සළුපිළි ඇඳගෙන "මම අලුත් නායකයා" කියලා ඔක්කොම ටික අරගෙන ආවා, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පක්ෂය - සින්නදොරේගේ පක්ෂය- "antigen test" එකත් දරුණු ලෙස පරාදයි. ඊළඟට, විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙලාවේ "antibody test" එක ආවා. අඩුම ගණනේ මේ ලෙඩේ දරාගන්න පුළුවන්ද කියලා බලන test එක. ඒ "antibody test" එකත් පරාදයි. හිටපු 52න් 6දෙනෙක් ආණ්ඩුවට එකතු වුණා. මේ වෙලාවේ තමයි ලෝකය පුරා කොරෝනා වසංගත තත්ත්වය එන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up now.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
I am winding up, Sir. එම නිසා, මෙවර අය වැය කොරෝනා වසංගතයත් එක්ක ඉදිරියට යන්න හදපු හොඳ අය වැයක් කියන එක මතක් කරනවා.

විශේෂයෙන්ම මේ වෙලාවේ මුස්ලිම් ජනතාව මේ රටේ ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා, කොරෝනා මරණයක් වුණාම ඒ අය විශ්වාස කරන විධියට, ඒ අයගේ ආගම අනුව භූමදාන කටයුතු කරන්න දෙන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ උතුරේ අපේ හාමුදුරුවන් වහන්සේ නමක් අපවත් වුණාම උන්වහන්සේ ආදාහනය කරන්න නොහැකි වුණු වෙලාවේ අපට දැනුණු වේදනාව අපියි දන්නේ. එම නිසා මම මේ වෙලාවේ කියන්නට ඕනෑ, මුස්ලිම් ජනතාවගේ වේදනාව මට දැනෙනවා කියලා. එම නිසා සෞඛ්‍ය බලධාරින්ගේ උපදෙස් මත මුස්ලිම් ජනතාව විශ්වාස කරන විධියට, ඒ නීතිය අනුව මුස්ලිම් ජනතාවගේ දේහ භූමදානය කිරීම සඳහා ආණ්ඩුව කටයුතු කරන්නට ඕනෑ. මොකද, අපේ හාමුදුරුවන් වහන්සේ අපවත් වුණු වෙලාවේ උන්වහන්සේගේ දේහය ආදාහනය කරන්න බැරි වෙනකොට යහපාලන ආණ්ඩුවේ කවුරුවත් ඒ ගැන කථා කළේ නැහැ. හැබැයි, අපට ඒ වේදනාව දැනුණා. ඒ වේදනාවම මුස්ලිම් අම්මාවරුන්ටත්, මුස්ලිම් තාත්තාවරුන්ටත් දැනෙනවා. එදා අපේ හාමුදුරුවෝ අපවත් වුණු වෙලාවේ අද කෑ ගහන සමහර අය කට වහගෙන සිටියා. එම නිසා, සෞඛ්‍ය බලධාරින්ගේ උපදෙස් මත මුස්ලිම් ජනතාවගේ දේහ භූමදානය කිරීම සඳහා ඒ අයට අවශ්‍ය පරිසරය සකස් කරන්නය කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Patali Champika Ranawaka. You have fifteen minutes.

[අ.භා. 1.36]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2021 අය වැය තෙවන වර කියැවීමේ අවසන් දිනය අදයි. මේ සමස්ත අය වැයත් අපි එළඹෙමින් තිබෙන 2021 සමාජ, ආර්ථික තත්ත්වයත් පිළිබඳව සලකා බලන්නට මේ අවසන් දිනය ඉතාම වැදගත්. අද රටේ ඉතාම පැහැදිලි ආර්ථික අර්බුදයක්, රාජ්‍ය මූල්‍ය අර්බුදයක් ඒ හා ගැට ගැසුණු ජනතා අසහනයක් පැතිරෙමින් යනවා. ගොවි ජනතාවට අද පොහොර නැහැ. අනෙක් පැත්තෙන්, පාරිභෝගිකයාට ගිනි ගණන්වලට සහල් මිලදී ගන්න වෙලා තිබෙනවා. ධීවර ජනතාවට මාළු විකුණා ගන්න බැහැ. ඒ වාගේම, අපේ ජනතාවට ඒ මාළු ආහාරයට ගැනීම පිළිබඳ බිය සැක ඇති කර තිබෙනවා. වැඩ කරන ජනයා අති විශාල පිරිසක් මහපාරට ඇද වැටිලා තිබෙනවා. ඒ වාගේම, අද තවත් විශාල පිරිසකට අඩ වැටුපකට, අතිකාල නැතිව වැඩ කරන්න සිදුවී තිබෙනවා. අද සංචාරක ක්ෂේත්‍රය, ඇඟලුම්, විදේශ රැකියා ආදී හැම ක්ෂේත්‍රයකම බිඳ වැටීමක්, ආදායම් අහිමිවීමක් සිදුව තිබෙනවා. ඒ වාගේම, ආනයන මත යැපුණු ව්‍යාපාර අද එකින් එක බිඳ වැටෙමින් තිබෙනවා. පසුගිය මාස 8ක කාලය තුළ මේ රටට එකම ත්‍රිවීලර් එකක්වත් ගෙන්වලා නැහැ. කාර් ගෙන්වලා තිබෙන්නේ 27යි. ඒ වාගේම, motorcycles ගෙන්වලා තිබෙන්නේ 277යි. මා මේ කියන්නේ, අපට ලබාදී තිබෙන සංඛ්‍යා ලේඛන අනුවයි. 2019ත් එක්ක බලනකොට වාහන සියයට තුනයි ගෙන්වා තිබෙන්නේ. අද ඒ නිසාම, ඒ ක්ෂේත්‍රයේ රැකියා ලක්ෂ ගණනක් අහිමි වෙමින්, ඒ ව්‍යාපාර බංකොලොත් වෙමින්, වසා දමමින් තිබෙනවා. මේ තත්ත්වය තව කොපමණ කාලයක් ඉදිරියට ගෙනයන්න පුළුවන් ද කියන ප්‍රශ්නය පැන නැඟී තිබෙනවා. ආනයන නැවැත්වීම සඳහා රජය කටයුතු කරනවා නම්, අනාගතයේ අපනයන සඳහාත් බාධා එල්ල වෙන්න පුළුවන් කියලා ලෝක වෙළෙඳ සංවිධානය ඇතුළු සංවිධාන ප්‍රකාශ කර තිබෙනවා.

ඒ වාගේම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, ස්වයං රැකියාලාභීන්, විශේෂයෙන්ම අද කොළඹ නගරය වාගේ තැන්වල දෛනික වැඩ කරන ජනතාව ආර්ථික අර්බුදයත්, සමාජ අසහනයත් නිසා ඉතාම දුක්ඛිත තත්ත්වයකට ඇද වැටී තිබෙනවා.

සේවා ක්ෂේත්‍ර, -විශේෂයෙන්ම කලාකරුවෝ- වාගේම ඒ ක්ෂේත්‍රවල ජීවත් වුණු අයට "අද බැංකු කඩන්න සිදුවෙලා තිබෙනවාය" කියන තැනට පරිවර්තනය වෙලා තිබෙන බව අප දැක්කා. මහා පරිමාණ ව්‍යාපාරිකයන්ටත් අද ඔවුන්ගේ ණය ගෙවා ගන්නට නොහැකි වී තිබෙනවා.

අපේ රට ශ්‍රේණිගත කිරීම්වලින් පහළින් පහළට ඇද වැටෙද්දී, ලංකා බැංකුව, Sri Lanka Insurance Corporation වැනි මහා පරිමාණ ව්‍යාපාරවලටත් අද විදේශ බැංකුවලින් ණය ගැනීමේදී අද ඉහළ පොලී අනුපාතයක් ගෙවීමට සිදුවී තිබෙනවා.

එම නිසා, අද සමාජයේ ඇති වෙලා තිබෙන මහා ආර්ථික අසහනයට, සමාජ අසහනයට සෑම ක්ෂේත්‍රයකටම මෙවර අය වැයෙන් නම් කිසිම පිළිතුරක් නැති බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම මේ අය වැය ලේඛනයේ ඉදිරිපත් කර තිබෙන ඉලක්කම් හිත රවටා ගැනීමක්, රට රවටා ගැනීමක්. වියදම් කප්පාදුව ගැන කියා තිබෙනවා. පොලී ගෙවීම 860ට අඩු කරනවා කියලා තිබෙනවා. හැබැයි, මේ අවුරුද්දේ පමණක් රුපියල් බිලියන 2,100ක ණය ගත්තා. මෙය කිසිම යථාර්ථවාදී ඉලක්කමක් නොවෙයි. අනිවාර්යයෙන්ම මේ පොලී ගෙවීම මීට වඩා වැඩි විය යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රාග්ධන වියදම ගැනත් යමක් කියන්න ඕනෑ. "වැඩ කරන රටක්" හදන්න ඇවිල්ලා මේ අවුරුද්දේ ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 419යි. වැඩ කළේ නැහැයි කියන යහපාලන ආණ්ඩුවේ 2019 වසරේ ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 967යි. මේ ප්‍රමාණය රුපියල් බිලියන 1,070කට වැඩි කරනවා කියලා තිබෙනවා. ඒ සඳහා පාරවල් කිලෝමීටර ලක්ෂයක් හදනවාය කියන එකයි ප්‍රධාන වශයෙන්ම කියා තිබෙන්නේ. මේ ගැන මේ ගරු සභාවේ සාකච්ඡා වුණා. නමුත්, අගමැතිතුමාගේ කථාවේදී කිව්වා, කිලෝමීටර 50,000ක් හදන්න රුපියල් බිලියන 20ක් දෙනවා කියලා. අපේ මන්ත්‍රීතුමෙකුත් ඒ කරුණ පෙන්වා දුන්නා. කිලෝමීටරයකට මිලියන හතරයි වෙන් වන්නේ. අද iRoad ව්‍යාපෘතියේ සෑම කිලෝමීටරයකටම මිලියන 42ක් යනවා. අඩුම වශයෙන් කිලෝමීටරයක් නිර්මාණය කිරීමට මිලියන 20ක් යනවා.

ඒ අනුව ඒ රුපියල් බිලියන 20,000න් හදන්න පුළුවන් කිලෝමීටර් 1,000ක් පමණයි. ඒ වාගේම අපට පෙනෙනවා, අද හැම තැනකම පැරණි කාපට් කරපු පාරවල් මත නැවත කාපට් කරනවා, ගල් අතුරපු තැන්වල ගල් අයින් කරලා ඒ වෙනුවට කාපට් කරනවා කියලා. මේ රට අද තිබෙන්නේ එතැනද? රාජ්‍ය මූල්‍ය අර්බුදය හමුවේ ඇතැම් පළාත් සභා ආයතන, ඇතැම් රාජ්‍ය ආයතන තමන් ඉන්නා ස්ථානවල කුලී ගෙවීම මාස හතරකින් පැහැර හැර තිබෙන තත්ත්වයක් තුළ, පඩියෙන් භාගයක් ගන්නය කියලා ජනාධිපති ලේකම් ඉල්ලන තත්ත්වය තුළ මේ පාරවල් විප්ලවය අපට කරන්න පුළුවන්ද? අද මේ සිදු කරගෙන යන්නේ ඊළඟ පළාත් සභා මැතිවරණය සඳහා රජයේ තිබෙන සීමාසහිත අරමුදල් ටිකත් මේ පාරවල්වලට යට කිරීමේ ක්‍රියාවලියක් මිසක්, රටේ මූල්‍ය ප්‍රමුඛතාව, රටේ ආර්ථික ප්‍රමුඛතාව හඳුනා ගැනීමක් නොවෙයි.

ආදායම් වැඩි කර ගැනීම ගැන කියනවා. මම නැවතත් කියනවා, 2019 දෙසැම්බර් 01 වැනි දා මේ රටේ ඉහළම ධන කුවේරයන්ට ලබා දුන් ඒ දැවැන්ත බදු සහනය නිසා තමයි අද රාජ්‍ය ආදායම බිඳ වැටිලා, හැම දේටම වෙන වෙන ආකාරවලින් බදු ගහමින් යන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන කාරණය. එදා ඒ කරපු නවලිබරල්වාදී බදු ප්‍රතිපත්තිය නිසායි එහෙම වුණේ.

යථාර්ථවාදීව ගත්තොත්, 2020 රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,350යි. ඒක 1,500ක් කියලා කියා තිබෙනවා. හැබැයි, 2021දී රුපියල් බිලියන 2,029ක රාජ්‍ය ආදායමක් බලාපොරොත්තු වෙනවා කියලා කියා තිබෙනවා. 2021 කියන්නේ 2020ටත් වඩා අඳුරු අවස්ථාවක්; අඳුරු ආර්ථික තත්ත්වයක්. ඒ අනුව මේ වසරට වඩා ලබන වසරේ සියයට 50කින් රාජ්‍ය ආදායම වැඩි වෙනවාය කියන එක කොයිතරම් යථාර්ථවාදීද? මේ ඉලක්කම් තුළින් තමන්ගේ හිත රවටා ගැනීමක්, රට රවටා ගැනීමක් නේද කරන්නේ කියලා අපි අහන්න කැමැතියි.

මේ අය වැය හිඟය පියවීම සඳහා දේශීය වෙළෙඳ පොළෙන් ට්‍රිලියන 1.5ක් ඒ කියන්නේ බිලියන 1,500ක් අවශ්‍ය වෙනවා. නමුත් අද වෙලා තිබෙන්නේ මොකක්ද? රුපියල් බිලියන 159.3ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නොවැම්බර් 04, 11, 18 සහ 25 කියන දිනවල නිකුත් කළා. හැබැයි, මේ අඩු පොලී අනුපාත යටතේ පිළිගත්තේ රුපියල් බිලියන 70.3යි, ඒ කියන්නේ සියයට 44යි. මේ නොවැම්බර් මාසයේ භාණ්ඩාගාර බිල්පත්වල තත්ත්වය ඒකයි. දේශීය මූල්‍ය වෙළෙඳ පොළේ ශක්තිය මේකෙන් අපට හොඳට පෙනෙනවා. මොකද, භාණ්ඩාගාර බිල්පත්වලින් සියයට 44යි පිළිගෙන තිබෙන්නේ. දැන් මොකද වෙන්නේ? ආණ්ඩුවට සිද්ධ වෙනවා, ඉතුරු ටිකට සල්ලි අච්චු ගහන්න. කීයක් අච්චු ගසා තිබෙනවාද? නොවැම්බර් 01 වැනි දා සිට දෙසැම්බර් 01 වැනි දා දක්වා රුපියල් බිලියන 130ක් සල්ලි අච්චු ගසා තමයි මේ ආණ්ඩුව ගෙන යන්නේ. මෙහෙම ගෙනියන්න පුළුවන්ද? මම එය ඇහුවා. මේ රටේ මහ බැංකුවේ ඉහළම ශ්‍රේණියේ නිලධාරියෙක් කිව්වා, "මුදල් අච්චු ගැසුවාය කියලා ආර්ථිකය කඩා වැටෙන්නේ නැහැ, මේක තමයි "Modern Monetary Theory" එක" කියලා. ඇත්තටම ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ විශාල සංචිත තිබෙන, ජාත්‍යන්තර වශයෙන් ශක්තිමත් ඩොලර් තිබෙන රටවලට මේ විදියට මුදල් නිකුත් කරලා ආර්ථිකය දුවවන්න පුළුවන්. ඒ ආකාරයට ගිහිල්ලාත් 2008-2009 කාලයේ පැවැති ආර්ථික අර්බුදය ඉදිරියේ ඉදිරිපත් කළ ඒ දැවැන්ත මූල්‍ය පැකේජය නිසා අද ඩොලරය කොච්චර හැල්ලු වෙලා තිබෙනවාද කියලා අපට පෙනෙනවා, අනෙක් මුල්‍යයන්ට සාපේක්ෂව. ඒ නිසා මේ ගමන යන්නේ නම් Modern Monetary Theory එකක් හරහා නොවෙයි. අර සිම්බාබ්වේ ගිය ගමනයි මේ යන්නේ. එය තමයි මේ ආරම්භ කරලා තිබෙන්නේ. සල්ලි අච්චු ගැසීම තුළින් මේ රටේ සිදු වෙන්නේ මොකක්ද කියලා අපට ලබන අවුරුද්දේ බලාගන්න පුළුවන්. මොකද, කොච්චර බදු සහන දුන්නත්, ජීවන වියදම අඩු නොවීමෙන්, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු නොවීමෙන්, ඒවායේ මිල සියයට 50කට අධික ප්‍රමාණයකින් ඉහළ යැමෙන් පෙන්වූයේ, ඔය කියන Modern Monetary Theory එක ෆේල් බවයි. ඒ නිසා ඒක ගැන අමුතුවෙන් කථා කළ යුතු නැහැ. අද වෙළෙඳ පොළට ගියාම, පාර තොටට බැස්සාම ජනතාවගේ තිත්ත කථාවලින් අපට ඒ ඇත්ත වටහා ගන්න පුළුවන්.

අපි බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා, රාජ්‍ය ආයතන එකින් එක බිඳ වැටෙමින් තිබෙන බව. COPE එකට කැඳවන රාජ්‍ය දෙපාර්තමේන්තු නොවන රාජ්‍ය අධිකාරි, සංස්ථා 400කට අධික ප්‍රමාණයක් තිබෙනවා. මේ සභාවට වාර්තාව ඉදිරිපත් කළේ එයින් 52ක් ගැන විතරයි. 52ක තොරතුරු විතරයි ඉදිරිපත් කළේ. ඒවායෙනුත් යහ පාලන කාලයේ ලාභ ලැබූ ආයතන 11ක් පාඩු ලබා තිබෙනවා. අනෙක් ඒවා ඉදිරිපත් කරන්නේ නැහැ, සමහර රාජ්‍ය ආයතන අද බංකොලොත් තත්ත්වයට ඇදවැටී තිබෙන

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

නිසා. මම ඒ ගැන දන්නවා. නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව අපි ගොඩනගපු ආයතන; ලාභ ලබපු ආයතන. අද ඒවා තිත්ත විධියට පාඩු ලබමින් ඉන්නවා. රටේ විදුලි ඉල්ලුම සියයට 33කින් අඩු වෙලා තිබියදී, ජල විදුලිය සැපයුම ඉතාම හොඳ මට්ටමක තිබියදී ලංකා විදුලිබල මණ්ඩලයත් මිලියන 40,000ක පාඩුවකට ගමන් කරමින් තිබෙනවා. එම මණ්ඩලය, අපි 2015දී මිලියන 20,000ක් ලාභ උපයපු තැනක්. මේ රාජ්‍ය ආයතන එකින් එක බිඳ වැටෙනවා. කිසිම ආකාරයකින් ඒවාට ඉහළට එන්න ඉඩක් ලැබෙන්නේ නැහැ. මොකක්ද විසඳුම? එය පියවා ගන්නට යන්නේ කොහොමද? ඒ, රාජ්‍ය දේපළ විකිණීමෙන් බව මම අද කියනවා. වරාය විකිණීමෙන්, එහෙමත් නැත්නම් ගුවන් තොටුපොළ විකිණීමෙන්, එහෙමත් නැත්නම් පුත්තලම බලාගාරය විකිණීමෙන්. පුත්තලම බලාගාරය විකිණීමට අවශ්‍ය පළමුවැනි පියවර තමයි, මහජන උපයෝගිතා කොමිසම ඉවත් කරලා, ඒක අක්‍රිය කරලා, පුත්තලම බලාගාරය විකුණන්න පුළුවන්ද බැලීම. කලබලයෙන් මැනිං වෙළෙඳ පොළ ඉවත් කරලා, එය මහ ජනතාවට නොදී කරන්න යන්නේ මොකක්ද? ඒ ආශ්‍රිත සියලු ඉඩම් විදේශිකයන්ට විකුණන්න තමයි අද සැලසුම් කරලා තිබෙන්නේ. මේ දෙස ඉතාම හොඳින් අපි බලා ගෙන ඉන්න බව විතරක් ප්‍රකාශ කරන්න ඕනෑ. අපි මේවායේදී අක්‍රියව ඉන්නේ නැහැ කියන කාරණයත් අපි කියන්න ඕනෑ. රාජ්‍ය දේපළ, ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව, රටට කිසිම වාසියක් ඇති නොවන ආකාරයට විකුණා දැමීමට, sale කිරීමට, රටේ ස්වෛරීභාවය බාල්දු කිරීමට අපි ඉඩ තබන්නේ නැහැ.

අද මුළු රටම ආතුර වෙලා, ලෙඩ වෙලා තිබෙන බව අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. සමාජ අසහනය පුපුරා යමින් තිබෙනවා. මේ සමාජ අසහනය පුපුරන කොට අද මාධ්‍ය කට්ටාඩියෙක් ඉන්නවා. මේ මාධ්‍ය කට්ටාඩියා මේ ආණ්ඩුවේ ඉහළින්ම ඉඳගෙන, විටින් විට විවිධ දිෂ්ටි මවනවා. පසුගිය මැතිවරණයට කලින් සහරාන් පිටුපස්සේ මහා බලගතු godfather කෙනෙක් ඉන්නවා කියලා රීරි යකෙක් මැව්වා; MCC මහ සෝනා මැව්වා; කැලණියට ගිහිල්ලා, නාග ලෝකයේ දිෂ්ටිය මැව්වා. මේ විධියට දිෂ්ටි ගොඩක් මවලා, ලෙඩා, එනම් මේ රටේ සමාජය පියවරෙන් පියවර ආතුර කළා. දැන් මොකද කරන්නේ? මුලින්ම චූර්ණය පටන් ගත්තා. ඒක තමයි පළමුවැනි දිෂ්ටිය. ඊළඟට, පැණියට මාරු වුණා, මුට්ටියට මාරු වුණා. එක එක දිෂ්ටි මවමින්, රෝගියා ආතුර කරමින් ඇත්ත සමාජ ප්‍රශ්නය, ඇත්ත සමාජ අසහනය යට ගහන්න උත්සාහ කරනවා.

හැබැයි, මේ රටේ ලොකු දිෂ්ටියක් තිබෙනවා; ලොකු යකෙක් ඉන්නවා. ඒ තමයි, කොරෝනා ගරානා යකා. Face mask එකෙන් ගැහුවා; sanitizer එකෙන් ගැහුවා; නිරෝධායනයෙන් ගැහුවා; ඇන්ටිජන් එකෙන් ගැහුවා; PCRවලින් ගැහුවා. මේ හැම එකකින්ම ගහපු කට්ටාඩියාට තමයි අද රටේ ජනතාවට විවිධාකාරයේ යක්ෂ දිෂ්ටි මවමින් මේ ආණ්ඩුව ගෙනි යන්න බාර දීලා තිබෙන්නේ. මෙහෙම වැඩි කල් ගෙනයන්න වෙන්නේ නැහැ. එක බොරුවකින් තව බොරුවකට යන්න පුළුවන් වෙන්නේ නැහැ. මේ දිෂ්ටිවලින් මේ රටේ ජනතාව ආවේශ කරන්න බැරි බවත් මම ප්‍රකාශ කරන්න ඕනෑ.

අද මේ සමාජ අසහනය පුපුරන කොට දේශපාලන අසහනයත් මතු වනවා. ඒ දේශපාලන අසහනයේ ප්‍රතිචාර තමයි අපට ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගෙන් ඇහෙන්නේ,"අපි දැන් පුලන්නෝ වෙලා, අපි දැන් හිඟන්නු වෙලා කියලා. ඒ තමයි ප්‍රධාන තැන්වලට බණින්න බැරි නිසා නිලධාරින් හරහා එය පිට කරන්න කරන උත්සාහය. ඔබ අපි සියලුදෙනාටම මේ රටේ අනාගතය ගොඩ නැඟීමේ අවශ්‍යතාවක් තිබෙන බවත්, මේ රටේ අනාගතය බේරා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙන බවත්, මේ රට බංකොලොත් වීමෙන් ගලවා ගැනීමේ වගකීම තිබෙන බවත් අපි ඒ මහත්වරුන්ට කියනවා.

ඉදිරිය බලා යන්න මේ රටේ නොයෙක් අත්හදා බැලීම් අපි කළ බව කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නායකයෝ වටා ගොනුවෙලා බැලුවා, පවුල් වටා ගොනුවෙලා බැලුවා, පක්ෂ වටා ගොනු වෙලා බැලුවා, මේ රට ගලවා ගන්න පුළුවන්ද කියලා. නමුත් අපට පෙනෙනවා, වෙනසකින් තොරව අපි අර්බුදයෙන් අර්බුදයට ගිහිල්ලා, අද සිම්බාබ්වේ රට පවතින බංකොලොත්භාවයට සමාන බංකොලොත්භාවයකට පත් වීමේ මුව විටටම අපේ රට ඇද වැටිලා තිබෙන බව. ඒ නිසා අපි බොහොම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, අද මේ රට ඉදිරියට ගෙනයන්න නම් අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතු දේ මොකක්ද කියන කාරණය. පුද්ගලයන්ට, පක්ෂවලට රට බාර නොදී, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් බිහි වෙච්ච කුසලතා පූර්ණ ඒ සුජාත පරපුරට රට බාර ගන්න ඉදිරියට එන්න කියලා පක්ෂ - විපක්ෂ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Rohitha Abegunawardhana. You have eight minutes.

[අ.භා. 1.49]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දවසේ 2021 අය වැය විවාදයට එකතු වීමට ලැබීම ගැන මම සතුටු වනවා. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අවසන් දිනයේ කථා කරන්න ලැබීම ගැනත් මම සතුටු වනවා.

ජනතාවාදී, ජනතාවගේ ඉදිරි අනාගතය වෙනුවෙන් රටේ ආර්ථිකය ගොඩ නඟන අය වැයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියා මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය රජයේ හිටපු ප්‍රබල අමාත්‍යවරයකු වන පාඨලී චම්පික රණවක හිටපු ඇමතිතුමා මට පෙර කථා කළා. ඒ ආණ්ඩුව හදන්න පිඹුරු පත් හදලා, ඒ ආණ්ඩුවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති පුටුවේත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති පුටුවේත් වාඩි කරවන්න, රවි කරුණානායක හිටපු ඇමතිවරයා මුදල් ඇමති පුටුවේ වාඩි කරවන්න, එතුමා හොඳ නැති නිසා මංගල සමරවීර මැතිතුමා ගෙනැල්ලා, ඒ මුදල් ඇමති පුටුවේ නැවත වාඩි කරවන්න වැඩ කරපු, හයිය දීපු ඇමතිවරයෙක් තමයි එතුමා.

හැබැයි, ඒ සියලු දේ කළා වාගේම දැන් ඉදිරිපත් කරපු ආර්ථික කළමනාකරණය ගැන උපදෙස් 2015-2019 කාලය ඇතුළතත් දුන්නා නම්, ඔබතුමන්ලාට අද ඔය පැත්තේ නොවෙයි ඉන්න වෙන්නේ, මේ පැත්තේ; ආණ්ඩුව පැත්තේ. මා හිතන්නේ, ඒ උපදෙස චම්පික රණවක හිටපු ඇමතිතුමා දුන්නා වුණත් ඒ අය ඒක ඇහුවේ නැහැ. දීපු උපදෙස ජනපති, අගමැති සහ අර කියපු දෙදෙනා ඇහුවේ නැහැ. එදා ඒ ආණ්ඩුවේ ආර්ථිකය මෙහෙය වූ ඒ ප්‍රබලයන් හතරදෙනාගෙන් එක්කෙනෙක් විතරක් පාර්ලිමේන්තුවේ අද ඉතිරි වුණා. ඒ තමයි මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා දැන් ඔය පැත්තේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகுரோஹிதஅபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ඔව්, මේ පැත්තේ තමයි. අපි ඒක පිළිගන්නවා. එතුමා මේ පැත්තේ. ඒ හතරදෙනාගෙන් එච්චරයි ඉතිරි වුණේ. අද pilot නැහැ. Pilot හිටපු අගමැති; Pilot ගෙදර. Co-pilotsලා දෙදෙනාත් ගෙදර. Co-pilotsලා දෙදෙනා දැන් කෝ? මම අහන්නේ ඒ දෙදෙනා කෝ කියලායි. එක් කෙනෙක්, රවි කරුණානායක. දෙවෙනි කෙනා, මංගල සමරවීර. තවම අපි ඒ අය හොයනවා. Pilot නැහැ, co-pilotsලාත් නැහැ. ඊකට බය වෙච්ච පාර, අනෙක් අය ජාතික ලැයිස්තුවේ! එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. කථාවක් තිබෙනවා, "බලය තිබෙන කොට මොළය නැහැ - මොළය තිබෙන කොට බලය නැහැ" කියලා. මේ වාගේ තත්ත්වයක් තමයි එදා තිබුණේ කියා අපි බොහොම පැහැදිලිව කියනවා.

ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමනි, ඔබතුමා අපිත් එක්ක එකටයි සිටියේ. ඔබතුමා අපිත් එක්ක සටන් මෙහෙය වූ සටන් සගයෙක්; අපිත් එක්ක එකතු වෙලා මේ රටේ සැබෑ ජනතාව වෙනුවෙන් වැඩක් කරපු කෙනෙක්. මම නැවත ඔබතුමාට කියනවා, ඉන්න ඕනෑ පැත්ත, යන හරි පැත්ත ඔබතුමාට කවදා හරි දැනෙයි කියලා. එතකොට ආපහු එක කඳවුරක් යටට එකතු වන්න එන්න කියලා මම ඔබතුමාට බොහොම ගෞරවයෙන් ආරාධනා කරනවා. මොකද, අපි එක විධියට හිතන්න පුළුවන් මිනිස්සු.

එවැනි ඉතිහාසයක් තිබුණු කාලයක් තමයි පසුගිය අවුරුදු පහ. ඒක පිළිගන්න වෙනවා. අපේ ගරු චම්පික රණවක හිටපු ඇමතිතුමනි, අපේ ගරු රවුෆ් හකීම් හිටපු ඇමතිතුමනි, අප හැම කෙනෙකුටම ඒක පිළිගන්න වෙනවා. [බාධා කිරීම්] කාටද? එතුමා බොහොම හිත හොඳ කෙනෙක්. ඒ එකට සිටි යාළුවෝ දෙන්නා.

මම බොහොම ඕනෑකමින් කියනවා, පසුගිය අවුරුදු පහ ගැන තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය කථා කරවන්න කියලා.

ආණ්ඩුවක් හැටියට අපි වැරදි කරනවා නම්, ඒවා පෙන්වා දීම විපක්ෂයේ වගකීම. අපි ඒවා පිළිගන්නවා. අපි ඒවා හිස නමා පිළිගන්නවා. හැබැයි, ඊට ඉස්සෙල්ලා තමුන්නාන්සේලා කල්පනා කරන්න ඕනෑ, 'අවුරුදු පහ තුළ අපෙන් වෙච්ච වැරැද්ද මොකක්ද' කියලා. ඒ වැරැද්ද ගැන කල්පනා කරන්න ඕනෑ.

මේ මුළු අය වැය විවාදය තුළත් අනෙක් වෙලාවටත් මේ සබා ගැබ තුළ කථා කරනවා, මහ බැංකු කොල්ලය ගැන. ඒ ගැන කථා කරලා දැන් අප්පිරියා වෙලා. ඒ ගැන කථා කරන කොට විපක්ෂය අපෙන් එක පාරටම අහනවා, "කෝ, දැන් හොරු අල්ලාගත්තාද, ඇයි අල්ලාගත්තේ නැත්තේ,හොරු අල්ලනවා කියලා නේද ඔයගොල්ලෝ බලයට ආවේ?" කියලා. දෙවි හාමුදුරුවනේ! ටයි එකක් දාගෙන, ඉංග්‍රීසියෙන් කථා කරලා, හොරකම් කරන්න අනුමැතිය දීලා, ඊකට අවශ්‍ය සියලු පරිසරය හදලා, ඒ වැඩේ කරලා ඉවර වෙලා අපට කියනවා, "හොරා අල්ලාගන්න" කියලා. හොරා සිංගප්පූරු යවනවා.

මේ ආකාරයට මහ බැංකු කොල්ලයක් සිද්ධ වනවා කියලා 2015 පෙබරවාරි මාසයේ 22වන දා අපි කියන කොට, "ආසියාවේ කොම්පියුටර් මොළය" කියලා ඔබතුමන්ලා විසින්ම හඳුන්වනු ලැබූ වික්‍රමසිංහ කළේ මොකක්ද? ඔබතුමන්ලා තමයි එතුමාට එහෙම කිව්වේ. අපි නොවෙයි. ඔබතුමන්ලායි වේදිකාවල කිව්වේ, "මෙන්න මෙතුමායි ආසියාවේ කොම්පියුටර් මොළය" කියලා. ඔබතුමන්ලා කියපු විධියට ඒ මොළය තිබෙන උන්නැහේ මොකක්ද කළේ? මහ බැංකු කොල්ලය ගැන සෙවීමට කමිටුවක් පත් කළා. ඒ, නීතිඥවරුන් තුන්දෙනෙකුගෙන් යුක්ත කමිටුවක්. එදා ඒ තුන්දෙනා උඩට ඇවිල්ලා මෙන්න මේ ගැලරියේ සිටියා. අපට එව්වා, කමිටු වාර්තාව. ඒ වාර්තාවෙන් කිව්වා, අර්ජුන් මහේන්ද්‍රන් කියන්නේ මේ රටට සම්පතක් වෙච්ච කෙනෙක් කියලා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ BOI එකේ ඉඳලා එතුමා එළවලා තිබෙනවා. එතුමා මේ රටට ආදරය කරන, උගත් බුද්ධිමත් කෙනෙක්, ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් කෙනෙක්, නැවත එතුමාට මඩ ගහන්නයි මේක කරලා තිබෙන්නේ කිව්වා. ඒක කියන කොට ඔය පැත්තේ ඉන්න ඔක්කෝම තප්පුලෑවා, "ටං! ටං!! ටං!!!" ගාලා. ගැහුවා, හොඳට අත්පුඩි. මගේ අම්මේ, දුන්නා නේද වැඩේ!

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Minister, you have another two more minutes.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகுரோஹிதஅபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
වෙලාව එච්චර ගියාද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා තප්පුලා කිව්වා, අනේ, බලන්න අර්ජුන මහේන්ද්‍රන්! කියලා. "හිරු" රූපවාහිනියේ "බලය" දේශපාලන වැඩසටහනට, "ස්වර්ණවාහිනියේ" "රතු ඉර" වැඩසටහනට, "දෙරණ" නාලිකාවේ වැඩසටහන්වලට අපිත් එක්ක ඇවිල්ලා කිව්වා, අර්ජුන මහේන්ද්‍රන් එක්ක පුදුම ඉරිසියාවක් තිබෙන්නේ. පුදුම වෛරයක් තිබෙන්නේ කියලා.

එහෙම කිව්වත් අන්තිමට මොකද වුණේ? අර්ජුන් මහේන්ද්‍රන් කරපු දේ ගැන තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය කියන දේ තමුන්නාන්සේලා විශ්වාස කරන්න.

විපක්ෂය දැන් ආර්ථිකය ගැන කියනවා. විපක්ෂ නායකතුමා දැන් මේ ගරු සභාවේ හිටියා නම් මම සතුටු වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විපක්ෂ නායකතුමා අද උදේත් කථා කරනවා මම අහගෙන හිටියා, COPE එකේ ඇති වෙච්ච සිද්ධියක් ගැන. දැන් විපක්ෂ නායකවරයා තරම් පිරිසිදු, මේ රටේ සියලු දේවල් හරියාකාරව ඉටු කරපු, රාජ්‍ය දේපළ කිසි දෙයක් අවභාවිත නොකරපු වෙනත් කෙනෙක් නැහැ වාගෙයි. සුදු ඇඳගෙන ඉන්නේ. නව ගුණ වැල අතේ. එන විධිය බලන්න එපා යැ. බොහොම මට සිලිටුවට ඇවිල්ලා තමයි වාඩි වෙලා ඉන්නේ; කථා කරන්නේ.

එතුමා තමයි හිටපු නිවාස ඇමතිවරයා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා නිවාස ඇමතිවරයා විධියට ඉන්න කොට මුදල් අමාත්‍යාංශයෙන් එවපු මුදල් කොහොමද වියදම් කරලා තිබෙන්නේ? "සිරි පැනනද ගම" කියන්නේ ඒ අතරින් එක ගමක්. දෙවැනි ගම, "සොබානිල්ල ගම". ඊළඟට හදනවා, "සැනසිලි ගම". ඊට පස්සේ හදනවා, "ආරාධි නගර්", "සංජීව නගර්". ඊළඟට හදනවා, "ශ්‍රී නිවාස ගම" කියලා එකක්. මේ වාගේ නම් ගණනාවකින් එක එක තැන්වල ගම් හදනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහෙම හදාගෙන යන කොට මට බයත් හිතුණා. ගරු චම්පික රණවක හිටපු ඇමතිතුමනි, එක තරුණ ළමයෙකු ජනාධිපතිවරණය කාලයේ ඇවිල්ලා මොබයිල් ෆෝන් එකේ ෆොටෝ එකක් පෙන්නලා ඒ ළමයාගේ දුක්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ගැනවිල්ල කියනවා මම දැක්කා. අනේ, ඒ ළමයාට ඒ වේදිකාව ඉස්සරහ හිටපු මිනිස්සු බිම දමාගෙන ගැහුවා. වෙලාවට සජිත් ප්‍රේමදාස මහත්තයා ජනාධිපති වුණේ නැහැ. ජනාධිපති වුණා නම් අනිවාර්යයෙන්ම ඒ ගමේ හදයි, "බිම දාගෙන නෙළුවා ගම" කියලා ගමක්. අනිවාර්යයෙන්ම හදයි, "බිම දාගෙන නෙළුවා ගම" කියලා ගමක්. මේ හදපු හැදිල්ලට -මෙහෙම හදපු එකේ- ඒ වාගේ එකක් හදන්න බැරි වන්නේ නැහැ නේ. හදනවා, අනිවාර්යයෙන්ම.

මා උදාහරණයක් කියන්නම්. එක ගමක ගෙවල් 24යි හදලා තිබෙන්නේ. මෙන්න, ඒකට අදාළ පොත. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න පොත. ඕනෑ නම් ඒ පොත සභාගත කරන්න මට පුළුවන්. මේ පොතේ පටන්ගත් තැන ඉඳන්ම තිබෙන්නේ මේ රටේ සියලු දිස්ත්‍රික්කවල ගහපු පෝස්ටර් පෙන්වන පින්තූර. මෙන්න, කොට්ටාවේ ගහන එක! මෙන්න, බත්තරමුල්ලේ ගහන එක! මෙන්න, පානදුරේ ගහන එක! මෙන්න, අනුරාධපුරයේ ගහන එක! මෙන්න, පොළොන්නරුවේ ගහන එක! මෙන්න, හම්බන්තොට ගහන එක! මේ, මහා ලොකුවට කථා කරන, තමුන්නාන්සේලාගේ නායකයා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Minister, please wind up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகுரோஹிதஅபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මට තවත් විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මේ බලන්න මේ කරලා තිබෙන දේවල්. එතුමා මහා ලොකුවට කථා කරනවා, අද රටේ මුදල් අවභාවිතයක් ගැන. මේවා තමයි, මුදල් අවභාවිත කිරීම්. කරන්න තිබෙන ඔක්කොම ජාති ටික කරලා, දැන් එනවා මොකුත් නොකරපු තොත්ත බබ්බු වාගේ කියන්න, "අපි මොකුත් කළේ නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්න ගියොත් එහෙම, පැටිකිරිය තවත් කියන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව මේ කාරණය කියනවා. ගරු විපක්ෂ නායකතුමා මෙතැන නොසිටියත්, මම කියනවා, අපි එතුමන්ලාට හොඳ ආදර්ශයක් දෙනවා කියලා. මේ තිබෙන්නේ, එතුමා ගමින් ගමට ගහපු පොත් ටික. ගෙවල් 27ක් හදනවා. නමුත් දැන් අපි ගෙවල් 14,200ක වැඩ පටන්ගෙන ඒවායෙන් සියයට 50ක පමණ වැඩ අවසන් කරලා තිබෙනවා. ගරු රවුෆ් හකීම් හිටපු ඇමතිතුමනි, අපි ගහලා තිබෙන මේ ජාතියේ එක පොතක් පෙන්වන්න; ගහපු එක තොරණක් පෙන්වන්න. සජිත් ප්‍රේමදාස මහත්තයා ගහපු මේ වාගේ එක පෝස්ටරයක් අප ගහලා තිබෙනවා නම් පෙන්වන්න. එතුමන්ලාගේ බඩු තිබෙනවා, අපි ගාව. අපි ඒවා තියාගෙන ඉන්නේ. අපි ගහපු මේ ජාතියේ එක පෝස්ටරයක් පෙන්වන්න. මේ, එතුමන්ලා ගහපු පෝස්ටර්. මේ පෝස්ටර් ගහපු මුදල්වලින්-

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Minister, please wind up your speech now.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகுரோஹிதஅபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
තවත් ටික වෙලාවකින්, මම කථාව අවසන් කරන්නම්.

මේවා ගහන්න ගිය මුදල් ටික එකතු කළොත්, තවත් නිවාස 14,000ක් හදන්න පුළුවන්. නිවාස 14,000ක්! රුපියල් ලක්ෂ හය ගණනේ දිලා නිවාස 14,000ක් හදන්න පුළුවන්. මෙන්න, ආදර්ශවත් විපක්ෂ නායක. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, පුළුවන්කමක් තිබෙනවා නම් අපට විවාදයක් දෙන්න, රාජ්‍ය මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් කථා කරන්න. අපට දෙන්න විවාදයක්. අපි එතකොට කියලා දෙන්නම්, කොහොමද මේ තත්ත්වය ඇති කළේ කියලා.

අපට අභියෝග තිබෙනවා. කොවිඩ් වසංගතය අභියෝගයක්. ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ කියන්නේ අභියෝග භාරගත් නායකයන් දෙන්නෙක්. එදා ඒ අභියෝග භාරගත්තා වාගේ මේ අභියෝගයත් භාරගෙන අපි ආර්ථික යුද්ධයත් ජයග්‍රහණය කරලා, රට සමෘද්ධිමත් රටක් බවට පරිවර්තනය කරනවාය කියන එක මා මතක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. Rauff Hakeem. You have eight minutes.

[2.00 p.m.]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman, we are on the final day of the Budget. In the Budget, the Government had proposed an import substitution programme to promote domestic production and value addition. Now, with all these challenges, particularly with the COVID-19 impacting on the economy very badly, it is expected that we need to somehow try and resolve our expanding debt crisis as well. Towards that, while maintaining our economy's expected targets, we are expected to look at incentives for local production.

While this is in limbo, we also find a variety of other difficulties we are facing in the region. We find the largest trading bloc that has come about in the Asian Region called the "Regional Comprehensive Economic Partnership". When the Trans-Pacific Partnership idea was brought to an end by the Trump administration, China took the initiative and have now, after almost eight years in negotiations, brought together diverse countries with different political ideologies together in forming the largest trading bloc. Now, we find that our great neighbour India has distanced herself from this partnership for the moment and perhaps in time to come, they too may join.

But in the meantime, our dilemma is different. We need to pursue our existing free trade agreements. We have a Free Trade Agreement to finalize with China and that Free Trade Agreement cannot simply go beyond the goods because we have done the same with the Indians. So, we have to have an equidistance between the Indians and the Chinese; we have to balance our interests.

In the meantime, the Foreign Policy too has been spelt out as a neutral foreign policy. Nobody understands what a neutral foreign policy is. We, of course, understand what a non-aligned foreign policy is. But now, we are talking about a neutral foreign policy. In the meantime, there is dealing with the regional powers, particularly with our great neighbour India. I see an interview by the Indian High Commissioner today in the "Daily Mirror" talking about the East Container Terminal of the Colombo Port. This is yet to be finalized and as a matter of fact, that is so advantageous since Japan is also supposed to be getting involved with the investment. But, how are we going to balance the already difficult situation in the Port of Colombo by trying to accommodate these two economic superpowers in coming and investing? It is important for us because it is also understandable that 60 per cent of our transshipment cargo is from India. So, it is, in fact, advantageous for us to do that. But, we have certain trade union problems in the Port, which the Government has to resolve fast and try to see that this comes to fruition because this is a long-standing expectation by these two powers who have been assisting us with immense economic support.

Now, let us take a look at our request for economic assistance and debt relief. Particularly now, the Government is not looking for debts; they do not want loans, but Foreign Direct Investment. This is what the Government has openly asked for from all our international friends. Then, we have also asked for market access for our exports. I have some interesting statistics here. Our entire debt share to China is 9.6 per cent whereas India's share is far below, 2.4 per cent. Then, the Foreign Direct Investment share of China is 16.7 per cent and India's share is not too far away, almost 13 per cent, 12.9 per cent.

Then, we have our export share to China which is just 2 per cent whereas we send 6.4 per cent exports to India facilitated by the Free Trade Agreement. So, similarly, if we are able to finalize a Free Trade Agreement with China, we may be able to enhance this. So, we need to look at this. These two nations have also responded to our call to assist in debt relief, whereas China has given US Dollars 500 as a top-up loan and India has, in the meantime, responded with US Dollars 400 million as a swap arrangement.

Our Government has very clearly stated that the services trade and the financial sector will not be open for free trade arrangements. So, with that blocked, we have to simply deal with a system of FTA where we would only be dealing with goods. In the meantime, what is the future of the CEPA and the subsequent arrangement, ETCA? These are arrangements that we were to do with India and those have also been put on hold. Our integration with India and the economic friendship with them will have to be further strengthened while not losing out on other advantages with new regional blocs emerging. If we do not, because there is almost 90 per cent of the goods in the new RCEP, the Regional trading agreement between China and the 15 countries that have come together, there is going to be tariff concessions among those countries which would affect our supply chain in a very impactful way. Therefore, it is important for us to focus on the trading agreements with the neighbouring countries as well as on the impact this new trading bloc is going to create. With that in mind, we will have to devise ways and means of meeting the already existing challenges of the COVID-19.

Thank you.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Then, the Hon. M.W.D. Sahan Pradeep Withana. You have five minutes.

[අ.භා. 2.08]

ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)
විශේෂයෙන්ම මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියටත්, ඒ වාගේම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියටත් මා මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාට ස්තුතිවන්ත වෙනවා, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන්න මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව.

විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කියන්නේ, මේ වැය ශීර්ෂ අතර තිබෙන ඉතාම වැදගත් වැය ශීර්ෂයක් කියලා අපි දන්නවා. සමස්තයක් වශයෙන් මුදල් අමාත්‍යාංශය සඳහා රුපියල් බිලියන 2350ක් වෙන් කර තිබෙනවා. ඒ මුදල පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 1,041කුත් හා මූලධන වියදම් සඳහා රුපියල් බිලියන 1,309කුත් වශයෙන් වෙන් කරලා තිබෙනවා. 2021 සමස්ත රාජ්‍ය ණය ආපසු ගෙවීම සඳහා රුපියල් බිලියන 1,257ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය මහ පොළොවේ පැළ කරන්න මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් බිලියන 61ක මුදලක් වෙන් කර තිබීම පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, විපක්ෂය හැම වෙලාවේම කථා කළේ වැය ශීර්ෂ පිළිබඳවයි, වියදම පිළිබඳවයි කියලා. නමුත් අපි අවධානය යොමු කළ යුතු පැත්තක් තමයි, ආදායම් සංකේත, එහෙම නැත්නම් අය ශීර්ෂ පිළිබඳව. මොකද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපි දැක්කා, 2016, 2017, 2018 හා 2019 යන වර්ෂවල ඇස්තමේන්තුගත ආදායම උපයා ගන්න යහ පාලන ආණ්ඩුව සමත්වෙලා නැහැයි කියලා. හැම වසරකම ඇස්තමේන්තු කළ ආදායමට වඩා අඩුවෙන් තමයි ලැබී තිබෙන්නේ. ඒ වාගේම 2016, 2017, 2018 හා 2019 යන කාල වකවානු තුළ ඇස්තමේන්තු කළ වියදම වියදම් කරගන්නත් පුළුවන්කමක් ලැබී නැහැ. අසාර්ථක පාලනයක් තමයි ඒ වසර හතරහමාරක කාලයක් තුළ සිද්ධ කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි, මේ රටේ තරුණ තරුණියන්ට රැකියා නොලැබුණේ. ඒ නිසා තමයි, මේ රටේ සංවර්ධනයක් සිද්ධ නොවුණේ. ඒ නිසා තමයි, මේ රටේ අහිංසක ජනතාව දුක් වින්දේ. අද පුරසාරම් දොඩන විපක්ෂය එදා තමන්ගේ පාලන කාලය තුළ අසාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආටිගල මහත්මයා නම්‍යශීලී, අපට ඇහුම් කන් දෙන නිලධාරියෙක්.

[ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා]

එතුමාගේ නිලධාරි මණ්ඩලයට මා මේ කාරණය කියන්න කැමැතියි. බදු ආදායම් තුළ අය ශීර්ෂ 47ක් තිබෙනවා. බදු නොවන ආදායම් තුළ අය ශීර්ෂ 60ක් තිබෙනවා. මේ පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා නිරන්තරයෙන් අධීක්ෂණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්වරුන් ගෙන්වා, විශේෂ වියදම් ඒකක 23 පිළිබඳවත්, අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ පිළිබඳවත් මාසයෙන් මාසය මූලධන වියදම්වල ප්‍රගතියත්, පුනරාවර්තන වියදම්වල ප්‍රගතියත් සොයා බලා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, අද මේ සභාවේ කථා කරන, යහ පාලන ආණ්ඩුවේ ආර්ථික විද්‍යාව පිළිබඳව කථා කරන විශේෂඥයන් කියා හිතාගෙන ඉන්න අය අසාර්ථකයි කියලා. ඒ කම්ටු වාර්තා දිහා බලනකොට අපි ඒක දකිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පැහැදිලිවම කියන්න ඕනෑ, 2019දී පළාත් සභා ආදායම වශයෙන් රුපියල් බිලියන 107ක් බොරුවට ඇස්තමේන්තු කර තිබෙන නමුත් අපේ අය වැය ලේඛනයට ශත 05ක්වත් ඇතුළත් වෙන්නේ නැහැ, ආදායමට එකතු වෙන්නේ නැහැ කියලා.

ඒ නිසා එවැනි ආදායම් ශීර්ෂ තිබෙනවා නම් ඒවා ඉවත් කරලා, ඒ වෙනුවට අලුත් අය ශීර්ෂ එකතු කරන්න කටයුතු කරන්න කියලා මම නිලධාරින්ගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up.

ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)
තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

මුදල් අමාත්‍යාංශය යටතේ සැමට ප්‍රතිලාභ සැලසෙන පරිදි සංවර්ධන කාර්යයන් සඳහා මිලියන 11,754ක් වෙන් කරලා තිබෙනවා. "සපිරි ගමක්" වැඩසටහනට මිලියන 8,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීමට මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම නියඟයෙන් පීඩාවට පත්වෙන කාන්තාවන්ටත් අපේ රජය මිලියන 420ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ආපදා අවශ්‍යතාවකදී ලබා ගැනීම සඳහා මිලියන 52ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, අපේ මන්ත්‍රීවරු සඳහා විමධ්‍යගත ප්‍රතිපාදනවලට මිලියන 2,250ක් වෙන් කරලා තිබෙනවා.

මට නියමිත කාලය අවසන් නිසා මගේ කථාවේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

මේ ආණ්ඩුවේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය මේ රට තුළ ක්‍රියාත්මක කරන්න අපි නවක මන්ත්‍රීවරු හැටියට රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගයත් අරගෙන දැවැන්ත කාර්ය භාරයක් කරන්න බලාපොරොත්තු වෙනවාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Next, the Hon. S.M. Marikkar. You have 13 minutes.

[අ.භා. 2.13]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව ආරම්භ කරන්න කලින් ඉතා පැහැදිලිව කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පෙරේදා කොවිඩ්-19 හැදිලා නැති වෙච්ච දින 20ක් වයසැති මට්ටක්කුලියේ ප්‍රදේශයේ බිළිඳෙක් පුච්චලා දාන්න තරම් අමානුෂික මිනිසුන් ජීවත් වන රටක් විධියට ලෝකයා ඉදිරියේ මේ වර්තමාන රජය අපේ රටේ නිරුවත හෙළි කළා. එක පැත්තකින් PCR පරීක්ෂණ ඉල්ලන සිරකරුවන්ට වෙඩි තියනවා. අනෙක් පැත්තෙන් කොවිඩ්-19 නිසා මියගිය දවස් 20ක් වයසැති බිළිඳෙක් ආදාහනය කළා. ඒ දරුවා කරපු වරද මොකක්ද පිච්චෙන්න? ඒකේ තිබෙන පුදුම සහගත කාරණය කියන්නේ ගෙදර ඉන්න අම්මාට, තාත්තාට, සීයාට, ආච්චිට කොවිඩ්-19 නැහැ. දරුවාට කොවිඩ්-19 ආවේ කොහොමද කියන සැකය අපට තිබෙනවා. වර්තමාන ආණ්ඩුවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම අපි හෙළා දකිනවා වාගේම දැඩි පිළිකුළෙන් යුතුව විවේචනයට ලක් කරන්න කැමැතියි.

දැන් ලෝක සෞඛ්‍ය සංවිධානය ලබා දෙන නිර්දේශ අනුව සියල්ලම කරනවාය කියනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය ලබා දෙන බෙහෙත් පාවිච්චි කරන්න කියනවා. දැන් අපි මුව ආවරණ පළඳිනවා, කොවිඩ්වලින් බේරෙන්න. ඉවතලන මේ මුව ආවරණ පුච්චනවාද? අනෙක් පැත්තෙන්, කොවිඩ්-19 වැලඳුණු රෝගීන් නාන වතුර අපජලයත් එක්ක යනවා. එතකොට ඒවා කොහේටද යන්නේ? එතකොට ඒවායින් කොරෝනා බෝ වෙන්නේ නැද්ද? ඉස්ලාම් ආගමේ අය පමණක් නොවෙයි, අද මියයන සිංහල බෞද්ධයන්ට පාංශුකූලය ලබා දීමේ අයිතියත් නැති කරපු ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුව කියන එක අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව මහා කයියක් එක්ක තමයි බලයට ආවේ. රට බේරා ගන්නවා, අරක කරනවා, මේක කරනවා, වැඩ්ඩෝ ටිකක් ඉන්නවා, වියත් මගේ උගත්තු බුද්ධිමත්තු ඉන්නවා කියලා තමයි බලයට ආවේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය අවුරුද්ද ආරම්භ කළේම ආපු ගමන් රාජ්‍ය බදු ආදායමින් බිලියන 600ක් බදු කපා හැර දමමින්. අතිරේක ආදායම් මාර්ගයක් නැතිව, වියදම ආදායමට වඩා වැඩි වෙනකොට ආදායම කපා හරින්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ. අනෙක් පැත්තෙන් මේ වැඩ්ඩෝ හැම එකටම දැන් කියන්නේ, "කොවිඩ්, කොවිඩ්" කියලා. මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ කොවිඩ්-19 වසංගතය තිබුණේ නැහැ. මාර්තු අග හරියේ තමයි ලංකාවට මේ කොවිඩ් වසංගතය ආවේ. පළමුවැනි කාර්තුවේ ලංකාවේ ආර්ථිකය සෘණ අගයකට ගියේ කොවිඩ්-19 නිසා නොවෙයි, මේ ආණ්ඩුවේ නොහැකියාව නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවුරුද්දේ මේ ගොල්ලන් විශාල ණය කන්දරාවක් අරගෙන තිබෙනවා. පළමුවැනි කාර්තුවේ බිලියන 721ක් අරගෙන තිබෙනවා. ඊට පස්සේ පාර්ලිමේන්තුවට දැනුම් දීලා බිලියන 1,300ක් අරගෙන තිබෙනවා. ඊට අමතරව පාර්ලිමේන්තුව රැස් නොවුණු කාලයේ හොරෙන් අරගෙන තිබෙනවා, බිලියන 629ක්. ඒ වාගේම මේ විසර්ජන පනත් කෙටුම්පතින් තවත් බිලියන 180ක් ගන්න යෝජනා කරලා

තිබෙනවා. බිලියන 2,850ක් මේ අවුරුද්දට විතරක් ණය අරගෙන තිබෙනවා. මේක අවුරුදු 73ක ඉතිහාසයේ විශාලම ණය ප්‍රමාණයක් ගත් අවුරුද්ද. ඒ විතරක් නොවෙයි, 2021 අවුරුද්දට බිලියන 2,900ක් ණය ගන්න යෝජනා කරලා තිබෙනවා. 2020ත්, 2021ත් කියන වසර දෙක එකතු කළාම විතරක් බිලියන 5,730ක් ණය ගන්න රටක් බවට මේ අය අපේ රට පත් කරලා තිබෙනවා. මේ ණය අරගෙන මොනවාද කරලා තිබෙන්නේ? වරායවල් හදලාද, ගුවන් තොටුපොළවල් හදලාද, එහෙම නැත්නම් ශීඝ්‍ර යටිතල පහසුකම් දියුණු කරලාද, අධ්‍යාපනය දියුණු කරලාද, කෘෂි කර්මාන්තය දියුණු කරලාද, ජාතික පාසල් හදලාද? මොනවාද කරලා තිබෙන්නේ? [බාධා කිරීම්] - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බල්ලෝ බිරුවාට අපි අපේ ගමන යනවා. "බව්, බව්" ගාන්න කට්ටියක් ඉන්නවා. බව්වන්ට "බව්, බව්" ගාන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපේ රටේ ආර්ථික වර්ධන වේගය ඉතා හොඳ නම් ලෝකයේ ශ්‍රේණිගත කිරීම් කරන rating ආයතනවලින් අපේ රට පහළට දාලා තිබෙන්නේ මොකද? දැන් මේකෙන් මොකක්ද වෙන්නේ? ලබා ගන්නා වූ ණයවලට අධිභාරයක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන නිසා. ඒ අධිභාරය ගෙවන්නේ කාගෙවත් බුදල්වලින්වත්, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දේපළවලින්වත් නොවෙයි. ඒවා ගෙවන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින්. හාල් ටිකට, පොල් ගෙඩියට, සීනි ටිකට ගහන බදුවලින්. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, මේ ආණ්ඩුව නොහැකියාව පෙන්වලා ඉවර බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පාලනයේ වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට හොරෙන් ණය ගන්න නියෝග දුන් අයටත්, ඒ නියෝග පිළිපැදලා පාර්ලිමේන්තුවට වහන් කරලා ණය ගත්තු අයටත්, අනාගතයේදී එයට මුහුණ දෙන්න සිද්ධ වන බව මම ඉතා පැහැදිලිව කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවුරුද්දේ පළමු මාස හතේ ආදායම බිලියන 763යි. හැබැයි අවුරුද්දට අපේක්ෂිත ආදායම බිලියන 1,588ක් කියලා අය වැයේ කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේක සම්පූර්ණයෙන්ම අය වැය පරතරය අඩු කරලා පෙන්වන්න කරපු ඉලක්කම් විජ්ජාවක් කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. සමහර කටුකන බල්ලන්නට ආර්ථිකය ගැන තේරෙන්නේ නැහැ. අපි ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, මේ අය වැය යෝජනා තුළ ලංකාවේ අවුරුද්දකට -

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, what is the point of Order?

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
ගරු මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි -

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, that is not a point of Order. Thank you. Hon. Marikkar, please continue with your speech.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ වෙලාව මට ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් කථාවක් කරනකොට කවු සූප්පු කරන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අවස්ථාව දෙන්න එපා.

සාමාන්‍යයෙන් අවුරුද්දකට දුශ්කරතාවය නිසා පාසල් නොයන, පාසල්වලට ඇතුළු නොවන ළමයින් 6,000ක් ඉන්නවා. [බාධා කිරීම්] අපි දැක්කේ නැහැ මේ අය වැය යෝජනාවලදී- [බාධා කිරීම්] ඒ ළමයි 6,000 ඊළඟ අවුරුද්දේ - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Order, please! Please stop using unparliamentary words. We will have to expunge those words from Hansard. So, please stop using unparliamentary words.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ගරු සභාව පාලනය කරන්න. කෑ ගහන්න එපා කියන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Members of the Government side, please stop disturbing!

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට කථා කරන්න අවස්ථාව දෙන්න. මේ නිකම් බොරු බයිලා නේ කියන්නේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Members, please stop disturbing.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය යෝජනා තුළ පාසල් නොයන ළමයින් 6,000 - [බාධා කිරීම්]

ගරු සංජීව එදිරිමාන්න මහතා
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, what is the point of Order?

ගරු සංජීව එදිරිමාන්න මහතා
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගෙන් මම අහනවා, අර මැරිච්ච දවස් 20 දරුවාගේ ගෞරවය ගැන -

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, that is not a point of Order.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියාගෙන ආවේ මේකයි. අවුරුද්දකට ලංකාවේ ළමයි 6,000ක් දුගීභාවය නිසා පාසල්වලට ඇතුළත් වෙන්නේ නැහැ. ඒ දුගීභාවය නිසා පාසල් නොයන ළමයි 6,000 වෙනුවෙන් ඊළඟ අවුරුද්දේ මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙන්නේ මොනවාද කියලා මම අහනවා. පාසල් හදන්න, පාසල් වැඩිදියුණු කරන්න, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කරන්න මුදල් වෙන් කර තිබෙනවාද කියලා අපි අහනවා. එහෙම නොවුණොත්, සාක්ෂරතාව, අධ්‍යාපන මට්ටම පහළට ගිය රටක් විධියට මේ අභියෝගය හමුවේ අපට ඉස්සරහට යන්න හම්බවෙන්නේ නැහැ.

දැන් කොවිඩ් රෝගයට එන්නතක් නිපදවා තිබෙනවා. එන්නත තිබුණාට, එන අවුරුද්දේ අපේ අය වැය තුළ කොවිඩ් එන්නත මිලදී ගැනීම සඳහා කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියන එක අපට ප්‍රශ්නයක්. කොවිඩ් එන්නත ගෙනැල්ලා, කොවිඩ් වසංගතය නැති කිරීම තමයි අත්‍යවශ්‍ය. ව්‍යාපාරික ප්‍රජාවට, ආයෝජකයන්ට විශ්වසනීයභාවය දෙන්න, ආර්ථිකයේ ස්ථාවරභාවය හදන්න, කොවිඩ් එන්නත ගෙනැල්ලා මේ රට කොවිඩ්වලින් මුදා ගන්නවාය කියලා පෙන්වන්න, මේ අය වැය තුළ වෙන් කරපු මුදල් ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ. ඒ කටයුත්ත මඟ හැරිලා හෝ අමතකවෙලා හෝ තිබෙනවා නම්, ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මොකද හේතුව? ලෝකයේ දියුණු රටවල් එන්නත් හොයා ගනිද්දි අපි පැණියක් පස්සේ යනවා. අපේ අල්ලපු රට වන ඉන්දියාව ඉදිරි කාලයේ එන්නත් තුනක් හඳුන්වා දෙන්න නියමිතයි. ඒ විතරක් නොවෙයි. ඔවුන් "vaccine tourism" කියලා සංචාරක කර්මාන්තය සඳහා ආකර්ෂණීය වැඩ පිළිවෙළක් ගෙනෙන්නත් සූදානම් වෙලා තිබෙනවා. අපි ආණ්ඩුවෙන් අහනවා, කෝ අපට එවැනි වැඩ පිළිවෙළක්? එවැනි වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අපට කියන්න. මේ අවුරුද්දේ සංචාරක කර්මාන්තයෙන් අපේක්ෂිත ආදායම ඩොලර් බිලියන 5යි. මම හිතන්නේ නැහැ ඩොලර් මිලියන 500ක්වත් ඇවිල්ලා තිබෙනවා කියලා. එහෙම නම්, තමුන්නාන්සේලාට ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වුණු වෙලාවේ, තෙල් බැරලය ඩොලර් 65 ඉඳලා 14ට ගිය වෙලාවේ අවුරුද්දටම ඇණවුම් කරන්න තිබුණා. සිංගප්පූරුව හා ජපානය වාගේ රටවල් අනුගමනය කරන ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න තිබුණා. තෙල් ඇණවුම් කරලා, ඒ රටවල්වලම තැන්පත් කරලා, අවශ්‍යතාව අනුව ගෙන්වන්න තිබුණා. එහෙම වුණා නම් ඩොලර් බිලියන 3.4ක විතර ආදායමක් අපට ලබා ගන්න තිබුණා. ඒ අවස්ථාවත් මේ ආර්ථික ඔස්තාර්ලා මඟහැරියා.

කොවිඩ් නිසා lock down වෙලා ඉන්න ජනතාවට රුපියල් 5,000යි දෙන්නේ. වර්ග අඩි 450ක් වැනි කුඩා බිම් කොටසක ජීවත් වෙන දහදෙනෙක්, දොළොස්දෙනෙකුගෙන් යුක්ත පවුලකට රුපියල් 5,000ක් දුන්නාම, ඒකෙන් සතියකට රුපියල් 1,250ක් තමයි වෙන් වෙන්නේ. අද මේ අයට කන්න නොවෙයි, ලෙව කන්න නොවෙයි, හිඟා කන්නයි වෙලා තිබෙන්නේ. අපි කොවිඩ් එක්ක ජීවත් වෙන්න පුරුදු වෙන්න ඕනෑ කියලා කියනවා. ලංකාවම lock down වෙලා නැහැ නේ. කොළඹ දිස්ත්‍රික්කයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් ප්‍රදේශ කිහිපයයි lock down වෙලා තිබෙන්නේ. අඩුම තරමින් මේ ජනතාවට රුපියල් 10,000ක්වත් ලබා දෙන්න ඕනෑ. මේ අයට ජීවත්වීමේ ඒ අවම අයිතියවත් ලබා දෙන්න මේ අය වැයෙන් allocation එකක් දමලා තිබෙනවාද? දෙන නොදෙන එක පස්සේ බලමුකෝ. ඉස්සෙල්ලා allocation එකක් තියෙන්න එපා යැ. ඒකවත් නැහැ. ඒ තරමට අමානුෂිකව තමයි ක්‍රියා කරන්නේ. කොළඹ 01, 15 කොට්ඨාසවල ජනතාවත්, කොලොන්නාව නගර සීමාවේ ජීවත් වෙන ජනතාවත් තමයි මෙහෙම lock down වෙලා ඉන්නේ. මේ lock down වෙලා ඉන්න ජනතාව සමඟි ජනබලවේගයට ඡන්දය දීපු නිසා පළිගැනීමට ද මෙහෙම කරන්නේ කියලා අපි අහනවා. හැබැයි, අපි අපේ ජනතාව තනි කරන්නේ නැහැ. ඒ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි පෙනී සිටිනවා. අපි ආණ්ඩුවට මේ කාරණය කියන්න කැමතියි. බඩගින්න එක්ක සෙල්ලම් කරන්න ඔබතුමන්ලා ලෑස්ති වෙන්න එපා. කොළඹ ඉන්නේ හිඟන්නෝ නොවෙයි. දවසක මේ අයගේ ඉවසීමේ සීමාව ඉක්මවා යනවා. ඒ වනතුරු පොඩ්ඩක් ඉන්නකෝ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ "සර්ගේ" දකුණු අත වගේ ඉන්න එක්කෙනා තමයි අධිකරණ ඇමතිතුමා. මට ලජ්ජයි, I am ashamed that the Minister of Justice is a Muslim. But, the Muslims of this country do not have any justice. අද නඩු ලක්ෂ 8ක් උසාවියේ හිරවෙලා තිබෙනවා. රුපියල් කෝටි ගණන් වියදම් කරලා ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ අලුත් ගොඩනැඟිලි ගන්න යන එකේ -අලුත් කාර්යාල හදන්න යන එකේ- මේ නඩු ටික ඉක්මනට අවසන් කරන්න අධිකරණ ඇමතිතුමාට බැරි ඇයි? උසාවිය උදේ 8ට ආරම්භ කරන්න ඒ අවශ්‍ය පහසුකම් ටික හදා දෙන්න බැරි ඇයි? මේ අය වැයේ ඒ වෙනුවෙන් කිසි යෝජනාවක් නැහැ. ඇමතිතුමාට සුඛෝපභෝගී කාර්යාල ලබා ගැනීමට කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරලා, ඒ අවශ්‍ය වැඩකටයුතු ටික නම් කෙරීගෙන යනවා.

අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්න කැමතියි. දළ දේශීය නිෂ්පාදනයට අපේ රටේ පෞද්ගලික අංශයෙන් සියයට 50ක දායකත්වයක් තමයි ලැබෙන්නේ. මලයාසියාව, තායිවානය, ඉන්දුනීසියාව වැනි රටවල සියයට 120ක වාගේ දායකත්වයක් දෙනවා, පෞද්ගලික අංශය. ඊළඟ අවුරුද්ද තුළ අපේ ඉදිරිගාමී වැඩ පිළිවෙළ මොකක්ද? මේ තිබෙන ණයවලට අමතරව රුපියල් බිලියන 5,780ක විතර ණය කන්දරාවක් ලබා ගනිද්දි, අලුතින් ආදායම ඇති කර ගැනීම සඳහා කරන්නේ මොනවාද කියලා අපි දැන ගන්න කැමතියි.

ගරු අගමැතිතුමාට අපි ගරු කරනවා. එතුමා ඊයේ පෙරේදා කියා තිබුණා, "අපි මහ මුහුදින් වට වුණු රටක්, නමුත් කර්මාන්තශාලා නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට විනාඩි 17ක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. තවම විනාඩි 11යි තත්පර 43යි ගෙවිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
No, no. You have only 13 minutes.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
I had 17 minutes.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
But, your time has been reduced to 13 minutes.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
But, still, I have one-and-a-half minutes more.

අගමැතිතුමා කියනවා, අපේ රට වටේට මුහුද තිබෙනවා ලු. හැබැයි, සැමන් ෆැක්ටරි නැති ලු. එතුමා අවුරුදු 10ක් මේ රටේ ජනාධිපති වෙලා හිටියා. දැන් එතුමාගේ මල්ලි තමයි ජනාධිපති වෙලා ඉන්නේ. මේ වාගේ සෙල්ලම් කථා කියන්න එපා, ගරු අගමැතිතුමනි.

ලංකාවේ traffic නවත්වන්න මේ අය වැයේ තිබෙන යෝජනා මොනවාද? ආසියානු සංවර්ධන බැංකුවෙන් LRT ව්‍යාපෘතියට දශම එකක පොලියකට දුන් ණය නැවැත්තුවා. ඇයි? පගාව ගහන්න බැහැ නේ. දැන් ලෝකයේ දියුණු රටවල් system එකෙන් තමයි traffic අඩු කරන්නේ. අපට කියන්න, LRT ව්‍යාපෘතිය නැවැත්තුවා නම් ජනතා පහසුකම් දියුණු කරන්න ඒ වැඩ පිළිවෙළ කරන්නේ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you. Next, the Hon. Harshana Rajakaruna. You have eight minutes.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, what is the point of Order?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මට කිව්වා විනාඩි 13ක් තිබෙනවා කියලා. විනාඩි 12යි තත්පර 40න් ඔබතුමා මගේ කථාව නැවැත්තුවා. අසාධාරණ වැඩ කරන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
No, the total time allotted to you was 13 minutes. Thank you.

[අ.භා. 2.26]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

පසු ගිය දශක කිහිපය තුළ අපේ රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව විමසා බලනකොට අපට පෙනී යන දෙයක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන අද මම විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ, ඉලක්කම්වලට වඩා, අපට අහිමි වුණු ප්‍රධාන දෙයක් ගැනයි.

ඒ, මෙන්න මේකයි. අපේ ජාතීන් අතර තිබුණු බෙදීම නිසා අපට ආර්ථිකය ඉදිරියට ගෙන යන්න බැරි වුණා. 1983දී ද්‍රවිඩ, සිංහල ජනතාව අතර ඇති වුණු යුද්මය තත්ත්වය නිසා අපේ රටේ ප්‍රධාන පෙළේ ද්‍රවිඩ ජාතික ව්‍යාපාරිකයන් මේ රටින් පිට රටවලට ගියා. දශක තුනක් තිස්සේ පැවැති යුද්ධය නිසා අපේ රට ලොකු ආර්ථික ගැටලුවකට මැදි වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ද්‍රවිඩ ජාතිකයෙක්. මම සිංහල ජාතිකයෙක්. 2009දී යුද්ධය අවසන් වුණාට පසුව සියලු ජාතීන් එකතු කරගෙන මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න තිබුණු අවස්ථාව අපට අහිමි වුණා. ද්‍රවිඩ, සිංහල ජනතාව අතර එදා ඇති වෙලා තිබුණු යුද්ධය අවසන් වුණාට, ඒ අරගළය අළු යට ගිනි පුපුරු වාගේ තවමත් හැංගිලා තිබෙනවා. ඒක අපට හොඳට තේරෙනවා, මේ පාර්ලිමේන්තුවෙන්. පාර්ලිමේන්තුවේ සිංහල මහජන නියෝජිතයන් සහ ද්‍රවිඩ මහජන නියෝජිතයන් අතර ඇති වන විවාදවලදී අපි ඒක දකිනවා; අපට දැනෙනවා; ඇහෙනවා. ඒක අහගෙන ඉන්න සිංහල ජනතාව තවත් අන්තයකට යනවා. ඒක අහගෙන ඉන්න ද්‍රවිඩ ජනතාවත් තවත් අන්තයකට යනවා. මේ ගැටලුවට තවම විසඳුමක් නැහැ.

පසුගිය සති කිහිපයේදී විශාල විවාදයක් තිබුණා, මිය ගිය අය සැමරීම පිළිබඳව. මගේ පවුලේත් තුන්දෙනෙකු හමුදාව නියෝජනය කරලා, යුද්ධය නිසා මිය ගියා. නමුත් අපි කවුරුත් මෙන්න මේ කාරණයට එකඟ වෙන්න ඕනෑ. සිංහල ජනතාවටත්, ද්‍රවිඩ ජනතාවටත්, මුස්ලිම් ජනතාවටත් -ඒ හැමෝටම- මිය ගිය පුද්ගලයෙකු සමරන්න අයිතියක් තිබෙන්න ඕනෑ. ඒක ප්‍රභාකරන් උපන් දවස වෙන්න ඕනෑ නැහැ. එහෙම නැත්නම් එය, පළමු එල්ටීටීඊ සොල්දාදුවා මිය ගිය දිනය විය යුතු නැහැ. නමුත් අපි හැමෝටම එකතු වෙලා, යුද්ධය නිසා මිය ගිය ජනතාව - අපේ සිංහල සොල්දාදුවන් වෙන්න පුළුවන්, සාමාන්‍ය සිවිල් ජනතාව වෙන්න පුළුවන්, එල්ටීටීඊ එකේ ද්‍රවිඩ ජනතාව වෙන්න පුළුවන්- සමරන්න එක දිනයක් වෙන් කර ගන්න පුළුවන් නම්, ඒක තමයි කරන්න පුළුවන් හොඳම දෙය වන්නේ. ඇයි අපට ඒක කරන්න බැරි? ඇයි අපට බැරි, එවැනි යුද්ධයක් මේ රටේ නැවත ඇති නොවේවා කියන ප්‍රාර්ථනයත් එක්ක දිනයක් තීන්දු කරගෙන

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

යුද්ධය නිසා මිය ගිය සියලු ජාතීන්වලට අයත් අය සමරන්න? ඒ මිය ගිය දෙමව්පියන්, දරුවන් සමරන්න ඒ අයගේ පවුල්වල සාමාජිකයන්ට දිනයක් වෙන් කර දෙන්න අපට බැරි ඇයි? මම දකින විධියට ඒකට ප්‍රධාන හේතුව තමයි දේශපාලනය. ජාතීන්, ආගම් අතර ඇති වන සිද්ධි දේශපාලනීකරණය වෙලා තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාල සීමාවේදී එය ද්‍රවිඩ ජනතාවත් එක්ක වුණු බව. පසුගිය අවුරුදු හතර-පහ තුළ එය මුස්ලිම් ජනතාවත් එක්ක වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලයේ මුස්ලිම් ජනතාවත් එක්ක ඇති වුණු සිද්ධියේදී දේශපාලන වාසිය ලබා ගන්න සමහර අය පාවිච්චි කළේ කවුද? ඔබතුමන්ලාට මතක ඇති, මාධ්‍යයෙන් වැඩියෙන්ම කථා වුණු මාතෘකාව තමයි Dr. Shafi. පසුගිය කාලයේ පැවැති මැතිවරණය ඉලක්ක කර ගෙනද මම දන්නේ නැහැ එහෙම වුණේ. එදා Dr. Shafi තමයි වැඩියෙන්ම කථා වුණු මාතෘකාව. වැඩියෙන්ම මාධ්‍යවල පෙන්වුයේ වඳ සැත්කම්, වඳ පෙති, වඳ කොත්තු වැනි දේවල් ගැන. ඒවා දැන් කෝ? දැන් Dr. Shafiත් නැහැ, වඳ සැත්කම් නැහැ, වඳ පෙතිත් නැහැ, වඳ කොත්තුත් නැහැ. මැතිවරණය ඉලක්ක කරගෙන දේශපාලන වාසියක් ලබා ගැනීමටද එවැනි තත්ත්වයක් උදා කළේ?

ඒකේ උච්චතම අවස්ථාව එනකොට කැලණි ගඟෙන් මහා නාගයෙක් ආවා. කැලණි ගඟ පසාරු කරගෙන මහා නාගයෙක් ඇවිල්ලා, අන්තිමට American Waterද, කොකා කෝලාද මොකක්ද බෝතලයක් ඇතුළේ හිටියා.

කැලණි ගඟ පුපුරුවාගෙන ආපු නාගයාට අර ප්ලාස්ටික් බෝතලය පුපුරුවා ගන්න බැරුව ගියා. කැලණි ගඟෙන් ආපු නාගයා! මෙන්න මේ වාගේ දේශපාලන වාසියට ජාතිය, ආගම යොදා ගැනීම නිසා අපේ රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වෙලා තිබෙනවා. මේක ගැන තේරුම් ගන්නේ නැත්නම්, ඒ ගැන අවබෝධයක් නැත්නම් මට ඉතා කනගාටුයි. මොකද, එහෙම අවබෝධයක් නැහැ. සමඟිය නැතිවීම තුළ අපේ රටේ ජාතීන් අපේ රට අතහැර දමා තිබෙනවා. ද්‍රවිඩ ජනතාව අපේ රටෙන් ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මුස්ලිම් ජනතාවට වෙලා තිබෙන අසාධාරණය නිසා අද සමහර මුස්ලිම් ජනතාව රට අතහැර දාලා යන්න හිතනවා. මේ වෙනකොට ඒ සමහර අය රට අතහැර දාලා යන්න හිතනවා.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමා ජාතිවාදයයි අවුස්සන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, that is not a point of Order.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මම කියන්නේ මොළේ කළඳක් තිබෙනවා නම්, මම කියන එක තේරෙයි. [බාධා කිරීමක්] මේක තේරුම් ගන්නේ නැත්නම් මම අනුකම්පා කරනවා මිසක් ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මුස්ලිම් ජනතාවට, ද්‍රවිඩ ජනතාවට තිබෙන ලොකුම ගැටලුව තමයි කොරෝනා වසංගතයෙන් මිය ගියාට පසුව මෘතදේහය භූමදානය කරන්නට නොදීම. ඒ නිසා අපේ බහුතර සිංහල ජනතාව කෙරෙහි ලොකු අප්‍රසාදයක් ඇති වී තිබෙනවා. ඒ නිසා නැවත මේ රටේ එදා වාගේ යුද්ධයක් ඇති නොවන්නට කටයුතු කිරීමේ වගකීම තමුන්නාන්සේලාට තිබෙනවා. ඒ නිසා ජාතීන්, ආගම් එක්ක දේශපාලනය කරන්න එපා කියා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The next speaker is the Hon. Selvarajah Kajendren. You have five minutes.

Before he starts, the Hon. Mayantha Dissanayake will take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[பி.ப. 2.34]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நிதி அமைச்சின்மீதான குழுநிலை விவாதம் இங்கு நடைபெற்றுக்கொண்டிருக்கின்றது. இன்றைய தினம் சர்வதேச மனித உரிமைகள் தினமாகும். இன்றைய நாளிலே, வடக்கு, கிழக்கு எங்கும் பிள்ளைகளைப் பறிகொடுத்த, பிள்ளைகளைத் தொலைத்த, மற்றும் சிறைகளிலே பிள்ளைகளைத் தவிக்க விட்டு வெளியிலேயிருந்து கதறியழும் பெற்றோர்களின் அவலக்குரல்கள் கேட்டுக்கொண்டிருக்கின்றன. இன்றைய இந்நாளிலே, சிறைகளிலே கொடிய பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் அடைத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள் விடுதலை செய்யப்பட வேண்டுமென்பதை வலியுறுத்துவதோடு, வடக்கு, கிழக்கு எங்கும் தங்களுடைய காணாமல் ஆக்கப்பட்ட பிள்ளைகளைத் தேடி அலைந்து கொண்டிருக்கின்ற அந்த மக்களின் போராட்டத்தோடும் அவர்களுடைய உறவுகளோடும் நாங்கள் கைகோர்த்துக் கொள்கிறோம்.

இந்த நாட்டிலே சிறந்ததொரு பொருளாதாரக் கொள்கையை வகுத்து, சிறந்த பொருளாதார முன்னேற்றத்தை ஏற்படுத்தி, அதன்மூலம் நாட்டிலுள்ள அனைத்து மக்களும் பொருளாதார ரீதியாக முன்னேற்றமடைந்து, ஐக்கியமாக வாழக்கூடிய ஒரு சூழலை உருவாக்க வேண்டுமென்பது நிதி அமைச்சின் குறிக்கோள்களிலொன்றாக இருக்கின்றது. அப்படியிருக்கின்றபொழுது, ஓர் இனவொழிப்புமூலம் முழுமை யாக அழித்தொழிக்கப்பட்ட எங்களுடைய தேசத்தின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்குக் கடந்த 10 ஆண்டுகளிலே இந்த அரசாங்கத்தினால் எந்தவித ஆக்க பூர்வமான நடவடிக்கைகளும் எடுக்கப்பட்டிருக்கவில்லை.

யுத்தத்தின் இறுதியிலே கிட்டத்தட்ட 1,47,000 தமிழர்கள் இராணுவத்தினரிடம் அகப்பட்ட பின்னர் காணாமல் ஆக்கப்பட்டிருக்கிறார்கள். இவர்களுக்கு என்ன நடந்தது? இராணுவத்தினரோடும் இராணுவத்தோடு சேர்ந்து இயங்கிய EPDP போன்ற துணை இராணுவக் குழுக்களாலும் கைது செய்யப்பட்ட பின்னரும் கடத்தப்பட்ட பின்னரும் காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு என்ன நடந்தது? என்பது தெரியாது எங்களுடைய மக்கள் தவித்துக்கொண்டிருக்கிறார்கள். இதற்கான பொறுப்புக்கூறலுக்கு நாங்கள் ஒரு சர்வதேச விசாரணையை வலியுறுத்திக்கொண்டிருக்கிறோம். அந்த வேளையிலே, காணாமல் ஆக்கப்பட்டவர்கள் தொடர்பில் ஐ.நா. மனித உரிமைகள் பேரவையிலே சில முடிவுகள் எடுக்கப் பட்டிருந்தபொழுது, சர்வதேச சமூகத்தை ஏமாற்றுவதற்காக OMP என்ற ஓர் அலுவலகம் உங்களுடைய அரசாங்கத்தினால் உருவாக்கப்பட்டது. அதிலே குற்றவியல் விசாரணைக்கான செயல்முறைகள் அனைத்தையும் நீக்கிவிட்டு, நிதி அமைச்சினால் 2018ஆம் ஆண்டில் 1.4 பில்லியன் நிதி அந்த அலுவலகத்துக்கு ஒதுக்கப்பட்டு, அந்த அலுவலகத்தினூடாக காணாமலாக்கப்பட்ட உறவுகள் ஏமாற்றப்பட்டு, பிழையாக வழிநடாத்தப்பட்டு, அவர்களது உறவினர்கள் இறந்து விட்டார்கள் என்று ஒப்புக்கொள்ள வைக்கப்பட்டு, அவர் களுக்கு மரணச் சான்றிதழ் கொடுக்கின்ற முயற்சிதான் நடைபெறுகின்றது. இதுதான் ஒரு நாட்டினுடைய நிதி அமைச்சினுடைய பொறுப்பான செயற்பாடா? என்பதை உங்களிடம் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, முழுமையானதோர் இனவாதக் கோணத்திலே பல திட்டங்களுக்கு நிதி அமைச்சினால் நிதி ஒதுக்கப்பட்டு, தமிழர்களுக்கு எதிரான செயற்பாடுகள் தீவிரப்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றன. தொல்பொருள் திணைக்களம் என்பது, உலக நாடுகளிலே கலாசார அமைச்சின்கீழ் கொண்டுவரப்படுகின்ற ஒரு திணைக்கள மாகும். ஆனால், இலங்கையிலே தொல்பொருள் திணைக்களம் பாதுகாப்பு அமைச்சின்கீழ் கொண்டுவரப்பட்டிருக்கின்றது. நிதி அமைச்சானது தொல்பொருள் திணைக்களத்துக்குக் கோடான கோடி நிதியை ஒதுக்கிக் கொடுத்து, அத் திணைக்களத்தி னூடாகத் தமிழ் மக்களின் வடக்கு, கிழக்கு தாயகப் பிரதேசத்தை "தொல்பொருள் பிரதேசங்களைப் பிரகடனப் படுத்தல்" என்ற பெயரிலே கபளீகரம் செய்து, சிங்களமயமாக்கு கின்ற - பௌத்த மயமாக்குகின்ற நடவடிக்கை களுக்கு வழங்குகின்ற செயற்பாடுகளும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. ஆகவே, இந்த அமைச்சானது இத்தகைய இனவாதச் செயற்பாடுகளை நிறுத்தி, யுத்தத்தினால் அழிக்கப் பட்ட பிரதேசங்கள் என்ற அடிப்படையில், வடக்கு, கிழக்கின் அபிவிருத்திக்கென விசேட வேலைத்திட்டமொன்றை ஏற்படுத்த வேண்டும். அதற்கென விசேட நிதி ஒதுக்கீடுகள் செய்யப்பட வேண்டும்.

முல்லைத்தீவு மாவட்டத்திலே ஹிபுல் ஓயா என்ற ஒரு நீர்ப்பாசனத் திட்டத்துக்கு 7,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்படுகின்றது. அந்தத் திட்டம் நூற்றுக்கு நூறுவீதம் சிங்களவர்களுக்கு மட்டுமென ஒதுக்கப்படுகின்றது. இவ் வாறான இனவாதச் செயற்பாடுகளை விடுத்து, வடக்கு, கிழக்குத் தமிழ் பிரதிநிதிகளோடு பேசி, தமிழ் பிரதிநிதி களுடைய முழுமையான பங்குபற்றுதலோடும் திட்டமிடல் களோடும் அபிவிருத்திச் செயற்பாடுகள் மேற்கொள்ளப்பட வேண்டுமென நான் இந்த இடத்திலே வலியுறுத்திக் கேட்டுக்கொள்வதுடன், -

ගරු මිලාන් ජයතිලක මහතා
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මන්ත්‍රීතුමා දිගින් දිගටම කථා කරන්නේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තව මිනිත්තුවයි තිබෙන්නේ.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
சர்வதேச மனித உரிமைகள் தினமான இன்றைய தினத்திலே நான் இன்னொரு விடயத்தையும் வலியுறுத்திக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்தத் தீவிலே வாழுகின்ற முஸ்லிம் மக்களுக்கு எதிராக இந்த அரசாங்கம் மிக மோசமான அடக்குமுறைகளைக் கட்டவிழ்த்துவிட்டிருக்கின்றது. 5-6 அடிப்படைவாதிகள் மேற்கொண்ட செயற்பாடுகளுக்காக ஒட்டுமொத்த முஸ்லிம் மக்களையும் இனவாதிகளாகவும் அவர்களை நாட்டின் எதிரிகளாகவும் சித்தரித்து, அம்மக்களு டைய பொருளாதாரத்தை நசுக்குகின்ற செயற்பாட்டை இந்த அரசாங்கம் ஆரம்பித்திருக்கின்றது. இச்செயற்பாட்டைத் தொடருமாக இருந்தால், எதிர்காலத்திலே இந்த அரசாங்கம் மிகுந்த இருண்ட பக்கங்களைச் சந்திக்க வேண்டிய நிலை ஏற்படும் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஒருவர் இறந்த பிற்பாடு, அந்த உடலில் கொரோனா தொற்று இருக்கின்றது என்பதைக் காரணம் காட்டி, அவர்களது மத வழக்கத்தின்படி அல்லாது அந்த உடலத்தை எரிப்பதற்காக அரசாங்கம் நடவடிக்கை எடுத்திருப்பது என்பது எந்த வகையிலும் ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். நீங்கள் அந்த மக்களுடைய அந்த அடிப்படை உரிமையை மீறுவதை ஏற்கமுடியாது. ஆகையி னாலே, இன்று காலை எங்களுடைய தலைமையினால் அது தொடர்பான ஒரு பிரேரணை இங்கு முன்வைக்கப் பட்டிருக்கிறது. அதற்கு நீங்கள் மதிப்பளிக்க வேண்டு மென்பதை இந்த இடத்திலே வலியுறுத்தி, விடைபெறு கின்றேன். நன்றி.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියපු කාරණය කරුණාකරලා නිවැරදි කරන්න කියන්න. සෞඛ්‍ය අංශ කියපු විධියට තමයි මේ වැඩපිළිවෙළ යන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, එතුමාට ඒ පිළිබඳව කථා කිරීමේ අයිතියක් තිබෙනවා.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අසත්‍ය ප්‍රකාශ නේ කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.40]

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන්න මට තිබෙන ඉතා කෙටි වේලාවේදී මුලින්ම සඳහන් කරන්න කැමැතියි, මේ අය වැයෙන් කොවිඩ් සම්බන්ධයෙන් අවධානය යොමු කරලා නැහැයි කියන කාරණය. මුදල් රාජ්‍ය අමාත්‍යතුමා සභාවේ ඉන්න වෙලාවේ කොවිඩ් නිසා සිදුවන ආර්ථික හානිය, ආර්ථික අවපාතය, ආර්ථිකයේ කඩා වැටීම ගැන කියන්න කැමතියි. ඒ ව්‍යාපාර නඟා සිටුවීමට, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය ඇතුළු නොයෙක් ක්ෂේත්‍රවලට අවශ්‍ය වැඩපිළිවෙළ තවම සකස් වෙලා නැති බව අපට පෙනෙනවා. අපි එදාත් මතක් කළා, සංචාරක ක්ෂේත්‍රයට මේ ලබාදෙන ණයවලට අමතරව, සහනාධාරයක් ලබාදෙන්න කියලා. මොකද, ණය ලබාදීමෙන් සිද්ධ වෙන්නේ තවත් ණය බරක් එකතු වෙලා ඒ අයට ඒ ණය ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙන එක. ඒකට යම් සහනයක් ලබාදෙන්න කියා අපි මේ වෙලාවේත් යෝජනා කරනවා.

මේ අවස්ථාව වෙනකොට කොවිඩ් නිසා අසහනයට පත් වෙච්ච පාසල් වෑන් රථ හිමියන් ගැන, ඒ අයගේ අපහසුතාව ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. මේ නිසා ඔවුන්ටත් බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ ගැනත් අපට හිතන්නට තිබෙනවා.

ඒ වාගේම, මේ කොවිඩ් වසංගත තත්ත්වය නිසාම කලාකරුවන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. සංගීතඥයන්, වේදිකා ආලෝකකරණය සපයන්නන්, වේදිකා සපයන්නන් වැනි ඒ සියලුදෙනා බරපතළ අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ඒ අය පිළිබඳව කිසිම අවධානයක් මේ අය වැය තුළින් යොමු කරලා නැහැ කියන කාරණාව මම මේ වෙලාවේ මතක් කරනවා.

මේ ආණ්ඩුව ආ ගමන්ම කථා කළා, හමුදාව පිළිබඳව, හමුදාවේ රණවිරුවන් පිළිබඳව. නමුත් අද වෙනකොට හමුදාවේ රණවිරුවන්ගේ ආහාර සලාකය කපා හැරීම සඳහා කටයුතු කරලා තිබෙනවා. ගෑස් මිල නිසා කියමින් රුපියල් 10,000ක ආහාර සලාකය රුපියල් 5,000 දක්වා කපා හැරීම සඳහා කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා නිකුත් කරපු සැප්‍ර/සැ/02/11 ලේඛනය **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හමුදාවට සලකන්නේ මෙන්න මේ විධියටයි.

රාජ්‍ය සේවකයන්ටත් 2016 සිට 2020 ජනවාරි මාසය දක්වා වැඩිවෙන්න තිබුණු වැටුප, ඒ වාගේම මේ වනතුරු වැඩිවීමට තිබුණු විශ්‍රාම වැටුප වැඩිකිරීමට තවම කටයුතු කරලා නැහැ. ඒ පිළිබඳව තවම නිශ්චිත තොරතුරක් වාර්තා කරලා නැහැ කියන එක මතක් කරනවා.

උපාධිධාරීන් සඳහා පත්වීම් ලබා දීමේදී EPF, ETF හේතු නිසා කපාහැර දැමූ උපාධිධාරීන්ගේ පත්වීම් තවමත් ලබා දීලා නැහැ. ඒ පිළිබඳවත් අපි උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට නුවර අධිවේගී මාර්ගයේ වැඩ කරගෙන ගියා; කොන්ත්‍රාත් සමාගම්වලට භාර දීලා තිබුණා; ඒ වැඩ කරගෙන ගියා. නමුත් අද වෙනකොට නුවර අධිවේගී මාර්ගයේ වැඩ නතර වෙලා තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමේ පටිපාටියක් ආරම්භ කරලා නැවත ඒ කටයුතු ප්‍රමාද කර තිබෙනවා. මේවා ප්‍රමාද කරන්නේ තමන්ගේ හිතවතුන්ට ලබා දීම සඳහා ද, නැත්නම් වෙනත් අකටයුතු කරවීම සඳහා ද කියලා අපි මේ වේලාවේ ප්‍රශ්න කරනවා.

පසුගිය දවසක අපේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඇහුවා, ද ෆිනෑන්ස් සමාගම පිළිබඳ ප්‍රශ්නයක්. ඒ සමාගම පසුගිය ආණ්ඩුවට පෙර ආණ්ඩුව කාලයේදී අත්පත් කරගෙන දැන් මේ වෙනකොට කඩාවැටිලා; එහි සේවකයෝ විතරක් නොවෙයි තැන්පත්කරුවෝ පවා අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. ඒ පිළිබඳව තීන්දුවක් සතියකින් ලබා දෙනවා කිව්වා. අදට ඒ සතිය සම්පූර්ණ වෙනවා. ඒ පිළිබඳවත් කිසිදු තොරතුරක් මේ වෙනකොට වාර්තා කරලා නැහැ.

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000ක් කරනවා කියලා අය වැය වාර්තාවේ ඉදිරිපත් කර තිබුණාට, කම්කරු ඇමතිතුමාම සඳහන් කළා, ඒ රුපියල් 1,000 ලබා දීමට අපි උත්සාහ කරනවා, තවම ඒ පිළිබඳව තීන්දුවක් ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ කියලා. වතු හාම්පුතුන් මේ වෙනකොට එයට එකඟතාවක් ලබා දීලා නැහැ කියලා කිව්වා. එතකොට අනෙකුත් දීමනා සියල්ල එකතු කරලා මෙම රුපියල් 1,000 ලබා දීමට සාකච්ඡා කිරීමෙන් වතු කම්කරුවන් රැවටීමක් තමයි කරලා තිබෙන්නේ කියන එක අපි මේ වේලාවේ සඳහන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

You have only two more minutes.

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ඩයගම, 6 වැනි Division එකේ නෝට්න්බෝන් කියන ප්‍රදේශයේ coronavirus positive වෙච්ච පුද්ගලයකුට කිලෝමීටර තුනක් පයින් එන්න කියලා තමයි වාහනයට නංවා ගන්නේ. ඒ වාගේ, ඉතාම අසාධාරණ විධියට වතු කම්කරු ජනතාවට සලකනවා කියන එකත් මම මේ වේලාවේ මතක් කරනවා.

මම මේ අවස්ථාවේදී විමල් වීරවංශ ඇමතිතුමාගේ කථාවක් උපුටා දක්වනවා. එතුමා මෙසේ කියනවා.

"ගෝඨාභය රාජපක්ෂ මහත්තයා එන්නේ මේ රටේ දුගී දුප්පත් ජනතාව බලගන්වන්න. සමෘද්ධිය නොලබන, එහෙත් සමෘද්ධිය ලැබීමට සුදුසුකම් ඇති ජනතාව, ස්ථිර ආදායම් නොමැති පවුල්වලට දෛනික කුලී කම්කරු රැකියාවල නිරත පවුල්වලට, ස්ථිර ආදායමක් නොමැති ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, සුව කළ නොහැකි දැඩි රෝගාබාධවලින් පෙළෙන අයට රුපියල් 3,000ක බඩු මල්ලක් දෙන්නයි එතුමා එන්නේ; මඩ ගහන්න, පළිගන්න නොවෙයි. වියළි ආහාර මල්ල, හාල්, පරිප්පු, වියළි මිරිස්, සීනි, මාසික ජල බිල්පත සඳහා සියයට 15ක සහනයක් දෙනවා. මාසික විදුලි පාරිභෝගික ඒකක 30ට අඩු බිල්පත් සඳහා සියයට 25ක සහනයක් දෙනවා. මේවාත් අරගෙන තමයි කුරුණෑගලට එන්නේ."

එතුමා මැතිවරණ වේදිකාවේ එහෙම කියනවා. නමුත් කෝ මේ සහන? මේ සහන සඳහා අය වැයෙන් මොනවාද මේ වෙනකොට කරලා තිබෙන්නේ කියන එක අපි මේ වේලාවේ අහනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

දැන් 2021 අවුරුද්දටයි මේ අය වැය හදන්නේ. 2020 ඉවරයි. හැම එකටම, කොවිඩ් සරණං ගච්ඡාමි! කොවිඩ් සරණං ගච්ඡාමි!! කොවිඩ් සරණං ගච්ඡාමි!!! කියලා "සර්ගේ ෆේල්" එක වහගන්න හැදුවාට අඩු තරමින් 2021 අය වැයෙන්වත් මේ ගැටලු විසඳන්නේ කොහොමද, ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්නේ කොහොමද කියලා අද පෙන්වා දීලා නැහැ කියලා මම මේ වේලාවේ කියනවා. ජනතාවට දෙනවා කියපු සහනවලින් මේ වෙනකොට කෝටි 7,300ක් මේ අය වැය ලේඛනය යටතේ අඩු කරලා තිබෙනවා. බඩු මිල ඉහළට යනවා. ව්‍යාපාරිකයන්ට සහයෝගය දෙන්න සීනි සඳහා බදු සහන ලබා දෙනවා. අල කිලෝග්‍රෑම් එක රුපියල් 300යි, ලූනු කිලෝග්‍රෑම් එක රුපියල් 250යි, බී ලූනු කිලෝග්‍රෑම් එක රුපියල් 500යි. පාලන මිලට පරිප්පු නැහැ. ගැසට් ගැහුවාට 'රිවස් ගැසට්' තමයි අද ඇවිල්ලා තිබෙන්නේ. ආණ්ඩුවට සල්ලි නැහැ. විශ්‍රාම වැටුප ගෙවාගන්න බැරි නිසා විශ්‍රාම යන වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කරලා තිබෙනවා. අවුරුදු 5ක් අර්ථසාධක අරමුදලේ සල්ලි රඳවාගන්න තමයි මේ තීන්දුව ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කියන එක අපි මේ වේලාවේ කියනවා.

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නතර කරලා ආසියානු සංවර්ධන බැංකුවෙන් සියයට 1ක පොලියට හම්බවෙච්ච ණය වෙනුවට චීනයෙන් සියයට 8ක පොලියට ණය ගන්න තමයි මේ අයට වුවමනා කරලා තිබෙන්නේ කියන එක අපි කියනවා. එදා මහින්ද රාජපක්ෂ මහත්මයා බලයට පත්වෙනකොට රුපියල් 95,000ක් වෙච්ච ඒක පුද්ගල ණය ප්‍රමාණය එතුමන්ලා බලයෙන් යනකොට 390,000ක් බවට පත් කරලා තමයි ගියේ. අද කෝටි ප්‍රකෝටි ගණනක් තවදුරටත් මේ රටේ ජනතාව ණයකරුවන් බවට පත් කිරීම තමයි මේ අවුරුද්ද ඇතුළතත් සිද්ධ වෙලා තිබෙන්නේ. යහ පාලන ආණ්ඩුවෙන් අවුරුදු 5ට ගත් ණය ප්‍රමාණයෙන් 1/3ක් මේ වෙනකොට මේ අලුත් ආණ්ඩුව අරගෙන ඉවරයි කියන එකත් මම මේ වේලාවේ කියනවා.

මේ වෙලාවේ ග්‍රීක් බැඳුම්කර ගනුදෙනුව, ශ්‍රී ලංකන් එයාර්ලයින් ගනුදෙනුව, ජපානයට රත්තරන් විකුණපු ගනුදෙනුව වාගේ ඒවායෙන් ආණ්ඩුව රටට කරපු පාඩුව නැවත අයකර ගැනීමක් ගැන කථා කරන්නේ නැතිව රටට මහා විශාල හානියක්, පාඩුවක් සිද්ධ කරලා, යහ පාලන ආණ්ඩුවේ වැරදි පිළිබඳව කථා කරන ගමන් මේ අය ප්‍රධානතම යෝජනාවක් විධියට ගෙන ආවේ මොකක්ද?

ඉපැයූ ආකාරය සොයා ගන්න බැරි මුදල් ලංකාවට ගෙනෙන්න මේ අය වැයෙන් ක්‍රමයක් හදලා දීලා තිබෙනවා. මේ මොකක්ද කරන්න හදන්නේ? නොයෙක්, නොයෙක් වේලාවට පිටරටට පටවපු සල්ලි ටික දැන් තමන්ට ඕනෑ විධියට අරගෙන එන්න, ඒ කළු සල්ලි ටික සුදු කර ගන්න තමයි මේ ක්‍රියාමාර්ගය හදලා දීලා තිබෙන්නේ. මේ අය වැය කළු සල්ලි සුදු කරන අය වැයක් මිස, ජනතාවට සහන සලසන අය වැයක් නොවෙයි කියන කාරණාව මම මේ වේලාවේ සඳහන් කරනවා.

ආබාධිත රණවිරුවන්ට සහන දෙනවා කියලා, විශ්‍රාම වැටුප් දෙනවා කියලා, ඔවුන්ගේ යැපෙන්නන්ට ජීවිතාන්තය දක්වා වැටුප් දෙනවා කියලා පොරොන්දු වෙලා ආණ්ඩුව මේ වන විට ඒ රණවිරුවන් පැත්තකට දමලා. ඒ විතරක් නොවෙයි, වැටුප් කප්පාදුව දක්වා ගිහිල්ලා මේ වන විට රුපියල් 5,000ක් වැඩියෙන් දුන්නා කියලා ආබාධිත රණවිරුවන්ගේ වැටුපෙන් මාසයකට රුපියල් 2,500 ගණනේ කපන්නත් පටන් ගෙන තිබෙනවා. ආබාධිත රණවිරුවන්ට එහෙමයි දැන් මේ ආණ්ඩුව සලකන්න පටන් ගෙන තිබෙන්නේ. මේ අය වැය, ජනතාවට දීපු පොරොන්දු පැත්තකට දමලා, ජනතාවට දීපු පොරොන්දු කුණු කූඩයට දමලා, තමන්ට ඕනෑ, ඕනෑ විධියට ගජමිතුරන්ට සලකන, තමන්ගේ ඡන්දය වෙනුවෙන් වැඩ කරපු, තමන්ගේ වැඩ පිළිවෙළ වෙනුවෙන් උදවු කරපු අයට සහන සලසන අය වැයක් විතරයි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාවේ ඉතිරි කොටස සභාගත කරන්න. අද වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගජ මිතුරු අය වැයක් විතරයි, කළු සල්ලි සුදු කරන අය වැයක් විතරයි, ෆේල් රාජ්‍යයක් කරා යන්න සූදානම් කරන ෆේල් ආණ්ඩුවක අය වැයක් විතරයි කියන එක සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා.

[අ.භා. 2.48]

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාදයේ අවසාන දවසේ ඒ සම්බන්ධ කරුණු කිහිපයක් එක්කාසු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා පෞද්ගලිකව සතුටු වෙනවා. මනුෂ නානායක්කාර මැතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම ගැනත් මා සතුටු වෙනවා. මම එතුමාගේ කථාව අහගෙන හිටියා. ඊට පිළිතුරක් ලබා දිය යුතුයි කියලා මම හිතුවා. එතුමා යම් උත්සාහයක් කළා. ඒ උත්සාහය සාර්ථකයි. එතුමා දක්ෂ කථිකයෙක්. හැබැයි, ඒ කරුණු සම්බන්ධ තීරකයා ජනතාවයි. ඒ ජනතා තීරකයා පැහැදිලි තීරණ ලබා දීලා තිබෙනවා. ඒ තීරණ තුළ ජනතාව ඉන්න සූදානම්. ජනාධිපති පත්වෙලා වසරයි. පාර්ලිමේන්තුව පත්වෙලා මාස හතරක් පමණයි. ඒ නිසා ඉතාම අසාධාරණ ලෙස කථිකත්වය භාවිත කිරීම ජනතාව ප්‍රතික්ෂේප කරලා අවසානයි කියලා කනගාටුවෙන් හෝ ප්‍රකාශ කරන්න ඕනෑ.

එතුමා කියපු කරුණු දෙකක් ගැන පමණක් මම කියන්නම්. පළමුවැනි කරුණ තමයි, එතුමා කිව්ව දැනට රැකියාවක නියුතු, EPF හිමිකම් ලබන, උපාධිධාරීන්ට තවම පත්වීම් දීලා නැහැ කියන කාරණාව. හැබැයි, මනුෂ නානායක්කාර මැතිතුමාට අමතක වුණා, උපාධිධාරීන් 60,000කට රැකියා දෙනවාය කියන එක. ඒක අමතක වුණා. ඒ නිසා බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, ඉතිහාසයේ පළමුවැනි වතාවට එක දිනයකදී 60,000කට පත්වීම් දෙන්න තීන්දු කළ බව. ඔරලෝසු කණු යට, හන්දි ගානේ, railway station එක ඉස්සරහ බෝඩ් එල්ලාගෙන හිටපු අපේ අහිංසක දරුවන්ට -මේ රටේ සියයට 3ටත් වඩා අඩු ප්‍රමාණයක් වන විශ්වවිද්‍යාලයට යන දරුවන්ට- එලෙස පත්වීම් ලබා දීම ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ. මතක තියා ගන්න, ඉතිරි 11,000ටත් ඉදිරි සති දෙක ඇතුළත පත්වීම් ලබා දෙනවා කියලා. දැනට EPF හිමිකම් ලබන උපාධිධාරීන්ට, ඒ අයගේ ඉල්ලීම අනුව රැකියා ලබා දෙනවාය කියන එක ඉතාම නිහතමානිව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මෙය ඉතිහාසගත වන වැඩක්. ඒ නිසා ඔබගේ දක්ෂ කථිකත්වය මහජනතාවගේ දේශපාලන වෙළෙඳ පොළේ අළෙවි වෙන්නේ නැහැ කියන එක බොහොම කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. හැබැයි, අපි අපේ පැත්තෙන් එහෙම කියන්නේ සතුටින්. ඒ නිසා එවැනි කරුණු මතක තියා ගන්න.

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

ඊළඟට, highway එක ගැන කිව්වා. ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභා ගැබේ ඉන්නවා. ඒ කාලයේ අපේ පළාතට highway එකක් එනවා කියනකොට මම හරි ආඩම්බර වුණා. 2014 ඒ වැඩ ආරම්භ කළා. අපි බලාපොරොත්තු වුණා, 2018.12.18වැනි දින ඒ වැඩ අවසාන කරන්න. මොන, මොන හේතු නිසා හෝ යහ පාලන කාලය තුළ ඒ ඉලක්කවලට යන්න බැරුව ගියා. ඒකට වැඩිම ප්‍රශ්න මතු වුණේ ඔබතුමන්ලාගේ පැත්තේ හිටපු ප්‍රබල ඇමතිවරයෙකුගෙන්. එතුමාට දීපු කොන්ත්‍රාත් එකේ මුළු මුදල තවම ගෙවලා නැති තත්ත්වයට පත් වෙලා, ඒක පැත්තකට යන්න, විසිවෙන්න advance එක අරගෙන වැඩ කරන්නේ නැති තත්ත්වයකට පත් වුණා. ඔබතුමාට ඒ ගැන කථා කරන්න බැරි වෙයි. නමුත් ඒක තමයි ඇත්ත.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ඇත්තක්.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
බොහොම ස්තුතියි. මම සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ අසත්‍ය කියන්නේ නැහැ. කරුණු හොයාගෙනයි කථා කරන්නේ. ඒ නිසා මේ අය වැය කථාවේදී-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා, මා ඔබතුමාට කියන්න ඕනෑ, එතුමාට advance එකක් දුන් බව. එක කිලෝමීටරයක්- [බාධා කිරීමක්]

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ time එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ වෙලාවෙන් ගන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Advance එකක් දුන්නා, හැබැයි ඒ advance එක ලබාගන්න පුළුවන්, අපේ agreement එක හදලා තිබෙන විධියට. එතුමන්ලාගෙන් ඒක ලබාගන්න පුළුවන්.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
අපි එහෙම බලාපොරොත්තු වෙමු. ඒ කියන්නේ, වංචාවක් කළා, ඒ වංචාව නිවැරදි කරගන්න උත්සාහයක යෙදෙනවා කියන එකයි. බොහොම හොඳයි.

මේ අවස්ථාවේ අපි කියන්න ඕනෑ, මේ අය වැයක පුරෝකථනයක් බව. මේ පුරෝකථනය ගැන වාද විවාද කරන්නට පුළුවන්. හැබැයි, ඒ වාද විවාද යථාර්ථයක් වන්නේ ලබන අවුරුද්දේ ඒ සම්බන්ධව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ එක්ක. මට මතකයි 2015 අය වැයෙන් රුපියල් බිලියන 303ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ බව. නමුත් වැඩ කළේ රුපියල් මිලියන 61ක. ඒ නිසා ඒ පුරෝකථන වැරැදියි. සෞඛ්‍යයට වෙන් කළ ප්‍රමාණයෙන් සියයට 26ක පමණයි වැඩ කරන්න පුළුවන් වුණේ. ඒ නිසා ඒ පුරෝකථනයත් වැරැදියි. ඒ නිසාම තමයි යහ පාලනය දවසින් දවස දියවෙමින් ගියේ.

මතක තියාගන්න, අත් දැකීම් තිබෙන කණ්ඩායමක් 2005 වර්ෂයේදී ආණ්ඩුව භාරගන්න කොට මේ රටේ ණය බර දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 98ක් වූ බව. මේ රටේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,030යි. මේ රටේ දර්ශක - indicators - සියල්ල, එනම් අය වැය පරතරය, විරැකියාව, උද්ධමනය ආදි සියල්ල පාලනයෙන් තොර තැනක තිබුණේ. අවුරුදු 5ක කාලයක් තුළ, එක පැත්තකින් යුද්ධය කරන විට, අනෙක් පැත්තෙන් ලෝක වෙළඳ පොළේ තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 100 - 120 අතර තිබෙන විට, ලෝක ආර්ථික අවපාතයක් ඇති වෙලා තිබෙන විට අපට පුළුවන් වුණා, අවුරුදු 30ක් තිබුණු යුද්ධය අවසාන කරන්න; ඒ පමණක් නොව ඒ හා සමානවම දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළ ගණනාවක් මේ රටේ ක්‍රියාත්මක කරන්න. අප රට භාරගන්න කොට මුළු රටේම වටිනාකම, GDP එක වෙලා තිබුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 24යි. අපි රට භාර දුන්නේ එය ඇමෙරිකානු ඩොලර් බිලියන 80ක් කරලායි. ඒ නිසා පැහැදිලිව මේ කාලය තුළ අප මනින්න ඕනෑ අප කරපු වැඩවලින් ඊළඟ වසරේ ලැබෙන ප්‍රතිඵලයි.

අපි අලුතින් දේශපාලන සංස්කෘතියක් හැදුවා. අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ වියදම් රුපියල් බිලියන 1.9කින් කපා හැරියා. රාජ්‍ය ආයතනවල එතුමාගේ පින්තූර ගහන එක නතර කළා. මුළු ජනාධිපති කාර්යාලය තුළ සිදු වෙච්ච අනිසි වියදම් සියල්ල අයින් කරලා තමයි, රටට ආදර්ශයක් දීලා එතුමා එතුමාගේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කරන්නේ කරුණු තුනක් ගැන. එකක්, ජාතික ආරක්ෂාව හා ඒ එක්ක බැඳුණු ජාතික සමඟිය. ඊළඟ එක, රටේ ආර්ථිකය. ඊළඟ එක තමයි බෙදුම්වාදයත් සමඟ අප ගනුදෙනු කරන විධිය.

බෙදුම්වාදය ගැන කථා කරන විට කිව යුතු කාරණයක් තිබෙනවා. මීට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කරද්දී කිව්වා, "For 70 years, you tried to destroy our voice, but we were able to keep our voice and we will continue to have it for another 70 years" කියලා. Remember, for 2,500 years, you have been saying this; for 2,500 years, they have been trying to separate this country; for 2,500 years, they have been trying to do this, but we were able to sustain it; we were able to hold it. We are happy to note that now all communities can get together and have one Sri Lanka. But, I remember one of the Hon. Members saying that there are different definitions for "sovereignty". I would like to know what the different definitions are for "sovereignty". You or any citizen of this country has no right to compromise with sovereignty. I must say that with conviction.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් බලන විට, අප ලබාදුන් පුරෝකථන සමඟ අප ගෙන ගිය වැඩ පිළිවෙළ අනුවයි ජනතාව අපට සහතිකයක් ලබා දීලා තිබෙන්නේ. කොවිඩ් වසංගතය වෙනුවෙන් රුපියල් බිලියන 80ක් වියදම් කරන්න අපට හැකියාවක් ලැබුණා. අපි යාපනයේ ගෙයක් හදන කොට බිබිලේ ගිහිල්ලා පෝස්ටර් ගැහුවේ නැහැ. ආණ්ඩුව මේ වන කොට ගෙවල් 14,000ක් හදමින් තිබෙනවා. මේ වන කොට මගේ

ආසනයේ හැම ග්‍රාම නිලධාරි වසමකම ගෙයක් හැදෙනවා. ලක්ෂ 7ක ණයක් නොවෙයි, දීමනාවක් දීලා තිබෙනවා. ඒ වාගේම සෑම ආසනයකටම නිවාස 100ක තට්ටු නිවාස එක ගණනේ ලබා දෙන්න අපි උත්සාහ කරනවා. අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මාර්ග කිලෝමීටර් 100,000ට අදාළ වැඩ ආරම්භ කරලා තිබෙනවා. හැම සතියේම මම මගේ ආසන තුනහතරක එවැනි වැඩ ආරම්භ කරනවා. ඒවා යථාර්ථයන්. අපි ඒ වැඩ කරනවා. ඒවා නිකම් කථාවට සීමා වෙච්ච දේවල් නොවෙයි. ඒ නිසාම තමයි විපක්ෂය අපට විරුද්ධව ගෙන යන වැඩ පිළිවෙළ ජනතාව ප්‍රතික්ෂේප කළේ. ඒ නිසාම තමයි අවුරුද්දකට අඩු කාලයක් වූ අපේ ආණ්ඩුවට නොයෙකුත් චෝදනා නඟද්දී, ඒ චෝදනා සියල්ල ප්‍රතික්ෂේප කරමින් ජනතාව කියන්නේ, "උඹලාට රට බාරදීලා තිබෙනවා, ඒ රටේ ඉතිරි වැඩ ටික කරන්න අපේ ආශීර්වාදය උඹලාට තිබෙනවා" කියලා. ඒ ආශීර්වාදය පන්සල, පල්ලිය, කෝවිල ඇතුළු හැම තැනින්ම අපට ලැබෙනවා කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Minister, your time is up.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
How many minutes more do I have, Sir?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is up, Hon. Minister.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
How many minutes did I have?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You had eight minutes.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Okay. Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Minister.

මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 2.57]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අය වැය විවාදයේ අවසාන දවස. මේ අවසාන දවසේ ඇත්තටම මා කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ තමුන්නාන්සේලාගේ අය වැයේ සාරාංශය පිළිබඳයි.

මේ අය වැය විවාදය පටන්ගන්න කොට අපේ ගරු විපක්ෂ නායකතුමා සෞඛ්‍ය ඇමතිතුමියගෙන් කාරණයක් විමසුවා. කොවිඩ්- 19 මරණ සම්බන්ධ එතුමියගේ වාර්තාව එතුමිය කෙටි කාලයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා කිව්වා. අපි මේ අය වැය විවාදය පටන්ගෙන අද වන කොට මාසයකට ආසන්න කාලයත් ගත වෙලා තිබෙනවා. නමුත් ඒ තාක්ෂණ කමිටුවේ වාර්තාව හෝ ඒ තාක්ෂණ කමිටුවේ ඉන්න නිලධාරින් කවුද, එහි සිටින වෘත්තීයවේදින් කවුද, ඒ විෂය සම්බන්ධයෙන් ඉන්න විශේෂඥයන් කවුද කියන එක ගැන අද වන කල් මේ පාර්ලිමේන්තුව දැනුවත් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට කොවිඩ්- 19 හේතුවෙන් මරණ එකසිය හතළිස් ගණනකට ආසන්න ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අතරින් මුස්ලිම් ප්‍රජාවගේ මරණ අසූ ගණනක්. මිය යන මුස්ලිම් ප්‍රජාවගේ දේහ භූමදාන කරන්න ඕනෑය කියන ඉල්ලීම අපි කර තිබෙනවා. අද වන කොට එම විරෝධය කොයි තරම් දුරකට ගිහිල්ලා තිබෙනවාද කිව්වොත්, මුස්ලිම් ප්‍රජාව ඒ මරණ බාරගන්නේ නැති තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. කවුරුවත් ඒ මරණ අද වන කොට බාරගන්නේ නැහැ. මොකද, ඒ අය විශ්වාස කරන දේ අනුව ඒ දේහ ආදාහනය කිරීම පාපයක්. ලෝකයේ අනෙකුත් රටවල, මිය ගිය කොවිඩ් ආසාදිතයන්ගේ දේහ භූමදාන කරන්න පුළුවන් වෙලා තිබෙන නමුත් මේ රජය හිතා මතාම එය මඟ හරිනවාය කියන කාරණය අද මේ රට තුළ ජීවත් වන මුස්ලිම් ප්‍රජාවගේ හිත්වලට කා වැදිලා තිබෙනවා.

අද ඉන්දියාවේ සුළුතරයක් හැටියට ජීවත් වන මුස්ලිම් ප්‍රජාවට ඒ අයිතිය තිබෙනවා; තායිලන්තයේ සුළුතරයක් හැටියට ජීවත් වන මුස්ලිම් ප්‍රජාවට ඒ අයිතිය තිබෙනවා. ලෝකයේ මුස්ලිම් ප්‍රජාව සුළුතරයක් හැටියට ජීවත් වන අනෙකුත් රටවලත් භූමදානය සඳහා අවසර ලබා දී තිබියදීත්, මේ ඇඹිල්ල, මේ අදෝනාව වෙනුවෙන් කරන්න පුළුවන් දෙයක් තිබියදීත් මේ රජය හිතුවක්කාර විදියට ඒක නොකර ඉඳීම තුළ පැහැදිලිවම ආණ්ඩුව එය මඟ හරිනවාය කියන අදහස, විශ්වාසය ඒ ජන කොටස්වලට අද කා වැදිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අපි දැක්කා, මට්ටක්කුලිය ප්‍රදේශයේ මිය ගිය දවස් 20ක සිඟිති දරුවකුට කොවිඩ්- 19 වයිරසය ආසාදනය වෙලා තිබෙනවා කියා ඒ දරුවාගේ දේහය අදාහනය කළ බව. එම දරුවාගේ දෙමවුපියන්ගෙන් කාටවත් කොවිඩ්- 19 වයිරසය ආසාදනය වෙලා තිබුණේ නැහැ. නමුත් ඒ දරුවාට කොවිඩ්- 19 වයිරසය අසාදනය වෙලා තිබුණා. එම දෙමවුපියන්ගේ ඉල්ලීම වෙලා තිබුණේ එම දරුවාගේ දේහය භූමදාන කරන්න ඉඩ දෙන්න කියන එකයි. නමුත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගෙන තිබෙන තීන්දු-තීරණ උඩ ඒ දරුවාගේ දේහය බලහත්කාරයෙන් ආදාහනය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙනවා, ගැටලුවක්. ලෝකයේ හැම රටක්ම කොවිඩ්-19 මරණ භූමදානයට ඉඩ දීලා තිබියදීත් තමුන්නාන්සේලා එයට ඉඩ දෙන්නේ නැත්තේ, මේ රටේ ඉන්න මුස්ලිම් ප්‍රජාව මේ රටේ දෙවැනි ගණයේ පුරවැසියන් හැටියට තමුන්නාන්සේලා සලකන නිසාද? දෙවැනි ගණයේ පුරවැසියන් හැටියටද අප සලකන්නේ? අපට ඒ අයිතිය ලබා දෙන්නේ නැත්තේ තමුන්නාන්සේලා එහෙම හිතාගෙන සිටින නිසාද? මේ තුළ තමුන්නාන්සේලා ලබන සන්තෝෂය මොකක්ද? මෙහෙම කරලා තමුන්නාන්සේලා කාලකණ්ණි සන්තෝෂයක් ලබනවාද?

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக்கல்வி, பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Women and Child Development, Preschools and Primary Education, School Infrastructure and Education Services)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මේ විධියේ ප්‍රකාශයක් කිරීම තුළ සිදු වන්නේ මොකක්ද? සිංහල, මුස්ලිම් ජනතාව බොහොම සාමකාමීව ජීවත් වන බේරුවල ප්‍රදේශයේයි මම ජීවත් වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
එතුමා කළ ඒ ප්‍රකාශය ඉතාම බරපතළ ප්‍රකාශයක්. එවැනි ප්‍රකාශයක් කිරීම-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක ඔබතුමන්ලාගේ කථාවලදී නිවැරැදි කරන්න. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අසාධාරණ තීන්දුව උඩ විශාල පිරිසක් තමන්ගේ සිත් තුළ විශාල වේදනාවක් තියාගෙන ජීවත් වෙනවා. මම කථා කළේ ඒ ගැන. තමන්ගේ විශ්වාසය අනුව මේ රටේ අවුරුදු දහස් ගණනක් ඒ මරණ භූමදාන කරන්න තිබුණු අයිතිය අද මේ ආණ්ඩුව පැහැර ගෙන තිබෙනවා. ඒක ගැන කථා කිරීම කිසිම අයුරකින් ජාතිවාදයක් නොවෙයි.

ගරු පියල් නිශාන්ත ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමාට මම කියන්න කැමැතියි, තමුන්නාන්සේ මුස්ලිම් ජනතාවත් එක්ක ජීවත් වෙනවා නම් තමුන්නාන්සේ අද ඒ මුස්ලිම් ජනතාවට වෙච්ච අසාධාරණයත් එක්ක හිටගන්න; ඒ වෙනුවෙන් කථා කරන්න කියලා. එහෙම නැතුව ඒකට විරුද්ධව අදහස් දක්වන්න එපා කියලා මම ඔබතුමාට කියන්න කැමැතියි. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මට කොවිඩ්-19 වයිරසය ආසාදනය වුණොත්, ආයුර්වේද ප්‍රතිකාර ගන්න ඕනෑ කියලා මම හිතුවාට මට ඒකට අයිතියක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඉක්මනට කථාව අවසන් කරන්න.

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පියල් නිශාන්ත ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාගේ නම කියපු නිසා ඔබතුමාට අවස්ථාව දෙනවා.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල ද, මුස්ලිම් ද, ද්‍රවිඩ ද, බර්ගර් ද, මැලේ ද කියන එක නොවෙයි බලන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Speak on what is being discussed today.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
අපි එක රටක් තුළ ජීවත් වන අය. ඒ නිසා මෙවැනි ජාතිවාදී කථා ප්‍රකාශ කිරීම වහාම නවත්වන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, තත්පර 30ක් තිබෙනවා, කථාව අවසන් කරන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැහැ, තත්පර 30ට වැඩිය තිබෙනවා.

தலைவர் அவர்களே, நான் ஒன்று கூற விரும்புகின்றேன் என்னவென்றால், இந்த நாட்டிலே இந்த ஜனாசா அடக்கம் தொடர்பாகத் தற்போதிருக்கின்ற சட்டமானது, இந்த நாட்டில் வாழக்கூடிய சிறுபான்மை மக்களில் ஒரு சிறுபான்மை மக்களுக்கு எதிராகச் செயற்படுத்தப்படுகின்ற சட்டமாகும். அதனால், இந்த நாட்டின் வரலாற்றிலே இந்த அரசாங்கத்தினர் அநியாயக்காரர்களாகத்தான் பதியப்படுவார்கள் என்பதனை எல்லோரும் ஞாபகத்தில் வைத்துக்கொள்ள வேண்டும். இது ஒரு சமூகத்திற்குச் செய்யக்கூடிய ஒரு துரோகமும்

அநியாயமும் ஆகும். உலகத்திலே இருக்கக்கூடிய எல்லா நாடுகளும் அவர்களது உடல்களை அடக்கம் செய்வதனை ஏற்றுக்கொண்டிருக்கின்றன. WHOவினால் ஏற்றுக்கொள்ளப் பட்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up. Please wind up.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
அவ்வாறு ஏற்றுக்கொண்டிருக்கின்ற ஒரு விடயத்தை உங்களுடைய அரசாங்கம் மட்டும்தான் ஏற்றுக்கொள்ளாமல், மறுத்துக்கொண்டிருக்கின்றது. எனவே, தயவுசெய்து இந்த நாட்டிலே வாழக்கூடிய இந்தச் சமூகத்திற்காக இதனை நீங்கள் அங்கீகரிக்கவேண்டுமென்று நான் கூறிக்கொள்ள விரும்பு கின்றேன். நன்றி.

ගරු මිලාන් ජයතිලක මහතා
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක සෞඛ්‍ය අංශය පිළිගන්නේ නැති කාරණාවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
It is not a point of Order, Hon. Member. - [*Interruption.*] Order, please! ගරු තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා කරුණාකර, සභා ගර්භය තුළ හැසිරෙන්න දැන ගන්න.

මීළඟට, ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා. It is your turn.

[අ.භා. 3.04]

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අය වැය විවාදයට එකතු වීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිතුමා වශයෙන් අය වැය ඉදිරිපත් කළාට පසු දින 21ක් තුළ මේ ගරු සභාවේ පැවති වාද විවාද රාශියකට මම ඇහුම්කන් දුන්නා. ඒ සමඟම වෙන වෙන අංශ සමඟත් සාකච්ඡා පවත්වන්න මට අවස්ථාව ලැබුණා. ඒ සියලු අදහස් මට ඉතාම වැදගත් බව මම මේ අවස්ථාවේ කියන්නට කැමැතියි. මේ ගරු සභාවෙනුත් අපට අදහස් රාශියක් ලැබුණා. ඒවා ගැනත් මම සියලු මැති ඇමතිවරුන්ට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කථා අහන කොට මා දැකපු එක මූලික දෙයක් තිබෙනවා. ඒ තමයි අපේ රටේ විපක්ෂය සාමාන්‍යයෙන් ඇහුම්කන් දෙන්නේ අපේ රටේ අයට නොවෙයි කියන එක. ඒ අය ඇහුම්කන් දෙන්නේ ජාත්‍යන්තරයට; ඩයස් පෝරාවට; ලෝක බලවතුන්ට; පොත් ලියන විද්වතුන්ට. ඒ අයට ඇහුම් කන් දෙනවා. ඒ අය කිසි විටෙක මේ රටේ ජනතාවට ඇහුම්කන් දෙන්නේ නැහැ. මේ රටේ ඉන්න දුගී දුප්පත් ජනතාවගේ අදහස් ඒ අයට අදාළ වෙනවා කියලා මම හිතන්නේ නැහැ. අපේ රජය ඇහුම්කන් දෙන්නේ අපේ රටේ ජනතාවට; ගොවීන්ට; ධීවරයන්ට; සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ට. අපි ඒ අයට ඇහුම්කන් දීලා තමයි අපේ අය වැය හදලා තිබෙන්නේ. ඒ අය ගැන අපි සැලකිලිමත් වෙනවා. සමහර විට ඒ අයට අපේ තර්ක තේරුම් ගන්න බැරි වෙන්න පුළුවන්. අපි ඒ අයගේ තර්ක තේරුම් ගත්තත්, ඒ අයගේ පරමාර්ථය වෙනස් නිසා අපට සමහර වෙලාවට ඒ තර්ක අනුව කටයුතු කරන්න බැරි වීම ගැන මේ අවස්ථාවේදී අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ සමඟම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා කථා කරන්න අවශ්‍යයි කියලා බොහෝ දෙනකු කියනවා අපට ඇහුණා. මම ඒ අයට පෙර අවුරුදු කිහිපයක්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කථා කරලා තිබෙනවා. 2007දී සහ 2008දී ලෝකයේ දැවැන්ත අර්බුදයක් තිබෙන අවස්ථාවක ශ්‍රී ලංකාව වෙනුවෙන් ගිහිල්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කථා කරන්න මට පුළුවන් වුණා. ඒ සමහර සාකච්ඡාවලදී අපේ වචන හුවමාරුව මට මතකයි. එක වරකදී ඒ අය කිව්වා, "You are not accepting the position of the international requirements. You have a different viewpoint on these matters" කියලා. එතකොට මම කිව්වා, "Yes, we have a different viewpoint because what we are concerned about is our country and our economy. For you, it is a case study; for you, it is a theory. You would probably write a nice book about it later on. Then, you would say, "This was the experience that I had in Sri Lanka" කියලා. ඒ අයට ඒක අත්දැකීමක්. ඒ අයට ඒක තමන්ගේ CV එකට දන්වන්නට තිබෙන එක කරුණක්. අපට එහෙම නොවෙයි. මේක අපේ රට, අපේ ජනතාව. අපට මේකට වග කියන්න තිබෙනවා. තව ටික කලකට පස්සේ ඒ අයට සිදු වන්නේ වෙන රටකට යන්නයි. ඒ අය ශ්‍රී ලංකාව ගැන කථා කරලා ටික කලකට පස්සේ වෙන රටක් ගැන කථා කරාවි. ඒ අය ඊට පස්සේ නවසීලන්තයට යාවි. අපට එහෙම නොවෙයි. අපි මේ රටේ ඉන්නේ. අපි මේ රට ගැන හිතනවා කියලා මම ඒ අයට පැහැදිලි කර දුන්නා. ඒ විවාදයෙන් පස්සේ අපට පුළුවන් වුණා, ශ්‍රී ලංකාවේ මතයට එන්න. ඕනෑ වෙලාවක IMF එකේ website එකට ගිහිල්ලා අපි ඒ කාලයේ ඒ අයත් එක්ක අත්සන් කරපු ගිවිසුම් බැලුවොත් පෙනේවි, ශ්‍රී ලංකාවට කිසිම හානියක් ගෙන දෙන එක වාක්‍යයක් ඒ ගිවිසුම්වල නැති බව. මම විශේෂයෙන්ම ඒ ගැන මතක් කර දෙනවා.

ඊළඟට, මේ alternatives ගැන කියනවා. ඔව්, සමහර alternatives තිබෙනවා. ඒ alternatives අපේ රටට ගැළපෙනවාද කියලා බලන්න ඕනෑ. ඒක තමයි මූලික දේ. අපි අපේ අය වැය සකස් කරද්දී අපේ රටේ දුර දර්ශනය ගැන හිතලා, දිගු කාලීන සැලැස්ම මොකක්ද කියලා බලලා තමයි අපේ රටේ සැලැසුම් හදලා තිබෙන්නේ. ඒ නිසා තමයි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ යම්කිසි දිසාවක් තිබුණේ; මහින්ද චින්තනයේත් යම්කිසි දිසාවක් තිබුණේ. අපේ ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාත් කිව්වා වාගේ, අපි ඒ දිසාවට දිගින් දිගටම ගමන් කළ නිසා තමයි 2005දී ඇමෙරිකානු ඩොලර් බිලියන 24ට තිබුණු දළ දේශීය නිෂ්පාදිතය 2014 වෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 79ක් දක්වා ගෙන ආවේ. විපක්ෂය අපේ රටේ ඉරණම භාර ගෙන සිටි කාලයේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 79ක්ව තිබුණු දළ දේශීය නිෂ්පාදිතය අවුරුදු පහක් තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 83ක් දක්වා ගෙන ඒමට පමණයි එතුමන්ලාට

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

පුළුවන් වුණේ. අවුරුදු පහක කාලය තුළ ගෙන එන්නට පුළුවන් වුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 4යි. අපේ කාලයේ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 24 ඉඳලා ඇමෙරිකානු ඩොලර් බිලියන 79ක් දක්වා ගෙන ගියේ අපි ඒ දැක්ම හරහා කටයුතු කළ නිසාය කියලාත් මේ අවස්ථාවේදී මා මතක් කර දෙන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ අප ඉදිරිපත් කර තිබෙන අය වැයේ පැති කිහිපයක් තිබෙනවා. පළමුවැනි එක තමයි වර්ධනය. වර්ධනයක් නැතිව කවදාවත් රටක් ගෙනයන්න බැහැ. අපි කොපමණ කිව්වත්, වර්ධනයක් නැතිව යන්න පුළුවන් කියලා හිතාගෙන සිටියත් ඒ ගමන යන්න බැහැ. රටක වර්ධනයක් තිබෙන්නට ඕනෑ. ඒ වර්ධනය හරහා තමයි රටේ උද්යෝගයක් ඇති වෙන්නේ. ඒක අවශ්‍යයි. ඒ නිසා තමයි අපි මේ investment එක කරන්නේ. අපි ආයෝජනය කරන්නේ අන්න ඒ නිසායි. ආයෝජනය නොකෙරුවා නම් අපට ඒ ගමන යන්නට බැරිවෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වර්ධනය ඇති කිරීම සඳහා රජය, අපේ රටේ පෞද්ගලික ක්ෂේත්‍රය අවශ්‍ය ආයෝජන කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒක අපි කරගෙන යනවා. ඒ සමඟම ස්ථායී ආර්ථිකයක් තිබෙන්නටත් ඕනෑ. රුපියල ස්ථායීව තිබෙන්නට ඕනෑ. රුපියලේ ස්ථායීභාවයක් නැතිනම්, පොලී අනුපාතය ස්ථායීභාවයක පවතින්නේ නැත්නම් කිසි විටෙක රටක් ඉදිරියට ගෙනයන්න බැහැ. පසුගිය ආණ්ඩුවට තිබුණු එක මූලික ප්‍රශ්නයක් තමයි රුපියලේ ස්ථායීභාවය රැක ගැනීමට එතුමන්ලාට නොහැකිවීම. රුපියලේ ස්ථායීභාවය රැක ගන්නට බැරි වුණා නිසා, විටින් විට දැවැන්ත ලෙස රුපියල කඩා වැටෙනවා අප දැක්කා. අවුරුදු පහක් තුළදී සියයට 50කින් පමණ රුපියල කඩා වැටුණා. එතකොට කිසිම ස්ථායිභාවයක් අපි දැක්කේ නැහැ. ඒ හරහා රටට දැවැන්ත පාඩුවක් සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ආණ්ඩුව අපේ රටේ ණය ප්‍රමාණය ට්‍රිලියන 13ක් දක්වා වැඩි කර තිබුණා. ට්‍රිලියන 1.8ක් එකතු වෙලා තිබුණේ රුපියල අවප්‍රමාණ වීම නිසායි. ඒ කියන්නේ කිසිම දෙයක් අපේ රටට එකතු වුණේ නැහැ. එකතු වෙන්නේ නැතිව ණය බර වැඩි වෙනවා. ඒ දිහා කවුරුන් හෝ බැලුවාම දකින්නේ ඉතාම නරක චිත්‍රයක්. ඒ නිසා තමයි මේවා රැක ගන්නට අවශ්‍ය වන්නේ. ඒ වාගේම, පොලී අනුපාතයත් වැඩි කරගත්තා. පොලී අනුපාතය වැඩි කර ගත්තාම ඒ හරහාත් දැවැන්ත ප්‍රශ්නයක් ඒ අයට ඇතිවුණා. ඒක manage කරගන්න බැරි වුණා. එම නිසා අපි ඒවා හොඳින් කළමනාකරණය කරගන්නට අවශ්‍යයි.

යටිතල පහසුකම් වර්ධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ජලය, රටේ පාරවල්, අලි-මිනිස් ගැටුම විසඳීම, අධ්‍යාපනය වෙනුවෙන් අපි ලබන අවුරුද්ද තුළදී මුදල් වෙන් කර තිබෙන්නේ අන්න ඒ නිසායි. ඒක අපි දිගින් දිගටම කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හරහාත් රටේ තිබෙන ස්ථායිභාවය තවදුරටත් රැකගන්නට අපට පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දූෂී-දූප්පත්භාවය තුරන් කරන්න අවශ්‍යයි. එසේ තුරන් කිරීම අවශ්‍යමයි කියලා මම කියනවා. මොකද, අපේ රටේ ජනතාව වෙනුවෙන් අපේ තිබෙන සැලැස්මේ ක්‍රියාකාරිත්වය අඩු කිරීම හෝ එහෙම නැත්නම් ඒ අය යම්කිසි කාලයක් තිස්සේ දුගී දුප්පත්භාවයෙන්ම තියා ගන්න අපි යනවා නම් ඒ සැලැස්මේ ඇති හරයක් නැහැ. එහෙම නම් අපි ඒ දුගී දුප්පත්භාවය නැති කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. අපි ඒක කරන බව මතක තබා ගන්නට අවශ්‍යයි.

පසු ගිය කාලය තුළ අපේ රටේ සංවර්ධන ධාරිතාව - capacity - අපි වැඩි කර තිබෙනවා. ඒ ධාරිතාව අපි දිගින් දිගටම පවත්වාගෙන යන්නත් අවශ්‍යයි. ධාරිතාව එලෙස පවත්වාගෙන යන්නට නම් අපේ රටේ තිබෙන අනෙකුත් ක්ෂේත්‍ර, රටේ ජනතාව, රටේ ශිෂ්‍යයන්, රටේ ශ්‍රම බලකාය ඒ සඳහා පුහුණු කරන්නට අවශ්‍යයි.

දැන් අපි ඉදිරිපත් කර තිබෙන අය වැය තුළින් ශ්‍රම බලකාය පුහුණු කිරීමට දැවැන්ත උත්සාහයක් ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම උත්සාහ කරගෙන යන බවත් අපි කියන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට බදු වැඩි කරන්නට බැහැ කියලා තිබෙනවා. පසු ගිය රජයේ ක්‍රමවේදයත් එක්ක බැලුවාම අපේ බදු වැඩි කිරීමේ ක්‍රමවේදය තුළ විශේෂ වෙනසක් තිබෙනවා. ඒ අය බදු වැඩි කරන්නට වැයම් කළේ, tax-to-GDP ratio එක වැඩි කරන්නට ඕනෑය කියලා පුළුවන් තරම් tax rate එක වැඩි කිරීමෙන්. Tax rate එක වැඩි කළාම, ඒ කියන්නේ ප්‍රතිශතය වැඩි කළාම අපි දැක්ක දේ තමයි දිගින් දිගටම ප්‍රතිශතය වැඩි වෙන එක. ඒ වුණාට base එක දුර්වල වෙනවා. Base එක දුර්වල වුණාම අපට එකතු කර ගන්න පුළුවන් බදු ප්‍රමාණය දිගින් දිගටම අඩු වෙනවා. ඒ තත්ත්වය නිසා ආර්ථිකය සංකෝචනය වෙනවා අපි දැක්කා. 2015දී ඒ අයට සියයට 5ක වර්ධන වේගයක් ඇති කර ගන්න පුළුවන් වුණා. 2016දී වර්ධන වේගය සියයට 4.7ක් දක්වා අඩු වුණා. 2017දී සහ 2018දී ඒක තව දුරටත් අඩු වුණා. ඒ වාගේම, 2019දී තව දුරටත් අඩු වුණා. 2019දී වර්ධන වේගය සියයට 2.3ක් දක්වා අඩු වුණා. අපි tax-to-GDP ratio එක වැඩි කරන්න හැදුවාට අන්තිමට සිදු වුණේ රටේ ආර්ථිකය සංකෝචනය වීමයි. එම නිසා අපි ඒ ගැනත් සැලකිලිමත් වෙලා, අපේ tax base එක වැඩි කර ගැනීමටත්, tax එකතු කර ගැනීමටත් කටයුතු කරන්න අවශ්‍යයි. සමහර තැන්වලදී බදු කාන්දු වෙන්න පුළුවන්, බදු එකතු කර ගැනීමට තිබෙන ප්‍රමාණයට වඩා අඩුවෙන් එකතු වෙන්නේ කියලා යම් අදහස් මතුවෙලා තිබෙනවා අපි දැක්කා. අපි ඒ ගැන සැලකිලිමත් වෙන්නට ඕනෑ. එම බදු එකතු කර ගන්නට අපි කටයුතු කරන්න අවශ්‍යයි. අපි ඒ පිළිබඳවත් සැලකිලිමත් වෙලා තිබෙනවා. බදු කෙරෙහි රටේ තිබෙන විශ්වාසනීයභාවය තව දුරටත් වැඩි කර ගැනීමට අපි කටයුතු කරන බවත් මේ අවස්ථාවේ මා මතක් කර දෙන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුනි, ඊළඟ වසර තුළදී අපේ රටේ ක්‍රියාත්මක වන සියලු ව්‍යාපෘති අපි ඉතාම ඕනෑකමකින් සහ ඉතාම වෘත්තීය ආකාරයෙන්, in a professional manner, දිගින් දිගටම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ වෙනකොට එම ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් බිලියන 5,277ක් පමණ වෙනවා. ඒක දැවැන්ත මුදලක්. ඒ මුදල එක අවුරුද්දක් තුළ වියදම් කරන්න නොවෙයි තිබෙන්නේ; එක අවුරුද්දකදී ආයෝජනය කරන්න නොවෙයි තිබෙන්නේ. ඒ වුණත්, අපි දිගින් දිගටම ඒවා ගැන හොඳින් සැලකිලිමත් වෙලා, ඒ වසර වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල ඉතාම පැහැදිලිව වැය කරලා, ඒ තිබෙන ප්‍රතිපාදන හරියාකාරව කාන්දු වෙනවාද කියලා සොයා බලා කටයුතු කිරීමට බලාපොරොත්තු වන නිසා අපේ රටේ සංවර්ධනය තව දුරටත් වැඩි වෙනවා අපට දකින්නට පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට අපෙන් අහන තවත් ප්‍රශ්නයක් තමයි අපට පිට රටවල්වලින් මුදල් එයිද කියන ප්‍රශ්නය. මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, දැනටමත් අපි කරගෙන යන සාකච්ඡා හරහා swap arrangements, ඒ කියන්නේ වෙනත් රටවල්වල තිබෙන reserve banks එක්ක අපි දැන් කරගෙන යන swap arrangements සාර්ථක වන බව.

ඒ සමඟම Port City එක වෙනුවෙන් ලබන අවුරුද්දේ විතරක් අලුතින් ඇමෙරිකානු ඩොලර් බිලියනයක් වෙන් කරන්න ඒ කොම්පැනිය බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ මුදලත් ලබන අවුරුද්දේ ආයෝජනයක් හැටියට එනවා. මේවා ණය නොවෙයි. අපි දිගින් දිගටම කිව්වා වාගේ මේවා ණය නොවෙයි, ආයෝජන. එම ආයෝජනය එනවා. එම ආයෝජනය එන බව අපට සහතික ලෙස කියන්න පුළුවන්. අපි JICA project එකත් එක්ක දැන් කරගෙන යන Airport renovation එක පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් වෙනවා. Shandong Haohua Tire Company Limited එකේ ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක්. තව අවුරුදු 3කින් තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් ආයෝජනය කරන්න බලාපොරොත්තු වන බව ඒ අය පෙන්වා දී තිබෙනවා.

ඒත් එක්කම අපි දැක්කා, කවුරු මොනවා කිව්වත් පසු ගිය,-

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is the point of Order, Hon. Member?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
එම ආයෝජනය ගෙනෙන tyre factory එකේ නිෂ්පාදන ධාරිතාව මිලියන 10ක් වෙනවා ලු. එතකොට මිලියන 2ක්,-

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
මම කථාව කරගෙන යන්නම්. ඊට පස්සේ ඔබතුමා අහන ප්‍රශ්නවලට මම උත්තර දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව දුරටත් කිව්වොත් අපේ රටේ විශ්වාසනීයභාවය දිගින් දිගටම වර්ධනය වන බව අපට පෙනෙනවා. සමහර අය කියයි, rating agency එකක් අප පහත හෙළුවා, එහෙම නැත්නම් වෙන කවුරු හරි අපි ගැන නරක චිත්‍රයක් මැව්වා, වෙන කවුරු හරි කෙනෙක් පොතක මොනවා හරි ලිව්වා කියලා. ඇත්ත වශයෙන්ම මුදල් ආයෝජනය කරන අයගේ ප්‍රතිචාරය මොකක්ද? ඒ අය මොනවාද කරන්නේ? අපි දැක්කා පසු ගිය අගෝස්තු මාසයෙන් පස්සේ මේ රටේ කොටස් වෙළෙඳ පොළේ turnover එකේ average එක රුපියල් බිලියන දෙකහමාරකට වඩා වැඩි බව. යහ පාලන රජය කාලයටම තිබුණේ මිලියන 900යි. ඒකෙන්ම පෙනෙනවා, අද වනවිට රට තුළ සිටින ආයෝජකයන්ගේ විශ්වසනීයභාවය කොයි තරම් දුරට වැඩි වෙලා තිබෙනවාද කියලා.

බොහෝ අවස්ථාවලදී අපට ඇහෙන දෙයක් තමයි, අපි දෙන සහන මදියි කියන එක. කෝ, සහන කියලා අහනවා. කොවිඩ්වලින් අසරණවූවන්ට සහන දුන්නාද කියලා අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් කියන්නේ, අලුත් අභියෝගයක්. අපි මීට පෙරත් අභියෝගවලට මුහුණ දීලා තිබෙනවා. යම් අවස්ථාවලදී අපට අනපේක්ෂිත දේවල්වලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒවා තමයි අභියෝග. අපට පුළුවන් වෙන්නට ඕනෑ, ඒවාට සාර්ථකව මුහුණ දෙන්න. අපි ඒ වාගේ අනපේක්ෂිත ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. අපේ රටේ යුද්ධයක් තිබුණා. අපේ රටට විරුද්ධව යම් යම් ප්‍රශ්න මතු වුණා. විශේෂයෙන්ම ලෝකයේ බැංකු කඩා වැටෙන්න පටන් ගත්තා; ලෝකයේ තෙල් මිල වැඩි වුණා. අපි ඒවාට මුහුණ දුන්නා. ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තමයි මේ කොවිඩ් ප්‍රශ්නය. අපි ඒකටත් මුහුණ දෙනවා. ඉදිරියේදීත් මේ වාගේ ප්‍රශ්නයක් ආවොත් අපට ඒකටත් මුහුණ දෙන්න පුළුවන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. State Minister, I was wondering whether you could mention something about the Modern Monetary Theory, your new theory.

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
I told you about what we have been listening to. Not that we do not know what the Modern Monetary Theory is, but we have been listening to our people. You do not listen to our people. That is the problem. That is why I explained at the beginning of my speech that we listen to our people. We listen to the pulse of our people. So, once we listen to the pulse of our people, we understand what they are yearning for. That is on which we base our measures. - [*Interruption.*] I do not disturb you. - [*Interruption.*] Thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සහන ලබා දෙන්නේ රටේ තිරසර සංවර්ධනයක් ඇති කරන්නයි; we want to have long-term development. Long-term development කියන්නේ මොකක්ද? අපි ජලය දෙනවා. දැනට සියයට 54කට පමණයි ජලය ලබා දී තිබෙන්නේ. එම ප්‍රමාණය සියයට සියයක් වෙනකොට අපේ රටේ කොච්චර ලොකු revolution එකක් වෙනවාද? කොයි තරම් වෙනසක් සිදු වෙනවාද? අපි අලි-මිනිස් ගැටුම නිරාකරණය කරනවා නම් කොයි තරම් වෙනසක් ඇති වෙනවාද? අපි පාරවල් අලුතින් හදලා දුන්නාම, renovate කරලා දුන්නාම, කොච්චර ලොකු වෙනසක් ඇති වෙනවාද? ඒක ඉතාම වැදගත්. සහන කියලා කියන්නේ අන්න ඒ වාගේ දේවලටයි. අපි ලබා දෙන්න බලාපොරොත්තු වෙන්නේ කෙටි කාලීන සහන නොවෙයි. අය වැයේ අන්තර්ගත ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳව කියවා බැලුවොත් ඔබතුමන්ලාට පෙනේවි, කොච්චර සහන රාශියක් දීලා තිබෙනවාද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please, wind up now.

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
How many minutes more do I have, Sir?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is over. But, I will let you finish your speech.

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
Okay, I will finish. Thank you very much.

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා අපහසුතාවට පත් කරන්නේ නැහැ. මම ඉතාම ඉක්මනින් ඉතිරි කාරණා ටික කියන්නම්. අපේ රජය රටට ඉදිරිපත් කර තිබෙන මේ සියලු ව්‍යාපෘති ඉතාම කඩිසරව, ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අය වැයක් ඉදිරිපත් කරලා, ඊට පසුව ඒකෙන් කියපු දේවල් සිදු වෙයිද, නැද්ද කියලා ඉදිරියේදී මිනිසුන්ට හිත හිතා ඉන්න අපි ඉඩ තබන්නේ නැහැ. අපි කරන්නේ ඒවා ක්‍රියාත්මක කිරීමයි. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් අපි විශේෂ කණ්ඩායම් ලැස්ති කරගෙන යනවා. මගේ අමාත්‍යාංශයේත් එවැනි කණ්ඩායමක් ලැස්ති කර, ඒවා monitor කිරීමට සහ එම කටයුතු සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

මේ අය වැය සකස් කිරීමට සහාය දුන් සියලුදෙනාටත්, අය වැය පිළිබඳව සාකච්ඡාවක යෙදුණු සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින්, විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, වතු කම්කරු ජනතාවට රුපියල් 1,000ක දෛනික වැටුප ලබා දීම සම්බන්ධව අගමැතිතුමාගේ කථාවේ සඳහන් කළා. නමුත් ඊයේ අපේ කම්කරු ඇමතිතුමා පැවසුවා, ඒකේ අසාර්ථකභාවයක් තිබෙනවා කියලා. ඒ පිළිබඳ ස්ථාවරය මොකක්ද? මොකද, ලබන මාසයේ, - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, . [බාධා කිරීමක්] ඒක point of Order එකක් නොවෙයි.

මීළඟට, ගරු සිවඥානම් සිරීතරන් මන්ත්‍රීතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is the point of Order?

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
රටට වැඩියෙන්ම foreign exchange ගෙනෙන ජනතාව ගැන ප්‍රශ්නයක්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
It is not a point of Order. Sorry, I cannot allow you to continue. ගරු සිවඥානම් සිරීතරන් මන්ත්‍රීතුමා.

[பி.ப. 3.24]

ගරු සිවඥානම් සිරීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நிதியமைச்சின்கீழான இந்த விவாதத்திலே மிக முக்கியமான ஒரு விடயத்தைக் குறிப்பிட விரும்பு கின்றேன். அதாவது, யாழ்ப்பாண மாவட்டம் நெடுந்தீவு பிரதேச செயலாளர் பிரிவிலே அண்மையிலே நடந்த ஒரு சம்பவத்தை இந்த இடத்திலே நான் பதிவுசெய்ய விரும்புகின்றேன்.

யாழ்ப்பாணம் 'விஷ்ணு புத்திர வெடியரசன் கோட்டை' என்கின்ற தமிழர்களுடைய பாரம்பரியமான மிக முக்கியமான ஒரு கோட்டைப் பிரதேசத்தைக் கடந்த 2020 ஒக்டோபர் 28ஆம் திகதி அந்த இடத்திற்கு விஜயம் செய்த தொல்பொருள் திணைக்களத்தினுடைய பணிப்பாளர் தலைமையதிபதி, பணிப்பாளர் மற்றும் யாழ்ப்பாணம், ஆரியகுளம் விகாரையினுடைய விகாராதிபதி உட்பட்ட 3 பிக்குமார்கள் பார்வையிட்டிருக்கின்றார்கள். பார்வையிட்ட பிற்பாடு கடந்த 2020.11.27ஆந் திகதி தொல்பொருள் திணைக்களத்தினுடைய பணிப்பாளர் தலைமையதிபதியினால் ஒரு வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டிருக்கின்றது. அதிலே, “188ஆம் அத்தியாயமான தொல்பொருள் கட்டளைச் சட்டத்தின் 33ஆம் பிரிவினால் எனக்குரித்தாக்கப்பட்ட தத்துவங்களின் பயனைக் கொண்டு, தொல்பொருள் பணிப்பாளர் தலைமையதிபதி திஸாநாயக்க முதியான்சேலாகே செனரத் பண்டார திசாநாயக்க ஆகிய நான், மேற்சொல்லப்பட்ட பிரிவின் ஏற்பாடுகள் இணங்கியொழுகப்பட்டுள்ளனவென திருப்தி யுற்று, இவ்வறிவித்தலுக்கான அட்டவணையில் குறித்துரைக் கப்பட்ட அரச காணி இடப்பரப்பானது மேற்சொல்லப்பட்ட கட்டளைச் சட்டத்தின் நோக்கத்திற்காக "தொல்லியல் ஒதுக்கிடம்" ஒன்றாக இருப்பதாகக் கருதப்படுதல் வேண்டுமென இவ்வறிவித்தல் மூலம் வெளிபடுத்துகின்றேன்” என்று குறிப்பிடப்பட்டுள்ளதுடன், இதற்கு, "நெடுந்தீவு, அழிவடைந்துள்ள துறவிமடக் கட்டடத் தொகுதி தொல்லியல் ஒதுக்கிடத்தைக் கொண்டுள்ள இடப்பரப்பு" எனத் தலையங்கம் இடப்பட்டிருக்கின்றது. மேலும், “வட மாகாணத்தில், யாழ்ப்பாண மாவட்டத்தில் நெடுந்தீவு பிரதேச செயலாளர் பிரிவிலுள்ள நெடுந்தீவு மேற்கு இல. J/01 கிராம அலுவலர் பிரிவில் அமைந்துள்ளதும் 1 ஏக்கர் 02 றூட் மற்றும் 21.07 பேர்ச்சஸ் விஸ்தீரணத்தைக் கொண்டுள்ளதும், நில அளவையாளர் தலைமையதிபதியின் இடத்தில், கொழும்பு நிலஅளவையாளர் அத்தியட்சகரினால் அளவிடப்பட்ட 1977ஆம் ஆண்டு டிசம்பர் மாதம் 29ஆந் திகதிய YA 1416ஆம் இலக்க, இட அமைப்பியல் முதன்மைத் திட்டத்தில் விபரிக்கப்படும் இறுதிக் கிராமத் திட்டத்தில் 01ஆம் இலக்க காணித்துண்டொன்றாக விபரிக்கப்படும், “நெடுந்தீவு அழிவடைந்துள்ள துறவிமடக் கட்டடத்தொகுதி தொல்லியல் தளம் என அழைக்கப்படும் பிரிக்கப்பட்டு வரையறுக்கப்பட்ட அக்காணித்துண்டு அடங்கலும்” என்று அதில் விபரிக்கப்பட்டிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இது வெளிப்படையாகத் தமிழர்களுடைய நிலங்களை அபகரிக்கின்ற ஒரு முயற்சியாகவே மேற்கொள்ளப்படுகின்றது. குறிப்பாக, விஸ்ணுபுத்திர வெடியரசன் என்கின்ற மன்னன் அந்த நெடுந்தீவுப்பகுதியை ஆண்டுவந்திருக்கின்ற ஒரு மிக முக்கியமான வரலாறு இருக்கின்றது. அந்த வரலாற்றோடு தமிழர்களுடைய வரலாற்று மையப்பிரதேசமான அந்தக் கோட்டையை ஒரு 'துறவி மடம்' என்ற பெயரிலே மாற்றி, அந்த இடத்தை அபகரிக்கின்ற ஒரு சூழ்ச்சியை சூட்சுமமாக இந்தத் தொல்லியல் திணைக்களம் மேற்கொண்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු සිවඥානම් සිරීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தவிசாளர் அவர்களே, இங்கு வெளிப்படையாகத் தமிழர்கள் வாழ்ந்த பிரதேசங்களை, அவர்களுடைய அடையாளங்களைத் தொல்லியல் என்ற அடிப்படையில் அபகரிக்கின்ற ஒரு சூட்சுமமான திட்டம் நடைமுறைப்படுத்தப் பட்டிருக்கின்றது. இது உடனடியாக நீக்கப்பட்டு, அது ஒரு தமிழர் பாரம்பரிய வரலாற்று அடையாளம் என்பதை ஏற்றுக்கொண்டு, அந்த இடத்தை அபகரிக்கும் திட்டத்தைக் கைவிடவேண்டும். குறிப்பாக, நெடுந்தீவிலேயே அந்த வெடியரசன் கோட்டை இருக்கின்ற பகுதியில்தான் கிட்டத்தட்ட 4க்கு மேற்பட்ட நல்ல தண்ணீர்க் கிணறுகள் உண்டு. அதனைவிட, அந்த மக்கள் வாழுகின்ற ஓர் ஏக்கருக்கு மேற்பட்ட காணிப் பிரதேசத்தை, 'கோட்டைக்காடு' என்று சொல்லப்படுகின்ற இடத்தை அபகரிப்பதற்கான முயற்சி மேற்கொள்ளப்பட்டிருக்கின்றது. இந்த விடயம் உடனடியாக நிறுத்தப்பட வேண்டும் என்பதையும் இந்த விடயத்தினூடாக அந்த மக்களுடைய பாரம்பரியமான அடையாளத்தை இல்லாமல் செய்கின்ற பணியை உடன் நிறுத்தவேண்டும் என்பதையும் இந்த இடத்திலே நான் வலியுறுத்திக்கூற விரும்புகின்றேன். மிக முக்கியமாக, அந்த வெடியரசன் கோட்டையை ஒரு பௌத்த விகாரையாக அடையாளப்படுத்த இந்தப் பிக்குமார்களும் தொல்லியல் திணைக்களத்தினரும் முயற்சிக்கின்றனர். அது ஒரு கோட்டை என்பதுகூடத் தெரிந்துகொண்டும் இவ்வாறு முயற்சிக்கின்றார்கள். அந்தக் கோட்டையோடு சேர்ந்த இடத்துக்குத்தான் கோட்டைக்காடு என்கின்ற பெயரும் உண்டு. யாழ்ப்பாண மாவட்டத்திலேயே முதலாவது கிராம அலுவலர் பிரிவு J.01. அந்த இடத்திலேயிருக்கின்ற இந்தப் பிரதேசத்தை அபகரிக்க முயற்சிக்கின்றார்கள். இதுவொரு மிக முக்கியமான விடயம். ஆகவே, இந்த விடயத்துக்கு அரசு ஒரு நீதியான தீர்வைப் பெற்றுத் தரும் வகையில் இந்தத் தொல்லியல் திணைக்களம் தன்னுடைய கபளீகர முயற்சியைக் கைவிடவேண்டுமென்று நான் பதிவு செய்கின்றேன். *[இடையீடு]*

ගරු විදුර වික්‍රමනායක මහතා (ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க - தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமியச் சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - State Minister of National Heritage, Performing Arts and Rural Arts Promotion)
ගරු සභාපතිතුමනි, එතුමා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට චෝදනාවක් එල්ල කරනවා. අපි ඒ ප්‍රදේශයට ඇවිල්ලා, ඒ ගැන සොයා බලන්න පොරොන්දු වනවා.

ගරු සිවඥානම් සිරීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களும் இங்கிருந்தது பொருத்தப்பாடாக அமைந்திருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தைச் சரியாகப் புரிந்துகொண்டிருப்பார் என்று நான் நினைக்கின்றேன். நீதி கிடைக்குமென்று நாங்கள் நம்புகின்றோம்.

கிளிநொச்சி மாவட்டத்தினுடைய பச்சிலைப்பள்ளி பிரதேச செயலாளர் பிரிவிலுள்ள தர்மக்கேணிக் கிராம அலுவலர் பிரிவிலுள்ள புதுக்காட்டுத் தோட்டம் என்கின்ற இடத்திலும் புலோப்பளை கிழக்குக் கிராம அலுவலர் பிரிவிலுள்ள காசிப்பிள்ளைத்தோட்டம் வெட்டுக்காடு, முடிச்சுப்பள்ளி என்கின்ற இடங்களிலும் அல்லிப்பளைக் கிராம அலுவலர் பிரிவிலுள்ள தட்டுவன்கொட்டித் தோட்டம் என்ற இடத்திலும் காணப்படுகின்ற LRC - காணிச்சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான நிலங்களை, காணி அமைச்சருடைய மறைமுகமான ஆதரவோடு, அவருடைய நேரடிக் கையாள் என்று தன்னைக் குறிப்பிடுகின்ற அமீன் என்கின்ற ஒரு நபர், ஒரு நபருக்கு 5 ஏக்கர் காணிவீதம் ஒவ்வொருவரிடமும் இரண்டு இலட்சம் ரூபாய்க்கு மேற்பட்ட பணத்தை வாங்கிக்கொண்டு விற்றுக்கொண்டிருக்கின்றார். யாழ்ப்பாணம் மாவட்டத்திலே 13,000 குடும்பங்கள் காணியில்லாமல் இருக்கின்றன. கிளிநொச்சி மாவட்டத்திலே 4,000 குடும்பங்களுக்கு இருப்பதற்கு நிலமில்லை. இந்த LRC - காணிச்சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளில் கிளிநொச்சி மாவட்டத்தைச் சேர்ந்தவர்களையும் யாழ்ப்பாணம் மாவட்டத்தைச் சேர்ந்தவர்களையும் குடியேற்றுவதற்கு ஏற்பாடு செய்யுமாறு நான் அரசாங்க அதிபரிடம் கோரியிருக்கின்றேன். காணியில்லாத மக்களுக்கு ஒரு ¼ ஏக்கர் வீதம் காணி வழங்கக்கூட நிலச்சீர்திருத்த ஆணைக்குழு முன்வருவதில்லை. ஆனால், அதேநேரம் அந்த இடத்திலே அமீன் என்பரை முகவராக வைத்துக்கொண்டு, காணி அமைச்சரினால் காணி விற்பனை செய்யப்படுகின்றது. நிலச்சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணி விற்பனை செய்யப்படுகின்றது. தயவுசெய்து இது உடன் நிறுத்தப்பட வேண்டும். இது மிக முக்கியமாக அந்த இடத்திலே காணியில்லாத மக்களைப் பாதித்திருக்கின்றது. நேற்று, நேற்று முன்தினம்கூட சென்று அந்த இடங்களைச் துப்புரவு செய்திருக்கின்றார்கள். பொலிசாரும் அதற்கு உடந்தையாக இருக்கின்றார்கள்; அதனைக் கட்டுப்படுத்து கின்றார்களில்லை. அரசாங்க அதிபர் அறிவித்தும்கூட செயற்படுத்தப்படவில்லை. நான் பிரதேச செயலாளருடனும் பேசியிருந்தேன். அவரும் இது தன்னை மீறி நடைபெறுவதாகக் குறிப்பிடுகின்றார். ஆகவே, இதுவொரு மிக முக்கியமான விடயம். குறிப்பாக, இந்த மக்கள் தாம் வாழுகின்ற இடத்திலே காணியில்லாமல் இருக்கின்றபொழுது, அந்த இடங்களிலுள்ள காணிகளை யாரோ ஒரு முகவரை வைத்து இரகசியமான முறையில் விற்பனை செய்வது ஒரு பகற்கொள்ளை! இதனை உடனடியாக நிறுத்தவேண்டும் என்பதை நான் இந்த இடத்திலே வலியுறுத்துகின்றேன்.

அடுத்து, கடந்த 2 - 3 நாட்களுக்கு முன்னர் நடைபெற்ற இன்னொரு விடயம் பற்றியும் குறிப்பிட வேண்டும். அதாவது, கோப்பாய் பிரதேச சபையின் தவிசாளர் தியாகராஜா நிரோஷ் அவர்களைக் கைதுசெய்வதற்கு பொலிசார் முயற்சித்தார்கள். கௌரவ தவிசாளர் அவர்களே, இந்த நாட்டிலே பிரதேச சபைகளுக்குள்ள அதிகாரம் பற்றி உங்களுக்குத் தெரியும். ஒவ்வொரு பிரதேச சபையும் தனித்துவமான ஓர் ஆட்சிக் கட்டமைப்பைக் கொண்டது. அவர்கள் தங்களுடைய அதிகார எல்லைக்குள் தங்களுக்குரிய வேலைகளைச் செய்கின்றார்கள்.

[ගරු සිවඥානම් සිරීතරන් මහතා]

அவ்வாறு தங்களுடைய பணியைச் செய்கின்ற வேளையில்தான், அந்தப் பிரதேச சபைக்குரிய ஒரு வீதி தொடர்பான விடயத்தில் குறித்த தவிசாளருக்கே தெரியாமல், அவரை மீறி, யாழ்ப்பாணத்தில் இருக்கின்ற, குடும்ப ஆட்சி செய்கின்ற, யாழ்ப்பாணக் கச்சேரியைத் தங்களுடைய வசம் வைத்திருக்கின்ற சில நபர்கள் தங்களுடைய அதிகாரத்தைப் பிரயோகித்திருக்கின்றார்கள். அதனால் அந்தத் தவிசாளர் அந்த இடத்திலேயிருந்த விளம்பரப் பலகையைக் கழற்றிக் கொண்டுவந்து தன்னுடைய அலுவலகத்திலே அவர் வைத்திருந்தார். அதற்காக அவர்மீது குற்றஞ்சுமத்தி, அவரைக் கைது செய்வதற்கு முயற்சித்திருக்கிறார்கள். கோப்பாய் பிரதேச சபை தவிசாளர் தியாகராஜா நிரோஷ் அவர்களைப்போல பலர் அங்கு சுதந்திரமாகப் பணி செய்யமுடியாத நிலை இருக்கின்றது.

இந்த நாட்டிலே நாங்கள் அதிகாரப் பகிர்வு கேட்கிறோம்; ஆட்சி செய்வதற்குக் கேட்கிறோம். இந்த நாட்டுக்குள்ளே சேர்ந்துவாழ வேண்டுமென்று கேட்கின்றோம். நீங்களும் "சேர்ந்து வாழ வாருங்கள்!" என்று சொல்கிறீர்கள். அன்றுகூட இங்கே கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்கள், "தமிழர்கள் நீங்கள் பிரிந்து நிற்க வேண்டாம், பழையதை மறந்து சேர்ந்து வாழ வாருங்கள்!" என்று சொன்னார். ஆனால் இங்கே என்ன நடக்கிறது? இருப்பதைப் பிடுங்குகிறார்கள்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. එම නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු සිවඥානම් සිරීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நெடுந்தீவிலே இருக்கின்ற எங்களுடைய தொல்லியல் அடையாளங்களைப் பிடுங்குகிறார்கள், தமிழர்கள் வாழுகின்ற நிலங்களை அபகரிக்கிறார்கள். அதைவிட ஒரு குறுநில நிர்வாகக் கட்டமைப்பான பிரதேச சபையின் தவிசாளரைக் கைது செய்வதற்குப் பொலிஸார் முயற்சிக்கின்றார்கள்; அவர் விசாரிக்கப்படுகின்றார். அதுவும் ஒரு தடவை அல்ல, இரண்டு தடவைகள். மிகவும் அபாயகரமான சூழல் அங்கே உருவாக்கப்பட்டிருக்கின்றது.

இதனைக் கேட்டால் உடனே 'பயங்கரவாதம்' என்கிறீர்கள், புலிகளை ஞாபகப்படுத்துவதாகச் சொல்கிறீர்கள். ஆனால் இந்த நாட்டிலே புலிகளை உருவாக்கியது யார்?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ආර්ථිකය ගැන කථා කරන කොට ආර්ථික ප්‍රශ්නයක් මේ රටේ තිබෙනවාය කියලා මුලින්ම මුදල් අමාත්‍යාංශය ඇතුළු මේ ආණ්ඩුව පැහැදිලිවම තේරුම් ගන්න ඕනෑ. හැබැයි, ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා කියලා තේරුම් නොගන්නා තාක් කල් අපට ආර්ථික ප්‍රශ්නය විසඳන්න බැහැ. විශේෂයෙන් Fitch Ratings ආයතන ඊයේ - පෙරේදා වනකොට අපේ රට තවත් downgrade කරලා තිබෙනවා. අපේ රට "CAA"වලට පහළට දමා තිබෙනවා.

අපේ ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය ඇමතිතුමා මේකට හේතුව විධියට කියන්නේ අපේ අය වැයේ පවා තිබෙන සංඛ්‍යාලේඛන පිළිබඳව විශ්වාසයක් නැහැ කියන එකයි. මේ කාරණය තේරුම් ගන්නේ නැති තාක් කල් රජයට ඉදිරියට යන්න බැහැ. දැන් ඔබතුමන්ලා කියනවා, ප්‍රශ්නයක් නැහැ කියලා. අපි දැකලා තිබෙනවා, සමහර අය කුණු වෙන්න ගහලා -හොඳටම වෙරි වෙලා- වැනි වැනී යන හැටි. ඔහුට වෙරි කියලා රටටම පෙනෙනවා. හැබැයි, ඒ මිනිහාගෙන් ඇහුවාම මොකක්ද කියන්නේ? "නැහැ, නැහැ. කිසි ප්‍රශ්නයක් නැහැ. මම හොඳට කෙළින් යනවා" කියනවා. ඒ වාගේ තමයි මේකත්. ඒ නිසා ආණ්ඩුව මේ ප්‍රශ්නය හඳුනා ගන්නා තුරු, ප්‍රශ්නයක් තිබෙනවා කියලා අවබෝධ කර ගන්න තුරු මේ ප්‍රශ්නයට ඔබතුමන්ලාට විසඳුම් සොයන්න බැහැ, ගරු සභාපතිතුමනි. ඒකයි ඇත්ත කතන්දරය. දැන් ඔබතුමන්ලා වෙන වෙන gameවලින් මේක cover කරන්න හදනවා. දළ දේශීය නිෂ්පාදනයට Colombo Port City එකේ ආයෝජන එකතු කරන්න හදනවා. අපේ කාලයේත් අවුරුදු ගණනාවක් - අවුරුදු තුන හතරක් - Colombo Port City තුළින් මේ කටයුත්ත සිදු වුණා. දැන් ඔබතුමන්ලා දළ දේශීය නිෂ්පාදනය Colombo Port City එකට දමලා පුම්බන්න උත්සාහ කරනවා කියන්නේ, ඒ තුළින් තවදුරටත් අපි පහළට යනවා කියන එක මිසක්, අපට මේකෙන් ගොඩ එන්න බැහැ කියන එකයි. අපි ඇත්ත ප්‍රශ්නය අවබෝධ කරගෙන ඒකට විසඳුමක් සොයන්න කටයුතු කළොත් විතරයි ප්‍රශ්නයට විසඳුම් සොයන්න පුළුවන් වන්නේ, ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමනි.

ආර්ථික කළමනාකරණය, දේශීයත්වය මූලික කරගෙන කරනවා කියලා තමයි ඔබතුමන්ලා කියන්නේ. නමුත් අපට එහෙම කටයුතු කරනවා පෙනෙන්නේ නැහැ. ඔබතුමා, ඔබතුමාගේ කථාවේදීම කිව්වා, හම්බන්තොටට චීනයෙන් ඩොලර් මිලියන 300ක ආයෝජනයක් එනවා කියලා. හම්බන්තොට ඉතාම හොඳ තැනක් බව අපි දන්නවා. හම්බන්තොට හොඳ hub එකක්.

හැබැයි, ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමනි, මට වඩා ඔබතුමාට හොඳට තේරෙන කාරණයක් තිබෙනවා. ඒ තමයි, හම්බන්තොටට එන්නේ අතිදැවැන්ත ව්‍යාපෘති. ඒ අතිදැවැන්ත ව්‍යාපෘති එනකොට ඔබතුමන්ලා ඒ නිෂ්පාදනවලින් සියයට 20ක් මේ රටට දමන්න දුන්නොත්, අපේ දේශීය නිෂ්පාදකයාට -දේශීය කර්මාන්තකරුවාට- නැවත නැඟිටින්න ලැබෙන්නේ නැහැ. ටයිල් කර්මාන්තය වෙන්න පුළුවන්, paint නිෂ්පාදකයා වෙන්න පුළුවන්, බිස්කට් නිෂ්පාදකයා වෙන්න පුළුවන්, ටයර් නිෂ්පාදකයා වෙන්න පුළුවන්, සෙල්ලම් බඩු නිෂ්පාදකයා වෙන්න පුළුවන්, ඩොලර් මිලියන 400ක, 500ක අතිදැවැන්ත ව්‍යාපෘති ඇවිල්ලා, ඒකෙන් සියයට 20ක් රට තුළට දමන්න දුන්නොත් මොකද වෙන්නේ? අපේ රටේ කර්මාන්තකරුවන් සියල්ලටම එතැනින් එහාට නැඟිටින්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා එතැනට එන ආයෝජනය සියයට සියයක් export කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. අද චීනයෙන් ඇමෙරිකාවට export කරන්න බැරි බව ඔබතුමා දන්නවා. ඒකට සියයට 40ක, 50ක tax එකක් ගහනවා.

ඒගොල්ලන් මේ රටට එන්නේ මොකද? චීනයේ ඉඳලා යුරෝපයට, ඇමෙරිකාවට භාණ්ඩ යවන්න සිදු වනකොට තිබෙන

බාධාව -ඒ barrier එක- ඉවත් කර ගන්න ඕනෑ. එතකොට ඒගොල්ලන්ට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ ආයතනයෙන් ඩුබායිවලට, යුරෝපයට, ඇමෙරිකාවට භාණ්ඩ යවන්න පුළුවන්. එතකොට ඒගොල්ලන්ට පාඩුවක් වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මේ කාරණයට දැඩි අවධානයක් යොමු කරන්න. මට වඩා හොඳට ඔබතුමාට මේ කාරණය තේරෙනවා කියලා මම දන්නවා. ඒ නිසා දේශීය නිෂ්පාදකයා ශක්තිමත් කරන්න නම්, අපේ රටට එන දැවැන්ත ආයෝජනවලින් සියයට සියයක් export කරන්න ඉඩකඩ ලබා දෙන්න ඕනෑ. එතකොට තමයි හරි යන්නේ. මේ රටේ ගජ මිතුරු ආර්ථිකයක් නිර්මාණය වෙමින් යන බව අපට අද තේරෙනවා, ගරු සභාපතිතුමනි. අද ගජ මිතුරු ආර්ථිකයක් තිබෙන්නේ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, සීනි ආනයනය හරහා මේ රටට හිමි වෙන්න තිබුණු රුපියල් කෝටි 450ක, රුපියල් කෝටි 1,000ක බදු ආදායම අහිමි වුණා කියලා. හැබැයි, ඒ බදු ආදායම අහිමි වීමේ වාසිය ඔබතුමන්ලා පාරිභෝගිකයාට දුන්නා නම් ප්‍රශ්නයක් නැහැ. ඒ කියන්නේ සීනිවල tax එක ශත 25 දක්වා අඩු කිරීමේ වාසිය පාරිභෝගිකයාට ගියා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත්, එහෙම ගිහිල්ලා නැහැ. ඒ විතරක් නොවෙයි, palm oil ගෙන්වීමේදීත් මේ ආයතනවලින් මේ විධියට සිදුවෙලා තිබෙනවා. ඒවා ලංකාවට එනකොට tax එක අඩුවනවා; පහුවදාට වැඩිවනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේවා ගැන සොයා බලන්න.

අද අපට පෙනෙනවා, ගජ මිතුරු ආර්ථිකයක්. අපට මතකයි, අපේ කාලයේ තමුන්නාන්සේලා කිව්වා රෝයල් කල්ලියක් ක්‍රියාත්මක වන බවක්. දැන් අපට පෙනෙනවා, ජාවාරම්කාර කල්ලියක් සතුටු කරන්න, සන්තර්පණය කරන්න, පිනවන්න, ශක්තිමත් කරන්න තමයි මේ ආර්ථිකය ක්‍රියාත්මක වන්නේ කියලා. එම නිසා පැහැදිලිව අපට පෙනෙනවා, මේ ආර්ථිකය ගමන් කරමින් යන්නේ රටේ ජනතාව ගැනවත්, රට ගැනවත් සිතා නොවෙයි කියලා. අවසාන වශයෙන් මම කියනවා, අපි ඒකට අවස්ථාවක් දෙන බව. දැන් අවුරුද්දක් ඔබතුමන්ලා මේ ආර්ථිකය කළමනාකරණය කළා; මුදල් අමාත්‍යාංශය මේ ආර්ථිකය කළමනාකරණය කළා. හැබැයි, ඒ ආර්ථික කළමනාකරණය හරහා රට ඉදිරියට යනවා කියලා අපට පෙනෙන්නේ නැහැ. ඔබතුමන්ලා පසුගිය කාලයේ දේශීය ආර්ථිකය ගැන කථා කරන ගමන් මහා පරිමාණ ගජ මිතුරන් කිහිපදෙනකු තමයි ශක්තිමත් කර තිබෙන්නේ.

මට කථා කරන්න බොහෝ කාරණා තිබුණත් අවස්ථාව නොමැති නිසා, මේ කරුණු සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන්න කියලා විශේෂයෙන් අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 5යි.

[අ.භා. 3.40]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

කථාව පටන් ගත් ගමන්ම මම ප්‍රකාශයක් කරන්න ඕනෑ. මොකද, මේ මුස්ලිම් ජනතාවට අද විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා, භූමදාන කටයුතු සම්බන්ධයෙන්. කොරෝනා වයිරසයෙන් මිය යන අය භූමදානය කරන්න නොදී ආදාහනය කිරීම නිසා ඒ අයට ඉතාම සංවේදී ආගමික ප්‍රශ්නයක් මේ අවස්ථාවේ පැන නැඟී තිබෙනවා. කතෝලිකයකු හැටියට මාත් කියන්න කැමැතියි, කතෝලික ජනතාවටත් එය සිද්ධ වෙලා තිබෙන බව. එම නිසා මම විශේෂ ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව නැවත නැවතත් සිතන්න කියලා. මේ කාරණය ඉතාම සංවේදීයි. යම් කිසි ආගමක් අදහන කෙනෙකුට ඒ ආගම පිළිබඳව විශ්වාසයක් තිබෙනවා නම්, හොඳින් ආගම අදහන මුස්ලිම් ජනතාව වෙනුවෙන් ඒ අවස්ථාව ලබා දෙන්න හැකියාවක් තිබෙනවා නම්, එය ලබා දෙන්න කියලා විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා.

අපි මේ සිටින්නේ 2021 අය වැය යෝජනා පිළිබඳ කථා කරන අවසන් දවසේයි. අය වැය යෝජනා ගැන කථා කරන අවස්ථාවේ විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ කරුණක් තිබෙනවා. එනම්, මේ දින කිහිපය තුළ අපි දැක්කේ නැහැ, ආණ්ඩු පක්ෂය 2021දී මේ රටේ ජනතාව වෙනුවෙන් කරන ඵලදායි ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් කථා කළ බවක්. හැම තිස්සේම ඒ ගොල්ලන් කථා කළේ විපක්ෂයේ ඉන්න කොට කථා කරපු දේවල්මයි, ජනාධිපතිවරණයට පෙර කථා කරපු දේවල්මයි, පාර්ලිමේන්තු මැතිවරණයට පෙර කථා කරපු දේවල්මයි. ඒකම තමයි නැවත නැවත - හෝද හෝදා මඩේ දමනවා වාගේ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළේ. එහෙම නැත්නම් එතුමන්ලා කථා කළේ පෞද්ගලික ප්‍රශ්න. සමාජයේ තිබෙන ජනතාවගේ ප්‍රශ්න සියල්ල අමතක කර දමලායි ඔබතුමන්ලා කථා කළේ. එක අමාත්‍යවරයෙක් සමහර වෙලාවට පැයක්, පැය එකහමාරක් කථා කරලා තිබෙනවා, මේ අය වැය කාරක සභා අවස්ථාවේදීත්, දෙවන වර කියවන අවස්ථාවේදීත්. එතුමන්ලා කථා කරපු හැම දෙයක්ම අපි අරගෙන බැලුවා. විපක්ෂයේ කණ්ඩායමක් හැටියට අපි ආණ්ඩුව වෙනුවෙන් කථා කරන අයගේ list එක හැදුවා, එතුමන්ලා කථා කරලා තිබෙන්නේ කොහොමද කියලා බලන්න. ඒ අනුව, ඒ පැයක් කථා කරපු කෙනා සියයට 80ක් කථා කරලා තිබෙන්නේ වල්පල්, ඕපාදූප. රටේ ජනතාවට ඕනෑ කරන දේවල් නොවෙයි කථා කරලා තිබෙන්නේ. මේ ආණ්ඩුව 2021 අය වැය යෝජනා ඉදිරිපත් කළාට ඒ තුළින් රටේ ආර්ථිකයට, ජාතික ආරක්ෂාවට, අධ්‍යාපනයට, සෞඛ්‍යයට හෝ විශේෂයෙන්ම අද මුහුණ දීලා තිබෙන කොවිඩ් වසංගතයට පිළිතුරක් හැටියට ප්‍රතිඵලදායක විධියට යමක් නොකියපු එක ගැන අපි කනගාටු වනවා වාගේම, ජනතාවට අනේ, අපොයි! කියලා විශේෂයෙන් ම ප්‍රකාශ කරනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මෙතැනදී මම සිහිපත් කරන්න ඕනෑ ප්‍රධාන කාරණාවක් තිබෙනවා. ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය අමාත්‍යතුමා කිව්වා, අපි සාමාන්‍යයෙන් ජනතාව ගැන හිතන්නේ නැහැ, එතුමන්ලා ජනතාව ගැන හිතනවා කියලා. 69 ලක්ෂයක් ඡන්දය දෙන්න පෙර මේ අය මැතිවරණ වේදිකාවලදී පොරොන්දු ගණනාවක් ජනතාවට ලබා දුන්නා. ඒ පොරොන්දු ටික දුන්නේ ජනතාවට ඒවා ඉටු කර දෙනවා කියලායි. හැබැයි, ඒ පොරොන්දු ටිකෙන් 2021 වර්ෂයෙන් පටන් ගන්නා පළමුවෙනි අය වැයේදී නිකම් එක පොරොන්දුවක් හෝ ඉටු කර තිබෙනවාද කියලා විශේෂයෙන් තමුන්නාන්සේලාගෙන් අහන්න වනවා.

මේ ගොල්ලන් පළමුවෙන්ම කිව්වා, හාල්, පරිප්පු, සීනි යනාදිය එක්ක රුපියල් 3,000ක බඩු මල්ලක් දෙනවා කියලා. ජල බිල්පතට සියයට 15ක අඩු කිරීමක් දෙනවා කිව්වා, විදුලි බිල්පතට සියයට 25ක අඩු කිරීමක් දෙනවා කිව්වා, ටෙලිෆෝන් බිලට සියයට 50ක අඩු කිරීමක් දෙනවා කිව්වා, ගෑස් සිලින්ඩරයට රුපියල් 100ක් අඩු කරලා දෙනවා කිව්වා, ගෑස් ළිප, rice cooker එක ගන්න සියයට 25ක සහනාධාරයක් දෙනවා කිව්වා, භූමිතෙල් සහනාධාරයක් දෙනවා කිව්වා, සමබර පෝෂ්‍යදායී ආහාර වේලක් දෙනවා කිව්වා, අඩු ආදායම්ලාභී අවුරුදු 12ට වඩා අඩු දරුවන් ඉන්න පවුලකට රුපියල් 5,000ක දීමනාවක් දෙනවා කිව්වා. ඒවා කෙසේ වෙතත්, කොවිඩ් වසංගතය නිසා වහලා තිබෙන ගෙදරකටවත් රුපියල් 5,000 දී ගන්න බැරි ආණ්ඩුවක් බවට අද මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා.

අවසාන වශයෙන් එක් කාරණයක් කියනවා. මගේ ළඟ තිබෙනවා, මේ හාල් බෑග් එක. මේ හාල් බෑග් එක අහිංසක, දුප්පත් මිනිසුන් ගන්න කිලෝ පහේ නාඩු හාල් බෑග් එකක්. මේ තිබෙන්නේ "අරලිය" හාල් බෑග් එකක්. මේ "අරලිය" හාල් බෑග් එකේ ගහලා තිබෙනවා පාලන මිල රුපියල් 480යි කියලා. මෙතැන බිල තිබෙනවා. බෝගවත්ත සමුපකාරයෙන් රුපියල් 525කට තමයි මේ හාල් බෑගය අරගෙන තිබෙන්නේ. රුපියල් 480යි කියලා පාලන මිලක් දාලා තිබෙන එක රුපියල් 525ට විකුණනවා නම් ඒකද තමුන්නාන්සේලා මෙච්චර කල් කළේ? එහෙම නම් මේකෙන් ගසා කනවාද? එහෙම නැත්නම් ආණ්ඩුව fail කරන්න හදනවාද? මේ ගැන සොයා බලන්න කියලා තමුන්නාන්සේලාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. කථා කරන්න ගොඩක් දේවල් තිබුණත් ඒකට අවස්ථාවක් නැති වුණත්, මේ අවස්ථාව හෝ ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාල්ස් නිර්මලනාදන් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.45]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டினுடைய பிரதமர் அவர்கள் நிதி அமைச்சராகவும் இருக்கின்ற நிலையில், நிதி அமைச்சின்மீதான குழுநிலை விவாதத்தில் ஒருசில விடயங்களை கௌரவ பிரதமர் அவர்களுடைய கவனத்திற்குக் கொண்டு வர விரும்புகின்றேன்.

முதலாவதாக, யுத்தம் முடிவுற்றபோது சரணடைந்த விடுதலைப் புலிகள் இயக்கப் போராளிகள் ஜனாதிபதியின் - தற்போதைய பிரதமர் அவர்களின் உத்தரவின்பேரில் புனர்வாழ்வளிக்கப்பட்டு, விடுதலை செய்யப்பட்டிருந்தனர். அப்போது அவர்களுக்கு எதிராகப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் வழக்குப் பதிவு செய்யவில்லை. ஆனால், அதற்கு முன்பு கைதுசெய்யப்பட்டவர்களுக்கு எதிராகப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் வழக்குத் தாக்கல் செய்யப்பட்டு, அவர்கள் இன்றும் சிறையில் இருக்கிறார்கள். அவர்களுடைய விடுதலை தொடர்பாக 15 பாராளுமன்ற உறுப் பினர்கள் கையொப்பமிட்ட எழுத்துமூலமாக கோரிக்கைக் கடிதத்தை நேற்று கௌரவ பிரதமர் அவர்களை நேரில் சந்தித்து வழங்கியிருந்தோம். ஆகவே, கௌரவ பிரதமர் அவர்கள் இது தொடர்பாக மிக விரைவாகத் தீர்மான மொன்றையெடுக்க வேண்டுமென்று நாங்கள் விநயமாகக் கேட்டுக் கொள்கின்றோம்.

அதேநேரத்தில், கௌரவ அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்கள் இரண்டு தினங்களுக்கு முன் இங்கே பேசியபோது, "வடக்கில் இருக்கின்ற மக்களுக்கு மூன்றுவேளை உணவை மாத்திரம் கொடுத்தால் போதும்; அதைத்தான் அவர்கள் எதிர்பார்க்கிறார்கள்" என்று இந்தச் சபையில் கீழ்த்தரமான ஒரு கருத்தைக் கூறியிருந்தார். அந்தக் கருத்தை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையிலே இருக்கின்றார். கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்குப் பின்னால் இழுபடுகின்ற ஒருசிலர்தான் இந்த விடயங்கள் தொடர்பாகத் தங்களுடைய வால்களை ஆட்டுவார்களேயொழிய, உண்மையான தமிழன், 'தமிழன்' என்ற அடையாளத்துடன் வாழ்வதற்குத்தான் விரும்புகின்றான் என்பதை நான் உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்பு கின்றேன். அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்களது கீழ்த்தர மான அந்தக் கருத்தை நாம் வன்மையாகக் கண்டிப்பதோடு, கௌரவ பிரதமர் அவர்கள் அவருடைய கருத்துத் தொடர்பாகக் கவனத்தில் எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரத்தில் பொலிஸ் திணைக்களத்தைத் தன்னுடைய கட்டுப்பாட்டுக்குள் வைத்திருக்கின்ற கௌரவ அமைச்சர் சரத் வீரசேகர அவர்கள், "தமிழ்த் தேசியக் கூட்டமைப்பைத் தடைசெய்ய வேண்டும்" என்று இந்தச் சபையிலே கூறியிருந்தார். இது அவருடைய தனிப்பட்ட கருத்தா அல்லது உங்களுடைய அரசாங்கத்தின் தீர்மானமா? என்பதை நான் கௌரவ பிரதமர் அவர்களிடம் கேட்க விரும்புகின்றேன். கௌரவ பிரதமர் அவர்கள் இந்த விடயங்கள் தொடர்பாகக் கருத்திலெடுக்க வேண்டும்.

அடுத்து, நேற்று மன்னார் மாவட்டத்தில் வங்காலை இராணுவ சோதனைச் சாவடியால் சென்ற நபர்கள்மீது அடையாள அட்டை இல்லை என்ற காரணத்தால் இராணுவத்தினர் தாக்குதல் மேற்கொண்டிருக்கிறார்கள். அதற்கு இரண்டு தினங்களுக்கு முன்பு face mask அணியவில்லையென்று மண்வெட்டிப் பிடியால் தாக்கியிருக் கிறார்கள். எங்களுடைய மக்களைத் தாக்குவதற்குரிய அதிகாரத்தை இந்த இராணுவத்தினருக்குக் கொடுத்தது யார்? என்று நான் கேட்க விரும்புகின்றேன். உங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்பு இராணுவத்தினரின் செயற்பாடுகள் மிகவும் மோசமாக இருக்கின்றன. எனவே, கௌரவ பிரதமர் அவர்கள் இது தொடர்பாகத் தெளிவான ஒரு முடிவையெடுத்து, அங்குள்ள பொலிஸார் மற்றும் இராணுவத் தினருக்கு அறிவுரைகள் வழங்க வேண்டும். எங்களுடைய மக்களை மனிதராக மதிக்க வேண்டுமென்று இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කථික ලැයිස්තුවේ වෙනසක් වෙලා තිබෙනවා. ඊළඟට කථා කරන්න තිබෙන්නේ විරුද්ධ පාර්ශ්වයටයි. ඒ අනුව දැන් කථා කරන්නේ, ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ඇයි, මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට කථා කරන්න දුන්නු අවස්ථාව අපට දුන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විරුද්ධ පාර්ශ්වයේ කථිකයන්ගේ ප්‍රමාණය වැඩි වෙලා තිබෙන නිසා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
එහෙම නම් ඒක වැරැදියි නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට කථා කරන්න දුන්නා. එතුමා කථා කරන්න ආරම්භ කළාට පස්සේ දැන් ඒ අවස්ථාව විරුද්ධ පාර්ශ්වයට දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. එහෙම එකක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ-

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
එහෙම නම් ආණ්ඩු පාර්ශ්වයේම වෙන කාටහරි දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරන්න ඉන්නේ තව කථිකයන් දෙදෙනායි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආණ්ඩු පක්ෂයෙන් දෙන්නෙක් සහ විරුද්ධ පාර්ශ්වයෙන් හය දෙනෙක් ඉන්නවා, කථා කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම්, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඊළඟ අවස්ථාව ලැබෙනවා. [බාධා කිරීම්] එහෙම නම්, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අපේ පැත්තේ කථා ඔක්කෝම අවසන් කරලා තමයි එහා පැත්තට අවස්ථාව දෙන්න හදන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තව කථා දෙකයි ආණ්ඩු පක්ෂයට තිබෙන්නේ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ, ගරු මන්ත්‍රීතුමා. ආණ්ඩු පක්ෂයෙන් තවත් කථිකයන් දෙදෙනකු විතරයි ඉන්නේ. [බාධා කිරීම්] විවාදය සමබර වෙන්න ඕනෑ හින්දා තමයි දෙපැත්ත මාරු කළේ.

එහෙම නම්, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට මිනිත්තු 16ක කාලයක් තිබෙනවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මා දැන්ම කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා මගේ නම ප්‍රකාශ කරලා, මගේ කථාවක් quote කරලා කිව්වා, උතුරේ දෙමළ ජනතාවට තුන්වේල කන්න දුන්නොත් ඇති කියලා මා කියපු බව. ඒක වැරැදි අවබෝධයක් ගරු මන්ත්‍රීතුමනි. මා මගේ කථාවේදී කිව්වේ, පසුගිය අවුරුදු පහේ උතුර සංවර්ධනය කරන්න දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු කටයුතු කළේ නැහැ. ඒ නිසා යුද්ධයෙන් පස්සේ ඒ මිනිසුන්ගේ සියලු අවශ්‍යතා සපුරන්න කටයුතු කළේ එදා අපේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නායකත්වයෙන් තිබුණු ආණ්ඩුව කියලායි. ඒකයි මා එදා කිව්වේ. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටියේ, උතුරේ දෙමළ ජනතාවට සහන ලබාදෙන්න අපිත් එක්ක එකතු වෙන්න කියලායි.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, උතුරේ ඉන්න ජනතාවට තුන් වේලට බත් විතරයි ඕනෑ කියලා. ඔබතුමා කිව්වේ නැහැ කියනවා නම්, පත්තරේ බලන්න. පත්තරවල දාලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමා කිව්වා. මමත් හිටියා. මමත් ඒ වෙලාවේ හිටියා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, මා ඔබතුමාත් එක්ක කථා කරනවා. ඔබතුමා මේ

වාගේ කථා කරන කොට අපට ලජ්ජා වෙන්න බැහැ. ඔබතුමන්ලා එහෙම කථා කරන්න එපා. ආණ්ඩුවේ ඉන්න ඔබතුමන්ලා එහෙම කථා කරලා ජනතාවට අපහාස කරන්න එපා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිසිම අවස්ථාවකදී එහෙම කිව්වේ නැහැ. තුන්වේල කන්න දුන්නොත් ඇති කියන එක නොවෙයි මා කිව්වේ. ඔබතුමා මගේ කථාව හරියට අහගෙන හිටියා නම් ඒක පැහැදිලි වෙනවා. මට සමාවෙන්න. ඔබතුමන්ලා සහ අප අතර communication gap එකක් තිබෙනවා. මා බස්නාහිර පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට සිටියදී, උතුරේ යුද්ධය අවසන් වුණාම බස්නාහිර පළාතේ ගුරුවරුන් පවා අපි නිදහස් කරලා උතුරට යැව්වේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඉල්ලීම පරිදියි. හැබැයි, පසුගිය අවුරුදු පහේ ඔබතුමන්ලා යහ පාලන ආණ්ඩුවට කඩේ ගිහිල්ලාවත් දෙමළ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරගන්න පුළුවන් වුණේ නැහැ. එදා ඔබතුමන්ලා කළේ, ඒ ආණ්ඩුවට කඩේ ගිහින්, එක් එක්කෙනාගෙන් සල්ලි අරගෙන, අය වැයේදී සල්ලි එකතු කරගෙන දෙමළ මිනිසුන් අසරණ කිරීමයි. අපි ඒ දෙමළ ජනතාව වෙනුවෙන් කථා කළේ, ගරු මන්ත්‍රීතුමා. එදා වෙන් කරපු මුදලින් වැඩ ටික කළේ නැහැ.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් විපක්ෂයේ කිහිපදෙනකුටම ආරාධනා කළා, කථා කරන්න. එතුමන්ලා කථා කරන්නේ නැත්නම්, කරුණාකර ඒ වෙලාව අපට දෙන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ආරාධනා කරලාත් කථා කරන්නේ නැත්නම්, වෙන කාට හෝ අවස්ථාව දෙන්න වෙනවා නේ.

[බාධා කිරීමක්]

[අ.භා. 3.54]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය සම්බන්ධයෙන් දවස් කිහිපයක් කථා කළා. අද අන්තිම දවසේ, අන්තිම හෝරාවේත් අර්බුදයක් මැද විනාඩි කිහිපයක් හෝ කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. මට තේ එක බොන්න ලැබුණේත් නැහැ. කථික ලැයිස්තුවේ මගේ නම තිබුණේ, අන්තිම කථිකයාට කලින්. ඒකයි මා තේ එක බීලා හරියට වෙලාවට එන්න බැලුවේ. හැබැයි, ප්‍රශ්න, අර්බුද තිබෙනවා නේ. [බාධා කිරීම්] ඒ නිසා මගේ කථාව කරන්නම්. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අද කතන්දරයක් නැද්ද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
පොඩි එකක් තිබෙනවා. ඒ සොක්‍රටීස්ගේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දාර්ශනිකයෙකු වන සොක්‍රටීස් මෙහෙම කථාවක් කියලා තිබෙනවා: "When the debate is lost, slander becomes the tool of the loser". ඒකේ තේරුම මොකක්ද? "විවාදය පරාජය වන බව දැනෙන විට අපහාස කිරීම පරාජිතයන්ගේ මෙවලමක් බවට පත්වේ" කියන එකයි. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එතැනින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයක් ඉදිරිපත් කළොත්, අපි සාමාන්‍යයෙන් ඊළඟ දවසේ පත්තරය බලනවා, මොනවාද අපට හම්බ වන සහන කියලා දැනගන්න. අය වැය කථාව කරද්දී ගම්වල මිනිස්සු පෙට්ටි රේඩියෝව දමාගෙන, බංකුවේ ඉඳගෙන අහගෙන ඉන්නවා, අද හම්බ වන සහන මොනවාද කියලා දැනගන්න.

හැබැයි, මේ අය වැයේදී නම් මරු වචන ටිකක් අපට අහන්න ලැබුණා.

ඒ එකක් ගැන මා කියන්නම්. අර "ක්ලියෝපැට්රා" එහෙම දැන් මෙතැන ඉන්නවාද දන්නේ නැහැ. ක්ලියෝපැට්රා කිව්වා, "ගංජා නීතිගත කරමු. ණය ගෙවමු." කියලා. "ගංජා නීතිගත කරමු. ණය ගෙවමු." කියන වචන හොඳට කනට ඇහුණා. "කළු සල්ලි සුදු කරමු. අපි අපේ ණය ගෙවමු." කියමින් මේ දින කීපය පුරා කථා කරනවා අපට ඇහුණා. ඒ වාගේම, හිරගෙවල්වල "රිවස්" පෙත්ත ගැනත් මේ අය වැය කාලය පුරාම අපට අහන්න ලැබුණා. අපේ "Antigen man" is a good man. මම දන්නවා, ඔබතුමන්ලා බොක්කේ දේශපාලනඥයන් බව. හැබැයි, ඔබතුමන්ලාට උඩින් ගිය "Antigen man" කෙනෙක් ඉන්නවා නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද? තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා ද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
එතුමා "Antigen man" ද? [බාධා කිරීම්]- මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න බොහොම පොඩි වෙලාවක් තිබෙන්නේ. මේක මම ආණ්ඩුව පැත්තේ ඉන්න ඔබතුමන්ලා වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කරන කථාවක්. [බාධා කිරීම්] මා එහෙම කියන්න හේතුව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව - [බාධා කිරීම්] මේ රටේ මුදල් ඇමතිතුමා වන මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් හැම කෙනාගේම නම දැනගත්තාට, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මෙතැන ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකක නොවෙයි, භාගයකවත් නම් දන්නේ නැහැ කියලා මම කියනවා. ඒකයි ඇත්ත කථාව. [බාධා කිරීම්]- කුට්ටි, එතුමා ඔබ දන්නේම නැහැ. [බාධා කිරීම්] ඇත්තම කථාව ඒකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනයේ එතුමන්ලාට වැරැදිලා තිබෙන,- [බාධා කිරීම්]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
අයියෝ! පිනට ආවේ. ඉඳගන්න කෝ පොඩ්ඩක්.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
කවුද පිනට ආවේ? ඔබතුමා නේ පිනට ඇවිල්ලා ඉන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේ තමයි පිනට ඇවිල්ලා ඉන්නේ. [බාධා කිරීම්] මම ඡන්දවලින් ආවේ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතිහාසයේ පළමුවැනි වතාවට මන්ත්‍රීවරු 10 දෙනා බැගින් ගෙන්නලා එතුමන්ලාට තිබෙන ප්‍රශ්න ගැන පෞද්ගලිකව කථා කරන්න අවස්ථාව දීලා තිබෙනවා. එතුමා හැම මන්ත්‍රීවරයකුගේම නම් දන්නවා, තමුන්නාන්සේලාගේ නායකයා මන්ත්‍රීවරුන්ගේ නම් දන්නේ නැති වුණාට.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. දැන් එතුමාට ඒ රිදිල්ල තිබෙනවා. මොකද, එතුමා කාලයක් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පෞද්ගලික ගෝලයා වෙලා, ඉල්ලන් කෑවා. දැන් ඉතින් පුළුවන් තරම් වඳිනවා. මම නමක් කිව්වේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] මම නමක් කිව්වේ නැහැ. ඒ නිසා මට බාධා කරන්න දෙන්න එපා. [බාධා කිරීම්] බාධා කරන්න එපා. මම නමක් කිව්වේ නැහැ. තොප්පි දාගන්නවාට, එක එක්කෙනාට කඩේ ගියත් ඇමතිකමක් නැතිව දැන් දුකින් අඬනවාට මට කරන්න දෙයක් නැහැ. සත්‍ය තිත්තයි. [බාධා කිරීම්]

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
Sir, I rise to a point of Order.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔය point of Order එකක් නොවෙයි. මගේ වෙලාව නාස්ති කරන්න දෙන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බලමු, මොකක්ද කියලා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
එතුමා මට චෝදනාවක් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමා ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයෙකු කළේ තමුන්නාන්සේලායි. [බාධා කිරීම්] අපි නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කළේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මම නමක් කිව්වේ නැහැ. [බාධා කිරීම්] ඇත්ත අහගෙන ඉන්න බැහැ. අද මේ මන්ත්‍රීවරුන්ට වෙලා තිබෙන්නේ මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ දේශපාලනයට ඇවිල්ලා අද එතුමා වෙනුවෙන් මේ මුදල් අමාත්‍යාංශයේ- [බාධා කිරීම්] එක අවංක වචනයක්- [බාධා කිරීම්] මේ රටේ මිනිසුන්ගේ ප්‍රශ්න විසඳන එක අවංක වචනයක් කිව්වාද කියලා කියන්න.

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර එතුමාට කියන්න අය වැය ගැන කථා කරන්න කියලා. අදත් ඇවිල්ලා මේ මොනවා ද කියන්නේ?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා ගත්ත වෙලාව මට ඕනෑ. ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාත් ගියා. මට එතුමාගේ වෙලාව දුන්නත් කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ දැන් අය වැය ගැන තමයි කථා කරන්නේ. පාර්ලිමේන්තුව එහා පැත්තට ගිහිල්ලා බලන්න, V8 වාහනවල ඇවිල්ලා, හොඳ කාර්වල ඇවිල්ලා නෝනා මහත්වරු රෝස් පාන් විකුණන හැටි; masks විකුණන හැටි. මේ තමයි, ඇත්ත කථාව.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉතින් හොඳයි නේ. [බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
අන්න! ඒක හොඳයි ලු. [බාධා කිරීම්] ඒක හොඳයි ලු. ඒක තමයි මේ අය වැයෙන් වුණේ. [බාධා කිරීම්] මේ රටේ මිනිසුන්ට, ඔබතුමන්ලාට ඡන්දය දීපු හැටනවලක්ෂයක් මිනිසුන්ට පාරට බැහැලා රෝස් පාන් විකුණන්න වුණා, මේ අය වැය නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැදගත් දෙයක් අහන්නම්. [බාධා කිරීම්]- කරුණාකර ඔහොම බාධා කරන්න එපා. මම වුවමනාවෙන් ඇවිල්ලායි කථාව ඉල්ලාගත්තේ. මේ වෙලාව මගේ කථාවට නියමිත වෙලාවත් නොවෙයි. පොඩි chance එකක් දෙන්න.

මම කියන මේ කාරණය වෙනුවෙන් ඔබතුමන්ලා සටන් කරන්න. මම නාමල් රාජපක්ෂ මැතිතුමාගෙනුත් මේ ඉල්ලීම කරනවා. ඔබතුමා මේ ගැන දන්නවා ද දන්නේ නැහැ. ගරු

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා නම් දන්නවා ඇති. ඒ, NatWealth Securities Ltd. සම්බන්ධව. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. "Minister of Trade, (Dr.) Bandula Gunawardana submitted a Cabinet Paper to the Cabinet Meeting held on 18th, March 2020 seeking approval to sell the company to a new investor" කියා සඳහන් වෙනවා. NatWealth සමාගමේ තමයි මහපොළ ශිෂ්‍යත්වයේ බිලියනයක් මුදල් ආයෝජනය කරන්නේ. ඒක විකුණන්න කියලා දාලා තිබෙනවා. ඔබතුමා මේ ගැන දන්නවා ඇති. ඔබතුමාගේ පුතාත් ඒ,- [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු අමාත්‍යතුමනි, මට බාධා කරන්න එපා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මම ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා ඉතාම හොඳ දෙයක් ගැන කථා කරන්නේ. අපි NatWealth සමාගමේ තමයි මුදල් හුඟක් ආයෝජනය කරලා මේ රටේ මහපොළ ශිෂ්‍යත්වය,- [බාධා කිරීමක්]- අපේ පැත්තේ වෙලාවෙන් අරගෙනයි මම මේ කථා කරන්නේ.

මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට මහා විශාල දායකත්වයක් ලබා දුන්නා. අපේ ආණ්ඩුවේ අන්තිම අවුරුද්දේ මම වෙළෙඳ ඇමති විධියට ඉන්නකොට කෝටි 47ක විතර ලාභයක් ලැබුවා, NatWealth සමාගම. ඒ NatWealth සමාගමට ලක්ෂ 20,000ක් මලික් සමරවික්‍රම පාඩු කෙරුවා. අපි ඒ ගැන පැමිණිලි කළා. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා තරුණ මන්ත්‍රීවරයෙක්. ඔබතුමාට හොඳ අනාගතයක් තිබෙනවා. ඊට පස්සේ ඒක විකුණන්න දැම්මේ මලික් සමරවික්‍රමගේ කාලයේ. අපි නොවෙයි. අපි ගිහිල්ලා ඒකට විරුද්ධව පැමිණිලි කළා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Wait! - [*Interruption.*] Wait, Hon. Kabir Hashim. Do not act like a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Give me time to speak. - [*Interruption.*] පොඩ්ඩක් කථා කරන්න දෙන්න. මේ ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා වාගේ වැදගත් විධියට ඉන්න කෝ. [බාධා කිරීම්] තමන්ගේ ලේකම්ව බලාගන්න බැරි වෙච්ච කෙනා. Be a decent Member.

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන සටන් කරන්න. මමත් ඒ වෙනුවෙන් ඉන්නවා. ලක්ෂ 20,000ක් හොරකම් කළා, මලික් සමරවික්‍රම. ඒකේ හිටියේ ගාමිණී දිසානායක මහත්මයාගේ මස්සිනා. ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දන්නවා. එතුමා වික්‍රමසූරිය. එයාගේ පුතා දාලා තමයි මේ රටේ මහජන මුදල් ලක්ෂ 20,000ක් හොරා කෑවේ, ඒ කාලයේ. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාත් එක්ක ඒ කාරණයේදී ඉන්නවා. ඔබතුමා ඉදිරිපත් කළේ හොඳ දෙයක්. හැබැයි, ඔබතුමන්ලාගේ කාලයේ තමයි ඒ හොරකම සිද්ධ වුණේ. [බාධා කිරීම්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේවා තමයි පාර්ලිමේන්තුවේ විය යුත්තේ. විපක්ෂය යම්කිසි කරුණක් ගෙනාවොත්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න ඕනෑ. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, Mahapola Fund එකේ opening fund value එක Rs. 3 billion තිබුණා; net income earned was Rs. 9 billion. හොරකම් කරපුවාත් ඇති. හැබැයි, මහ පොළ අරමුදලට ගෙවලා තිබුණේ, Rs.4 billion ගණනක්. එතකොට තවම closing value එකක් තිබෙනවා, Rs. 8 billion. මම කියන්නම් එතැන තිබෙන වංචාව මොකක්ද කියලා.

මෙතැන තිබෙනවා කොම්පැනි. ඔබතුමාත් දන්නවා මේ පුද්ගලයා කවුද කියලා. ඒක settle කරන්න ගියොත් නඩු දෙකක් තිබෙනවා. ඒ නඩු දෙක settle කරන්න මිලියන 400ක් යනවා. කොම්පැනි දෙකක් තිබෙනවා. එකක්, Trillion Securities (Pvt.) Limited. අනෙක් එක, Virtual Investments and Trading Lanka (Pvt.) Limited. ඒකේ අයිතිකාරයා මාත් දන්නවා; ඔබතුමාත් දන්නවා; ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාත් දන්නවා. එයා ලංකාවේ ඉන්න ව්‍යාපාරිකයෙක්. හැබැයි, එතුමා ක්‍රීඩා සමාජයකත්, ක්‍රීඩා ආයතනයකත් සභාපති කෙනකු හැටියට ඉන්නවා. ඔහුට ඒ ගණන ගෙවන්න වනවා, ඒ කොම්පැනිය වැහුවොත්; settle කළොත්. ඒකටද මේ Cabinet Paper එක එළියට ඇවිල්ලා තිබෙන්නේ? මේකටද මහපොළ ශිෂ්‍යත්ව අරමුදල කියන ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. මම පස්සේ ඒ ගැන කියන්නම්. නැත්නම් ඒගොල්ලෝ හිතනවා, මම මඩ ගහනවා කියලා. මට මිනිසුන්ට මඩ ගහන්න වුවමනාවක් නැහැ. මේක ඇත්ත කථාවක්. මේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමන්ලාට මේ කරුණු හොයා ගැනීමේ හැකියාව තිබෙනවා. මම මේ කොළේ ඔබතුමාට දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙලාවේ ලොකු ප්‍රශ්නයක ඉන්න රටක්. අද කොවිඩ් ප්‍රශ්නය තිබෙනවා. දරුවන්ට ඉගෙන ගන්න විධියක් නැහැ. මේ අවුරුද්දට දින 60යි ඉස්කෝල පවත්වලා තිබෙන්නේ. මේ ප්‍රශ්නත් එක්ක මහ පොළ අරමුදලටත් හානි වෙලා ගියොත්, අපට යන එන මං ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මගේ ඉල්ලීම, අඩුම ගණනේ සාධනීය කරුණක් මේ පාර්ලිමේන්තුව තුළ අපට එකතු වෙලා -[බාධා කිරීම්]

ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍යකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

Sir, I rise to a point of Order.

මලික් සමරවික්‍රම මැතිතුමාට සහ වික්‍රම වීරසූරිය මැතිතුමාට විරුද්ධව, මිලියන 1,000ක් වංචා කළාය කියලා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. එදා කට වහගෙන හිටිය-

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඒ පැමිණිල්ලම දැන් ඔබතුමන්ලාට ආපහු කරන්න පුළුවන් නේ. නැවත පැමිණිල්ලක් කරලා, මේ ආයතනය ආරක්ෂා කරන්න කෝ. විකුණන්න එපා. හොරකම් කළා නම් ඒ මිනිහා හිරේ දාන්න කෝ. අඩු ගණනේ මේක විකුණන්නේ නැතුව ඉන්න කෝ. මහපොළ ශිෂ්‍යත්ව අරමුදල කියන්නේ ගරු ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා මේ රටට දීපු දායාදය. ඒක මේ රටේ ජනතාවගේ අහිංසක දරුවන්ට නැති කරන්න එපා. ඒකයි අපි ඉල්ලන්නේ. [බාධා කිරීමක්] විකුණන්නේ නැත්තේ කොහේද? ඒකට Cabinet Paper එකක් දාලා තිබෙනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, NatWealth සමාගම ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා හදපු එකක් නොවෙයි. රවි කරුණානායක මහත්මයා ඉන්න කාලයේ තමයි ඒ සමාගම් දෙක හැදුවේ. පොඩි සමාගම් දෙකක්. The main body is there. [බාධා කිරීම්] මුළු මුදල. ඒකේ තමයි trading කළේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

Primary trading කරපු licence එකක් තිබෙනවා. ඒ licence එකත් විකිනවා. ඒ licence එකත් වෙන මිනිහෙකුගේ අතට යන එක සෙල්ලමක් නොවෙයි. Bond ප්‍රශ්නයට අපි තවමත් පරිප්පු කනවා. ඔය primary dealings නිසා තමයි අපි පරිප්පු කන්නේ. මම ඔබතුමන්ලාට ෆේල් නොවී පාස් වෙන්න පාරක් කිව්වේ. මේකත් කළොත් ආයෙත් ෆේල්. ඒ නිසා මතක තියා ගන්න, මහපොළ අරමුදලට අත තැබුවොත් ෆේල් කියලා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඒ සමාගම විකුණන එක සම්පූර්ණයෙන්ම තහනම් කළේ, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට කලින් හිටපු ඇමතිතුමා. ඊට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා. මේ ඒකේ continuation එකක් තිබෙන්නේ. අපිත් විකුණනවාට විරුද්ධයි. [බාධා කිරීමක්] අපි විරුද්ධයි සම්පූර්ණයෙන්ම.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

අපේ අතින් වැරදි වෙච්ච නිසානේ අපි පැරදුණේ. අපේ අතින් වුණු වැරදි ඔබතුමන්ලාට නිවැරදි කරන්න පුළුවන් නේ. ඒ නිසා මේක නිවැරදි කරන්න. මේ paper එක මම ඔබතුමාට දෙන්නම්. ඒ සම්බන්ධයෙන් ඔබතුමා බලන්න. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

අයියෝ! මට බාධා කරන්න එපා.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

ඔබතුමා ඔය කියන නම අපට දැන ගන්න පුළුවන්ද? ඔය වංචාව කළා කියා ඔබතුමා කියන කෙනාගේ නම අපට කියන්නකෝ. [බාධා කිරීමක්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඔක්කෝමලා "පොරවල්" වෙන්න හදන එකයි. හැබැයි, එකම පොරයි ඉන්නේ. ඒ පොර ඉන්නේ එළියේ. ඒ තමයි "ඇන්ටිජන්". ඇන්ටිජන් තමයි ඉන්න පොර. ඒ මිනිහාට ඕනෑ දේවල් තමයි මේකෙන් කෙරෙන්නේ. මම දන්නේ නැහැ මේක ඇත්ත ද බොරුද කියලා. සිසිර ජයකොඩි ඇමතිතුමා ඉන්නවා ද දන්නේ නැහැ. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය නම් මේකට විරුද්ධයි. ආරංචියක් ආවා පාර්ලිමේන්තුවටත් පැණි ඇවිල්ලා තිබුණා; පෝළිමක් තිබුණා කියලා. කවුරු හරි පැණි බිව්වාද? ගත්තාද? ඇයි ද දන්නේ නැහැ කට වහගෙන ඉන්නේ. අරගෙන වාගෙයි පෙනෙන විධියට නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යාවයි, මිථ්‍යාවයි කියලා දෙකක් තිබෙනවා. ලෝකය යන්නේ විද්‍යාව පැත්තට; අපි යන්නේ මිථ්‍යාව පැත්තට. මේ ආණ්ඩුව පළමුවෙනි අවුරුද්දේ ෆේල් වුණා කියලා අපි නොවෙයි කියන්නේ; මේ රටේ මහජනතාවයි කියන්නේ. [බාධා කිරීම්] කුට්ටි, ඔබතුමා O/L කරලා තිබෙන බව මම දන්නවා. අනික් එක්කෙනා වාගේ නොවෙයි. මම ඉල්ලීමක් කරනවා, O/L නොකරපු බහුතරයක් ඉන්න මේ ගරු සභාවේ ඔට්ටුවකටත් එක්ක O/L results දාලා බලමු කියලා. අපි අභියෝගයක් කරමු. ඔබතුමන්ලාගෙන් 150ක් දාන්න. අපෙනුත් දමන්නම්. කීයෙන් කී දෙනෙක් පාස් ද ෆේල් ද කියලා බලමු. ඒ නිසා බොරුවට මඩ ගහලා මිනිස්සුන්ගේ නම නාස්ති කරලා පෞද්ගලික දේවල් කථා කරලා වැඩක් නැහැ. සාධනීය දෙයක්, පාර්ලිමේන්තුවට හොඳ දෙයක්, පාර්ලිමේන්තුවෙන් රට වෙනස්වන දෙයක්, ඒ වාගේම රටේ මිනිස්සු "පාස්" කරන දෙයක් කරන්න අපි එකඟ වනවාය කියන එක මතක් කරමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා. මේ අය වැය අන්තිම පරාජය වෙච්ච අය වැයක්. හැබැයි, ලබන අවුරුද්දේවත් හොඳ තැනකට යන්න සියලුදෙනාටම හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ඔබතුමා ආණ්ඩු පක්ෂයට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. අපේ තව කථිකයන් දෙන්නයි ඉන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ පැත්තේත් දෙන්නයි ඉන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම දාම මේ වැඩේ කරනවා. අපේ තව කථිකයන් දෙදෙනායි ඉන්නේ. ඒ නිසා ආණ්ඩුව පැත්තට අවස්ථාව දීලා ඊළඟට අපේ පැත්තට දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මේ පැත්තේ ඉන්නේත් කථිකයන් දෙදෙනායි. විපක්ෂයට එක් අවස්ථාවක් දීලා අනෙක් අවස්ථාව ආණ්ඩු පක්ෂයට දුන්නාම තමයි balance වෙන්නේ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පැත්තෙන් ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගෙන් පස්සේ ගරු අගමැතිතුමාගේ විනාඩි දෙකක ස්තුතියක් පමණයි තිබෙන්නේ. අපේ කථා එතැනින් අවසන්. කථාවලට බය වෙන්න එපා. වෙලාව නැත්නම් අපි මේ විවාදය අවසන් කරමු. ඇයි මේ කථා කරන්න බය වෙන්නේ? ඇයි බය? මාර විපක්ෂයක්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාකරන්න ඉන්න අයගේ නම් ටික කියන්න බලන්න, කවුද බය කියලා බලන්න. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මුහුණ දුන්නා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් එක්ක ප්‍රශ්න තිබෙනවා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මුහුණ දුන්නා. දැන් බය කවුද කියලා බලන්න, නම් ටික කියන්න බලන්න.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියන විධියට අපි කවුරුවත් බය නැහැ. මේ විවාදයක් යන්නේ. ඒක දෙපැත්තට යන්න ඕනෑ. අපේ පැත්තෙන් තුන් දෙනෙක් කථා කළා. දැන් ඔය පැත්තෙන් තමයි කථා කරන්න ඕනෑ. ඇයි, විවාදයක් නේ යන්නේ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා මගේ හිතවතා; මගේ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. අවුරුදු ගණනාවක් පාර්ලිමේන්තුවේ ඉන්න කෙනෙක්. එතුමා දන්නවා පාර්ලිමේන්තුවේ අවසාන කථාව තිබෙන්නේ ආණ්ඩු පක්ෂයට බව. තමුන්නාන්සේලා විනාඩි 5, විනාඩි 5 දීලා කථිකයන් 20ක් විතර දාලා තිබුණා. රවුෆ් හකීම් වාගේ හොඳ ජ්‍යෙෂ්ඨ නායකයකුට හම්බවුණේත් විනාඩි 10යි. දැන් තමුන්නාන්සේලා කථා කරන්න ඕනෑ. අපි තමයි අවසාන කථාව කරන්නේ. තමුන්නාන්සේලා ද අවසාන කථාව කරන්නේ? [බාධා කිරීම්] ඉතින් තමුන්නාන්සේලාගෙත් කථිකයන් දෙන්නෙක් ඉන්නවා. ගණන් තේරෙන්නේ නැද්ද? ගණන් තේරෙන්නේ නැහැනේ තමුන්නාන්සේලාට. ගණන් තේරෙන්නේ නැතිව විහිළු කරනවා. Hon. Lakshman Kiriella, you can teach them a lesson; පොඩි පන්තියක් තියන්න මේ ගොල්ලන්ට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයට එක් අවස්ථාවක් ලබා දීලා, ඊට පස්සේ අපේ කථා අවසන් කරලා අගමැතිතුමාගේ කථාවට අවස්ථාව ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතකොට විපක්ෂය පැත්තෙන්,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩු පක්ෂයට එක් අවස්ථාවක් දීලා, ඊට පස්සේ අපේ කථා අවසන් කරලා, අගමැතිතුමාගේ කථාවට අවස්ථාව ලබා දෙන්න. දෙපැත්තටම කථා ලැබෙන්න ඕනෑ. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක හරි. නමුත් - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එක පැත්තක අය විතරක් කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ වුණාට ගරු මන්ත්‍රීතුමනි, මේක මේ දෙපැත්තටම - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ පැත්තට එක අවස්ථාවක් දීලා අපේ කථාව ඉවර කරලා ගරු අගමැතිතුමාට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා පොඩි ළමයි වාගේ කථා බෙදා ගන්න කෑ ගහනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා

දැන් කථා කරන්න. කථා දෙකයි නේ තිබෙන්නේ. ඔබතුමන්ලාට විනාඩි හතරක් තිබෙනවා නේ. [බාධා කිරීම්] ඉතින් ඒ විනාඩි හතර කථා කරන්න කෝ. [බාධා කිරීම්] ආයෙත් මොකක්ද පොඩි ළමයි වාගේ කථා ටික බෙදා ගන්න කෑ ගහන්නේ? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පොඩි ළමයින්ට මේවා තේරෙන්නේ නැහැ. මේක විවාදයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයක් තමයි. නමුත් දැන් -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක විවාදයක්. ඒ පැත්තට කථාවක් දීලා, අපේ කථාව ඉවර කරලා ඒ පැත්තට දෙන්න. අන්තිම කථාව, ගරු අගමැතිතුමාගේ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, දැන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පැහැදිලි කළා නේ, කථිකයෝ ඉන්න ප්‍රමාණය කොහොමද, කටයුතු කෙරෙන්නේ කොහොමද කියලා. ඒ නිසා බාධාවක් නැතිව කටයුතු කරගෙන යන්න ඔබතුමන්ලාගේ සහයෝගය දෙන්න.

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ පැත්තේ කථිකයෝ තුන්දෙනෙක් එක දිගට දැම්මාම ඒක විවාදයක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම සංශෝධනය වුණේ මේ අතරමැදදී නේ ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] සංශෝධනය වුණේ අවසාන වෙලාවේ. එතකොට ඒ තුළ කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ. [බාධා කිරීම්] කාලය ගෙවිලා යනවා. එහෙම නම් අපි ආණ්ඩු පක්ෂයට කථාවක් දීලා ඉතුරු කථාව මේ පැත්තට දීලා ඉවර කරලා දමමු. එහෙම නම් ගරු මහින්දානන්ද - [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, නැහැ, නැහැ. එහෙම කොහොමද දෙන්නේ? [බාධා කිරීම්] එහෙම නම් එතුමා අවසාන කරලා - [බාධා කිරීම්] ඇයි බය? [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දැන් අපට අලුත් නමක් යෝජනා කරලා තිබෙනවා. තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමාට මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා. [බාධා කිරීම්]

[අ.භා. 4.14]

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] කරුණාකරලා අහ ගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
කරුණාකරලා අහ ගන්න. [බාධා කිරීම්] දැන් කථිකයෙක් නේ ඉල්ලුවේ. [බාධා කිරීම්] දැන් මමයි මේ ආණ්ඩු පක්ෂයේ කථිකයා. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ කථිකයා. [බාධා කිරීම්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාට කථා දෙකයි තිබෙන්නේ කියලා බොහොම පැහැදිලිව ආණ්ඩු පක්ෂයෙන් කිව්වා. [බාධා කිරීම්] අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එතකොට මෙතුමාගේ කථාවෙන් පසුව තව එක කථාවයි තිබෙන්න පුළුවන්. [බාධා කිරීම්] ඔබතුමාට සභාවට බොරු කරන්න බැහැ. [බාධා කිරීම්] ඔබතුමාට සභාව නොමඟ යවන්න බැහැ. ඒක හොඳට මතක තබා ගන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැක්කා නේ. එතුමා මෙතැනට ඇවිල්ලා ආපසු ඒක සංශෝධනය කළා. මූලාසනයෙන් දැනුම් දුන්නේ ඒක. ඊට පසුව තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමාට අලුතින් විනාඩි දෙකක කාලයක් ලබා දුන්නා.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] කරුණාකරලා මතක තබා ගන්න, ආණ්ඩු පක්ෂයේ කොච්චර කථිකයෝ හිටියත් අපි විපක්ෂයට අවසරය ලබා දුන්නා කියලා. [බාධා කිරීම්] හැබැයි අපට පෙනෙනවා, විපක්ෂයේ අද කථිකයෝ නැහැ කියලා. අද කථා කරන්න බය වෙලා ඉන්නවා. [බාධා කිරීම්] එම නිසා විපක්ෂයට බොහොම පැහැදිලිව මතක් කරනවා, ආණ්ඩුවේ - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එහා පැත්තේ මන්ත්‍රීවරයකුගේ නම කිව්වා. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයෙන් ඇවිල්ලා මෙතැනට ඒ සංශෝධනය භාර දුන්නා. ඒ නිසා තමයි ඒ නම කිව්වේ. [බාධා කිරීම්] තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීතුමා විනාඩි දෙකක කාලය ලබා ගන්න.

ගරු තිසකුට්ටි ආරච්චි මහතා
(மாண்புமிகு திஸகுட்டி ஆரச்சி)
(The Hon. Thisakutti Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග කඩ කරන්න එපා කියලා අපි විපක්ෂයට බොහොම පැහැදිලිව මතක් කරනවා. අපි විපක්ෂයේ ඔබතුමන්ලාට අවස්ථාව ලබා දුන්නා. විපක්ෂය ඇයි ඔච්චර කථා කරන්න බය? [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෝඩ කථා කියන්න එපා, වහපං, වහපං කියලා - [බාධා කිරීම්] වැදගත් විධියට කථා කරන්න. අපි පසු පෙළ මන්ත්‍රීවරු. අපට අවස්ථාව දුන්නාට පස්සේ, පසු පෙළට අවස්ථාවක් දුන්නාට පස්සේ අපට කථාව කරගෙන යන්න දෙන්න. විපක්ෂයේ සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාට කථා කරන්න කිව්වාම කථා කළේ නැහැ. අනෙකුත් මන්ත්‍රීවරුන්ට අවස්ථාව දුන්නා, ගත්තේ නැහැ. පසු පෙළ මන්ත්‍රීවරයෙකුට මේ වාගේ විවාදයකදී අවස්ථාවක් දුන්නාම ලක්ෂ්මන් කිරිඇල්ල වාගේ ජ්‍යෙෂ්ඨ නායකයන් නැඟිටලා ඒක නවත්වන්න හදන්න එපා. මේ රට ඉස්සරහට ගෙන යන්න තරුණයෝ ඕනෑ. මේ වාගේ වෙලාවක අපට කතා කරන්න දෙන විනාඩි දෙක නවත්වන්න හදන්න එපා. ඒ කාරණය මතක් කරන ගමන්, මේ අය වැයට සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.16]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද 2021 අය වැය විවාදයේ අවසාන දවස. ආණ්ඩු පක්ෂයේ බොහෝ දෙනා කෑ ගහලා කථා කළත්, මේ ආණ්ඩුවට කෝකටත් තෛලය හැටියට සිටින්නේ එකම එක ඇමතිවරයෙක් බව අපි දන්නවා. ඒ තමයි මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිවරයා. එතුමා කඩේ යනවා. එතුමා පිළිබඳව කියන්න කොතෙක් දේ තිබුණත්, අවසානයේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට වෙන්නේ මොකක්ද කියලා අපි දන්නවා. එතුමාගෙන් වැඩ අරගෙන, අද එතුමාට කෘෂිකර්ම අමාත්‍යාංශය භාර දීලා, අමුඩය ගස්සවලා තිබෙනවා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට දැන් අමුඩය ගස්වලා තිබෙන්නේ.

අද මේ ආණ්ඩුව ෆේල් කියලා කියන්නේ අපි නොවෙයි, මේ රටේ ජනාධිපතිතුමා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අන්තර් ජාතික දූෂණ විරෝධී දිනයේ ජනාධිපතිතුමාගේ පණිවුඩය හැටියට එතුමා කියනවා අපි දැක්කා, මේ රටේ හොරු අල්ලන්න ජනතාවට එකතු වෙන්න කියලා. එහෙම නම්, මේ රටේ හොරු කවුද කියලා ජනාධිපතිතුමාගෙන් අපි අහනවා. එතුමාගේ ආණ්ඩුවක් තියාගෙන, එතුමාගේ අමාත්‍ය මණ්ඩලයක් තියාගෙන, එතුමා රටේ ජනතාවට හොරු අල්ලන්න අඬගහනවා. එහෙම නම්, ෆේල් නැද්ද? අපි ආණ්ඩුව ෆේල් කියලා කියනකොට, ඒ ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා ඇතුළු සියලු අමාත්‍යාංශ ෆේල් කියලා ඊයේ ජනාධිපතිතුමා කියනවා. ඊට වඩා සාක්ෂි ඕනෑ නැහැ නේ. අපට තිබෙන දුක, අයියා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියන කාරණය ජනාධිපතිතුමා නොකියා කියන එකයි. අයියාත් එක්ක ඉන්න අමාත්‍ය මණ්ඩලය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා ඊයේ දූෂණ විරෝධී දිනයේ කිව්වේ නැද්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ගෝඨාභය මහත්මයා ඇවිල්ලා බල්ට් ගහලා, විසිල් ගහලා කථා කරනකොට, තමන්ගේ රූහේ එකා වුණත් හොරකම් කරනකොට අල්ලයි කියලා අපි හිතුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් කෙකර ගානවා. රට ආරක්ෂා කරන්න, හොරු එළවන්න කියලායි ආවේ. දැන් ලජ්ජා නැතුව රටේ ජනතාවට කියනවා, හොරු අල්ලන්න එන්න ලු. ජනාධිපතිතුමා කියනවා, මේ ආණ්ඩුවේ ඉන්නේ හොරු කියලා. ඊට වඩා කියන්න දෙයක් නැහැ නේ, මූලසුනේ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, තටමන්නේ?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තටමන්නේද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී එතුමන්ලා පැරදුණා. එතුමන්ලා කිව්වා, ස්වර්ණමය යුගයක් නැවත නිර්මාණය කරන්නට එතුමන්ලාට නැවත බලය දෙන්න කියලා. ගරු අගමැතිතුමනි, ඔබතුමන්ලා - මහින්ද රාජපක්ෂ මහත්මයා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා - නැවත ඇවිල්ලා රටේ විනාශය නවත්වන වැඩ පිළිවෙළක් හදයි කියලා පසුගිය කාලයේ මේ රටේ ජනතාව තුළ විශ්වාසයක් තිබුණා. ඔන්න හදන හැටි; ඔන්න හැදෙන හැටි!

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියනවා, මගේ සහෝදරයොත්, මේ ආණ්ඩුවත් සියලු දෙනා එකතුවෙලා වංචා දූෂණවලින් පිරිච්ච වැඩ පිළිවෙළක් කරනවා කියලා.

මම පෞද්ගලිකව කියන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ වාද විවාද කරන්න ඕනෑ, නිවැරදි තර්ක විතර්කත් එක්ක. හැබැයි පෞද්ගලික කෝන්තර, මඩ ගැහිලි තිබෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] ඒවා ඉප්පු කරන්න ඕනෑ. [බාධා කිරීම්]ඒ වැඩපිළිවෙළ කරන්න ඕනෑ. [බාධා කිරීම්]ඊයේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා නේ කිව්වේ. මම කිව්වේ, වෙන කවුරුවත් කිව්ව කථාවක් නොවෙයි නේ. ජනාධිපතිතුමා ම රටේ ජනතාවට කියනවා නම් හොරු අල්ලන්න එන්න කියලා . කවුද රටේ හොරු? විපක්ෂයේ අපිද හොරු? [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. AJITH RAJAPAKSE *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු සභාපතිතුමනි, අපි කියපු දෙයක් ගැන නොවෙයි මම මේ කියමින් සිටියේ. රටේ වර්තමාන ජනාධිපතිතුමා, මේ ආණ්ඩුවේ ප්‍රධානියා කියපු දෙයක් මම කිව්වේ. එතුමා ඊයේ කිව්වේ. අය වැය විවාදය අවසන් වෙන්න කලින්, අවුරුද්ද අවසන් වෙන්න කලින් තමන්ගේ ආණ්ඩුවේ ඉන්න හොරු අල්ලන්න ජනතාවට අඬ ගහපු එක ගැන තමයි මම කිව්වේ. ඉතින්, මේ රට ඉදිරියට යයිද? එතුමන්ලාට රට ඉදිරියට ගෙන යන්න පුළුවන්ද කියන අවිශ්වාසය අප තුළ තිබෙනවා.

අපි කුරුසයේ ඉන්නවාද, ඇණ ගැහුවාද කියන එක නොවෙයි තිබෙන ප්‍රශ්නය, ගරු සභාපතිතුමනි. පසුගිය දිනක හොඳට බීලා ගිහිල්ලා රුවන්වැලි සෑය භූමියට ඇතුළු වෙන ගේට්ටුවට පයින් ගහපු බෞද්ධයෝ තමයි මේ ආණ්ඩුවේ ඉන්නේ. මේවා කියන්න ලජ්ජයි, ගරු සභාපතිතුමනි. මේ ජනාධිපතිතුමා දිවුරුම් දුන්නේත් රුවන්වැලි සෑය අභියස නේ. [බාධා කිරීම්] අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දුන්නේ නුවර. [බාධා කිරීම්] දැන් අපට කියන්න එනවා, අපි ආගම්වලට ගරු කරනවා, අපි සියලු ආගම් ආරක්ෂා කරනවා කියලා. එහෙම කියලා ආපු මේ කණ්ඩායමට වඳින්න යන්න දුන්නේ නැති වුණාම ගේට්ටුවට පයින් ගහනවා, බලහත්කාරයෙන්. හොඳට බීලා තමයි එතැනට ගිහිල්ලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි. [බාධා කිරීම්] ඔන්න, එතුමන්ලාගේ වැඩ. ඔය ගමන වැඩිදුර යන්න බැහැ.

ගරු අගමැතිතුමනි, අපි මොන පක්ෂයේ හිටියත් එදා අපි ගමේ ඉන්නකොට ඔබතුමා පිළිබඳව ලොකු විශ්වාසයක් තිබුණා. අපි හිතුවා, ඔබතුමා මේ ගමන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදාවි කියලා. අද ඔබතුමා අසාර්ථක කර තිබෙන්නේ. ඔබතුමා අසාර්ථකයි කියන්නේ එක කුස උපන් ඔබේම බාල සහෝදරයායි, ගරු අග්‍රාමාත්‍යතුමනි. අපි තියපු ඒ විශ්වාසය රටේ අනාගතයට දෙන්න පුළුවන් ගමනක් නිර්මාණය වෙලා නැහැ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, රටේ ජනතාව ගැන නොසිතන, තමන්ගේ ගජ මිතුරන්ට, තමන්ගේ දේශපාලන හෙන්චයියන්ට සලකන දේශපාලන න්‍යාය පත්‍රයක් වර්තමාන ආණ්ඩුව නිර්මාණය කළා කියලා. මේක තමයි ඉදිරියේ තමුන්නාන්සේලාගේ ක්‍රියාදාමය. ඒකම තමයි ඔබතුමන්ලාගේ වැටීමේ ආරම්භය.

අවසාන වශයෙන්, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපේ සමහර මන්ත්‍රීවරුන් යම් යම් කාරණා දැනගෙන නොවෙයි කථා කළේ, ගරු සභාපතිතුමනි. අපි ප්‍රාදේශීය සභාවෙන්, නගර සභාවෙන් පාර්ලිමේන්තුවට ආවේ, ඒ ආයතන සියල්ල නිර්මාණය කරලා, හොඳට ගොඩනඟලායි. අපි විශ්වාස කළා, මේ රටේ ඉන්න දේශපාලන නායකයෝ, ඉහළ පෙළේ නායකයෝ මේ රටේ ඡන්දදායකයාගේ, පාක්ෂිකයාගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන්න කටයුතු කරයි කියලා, ගරු සභාපතිතුමනි. නමුත්, එහෙම දෙයක් වෙන්නේ නැහැ. මේ තත්ත්වය පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂයේත් තිබුණා. වර්තමානයේ මේ ආණ්ඩුවේත් තිබෙනවා. ඉතිහාසයේත් තිබුණා. අපේ විවේචන තිබෙන්න පුළුවන්. ඒ විවේචන තුළින් රටට හොඳ අනාගතයක් කරා යන්න පුළුවන් ගමන නිර්මාණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒකට හයිය දෙන්න අපි ඉන්නවා. අපි බලාපොරොත්තු වෙනවා, සමගි ජනබලවේගයේ නායකයා තුළිනුත් දේශපාලන ඩීල් නැති, දේශපාලන අතකොළුවලින් මේ රටේ ජනතාව පීඩනයට පත් නොකරන යහපත්, සාධාරණ වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න. ඒ විශ්වාසය අපට තිබෙනවා. මේ සියලු දේවල් නිවැරදි කරන්න අවශ්‍ය රාජ්‍ය යාන්ත්‍රණය නිර්මාණය කිරීමට සමගි ජනබලවේගයේ ඒ වැඩ පිළිවෙළ කඩිනමින් අපි නිර්මාණය කරනවා.

ගරු සභාපතිතුමනි, සමහර කතන්දර කියනකොට හොඳ පරිස්සමෙන් කියන්න ඕනෑ. එක් මන්ත්‍රීවරයකු පසුගිය දවස් කිහිපය තුළම නොදරුවකු වාගේ විවිධ මඩ, අවලාද නැගුවා. ඒ මන්ත්‍රීවරුන්ට මම කියනවා, හොඳට දැනගෙන ඒ අවලාද නඟන්න කියලා. අපි හොඳ අම්මාට තාත්තාට ජාතක වෙලා ඉපදිලා තිබෙන්නේ. සමහර කණ්ඩායම් ඉන්නවා, ඒ ජාතකයට එහා ගිය මහා ජඩ වැඩ කරනවා, ගරු සභාපතිතුමනි. අපි ඔවුන්ගෙන් ඉල්ලීමක් කරනවා. මඩවලින් නොවෙයි, සාධාරණ කාරණාවලින් අපි වාද විවාද කරමු; තර්ක විතර්ක කරමු. 2021 අය වැය පරාජය කිරීමේ කටයුත්ත අද සිදු නොවුණත්, ඉදිරි වර්ෂයේ අය වැය පරාජය කරලා මේ ආණ්ඩුවත් පරාජය කරන වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවාය කියන කාරණය මතක් කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ගරු ඇමතිතුමා, ඔබතුමා බයයි නේ, කථා කරන්න. පුදුම බයක් තිබෙන්නේ. කථා කරන්න නැඟිටිනවා, වාඩිවෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා නලින්ට බය වුණාට අපි බය නැහැ. අපි කාටවත් බය නැහැ.

[අ.භා. 4.25]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ஃபீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

හරි, හරි. තමුන්නාන්සේ වාඩිවෙන්න. කියන්න තිබෙන දේ මම කියන්නම්. තමුන්නාන්සේ සිංහයෙක් වාගේ කථා කරනවා. ඒ වුණාට තමුන්නාන්සේගේ වැඩ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේයි. ඒකයි ප්‍රශ්නය.

ගරු සභාපතිතුමනි, මුලින්ම මම මේ කාරණය කියන්න ඕනෑ. කොවිඩ් වසංගත තත්ත්වය නිසා මේ අවස්ථාව වන විට අපේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ, ඒ අහිංසක මිනිසුන්ගේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා. රටේ ආර්ථිකයට වඩා, අපේ ජනතාවගේ ආර්ථික තත්ත්වය අපට බලපානවා. මීගමුව කියන්නේ, මගේ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන ආසනයක්. ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමන්ලා අපට වඩා මේ ගැන උනන්දු වෙනවා. මගේ දිස්ත්‍රික්කයේ මට ඡන්දය දුන් 110,000ක ජනතාවගෙන් 8,000ක පිරිසක් මීගමුවේ ඉන්නවා. මේ දිනවල පවතින කොරෝනා වසංගතය ඒ ජනතාවට කෙළින්ම බලපා තිබෙනවා. මෙය, ධීවරයන් විශාල සංඛ්‍යාවක් සිටින ප්‍රදේශයක්. මාර්තු මාසයේ කොරෝනා ව්‍යසනය පටන් ගත්තාට පස්සේ, ධීවර කටයුතු සම්පූර්ණයෙන් කඩා වැටුණා. ඒ අයට තවමත් හරියට ඔළුව උස්සා ගන්න බැරිවයි ඉන්නේ.

ඊළඟට, සංචාරක ක්ෂේත්‍රය. ජා-ඇලෙන් එහා, මීගමුවේ සංචාරක ව්‍යාපාරය විශාල වශයෙන් කෙරෙනවා. [බාධා කිරීම්] මම මේ වැදගත් දෙයක් කියන්නේ. බයේ කෑගහන්න එපා. තමුන්නාන්සේලා දන්නවා, සංචාරක ව්‍යාපාරයේ වෙනස් වෙනස් අංග තිබෙන බව. නොයෙක්, නොයෙක් හෝටල් තිබෙනවා. සංචාරකයන් සමඟ යන guidesලා ඉන්නවා. කුඩා කඩ විශාල වශයෙන් තිබෙනවා. මේ සියලුදෙනාම දැන් අනාථ වෙලා ඉන්නේ. කන්න බොන්නවත් නැතිව ඒ සියලුදෙනා මේ දවස්වල ඉතාම දුෂ්කර ජීවිත ගත කරනවා.

විශාල පිරිසක් ගුවන්තොටුපළ ආශ්‍රිතව රැකියා කරනවා, ගම්පහ දිස්ත්‍රික්කයේම අය. මීගමුව, කටාන, මිනුවන්ගොඩ, ජා-ඇල යන මේ සියලු ප්‍රදේශවල අය ගුවන් තොටුපළ ආශ්‍රිතව රැකියා කරනවා. මේ කට්ටියත් ඉතා අසරණ තත්ත්වයක ඉන්නේ. අද ගුවන් තොටුපළ වහලා තිබෙන්නේ. අපට කොහොමත් යෝජනා කරන්න බැහැ, ඒක විවෘත කරන්න කියලා. මේ තත්ත්වය යටතේ ඒක අනිවාර්යයෙන්ම වහලා තියන්න ඕනෑ. නමුත් අපි තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ අය වෙනුවෙන් මොනවා හෝ කරන්න කියලා. මොනවාද කරන්නේ කියලා අපටත් හිතාගන්න බැහැ. නමුත් රජයක් හැටියට තමුන්නාන්සේලා ඒ ගැන හිතන්න.

මා ඉදිරියේ වාඩි වෙලා ඉන්නවා මගේ දිස්ත්‍රික්කයේ ඡන්ද 113,000ක් ලබා ගත්ත ගරු ඇමතිතුමා. එතුමාත් මේ ගැන දන්නවා. ඊළඟට, මැටි කර්මාන්තය භාර රාජ්‍ය ඇමතිවරයාත් සභාවේ ඉන්නවා. මම එතුමා හෑල්ලුවට ලක් කරනවා නොවෙයි. එය මගේ ආසනයේ තිබෙන ප්‍රබලම කර්මාන්තයක්. පිත්තල, මැටි, වේවැල් කියන කර්මාන්ත සියල්ල අද කඩා වැටී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ ආසනයේ තමයි පෑලියගොඩ මාළු මාර්කට් එක තිබෙන්නේ. පෑලියගොඩ මාළු මාර්කට් එක විශාල ප්‍රශ්නයක්; ඒක රටටම ප්‍රශ්නයක් වුණා. තවමත් ඒ ස්ථාන හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ, පෑලියගොඩ ප්‍රදේශයේ තමයි දුප්පත්ම ජනතාව ඉන්නේ. යන්තම් එදා වේල සොයාගෙන කන ජනතාවක් තමයි මේ ප්‍රදේශයේ ඉන්නේ. කුඩා නිවාසවල, අනවසර නිවාසවල ඒ අය ඉන්නේ. අපේ කැලණිය ආසනයේ සියයට 50ක් දෙනා ඉන්නේ අනවසර නිවාසවල. මේ ගොල්ලන් ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. මේ අය පසුගිය දවස්වල පොඩි උද්ඝෝෂණයක් කරනවා මම දැක්කා. එතැන ඉන්නේ මාර්කට් එකේ වැඩ කරන අය විතරක් විතරක් නොවෙයි. දෛනික රැකියාවල නිරත වෙන අය තමයි වැඩිපුරම කැලණිය ආසනයේ ඉන්නේ. මධ්‍යම පන්තියේ අය ගොඩක් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉන්නවා. දෛනික රැකියාවලින් ජීවත් වෙන අය සියයට 50ක් පමණ ඉන්නවා. මේ ගොල්ලන්ට සහනයක් ලබාදෙන්න, ගරු ඇමතිතුමනි.

අපි තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ගරු අගමැතිතුමනි, ඒ අයට සහනාධාරයක් දීම ගැන තමුන්නාන්සේලාට අනිවාර්යයෙන් කල්පනා කරන්න වෙනවා. මේ ජනතාවට මාස තුනක්, හතරක් රුපියල් 5,000 දුන්නත් ඒ මුදලින් ජීවත් වෙන්න බැහැ; දරුවන්ට කන්න දෙන්න බැහැ. ඒ සමහර පවුල්වල හත් අටදෙනා ඉන්නවා. ඒ නිසා තමුන්නාන්සේලා මේ සම්බන්ධයෙන් මොනවා හෝ කරන්න.

ඊළඟට, මට තවත් කාරණයක් කියන්න තිබෙනවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, තමුන්නාන්සේ මේකට නේ, බයේ හිටියේ. ඒ කාරණයට යන්න ඉස්සෙල්ලා, ගරු සරත් වීරසේකර ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම ඇමතිතුමාට මතක් කිරීමක් කරන්න ඕනෑ. කමාන්ඩෝ රෙජිමේන්තුවේ සෙබළු ගොඩක් මේ දවස්වල මට කෝල්ස් දුන්නා. තමුන්නාන්සේ එදා මම දිහා බලලා කිව්වා, -මට ඇඟිල්ල දිගු කළා- emotions නැති මිනිහෙක් යටතේ කමාන්ඩෝ හටයින් 300ක් එක තැනක ඝාතනය වුණා කියලා. තමුන්නාන්සේ කළ කථාව බලන්න. තමුන්නාන්සේට මම මතක් කර දෙන්න ඕනෑ. අපේ හමුදා ඉතිහාසයේ කමාන්ඩෝ හටයින් 100ක් නැති වුණා සාම්පූර්වලදී. ඒ, දෙවැනි ඊළාම් යුද්ධයේදී. ඊළඟට, තුන්වැනි ඊළාම් යුද්ධයේදී කමාන්ඩෝ හටයින් 150ක් නැති වුණා මාන්කුලමේදී. ඒ හැර, කමාන්ඩෝ හටයින් අතුගෑවිලා ගිය තැනක් මගේ යුද්ධයේදී තිබුණේ නැහැ. එක තැනකදී විතරයි ත්‍රස්තවාදීන් අපි පහර දෙන්න කලින් අපට පහර දුන්නේ. ඒ, යාලේදී විතරයි. එතැනදී හයදෙනෙක් මැරුණා. අනෙක් හැමතැනම අපි තමයි මුලින් පහර දුන්නේ. අපේ දහයක් මැරෙනකොට අපි ඒ ගොල්ලන්ගේ 20ක් මැරුවා. ආරක්ෂක කවුන්සලයේ දිගටම අපිත් එක්ක හිටපු නිසා අගමැතිතුමා මේවා දන්නවා.

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමනි, ඔබතුමා ඊයේ කථා කළා. ඔබතුමා කිව්වා, මෙතෙක් කල් මට ගරු කළා, මෙතැනින් එහාට ගරු කරන්නේ නැහැ කියලා. මම මෙතැන ඒ තරම් නරක වැඩක් කළේත් නැහැ. එහෙම නම් මම තමුන්නාන්සේටත් කියන්නට ඕනෑ, තමුන්නාන්සේ ගැන මගේ හිතේ තිබෙන රූපය දූෂිත එකක් එක. ඒ නිසා මම කවදාවත් තමුන්නාන්සේට ගරු කළේ නැහැ. තමුන්නාන්සේ ඊයේ වනතුරු මට ගරු කළා. ඒක නිසායි මම කිව්වේ. මම තමුන්නාන්සේට ගරු කළේ නැහැ.

තමුන්නාන්සේ මඩ ගසමින් මේ සභාවේ සිංහයෙක් වාගේ කෑ ගහනවා. දැන් නැඟිටලාත් තමුන්නාන්සේ ඒකමයි කරන්න යන්නේ. වටේටම මඩ ගහනවා, නමුත් කල්ක්‍රියාව බැලුවාම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේ. තමුන්නාන්සේ මට මඩ ගහයි, නමුත් මට කියන්න තිබෙන දේ මම තමුන්නාන්සේගේ මූණටම කිව්වා.

තමුන්නාන්සේ දූෂණය ගැන කථා කරනවා, නොරොච්චෝලේ වුණේ මොකක්ද කියන එක තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය දන්නවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය නොරොච්චෝලේ දෙන්න ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 175කට ස්විට්සර්ලන්තයට. ඉන් පසුව ඇමෙරිකානු ඩොලර් මිලියන 225කට චීනයට දුන්නා. ඒ අය ගෙනාවේ පරණ මැෂින්. චීනය පරණ මැෂින් ගෙනැල්ලා සවි කළා. ස්විට්සර්ලන්තය අලුත් මැෂින් ගෙනැල්ලා සවි කරන්නයි හිටියේ. තමුන්නාන්සේ ඒවාට ඕනෑ උත්තරයක් දී ගන්න. තමුන්නාන්සේගේ පැටිකිරිය ගැනයි මම පොඩ්ඩක් කියන්නේ. [බාධා කිරීම්] ඊළඟට, තමුන්නාන්සේ තව එකක් කිව්වා. [බාධා කිරීම්] මට කථා කරන්න දෙන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ තව එකක් කිව්වා, මගේ ෆීල්ඩ් මාර්ෂල් පට්ටම ගලවන්නට- [බාධා කිරීම්] මගේ ෆීල්ඩ් මාර්ෂල් පට්ටම ගලවලා වෙන කාටද දෙන්න ඕනෑ කිව්වා. ගරු අගමැතිතුමනි, මගේ ෆීල්ඩ් මාර්ෂල් පට්ටම ගලවන්නට පුළුවන් එක්කෙනයි ඉන්නේ. ඒ ගරු ජනාධිපති. ඒත් සාධාරණ හේතු මත පමණයි. [බාධා කිරීම්] මේ වාගේ පුද්ගලයකුට කෝප්‍රල් කෙනෙකුගේ පටි දෙකක්වත් ගලවන්නට බැහැ. කෝප්‍රල් කෙනෙකු තරම්වත් වටින්නේ නැති චරිතයක්. ෆීල්ඩ් මාර්ෂල් පට්ටම එහෙම ගලවන්නට බැහැ. ඒක ලේ, දහඩිය, කඳුළු හෙළලා ගත්තු එකක්. ඒවා ගත්ත හැටි තමුන්නාන්සේලා දන්නවා. [බාධා කිරීම්] මේ ගරු සභාවේ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා හිටියා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා මට ෆීල්ඩ් මාර්ෂල් පට්ටම ගන්න මාර්ගය පෑදුවාට. මොකද, එතුමා ඇවිල්ලා බොරු සාක්ෂි කියලා තමයි මගේ ජෙනරල් පට්ටම ගැලෙව්වේ. ජෙනරල් පට්ටම ගැලෙව්වේ නැත්නම් මම කවදාවත් ෆීල්ඩ් මාර්ෂල් කෙනෙක් වෙන්නේ නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේ දැන ගන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ රටට මොනවාද කරලා තිබෙන්නේ? අපි මොනවාද කරලා තිබෙන්නේ? අපි තමුන්නාන්සේලාට මඩ ගහලා දේශපාලනය කරන්නේ නැහැ. අපි හිතට එකඟවයි දේශපාලනය කරන්නේ. [බාධා කිරීම්] තමුන්නාන්සේ කිව්ව කතා නිසායි මම මේ ටික කිව්වේ. තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] හමුදාවට බඩු බෙදුවා. [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කථා කරන්නේ නැද්ද? [බාධා කිරීම්]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ආණ්ඩු පක්ෂයට අවස්ථාව දීලා මට අවස්ථාව දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ආණ්ඩු පක්ෂයේ කථා කරන්න කවුරුත් නැහැ. ඒ පැත්තේ ඉන්නේ ගරු අගමැතිතුමා විතරයි. [බාධා කිරීම්] ආ, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ඉන්නවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාට කථා කරන්න කියන්න. ගරු සභාපතිතුමනි, සම්ප්‍රදාය තමයි මේ පැත්තෙන් කථා කළාම ආණ්ඩු පක්ෂයෙන් කවුරුත් හෝ කථා කරන එක. ආණ්ඩු පක්ෂයේ ඊළඟ කථිකයා ඉන්නවා. එතුමාට කථා කරන්නට කියන්න. මම තවම ලෑස්ති නැහැ. එතුමාගේ කථාවෙන් පසුව මම කථා කරන්නම්. සම්ප්‍රදායක් තිබෙනවා නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කථා කරනවාද? [බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේ ඉන්නේ අවසානයට කථා කරන අපේ කථිකයා. දැන් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා සම්ප්‍රදායක් ගැන කියනවා. දවල් එක දිගට ආණ්ඩු පක්ෂයේ අයටත් කථා දුන්නා. ඉතින්, ඒ තමයි තිබෙන සම්ප්‍රදාය. [බාධා කිරීම්] ඇයි භය? ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා, ඇයි භය? [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා කරන්නේ ස්තුති කථාව. මොනවාද මේ කියන්නේ? [බාධා කිරීම්] ඒක තමයි සම්ප්‍රදාය? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි භය? [බාධා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු සභාපතිතුමනි, මේ භය නොවෙයි, ඇත්තටම පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව පිළිතුරු කථාව ගරු අගමැතිතුමා විසින් කරන්න ඕනෑ, ගරු අග්‍රාමාත්‍යතුමා පිළිතුරු කථාව කරයි. අවසාන කථාව -පිළිතුරු කතාව- ගරු අගමැතිතුමා කරනවා නම් අපේ කථාව අපි කරන්නම්. ඒකේ ගැටලුවක් නැහැ. නමුත්, ආණ්ඩු පක්ෂයෙන් කථා දෙකක් තිබියදී විපක්ෂයෙන් කථා කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, ඒකයි අපි කියන්නේ. ගරු අගමැතිතුමාත් කථා කරනවා. ඒ වාගේම තවත් කථාවක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, මේ පැත්තෙන් එක කථාවයි තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයට තව කථා දෙකක් තිබෙනවා. ඒ නිසා මුලින් ආණ්ඩු පක්ෂයට දීලා, ඊළඟට අපට දීලා, අන්තිමට ගරු අගමැතිතුමට දෙන්න. That is the order. [බාධා කිරීම්]

[අ.භා. 4.36]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)
ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේලා දන්නවානේ මහින්දානන්ද භයත් නැහැ, ණයත් නැහැ. [බාධා කිරීම්] එහෙම තමයි ඔබතුමන්ලා හිතාගෙන ඉන්නේ. [බාධා කිරීම්] පසු ගිය අවුරුදු පහේ ඊට වැඩිය ලොක්කෝත් හම්බ වුණා. හිර ගෙවල්වල දාලාත් අපි හිටියා.

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා නොවැම්බර් මාසයේ 16වැනි දා එතුමාගේ ජයග්‍රහණයෙන් පස්සේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මංගල අය වැය මෙයයි. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රටේ කොවිඩ් - 19 වසංගත තත්ත්වයක් තිබෙන වෙලාවේ ඔබතුමා අය වැය සඳහා පාර්ලිමේන්තුව කැඳවනකොට ඔබතුමාට විවිධ චෝදනා එල්ල කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කැඳෙව්වොත් කොවිඩ් - 19 වයිරසය ආසාදනය වෙයි, සේවකයන්ට කරදර වෙයි කියලා ඔබතුමාට චෝදනා කළා. ඔබතුමා පාර්ලිමේන්තුවේ සේවකයන් 800ක් පමණ, මන්ත්‍රීවරු 225ක් ගෙනැල්ලා, මහ ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට කිසිදු ප්‍රශ්නයක්, අභියෝගයක් ඇති නොවන ආකාරයට මෙවර අය වැය විවාදය අවසන් කරන්න කටයුතු කළා. ඒ පිළිබඳව මුලින්ම අපි මහ ලේකම්තුමාට, ඔබතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. කිසිදු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හෝ මන්ත්‍රීවරියකට කරදරයක් නැතුව නිරෝධායන නීති භාවිත කරමින් ඔබතුමා මේ කරපු ශ්‍රේෂ්ඨ කාර්යභාරය පිළිබඳව අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මුදල් ඇමතිවරයා හැටියට අය වැය ඉදිරිපත් කළා. දින 21ක් මෙවර අය වැය පිළිබඳ කරලා, අවසාන දිනය තමයි අද අපි ගත කරන්නේ.

මගේ කථාවට කලින් ෆීල්ඩ් මාර්ෂල් ගරු ෆොන්සේකා මැතිතුමාට මම උත්තරයක් දෙන්න ඕනෑ. එතුමා කිව්වා, මහින්දානන්ද අලුත්ගමගේ පසුගිය කාලය පුරාම මඩ ගැහුවා කියලා. මට ඔබතුමන්ලාගෙන් කවුරු හෝ එක් කෙනෙක් කියන්න, මම ඔබතුමන්ලා කවුරු හෝ කෙනෙකුගේ පෞද්ගලිකත්වය ගැන කථා කරලා මඩක් ගැහුවාද කියලා. [බාධා කිරීම්] ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඔළුව නැමුවා. ඔබතුමා තමයි කිව්වේ, පසුගිය කාලයේ මේ රට පාලනය කළේ මෛත්‍රීපාල මැතිතුමායි, රනිලුයි විතරයි කියලා. [බාධා කිරීම්] මම ඔබතුමාගෙන් ඇහුවේ ඔබතුමා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු හැටියට ඒ කැබිනට් මණ්ඩලයේ රනිල්ලාගේ පාලනයට විරුද්ධව කථා කරන්න ඔබතුමාට කොන්දක් තිබුණේ නැද්ද කියලායි. තමුන්නාන්සේ වේලුපිල්ලේ ප්‍රභාකරන්ටත් ගහපු ජනරාල්. එහෙම ජනරාල් කෙනෙකුට රනිල් වික්‍රමසිංහ මහත්තයා පාලනය කර ගන්න බැරි නම් - [බාධා කිරීමක්] ඒ ගැනයි මම ඔබතුමාත් එක්ක කථා කළේ. [බාධා කිරීම්] එයින් එහාට මම කාගේවත් නමක් කිව්වේ නැහැ. ගරු සභාපතිතුමනි, එම නිසා - [බාධා කිරීම්] අපි ඔබතුමාට කියන්න ඕනෑ- [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, මම කාගේවත් නම කිව්වේ නැහැ. එම නිසා කලබල වෙන්න ඕනෑ නැහැ. [බාධා කිරීම්] අහගන්න කෝ. ගරු සභාපතිතුමනි, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා මහින්දානන්දට දූෂිතයෙක් කියලා බැන්නා. ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට කියනවා, මගේ දූෂණ ගැන කථා කරන්න තමුන්නාන්සේ ඕනෑ දවසක මා එක්ක රූපවාහිනී විවාදයකට එන්න කියලා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මහින්දානන්දගේ වත්කම් බැරකම් ප්‍රකාශය ඔබතුමා අතට ගන්න, ඔබතුමා ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගිහිල්ලා මහින්දානන්දගේ ආදායම් බදු file එක අතට ගන්න. මහින්දානන්ද අලුත්ගමගේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන වත්කම් බැරකම් ප්‍රකාශයෙන් එහාට වැලි ඇටයක්, නූල් පොටක්, ශත පහක දෙයක් තමුන්නාන්සේලාගේ කාලයේ හොයාගෙන තිබෙනවා නම් තමුන්නාන්සේ මට කියන්න. තමුන්නාන්සේලා මට නඩු දෙකක් දාලා තිබෙනවා. [බාධා කිරීම්] එකක් තමයි, වෘත්තීය සමිතියකින් ලක්ෂ 14ක ණයක් ගත්තාය කියන එක. ඊළඟට මට නඩුවක් දාලා තිබෙනවා, කැරම් බෝඩ් ගෙනාවා කියලා. තමුන්නාන්සේලා අවුරුදු 5ක් මහින්දානන්ද හිරේ යවන්න නඩු කොච්චර හෙව්වාද? ඒකට පිට්ටනි මැන්නා; හැම තැනම ගියා. තමුන්නාන්සේලාට එක නඩුවක් හොයා ගන්න බැරි වුණා. මහින්දානන්ද දූෂිතයෙක් කියලා තමුන්නාන්සේලාට කියන්න පුළුවන්. මොකද, තමුන්නාන්සේලාට මහින්දානන්ද කන පැළෙන්න ගහන නිසා; තමුන්නාන්සේලාට බඩ පිරෙන්න දෙන නිසා; තමුන්නාන්සේලාගේ හිටපු අගමැතිට මහ බැංකුව කොල්ල කාපු හොරා කියලා පාර්ලිමේන්තුවේ කෙළින් කියපු නිසා - [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඇමතිවරු 14දෙනෙකු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගෙන ගොස් රෙදි ගලවපු නිසා තමුන්නාන්සේලාට මහින්දානන්ද දූෂිතයෙකු වුණා. අපි "Top Ten" නඩු දානකොට තමුන්නාන්සේලා අපට කිව්වා, අපට නඩු දානවා කියලා. දැම්මාද නඩු? එම නිසා අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, මහින්දානන්දලා තමුන්නාන්සේලාගේ හොරකම් හෙළි කරපු නිසා,

මහින්දානන්දලා නුගේගොඩ හයිඩ් පාර්ක් එකේ රැස්වීම් තියලා ආණ්ඩුවට විරුද්ධව හිට ගත්ත නිසා, මහින්දානන්දලා මහනුවර ඉඳලා කොළඹට පයින් ඇවිල්ලා ඒ ආණ්ඩුව දෙදරවපු නිසා, රනිල් වික්‍රමසිංහගේ බැඳුම්කර කොල්ලය එළියට දාලා ඇමතිවරුන්ගේ රෙදි ගලවපු නිසා මහින්දානන්දලා තමුන්නාන්සේලාට දුෂිතයන් වුණා. හැබැයි, ඔබතුමන්ලා අවුරුදු 5ක් ආණ්ඩු කරලා, නඩුකාරයන්ට කථා කරලා, නීතිපති ගෙනැල්ලා, අවසානයේ උත්තරය වුණේ වෘත්තීය සමිතියකින් ලක්ෂ 14ක ණයක් ගත්තා කියලා ගිහිල්ලා නඩුවක් දමපු එක. හැබැයි අපි හිටපු හමුදාපතිතුමාට කියනවා, මගේ පුතා හමුදාවට බඩු supply කළේ නැහැ කියලා. ගරු සභාපතිතුමනි, මේ ලංකාවේ හිටපු හමුදාපතිවරු අතරින් - [බාධා කිරීම්] හමුදාවට බඩු supply කරපු එකම හමුදාපති අපේ පාර්ලිමේන්තුවේ ඉන්න හමුදාපතියි.

අපේ දරුවෝ හමුදාවට බඩු supply කළේ නැහැ. තමුන්ගේ දුවගේ මහත්තයා, ඒ කියන්නේ බෑනා-[බාධා කිරීම්] හරි, ඒ කියන කෙනාට පුත්තු නැහැ. සමාවෙන්න, එය අයින් කර ගන්නවා. තමන්ගේ දුවගේ මහත්තයා. මට මතක නැහැ, ඇමෙරිකානු කොම්පැනිය මොකක්ද කියලා. ඔබතුමන්ලාට මතකයි. ඇයි, තමුන්නාන්සේලාට එහෙම වුණේ? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
"හයිකෝප්" සමාගම.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
"හයිකෝප්" කියන සමාගමේ බෑනා හිටියේ. බෑනාගේ සමාගමෙන් හමුදාවට රෙදි සැපයුවා. හමුදාවට රෙදි සපයලා ඒ සියලු කටයුතු කළා. හැබැයි, අපි එහෙම කළේ නැහැ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට ඉදිරිපත් කළා, මා හිරේ දැමූ යුද්ධාධිකරණයේ වාර්තාව. ඒ වාර්තාවේ කියනවා, මම වංචාවක් කරලා නැහැ, වංචා කිරීමට බලාපොරොත්තුවක් තිබිලාත් නැහැ, රජයට පාඩුවක් වෙලාත් නැහැ කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
That is enough.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කිව්වේ නැහැ, කොයි හමුදාපතිතුමාද කියලා. හැබැයි, එක හමුදාපති කෙනකු නැඟිටලා කියනවා, "මගේ බෑනා රෙදි ගෙනාවා. හැබැයි, රජයට පාඩුවක් වෙලා නැහැ" කියලා. තොප්පිය හරි නම් ඔබතුමා දමා ගන්න. ආප්පේ හරියට පිච්චුණේ නැති වුණාම ආප්ප හදපු කොල්ලාගේ කනට ගහලා එලෙව්වේ නැහැ අපි. ආප්පේ හරියට කර වෙලා නැත්නම් ආප්ප ගෙනාපු කොල්ලාගේ කනට ගැහුවේ නැහැ අපි. ඔබතුමන්ලා අපට එක ඇඟිල්ලක් දිගු කරන කොට ඇඟිලි තුනක් ඔබතුමන්ලාගේ පැත්තට නැමෙන බව මතක තියා ගන්න ඕනෑ. මම ඔබතුමාට දොස් කිව්වේ නැහැ. ඔබතුමා කලබල වෙන්න ඕනෑ නැහැ. වේලුපිල්ලේ ප්‍රභාකරන් ඝාතනය කළ හිටපු හමුදාපති රනිල්ට හයයි කියලා අපි හිතුවේ නැහැ. අපි හිතුවේ සෙන්පතියකු විධියට ඔබතුමා ශ්‍රේෂ්ඨ වීරයෙක් කියලායි. බැලුවාම අපේ ග්‍රාම ආරක්ෂක බළකායට හයිය දුන්නු සරත් වීරසේකර මහත්තයා ඊට වැඩිය වීරයෙක්. එතුමා මායිම් ගම්මාන රැක්කා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්තයා වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ- [බාධා කිරීම්] මට මේක කිව්වේ ඔබතුමා. ඔබතුමා තමයි කිව්වේ පසුගිය අවුරුදු පහේ මේ රට කඩා වැටුණේ රනිලුයි, මෛත්‍රීයි හින්දා කියලා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
ඔව්, ඇත්ත තමයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙනම් තමුන්නාන්සේ කැබිනට් එකේ හිටියේ නිදියා ගෙනද? ඇස් දෙක වහ ගෙනද හිටියේ? තමුන්නාන්සේ කැබිනට් එකට ගියේ නැද්ද? මේවා කැබිනට් එකේ සාමූහික තීන්දු නොවෙයිද? [බාධා කිරීම්]ගරු මන්ත්‍රීතුමනි, මේක හමුදාව නොවෙයි; පාර්ලිමේන්තුව. තමුන්නාන්සේගේ ආවේගය, වේදනාව මට තේරෙනවා. තමුන්නාන්සේට රනිල් වික්‍රමසිංහ මහත්තයා දුන්නු ඇමතිකම මොකක්ද? තමුන්නාන්සේට දුන්නේ වනජීවී ඇමතිකම. ඔබතුමා බලාපොරොත්තු වුණා, ආරක්ෂක ඇමතිකම. අන්තිමට තමුන්නාන්සේට දුන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත ප්‍රතිපාදන ටික බෙදන්න. මම තවත් ඔබතුමා අවුස්සන්නේ නැහැ. මොකක් හරි වෙලා "හූටස්" ගාලා නැවතුණොත් ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා මම ඔබතුමා තවත් අපහසුතාවට පත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, මම නැවතත් ඔබතුමාට අභියෝග කරලා කියනවා, ඕනෑ වෙලාවක ඇවිල්ලා ඒ ගැන කථා කරන්න. තමුන්නාන්සේ නොරොච්චෝලේ ගැන කථා කරනවා මම අහගෙන හිටියා. තමුන්නාන්සේ කියනවා, "නොරොච්චෝලේ වාගේ බලාගාරයක් හදන්න මහින්දානන්දට පුළුවන් නම් මහින්දානන්ද ලොකු වැඩ කාරයෙක්" කියලා. ඒ වාගේ ව්‍යාපෘති කරන්න මහින්දානන්දට පුළුවන් නම්, -නොරොච්චෝලේ හදනකොට මහින්දානන්ද විදුලිබල නියෝජ්‍ය ඇමති- රටේ මහා භාණ්ඩාගාරය පිළිබඳ තීන්දු තීරණ ගන්න පුළුවන් නම් අපිත් හොඳ මිනිස්සු. [බාධා කිරීම්] මම දැක්කා, තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා ෆොන්සේකා මන්ත්‍රීතුමාට මොකක්දෝ පොඩි කථාවක් කිව්වා. හැබැයි, තිස්ස අත්තානායක මහත්තයෝ, ඔබතුමා හිරේ දමන කොට මේ ගොල්ලන් කවුරුත් ඔබතුමා වෙනුවෙන් කථා කළේ නැහැ. ඔබතුමාට විරුද්ධව බොරු නඩු දාලා ඔබතුමා හිරේ දමන කොට ඔය පේළියේ ඉන්න කවුරුත් තමුන්නාන්සේ වෙනුවෙන් කථා කළේ නැහැ. තමුන්නාන්සේ වෙනුවෙන් එදා හිටියේ අපි විතරයි. අපි තමයි ඔබතුමා බලන්න ආවේ. අපි තමයි ඔබ රැක්කේ. තමුන්නාන්සේ අද ඔතැන හිටියාට, ඔය පක්ෂය තමන්ගේ මහලේකම් හිරේ දමාපු පක්ෂය. ඔබතුමා අයින් කරලා කබීර් හෂීම් මන්ත්‍රීතුමා පත් කළා. එතුමාට මොකද කළේ? අහන්න, එතුමාට කරපු අසාධාරණය ගැන. එතුමාට ඇමතිකමේ වැඩ කරන්න දුන්නාද? ඒ කැබිනට් පත්‍රිකා දැම්මේ මලික් සමරවික්‍රම. අහන්න කබීර් හෂීම් මන්ත්‍රීතුමාගෙන් airplanes ගෙන්වන කැබිනට් පත්‍රිකාව දැම්මේ කවුද කියලා. ඒක දැම්මේ මලික් සමරවික්‍රම. අන්තිමට මෛත්‍රීපාල හිටපු ජනාධිපතිවරයා තමයි කිව්වේ, විෂයභාර ඇමතිට පමණයි කැබිනට් පත්‍රිකාව දමන්න පුළුවන් කියලා. පක්ෂයේ මහලේකම්ලාගෙන් එක් කෙනෙක් හිරේ දැම්මා; අනෙක් කෙනාගේ අත පය බැන්දා. කිසි වැඩක් කරන්න දුන්නේ නැහැ. එතුමා මහාමාර්ග ඇමතිකම බලාපොරොත්තුවෙන් හිටියා. ඒක කිරිඇල්ල මන්ත්‍රීතුමාට දුන්නා. අන්තිමට පාකිස්තානයට ගිහිල්ලා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

එන්නේ නැතිව හැංගිලා හිටියා. කලකිරිලා, එපා වෙලා පාකිස්තානයේ හිටියේ. අන්තිමට අපි තමයි පකිස් පෙට්ටියෙන් ගෙනැල්ලා එතුමාට මෙහේ ඇමතිකම දුන්නේ. හැබැයි, ඒ දීලාත් එතුමාට වැඩක් කරන්න බැරි වුණා. එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා හැටියට එතුමාට කිසිම දෙයක් කර ගන්න බැරි වුණා.

අපට මතකයි, ඒ දවස්වල අපි විපක්ෂයේ ඉඳගෙන SriLankan Airlines එකට ගහනකොට කබීර් හෂීම් ඇමතිතුමා මේසයට ගහනවා. තමන්ගේ අමාත්‍යාංශයේ හොරකම් ගැන කථා කරනකොට විෂය භාර අමාත්‍යතුමා මේසයට තට්ටු දානවා. අපි COPE එකට යනකොට අපට තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ files එව්වේ කවුද? තමුන්නාන්සේලාගේම ලේකම්වරු. ඔබතුමන්ලාගේම ලේකම්වරු තමයි අපට files එව්වේ. ඇමතිවරු අපට රෑට කථා කරලා කියනවා, "ඔන්න file එක එනවා, මේක අදින්න, මේක දාන්න" කියලා. එහෙම නැත්නම් අපට කොහෙන්ද කැබිනට් තොරතුරු? ඇතුළේ හිටපු තමුන්නාන්සේලාගේම අය තමයි අපට ඒ තොරතුරු දුන්නේ. ඔබතුමන්ලා අද මොනවාද කථා කළේ? මගේ මිත්‍රයා, ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අද ලොකුවට කථා කරලා, කෑ ගහලා අවසානයේ මොනවාද කිව්වේ? මේ අය වැයේ පරාජය ගැනයි තමුන්නාන්සේලා කථා කරන්නේ. මේ දවස් 21 තුළ විපක්ෂයේ ඔබතුමන්ලා මොනවාද කථා කළේ? විපක්ෂය මේ දවස් 21ක් තුළ කථා කරපු කරුණු සංක්ෂිප්තයක් හැටියට ගන්න. තමුන්නාන්සේලා පළමුවැනි සතියේ "බුරවි" සුළි කුණාටුව ගැන කථා කළා. සතියක් "බුරවි"ට ගැහුවා. තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ "බුරවි" කුණාටුව ගැන කථා කළා; ඊළඟට, තමුන්නාන්සේලා ධම්මික මහත්මයාගේ පැණිය ගැන කථා කළා; ඊළඟට තමුන්නාන්සේලා මහර හිර ගෙදර ගැන කථා කළා. තමුන්නාන්සේලා දවස් 21ක් පැණියටයි, බුරවිටයි, මහරටයි හිරවෙලා හිටියේට. ජනතාවට සහන දෙන්න තිබෙන අය වැයක් වෙනුවට තමුන්නාන්සේලා කථා කළේ "බුරවි" සුළි කුණාටුව ගැනයි; වෙද මහත්මයාගේ පැණි බෝතලය ගැනයි. මේවාද, මේ රටේ මිනිසුන්ට තිබෙන ප්‍රශ්න? අද ඒ තරමටම විපක්ෂය බංකොලොත් වෙලා තිබෙනවා.

ඔබතුමන්ලා ඇහුවා, මේ අය වැයෙන් ආණ්ඩුව ලබා දුන් සහන මොනවාද කියලා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා දැන් මෙම ගරු සභා ගැබේ නැහැ; ගිහිල්ලා. එතුමා කථා කරනකොට ඇහුවා, මේ අය වැයෙන් මිනිසුන්ට මොනවාද දුන්නේ කියලා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා, වෙන දා අය වැයෙන් දෙන සහන මොනවාද කියලා දැනගන්න පත්තරේ බලාගෙන ඉන්නවා කියලා. තමුන්නාන්සේ බලන්න, මේ අය වැයෙන් දීලා තිබෙන සහන. තමුන්නාන්සේලා කපපු පොහොර සහනාධාරය අපි දුන්නා. තමුන්නාන්සේලා බලන්න, අපි මාර්ග කිලෝමීටර් ලක්ෂයක් කාපට් කරනවා. තමුන්නාන්සේලාගේ අවුරුදු 5ට කිලෝමීටර් 1,000ක් කාපට් කළාද කියලා බලන්න. ගරු කබීර් හෂීම් මැතිතුමා, හිටපු මහාමාර්ග ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභා ගැබේ ඉන්නවා. වරකාපොළ highway එක දාගන්න ඔබතුමා කොච්චර උනන්දු වුණාද? තමුන්නාන්සේ කොච්චර සටන් කළාද? තමුන්නාන්සේට ආණ්ඩුවෙන් උත්තරයක් දුන්නාද? ඔබතුමා ඒ දිස්ත්‍රික්කයේ නායකයා; පක්ෂයේ මහ ලේකම්වරයා. තමුන්නාන්සේට ඒක කරන්න හයිය දුන්නේ නැහැ. හැබැයි, අද කිලෝමීටර් ලක්ෂයක් කාපට් කරන්න, හැම ගමකටම කාපට් පාරක් දෙන්න මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. ඒවා සහන නොවෙයිද? හැම කෙනෙකුගේම ගෙදරකට වතුර ටික දෙන්න ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් රුපියල් බිලියන 200 ගණනක් වෙන් කරලා තිබෙනවා. පාරවල් හදන්න රුපියල් බිලියන 300ක් වෙන් කර තිබෙනවා. මේවා ජනතාවට දෙන සහන නොවෙයිද කියලා අපි ඔබතුමාගෙන් අහනවා.

ඒ විතරක් නොවෙයි, හැම වසමකටම නිවාස ඉදි කරන්නත් කටයුතු කරනවා. තමුන්නාන්සේලාගේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා උළු බෙදුවා; අරවා බෙදුවා; මේවා බෙදුවා. ඒ වාගේම "උස නම් security, කොට නම් තව මොනවද" කිව්වා. අපි අහනවා, තමුන්නාන්සේලාගේ අවුරුදු පහක පාලන කාලය තුළ ගෙවල් කීයක් හැදුවාද කියලා. අපේ අගමැතිතුමා මේ අවුරුද්දට ගෙවල් 14,193ක් සම්පූර්ණයෙන් හදලා ඉවරයි. අපි හැම වසමකටම ගෙයක් හැදුවා. ඒ නිසා අපි මිනිස්සු වෙනුවෙන් ඕනෑ තරම් වැඩ කරලා තිබනවා.

ඒ විතරක් නොවෙයි, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට රැකියා ලක්ෂයක් ලබා දුන්නා. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) අසමත්, 8 ශ්‍රේණිය දක්වා පාසල් ගිය දරුවන්ට රැකියා ලබාදෙන වැඩ පිළිවෙළක් හැදුවා. අපි තමුන්නාන්සේලාට කියනවා, උපාධිධාරීන් 68,000කට රැකියා දුන්න බව. වෙන මොකුත් ඕනෑ නැහැ.

දැන් තමුන්නාන්සේලා "Antigen" ගැන කියනවා. තමුන්නාන්සේලා බලන්නේ, ගෝඨාභය මහත්මයාට ගැහුවාම ආණ්ඩුව වැටෙයි කියලා. එක්කෙනෙක් කිව්වා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනාගේම නම් ටිකවත් දන්නේ නැහැ කියලා. අපේ නම් නොදන්නවා වුණාට, "Top Ten" අයගේ නම් ටික නම් එතුමා හොඳට දන්නවා. එතුමා මේ පාර්ලිමේන්තුවේ ඕනෑම කෙනෙකුගේ නම් දන්නවා. ඔබතුමන්ලා ජනාධිපතිවරයාට පහර ගහන්න, අගමැතිවරයාට පහර ගහන්න උත්සාහ කරනවා. මේ රටේ අවුරුදු 30ක් තිබුණු යුද්ධය අවසන් කරලා, මේ රටට සාමය ගෙනැල්ලා, අපට නිදහසේ ජීවත් වීමේ අයිතිය ලබා දුන් නායකයා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන එක තමුන්නාන්සේලා අමතක කරන්න එපා. එතුමාගේ කාලයේ තමයි මේ රටේ වැඩ කළේ, එතුමාගේ කාලයේ තමයි මේ රටේ ආර්ථිකය හැදුණේ, එතුමාගේ කාලයේ තමයි මේ රටේ සංචාරක ව්‍යාපාරය හැදුණේ. ඒ නායකයාගේ කාලයේ තමයි ඒ සියලු වැඩ කටයුතු සිදු වුණේ.

ඊළඟට, වත්මන් ජනාධිපතිවරයා ගැන තමුන්නාන්සේලා විවිධ චෝදනා සහ විවේචන එල්ල කළා. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය යටතේ 2019 දී වැය කළ මුදල සහ 2020 වැය කළ මුදල තමුන්නාන්සේලා ගණන් හදලා බලන්න. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පමණක් රුපියල් බිලියන 1.8ක saving එකක් කරලා තිබෙනවා. රුපියල් බිලියන1.8ක saving එකක්! මේ රටේ ජනතාව වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විතරක් රුපියල් බිලියන 1.8ක් ඉතුරු කරලා තිබෙනවාය කියන එක අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකය ගැන කථා කරනවා. ඔබතුමන්ලා හිතනවා, මේ ආණ්ඩුව අසාර්ථකයි කියලා. මේ ආණ්ඩුවට ගහලා, මේ ආණ්ඩුව වැටෙයි කියලා තමුන්නාන්සේලා උඩ බලාගෙන ඉන්නවා. පන්දම් අල්ලාගෙන හිටියාම, පෙළපාළි ගියාම, 20වැනි දා බදුල්ලේ ගිහිල්ලා ප්‍රතිසංවිධාන කටයුතු කළාම තමුන්නාන්සේලා හිතනවා තමුන්නාන්සේලාට ආණ්ඩුව අල්ලන්න පුළුවන් වෙයි කියලා. ඔබතුමන්ලා හොඳට මතක තබාගන්න, මේ රටේ මිනිස්සු මැරිලා ඉපදිලා නැහැ කියලා. මේ රටේ මිනිසුන්ට හොඳට මතකයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ එක්සත් ජාතික පක්ෂ පාලනය. අද ඔබතුමන්ලා "සජබ"

කියාගෙන ඉන්නවා. හැබැයි, බෝතලයේ තිබෙන්නේ පරණ වයින් ටිකමයි. අලුතින් වයින් ඇවිල්ලා නැහැ. ඒකේත් මේ "සෙට්" එකම තමයි ඉන්නේ. පසුගිය ජනාධිපතිවරණයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක හිටපු අන්තවාදීන්, ත්‍රස්තවාදීන් සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කණ්ඩායමේත් ඉන්නවා. මේකේ වෙනසක් නැහැ. ඔබතුමන්ලා 2015 වර්ෂයේදී බලයට පත් වුණේ මොනවා කියලාද? [බාධා කිරීමක්] ෆොන්සේකා මහත්මයා කියනවා, දූෂිතයෝ- [බාධා කිරීමක්] අපි ඔබතුමාගෙන් අහනවා, 2015 වර්ෂයේ ඔබතුමන්ලා වේදිකාවට නැඟලා බලය ගත්තේ මොනවා කියලාද කියලා? හොරකම නවත්වනවා, දූෂණය නවත්වනවා කියලායි ඔබතුමන්ලා බලය ගත්තේ. තමුන්නාන්සේලා 2015 ජනවාරි 08වැනි දා ඡන්දය දිනලා පෙබරවාරි මාසයේ මහ බැංකුව කොල්ල කෑවා. තමුන්නාන්සේලා කාට හෝ කියන්න පුළුවන්ද, "ඒක එහෙම නොවෙයි" කියලා. මහ බැංකුවේ සල්ලි ගත්තේ නැති කෙනෙකු ඉන්නවා නම් අත ඔසවලා කියන්න, "සල්ලි ගත්තේ නැහැ" කියලා. ගරු සභාපතිතුමනි, 2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ සියලු අපේක්ෂකයන්ට සල්ලි දුන්නා. ඒ ඔක්කොම ඇලෝසියස්ගේ සල්ලි; ඇලෝසියස්ගේ අරක්කු. ඒවා අරගෙන ඡන්ද කරලා තමුන්නාන්සේලා දූෂණ ගැන කථා කරනවා. ඒ විතරක් නොවෙයි, ඒ වෙච්ච වංචාව නිසා එක රැයට පොලී අනුපාතය සියයට තුනකින් ඉහළ ගියා. අද වන කොට එහි ආවස්ථික පාඩුව ගත්තොත්, බිලියන 1,000කට වැඩියි. තවම බැඳුම්කර වංචාවේ පාඩුව ගණනය කරලා නැහැ. ඒක හිතාගන්න බැහැ. ඒක එච්චර විශාල වංචාවක්, එච්චර පාඩුවක්. ඒ කාලයේ හිටපු මුදල් රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකතුමා; අපේ මිත්‍රයා. එතුමන්ලා තමයි ඒ කාලයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට උපදෙස් දුන්නේ. ඒ බැඳුම්කර වංචාවේ සිදු වෙච්ච පාඩුව තවම ගණනය කරගන්න බැහැ. ඒ වංචාව නිසා එක රැයට පොලී අනුපාතය සියයට 3කින් ඉහළ ගියා. එහෙම කරපු තමුන්නාන්සේලා,-

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒකට නඩු දාන්න. [බාධා කිරීමක්] නඩු දාන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නඩු! පොඩ්ඩක් ඉන්න. බැඳුම්කර සිද්ධියට කලින් සහරාන්ට ලක්ෂ 50 දුන්නාට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නඩු වැටෙනවා. බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් නඩු දාලා නැහැ කියලාද තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නේ? බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් නඩු දාලා තිබෙනවා; සමහරු බන්ධනාගාරගත කරලාත් තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු මුදල් ඇමති දැන් උසාවියේ. ඊළඟට, හිටපු මුදල් රාජ්‍ය ඇමති එනවා උසාවියට. ඊළඟට, COPE එකේ සාමාජිකයෝ එනවා උසාවියට. ඒ ඔක්කොම එනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසාන වෙගෙනයි එන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේලා බලාගෙන ඉන්න. එහෙම හදිසියට නඩු දාන්න බැහැ මන්ත්‍රීතුමා. ඒවාට අදාළ නීතිමය කටයුතු තිබෙනවා. ඒවා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒ නිසා තමුන්නාන්සේලා පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා. තමුන්නාන්සේලාට ඕනෑ විධියට ඒවා කරන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

Hon. Chairman, the Hon. Minister made an allegation that there are many people on this side who have taken money from the Bond scam. If so, I would like him to name them and to say whether they have resorted to litigation. We would like him to name them now!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එක්සත් ජාතික පක්ෂයේ හිටපු මහ ලේකම්තුමා, ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ට සල්ලි දුන්නේ නැද්ද මැතිවරණයේදී? පක්ෂයේ අපේක්ෂකයන්ට සල්ලි දුන්නාද?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, මට මයික් එක දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්, කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
අපේ පක්ෂ මූලස්ථානයෙන් අපි සල්ලි බෙදුවේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සිරිකොතේ?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
අපි ඒ අයට උපදෙස් දීලා ඡන්ද කරන හැටි කිව්වා. අපි ඔබතුමන්ලා වාගේ සල්ලි බෙදලා ඡන්ද දිනන්නේ නැහැ. තමුන්නාන්සේලා තමයි සල්ලි දීලා ඡන්ද දිනන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි. හැබැයි, ඔබතුමා මතක තබාගන්න, ඔබතුමාගේම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු තමයි,

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

සිරිකොතේදී ඇලෝසියස්ගේ වාහනයෙන් සල්ලි බෙදුවා කියලා දිවුරුම් ප්‍රකාශ දුන්නේ කියන එක. ඒ පිළිබඳ පරීක්ෂණ යනවා. ඔබතුමා නැහැ කියනවා නම්, ඒ ගැන කථා කරන්න පුළුවන්. ඒ පිළිබඳ සොයා බලමු. [බාධා කිරීමක්] ඉතින් කලබල වෙන්න එපා. ඇයි, ඔය කලබල? ගත්තේ නැත්නම් කලබල වෙන්න එපා. ඇයි, කලබල වෙන්නේ? ගත්තේ නැත්නම් කලබල වෙන්න එපා. අපි කියන්නේ ගත්තු අයටයි. ගත්තේ නැති අය මේ පිළිබඳ කලබල ඇති කරගන්න එපා.

ඒ විතරක් නොවෙයි, අපි මේ කාරණයත් ඔබතුමන්ලාට කියන්න ඕනෑ. තමුන්නාන්සේලා අවුරුදු ගණනකට පොලිය,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමා. තවත් මන්ත්‍රීවරු ඉන්නවා කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි, ගරු සභාපතිතුමනි.

අපි ඔබතුමන්ලාට කියනවා, ඔබතුමන්ලා,- [බාධා කිරීමක්] ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කියනවා, 'දැන් බැන්නා ඇති.' කියලා. බැණිල්ලක් නොවෙයි ගරු මන්ත්‍රීතුමා.

එදා විපක්ෂය හැටියට හිටිය අපි ආණ්ඩුවක් හැදුවා. ඒ පිළිබඳ අපට අත්දැකීම් තිබෙනවා. අපි කාටවත් මඩ ගැහුවේ නැහැ. අපි ඇත්ත කථා කළේ. අපි අය වැය ගැන සත්‍ය කථා කළේ. තමුන්නාන්සේලා "බුරුවි" ගැන කථා කළා; "පැණි" ගැන කථා කළා; "මහර" ගැන කථා කළා. නමුත් මිනිසුන්ගේ ප්‍රශ්න ගැන තමුන්නාන්නන්සේලා කථා කළේ නැහැ.

මේ අය වැයෙන් ජනතාවට දැවැන්ත සහන රැසක් දීලා තිබෙනවා. මේ අය වැය ලෝක ආර්ථික අර්බුදයක් තිබෙන වෙලාවේ, කොරෝනා වසංගතයට රට මුහුණ දී තිබෙන වෙලාවේ, ඒ සියලු අභියෝග හමුවේ ජනතාවට සහන දෙමින් සාර්ථකව ඉදිරිපත් කරපු අය වැයක් බව මම මතක් කරනවා. ගරු මුදල් ඇමතිතුමා වන අගමැතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

[අ.භා. 4.56]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ස්තුතියි, ගරු සභාපතිතුමනි. මම හිතුවා ආණ්ඩුවේ හොඳම ආර්ථික විශේෂඥයා තමයි අන්තිමට කථා කරන්න දාලා තිබෙන්නේ කියලා. [බාධා කිරීම්] ආණ්ඩුවේ ආර්ථික දැනුම මැනගන්න පුළුවන්, විශේෂඥයාගේ කථාවෙන්. [බාධා කිරීම්] එතුමා පුදුම කථාවක් කළා.

ගරු සභාපතිතුමනි, රටක වාර්ෂික අය වැය පිළිබඳ විවාද කිරීම සහ සම්මත කරගැනීම මහජන මුදල් කළමනාකරණයේ මූලික කටයුත්තක්. රටේ පුරවැසියන්ට, ආධුනිකයන්ට අය වැයේ හරය තේරුම්ගන්න නම්, දෙන ඉලක්කම්, ඇස්තමේන්තු සහ උපකල්පනවල ප්‍රමිතිය හරියට තිබිය යුතුයි.

මේ වසරේ අය වැය ලේඛනයේ බරපතළ අවගණනය කිරීමක් සිදු වෙලා තිබෙනවා. ආදායම් සහ වියදම් කියන දෙකටම අදාළ ගණන් එකම වාර්තාවේ තැන් දෙකක, පිටු දෙකක වෙනස්ව සඳහන් කර තිබෙනවා. ඒ වාගේම අය වැය කථාවේ, අය වැය ඇස්තමේන්තු ලේඛනයේ සහ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ගණන් ගැළපෙන්නේත් නැහැ. ඒවාත් පරස්පරයි. 2021 අය වැය කථාවේ රාජ්‍ය ආදායම් අඩු වීමේ යෝජනා 36ක් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් ගන්නා විකල්ප මූල්‍ය ක්‍රියා මාර්ග මොනවාද කියලා කොහේවත් සඳහන් කරලා නැහැ. ඒ වාගේම රාජ්‍ය වියදම් සඳහා යෝජනා 32ක් තිබෙනවා. හැබැයි, ඒවාට මුදල් වෙන් කරලා නැහැ. මේක බරපතළයි. මේකෙන් පෙනී යන්නේ අය වැය වාර්තා කිරීමේ ක්‍රමවේදයේ, ප්‍රමිතියේ බිඳ වැටීමක් මේ වසරේ බරපතළ විධියට සිදුවී තිබෙන බවයි. එහි ප්‍රමිතිය වැටිලා තිබෙනවා. අප ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කරනවා නම්, විශ්වසනීයත්වය - credibility- ඉතාම වැදගත්. හිටපු මුදල් රාජ්‍ය අමාත්‍ය, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා වාගේම, මගේ මිත්‍ර ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ ගැන මේ ගරු සභාවේ විස්තරාත්මකව කථා කරලා, කරුණු විශ්ලේෂණය කරලා, ඒ බව ඔප්පු කළා. මේ අසත්‍ය ඉලක්කම් ඉදිරිපත් කිරීමේ, ගණිත විජ්ජාව කිරීමේ ප්‍රතිවිපාකය ලැබෙන්නේ මේ ආණ්ඩුවට පමණක් නොවෙයි. මුළු රටටම මෙහි ප්‍රතිවිපාකය විඳින්න සිදු වෙනවා.

විදේශ ආයෝජන ගෙන්වාගන්න නම්, අඩු පොලියට ජාත්‍යන්තරයෙන් ණය ලබාගන්න නම් තිබිය යුතු ප්‍රධාන සාධකයක් තමයි, ඇදහිය හැකි දත්ත ඉදිරිපත් කිරීම. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය කළමනාකරණ ශ්‍රේණිගත කිරීමේ ආයතන අප රටේ ආර්ථිකය සම්බන්ධ ඇගයීමක් කරන විට, ඒ වාගේ ඇදහිය හැකි දත්ත තිබෙන්නටම ඕනෑ. ගරු අගමැතිතුමා, මේ ආණ්ඩුව මූඩීස් ආයතනයට දිගටම අපහාස කළා, චෝදනා කළා, ඔවුන් මේ ඇගයීම කරලා රට පහතට හෙළූ නිසා. හැබැයි, ඒ ගොල්ලන් ඒ downgrade කිරීම කළේ ඇයි කියලා තමුන්නාන්සේලා කල්පනා කළේ නැහැ. මූඩීස් ආයතනය ඔබතුමන්ලාට දිගටම අවවාද කළා, රාජ්‍ය ආදායම අවිධිමත්ව කපා හරින්න එපා කියලා. ඒ වාගේම, මූල්‍ය ප්‍රශ්නයක් ඇති වෙයි කියලාත් මතක් කළා. සීමාව ඉක්මවා මුදල් අච්චු ගහන කොට, අපේ ආර්ථිකයට විශාල තර්ජනයක් ඇති වෙයි කියන එක ඒ අය දිගටම මතක් කළා. නමුත් ඔබතුමන්ලා ඒ ගැන කල්පනා කළේ නැහැ. ඔබතුමන්ලා ඒකට ඇහුම් කන් නොදී ඒ දෙකම කළා. මොකක්ද ප්‍රතිඵලය? ගජ මිතුරන් පෝෂණය කරන්න රාජ්‍ය ආදායම කපා හැරියා. අනෙක් පැත්තෙන්, මාර්තු මාසයේ විතරක් රුපියල් බිලියන 165ක් මුදල් අච්චු ගසා මේ රටේ මුදල් අස්ථායිතාවක් - monetary instability - ඇති කළා. මේ රටේ ආර්ථිකයට ඔබතුමන්ලා අසීමිතව වද දුන්නා. වද දීලා මොකක්ද කළේ? ඒක කොරෝනා පිට පැටෙව්වා. මේක තමයි යථාර්ථය. එහි ප්‍රතිඵලය මොකක්ද? මූඩීස් ආයතනය ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රමිතිය Caa1 කියන මට්ටමට අවප්‍රමාණ කිරීමයි ප්‍රතිඵලය.

ඊළඟට, ජාත්‍යන්තරය තව chance එකක් දුන්නා. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන සහ ආයෝජකයන් බලා සිටියා, ඔබතුමන්ලා ඉදිරිපත් කරන අය වැයෙන්වත් මේ රට ගොඩගන්න පුළුවන් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරයිද කියලා. හැබැයි, මොකක්ද ප්‍රතිඵලය? මේ වන කොට ලෝකයේ තිබෙන අනෙක් ප්‍රධාන මූල්‍ය ප්‍රමිති ආයතන දෙකත් අප අවප්‍රමාණ කර තිබෙනවා. මේක තමයි අය වැය ඉදිරිපත් කළාට පසුව ප්‍රතිඵලය. දැන් වන කොට ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ආයතනය සහ ෆිච් රේටින්ග්ස් ආයතනය අප අවප්‍රමාණ කරලා ඉවරයි.

මේ රජයේ ප්‍රධාන ආර්ථික ඔස්තාර්ලා ඉන්නවා; උපදේශකවරු ඉන්නවා. මේ සභාවේත් ඉන්නවා, ඒ වාගේ ලොකු මිනිස්සු. ඒ අය, තමන්ට ලොකු දැනුමක් තිබෙනවා කියලා හිතාගෙන ඉන්න මිනිස්සු. එතුමන්ලාගේ බුද්ධි විශ්ලේෂණය මත එතුමන්ලා කියයි, මේ ශ්‍රේණිගත කරන ආයතන හරියට මේ වැඩේ කරලා නැහැ, මේක වෙනත් මොකක් හරි කුමන්ත්‍රණයක් කියලා. විමල් වීරවංශ ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා නම්, එතුමාගෙන් ඇහුවොත් එතුමා කියයි, මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් කියලා. මේ ශ්‍රේණිගත කිරීම ගැන අර මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගෙන් ඇසුවා නම්, එතුමා කියයි, මේක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ වැඩක් කියලා. මොකද, එතුමන්ලාගේ බුද්ධි මට්ටම එච්චරයි. එතැනින් එහාට හිතන්න බැහැ. [බාධා කිරීම්] මේක තමයි ඇත්ත. [බාධා කිරීම්] ඇත්තටම මේ ප්‍රමිති ආයතනවලට සහ ආයෝජකයන්ට අපේ රටේ රාජ්‍ය ආදායම් කපා හැරීම හෝ මුදල් අච්චුගැසීම දිහා හෝ බලන්න ඕනෑ නැහැ. ඒ ගොල්ලන් අපේ ප්‍රමිතිය, අපේ ශ්‍රේණිය අඩු කරන්න බලපාන තව හේතු ගොඩක් තිබෙනවා. ඒවා මොනවාද? මේ රටේ ආණ්ඩුවක් තිබෙනවා-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order. එතුමා මගේ නම කිව්වා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, "මේ ආර්ථිකය ගැන අපෙන් අහන්න" කියලා ඔබතුමා කිව්වා. මා දන්නේ නැති නිසා මම ඔබතුමාගෙන් දෙයක් අහනවා. අපේ රටේ ආර්ථිකය තමුන්නාන්සේලා ඇෆ්ගනිස්ථානයේ මට්ටමටත් වඩා පහළ බස්වා දුන්නා නේ. ඒක කළේ කොහොමද, කියලා කියන්න. [බාධා කිරීම්] ආර්ථිකය ඇෆ්ගනිස්ථානයේ මට්ටමටත් වඩා පහළ බස්වා දුන්නා නේ. [බාධා කිරීම්]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, මේ රටට පළමුවෙන්ම මේ ශ්‍රේණිගත කිරීමේ ආයතන ටික ගෙනෙන්න තීරණය කළේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා හැටියට සිටියදී 2005 අවුරුද්දේයි. මේ ශ්‍රේණිගත කිරීමේ ආයතන ටික පළමුවෙන්ම ලංකාවට එන්නේ 2007 අවුරුද්දේ. ඒ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේයි, ගරු ඇමතිතුමනි.

හැබැයි, 2007 සිට 2020වනතුරු අවුරුදු දහතුනක්ම අපේ රටේ ශ්‍රේණිගත කිරීම කිසිම දවසක B Grade එකට වඩා පහළට වැටුණේ නැහැ. අපේ ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ රටේ ශ්‍රේණිගත කිරීම C Grade එකට වැටිලා තිබෙනවා. මම හිතන විදියට ඒ ගෞරවයත් හිමි වෙන්න ඕනෑ ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාටයි. ඒ නිසාම තමයි අපි කියන්නේ, "සර් ෆේල්" කියලා. කරන්න බැරි දේ එතුමා කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ දවස්වල ආණ්ඩුව පැත්තේ ඉන්න අය දිගටම "රිවර්ස්" පෙත්ත ගැන කථා කරනවා. එතුමන්ලා නිතරම මේ වචනය කථා කරනවා. "රිවර්ස්"පෙත්ත ගැන කථා කරන කොට මට මතක් වෙන්නේ මේගොල්ලන්ට පොඩි වයර් මාරු වීමක් සිදු වෙලා තිබෙන බවයි. මොකද, රටේ තිබෙන ආර්ථික ප්‍රශ්න මත මේ "රිවර්ස්" පෙත්ත අරගෙන තිබෙන්නේ මම හිතන විදියට බන්ධනාගාරයේ අය නොව, භාණ්ඩාගාරයේ ඉන්න නිලධාරින්. මොකද, මේ ආර්ථිකය අද reverse එකේ යන්නේ. ඒ වාගේම රාජ්‍ය ආදායම් reverse එකේ යන්නේ. පොදු ජනයාගේ ආදායම් ටිකත් reverse එකේ යන්නේ. මේ "රිවර්ස්" පෙත්ත භාණ්ඩාගාරය අරගෙන තිබෙනවා කියලා ඔප්පු කරන්න ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාම -වෙන කවුරුවත් නොවෙයි- මෙම ගරු සභාවේ ප්‍රකාශයක් කළා. එතුමාගේ ප්‍රකාශය දේශපාලනීකරණය කරන්න මම කැමැති නැහැ. හැබැයි, එතුමා ලොකු පීඩනයකින් කිව්වේ මේ භාණ්ඩාගාර නිලධාරින් පාර්ලිමේන්තුව නොමඟ යවනවා කියලා. ඒක බරපතළ චෝදනාවක්. පාර්ලිමේන්තුව නොමඟ යවන නිලධාරින් ඉන්නේ කියලා එතුමා කිව්වා. ඒ වාගේ තත්ත්වයක් තිබේද්දි, තමන්ගේ භාණ්ඩාගාරයේ විශ්වාස කරන්න බැරි නිලධාරින් සිටියදී මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් තියාගන්න පුළුවන්ද? මේක තමයි තත්ත්වය. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියපු කාරණය සහතික වනවා. මොකද, ඒ වනකොට දක්ෂ කළමනාකරුවෙකු වාගේම දේශීය ව්‍යාපාර හිමියෙකු වන අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ප්‍රභාෂ් සුබසිංහ මහතා ඉල්ලා අස් වුණා. එතුමා ඉල්ලා අස් වෙන්නේ පෞද්ගලික හේතු මත කියායි කිව්වේ. හැබැයි, එතුමා ඇත්ත කියන්න යන්නේ නැහැනේ, ඇයි අස් වෙන්නේ කියලා. ඒ වාගේම ජෝන් කීල්ස් සමාගමේ හිටපු සභාපති,-

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - வர்த்தக அமைச்சர்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Trade)
Sir, I rise to a point of Order.

ගරු කබීර් හෂීම් හිටපු ඇමතිතුමා මගේ නම දෙවරක්ම සඳහන් කළා. මම මේ ගරු සභාවට කිව්වේ, කාගේ ආණ්ඩුව තිබුණත් පාර්ලිමේන්තුව විසින් කළ යුතු කාර්යය කරන්න දෙන්නේ නැති සමහර නිලධාරින් එදාත්, අදත්, හැම දාම ඉන්නවා, ඒ අය විසින් ඒ අයගේ න්‍යාය පත්‍ර අනුව අගමැතිතුමාට, ජනාධිපතිතුමාට, ආණ්ඩුවට නැති බලයක් ආරෝපණය කරගෙන ඉන්නවා කියායි. [බාධා කිරීම්]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, ප්‍රභාෂ් සුබසිංහ මහතා ඉල්ලා අස් වුණා. ඒ වාගේම ජෝන් කීල්ස් සමාගමේ හිටපු සභාපති සුසන්ත රත්නායක මහතා - BOI එකේ සභාපතිතුමා - ඉල්ලා අස් වුණා. එතුමා අයින් වුණා. මේ ඔක්කොම මේ වෙලාවේ අයින් වන කොට මට තේරෙන්නේ නැව ගිලෙන්න කලින් එක් එක් කෙනා දැන් නැවෙන් පනින්න පටන් ගන්නවා කියන එකයි, ගරු අගමැතිතුමනි. එක් එක්කෙනා යනවා. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව control කරන්නේ මම හිතන තරමට ඊනියා වියතුන් කණ්ඩායමක්, රහපාන උගතුන් පිරිසක් සහ නව ධනේශ්වර පන්තියට අයිති ව්‍යාපාරිකයන් පිරිසක්. මේගොල්ලන් සඳහා තමයි මේ ආණ්ඩුව වැඩ කරන්නේ. අගමැතිතුමාට ඒක තේරෙනවා ඇති. හැබැයි, මේ ආණ්ඩුව control කරන මේ කණ්ඩායම එක දෙයක් කරලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා අවුරුද්දක් ඇතුළත hero to

[ගරු කබීර් හෂීම් මහතා]

zero කරලා අවසන් කරලා තිබෙනවා. අද වනකොට එතුමා hero to zero කරලා අවසානයි. ඒක තමයි තත්ත්වය. [බාධා කිරීම්] ඒ නිසා තමයි දැන් hero to zero වෙලා ඉන්න එතුමාට අපි කියන්නේ "සර් ෆේල්" කියලා. රටම කියන්නේ "සර් ෆේල්" කියලා. වෙන මොනවා කියන්නද? [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව දැන ගත යුතු කරුණු කීපයක් තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානය නොහොත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැම වතාවේම බලයට එන්නේ ජාතිය, කුලය, ආගම, පන්තිය අතර බෙදීමක් ඇති කරලා. නැත්නම් වෛරය වපුරලා. ඒ නිසා මේ ආණ්ඩුව පසුගිය ඡන්දයේදී ජාතික ආරක්ෂාව ගැන ගොඩක් කළා. හැම තැනම ජාතික ආරක්ෂාව ප්‍රධාන සටන් පාඨ බවට පත් කළා. ගෝලීය ත්‍රස්තවාදයට මුහුණ දෙන්න පුළුවන් නවීකරණය කරන ලද තාක්ෂණය තුළින් ජාත්‍යන්තර තලයට සරිලන ඉහළම බුද්ධි අංශයක් දියුණු කරනවා කියලා රටට පොරොන්දුවක් ලබා දුන්නා. බලය ගත් ගමන් පාස්කු ඉරිදා බෝම්බය පසුපස ඉන්නේ කවුද කියලා හොයා දෙනවා කිව්වා; මහ බැංකු හොරුන්ට දඬුවම් ලබා දෙනවා කිව්වා; අර්ජුන් මහේන්ද්‍රන් හොයලා ගෙනැල්ලා දෙනවා කිව්වා. දැන් අවුරුද්දක් ගතවෙලා අවසන්. දැන් නොවැම්බර්. [බාධා කිරීම්] මෙපමණ කාලයක් ගතවෙලාත් තවම එ් හොරු අල්ලා නැහැ; කවුරුත් හොයලා නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා (වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணவீர - பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Prasanna Ranaweera - State Minister of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion)
Sir, I rise to a point of Order.

අර්ජුන් මහේන්ද්‍රන් යවන්න ඉඩ දුන්නේ කවුද? එවෙලේ කොහේද හිටියේ? ආර්ථික ඔස්තාර්ලාගේ තත්ත්වය මොකක්ද? [බාධා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
It is not a point of Order.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
අනේ! අපට හිනායනවා, එතුමා අහන දේවල්වලට.

ගරු සභාපතිතුමනි, 2020 නොවැම්බර් 21වෙනි දා මේ සභාවේදී කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා වී මිල සහ හාල් මිල ගැන මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නයකට එතුමා ලබා දුන් පිළිතුර ඇතුළත් කොටස මම හැන්සාඩ් වාර්තාවෙන් උපුටා දක්වන්න කැමැතියි.

2020 නොවැම්බර් 21 දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 756හි සහ 757හි මෙසේ සඳහන් වනවා:

> "ගරු කිංස් නෙල්සන් මැතිතුමනි, පසුගිය කන්නයේ අපි මේ රටේ හෙක්ටෙයාර් 426,000ක් වගා කළ බව ඔබතුමන්ලාට කියන්නට ඕනෑ. අපි මෙට්‍රික්ටොන් මිලියන 1.8ක් නිෂ්පාදනය කළා. මාසික අවශ්‍යතාව මෙට්‍රික්ටොන් එක්ලක්ෂ අනූපන්දහසයි. පෙබරවාරි, මාර්තු වනතුරු අවශ්‍ය සහල් මේ රටේ තිබෙනවා. හැබැයි, සහල් හංගලා. සහල් නැති ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. සහල් හංගලා."

මේක කියන්නේ කවුද? මේක කියන්නේ මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමායි. ගරු සභාපතිතුමනි, ජාතික ආරක්ෂාව ගැන කථා කරපු අය, අපේ කාලයේදී බුද්ධි අංශ දුර්වල කළා කියලා කියපු අය, ආ ගමන් බැංකු හොරු අල්ලනවා, ත්‍රස්තවාදීන් අල්ලනවා කියපු අයට හංගපු හාල් ටික හොයා ගන්න බැහැ. හංගපු හාල් ටික හොයා ගන්න බැරි ආණ්ඩුවක් කොහොමද බැංකු හොරු අල්ලන්නේ, කොහොමද ත්‍රස්තවාදීන් අල්ලන්නේ? ලජ්ජා නැහැ. එතුමාම කියනවා, හාල් හංගලා කියලා. මේ, හාල් හොරු ටික අල්ලා ගන්න බැරි දුර්වල ආණ්ඩුවක්. හරි ලජ්ජයි කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, කිසිම ලජ්ජාවක් නැහැ කියන්න. ඔබතුමා මගේ නම සඳහන් කරලා යමක් කිව්වා. ඔබතුමා කියපු දේ මම කිව්වා. හැබැයි, හාල් මාෆියාවක් විසින් හාල් හංගනවා. මම කියපු එක අහන්න. මම කිව්වා, අද රටේ කිසිම හාල් හිඟයක් නැහැ, සියලුදෙනාට හාල් තිබෙනවා කියලා. මහ බැංකුවේ හොරු අල්ලන එක වෙනම දෙයක්. නමුත්, රටේ කිසිම හාල් හිඟයක් නැහැ. අද ඕනෑ කෙනෙකුට හාල් තිබෙනවා. තමුන්නාන්සේ බොරු කියන්න එපා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
අද පොඩ්ඩක් වයර් ෂෝට් වෙලා.

ගරු සභාපතිතුමනි, 1994 සිට 2020 දක්වා වූ කාලයෙන් වැඩි කාලයක් මේ රට පාලනය කරලා තිබෙන්නේ මේ කණ්ඩායමමයි. ලජ්ජා නැතිව මෙතැනට ඇවිල්ලා කියනවා, රටේ දැවෙන ප්‍රශ්න තිබෙනවා කියලා. වැඩි කාලයක් රටේ වගකීම තිබුණේ එතුමන්ලා අතේ. එතුමන්ලා හැම දාම බලය ගත්තේ යූඑන්පී එකේ ප්‍රතිපත්ති විවේචනය කරලායි. ඒ දවස්වල සිට එක්සත් ජාතික පක්ෂයේ සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට මඩ ගැහුවා, රණසිංහ ප්‍රේමදාස මහතාට මඩ ගැහුවා, රනිල් වික්‍රමසිංහ මහතාට මඩ ගැහුවා. මෙතැන සිටින මේ කණ්ඩායමම තමයි, ගාමිණී දිසානායක මැතිතුමා ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තරයට ගෙන යන්න බලන කොට මහපාරේ පෙළපාළි ගියේ. ආර්. ප්‍රේමදාස මැතිතුමා ක්‍රිකට් ක්‍රීඩාංගණය හදන කොට ඒවාට විරුද්ධව පාරට බැස්සේත් මේ කණ්ඩායම. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රූපවාහිනිය මේ රටට හඳුන්වා දෙනකොට මේ රටේ සංස්කෘතිය, අපේ ජාතිය ඉවර වෙයි කියලා කෑ ගැහුවේත් මේ කණ්ඩායම. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා හදන කොට ජංගි මහන ෆැක්ටරි ගහනවා කියලා විවේචනය කළේත් මේ කණ්ඩායමම තමයි. හැබැයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විධායක ජනාධිපතිකම, එතුමාගේම ව්‍යවස්ථාව විවේචනය කළේත් මේ කණ්ඩායමම තමයි. හැබැයි, මේ ටික ඔක්කෝම අද තමන්ගේ වාගේ බදාගෙන ඉන්නේත් මේ කණ්ඩායමම තමයි. නමුත්, මේ රටේ තිබෙන්නේත් මේ නායකයෝ කරපු ටික පමණයි.

ගරු සභාපතිතුමනි, යූඑන්පීය රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරනවා, රටේ දේපළ විදේශිකයන්ට විකුණනවා කියලා රටේ බොරු මතයක් හැදුවා. මේ රට ඇත්ත දැනගත යුතුයි.

මම අද ඒවා කියන්නම්. 1995දී ලංකා ගෑස් කොම්පැනිය පෞද්ගලීකරණය කළා. 1996දී ඔරියන්ට් ලංකා එක විකිණුවා. 1997දී ශ්‍රී ලංකා ටෙලිකොම් එක විකිණුවා. 1998දී ශ්‍රීලන්කන්

එයාර්ලයින් එක විකිණුවා. ඊ ළඟට, වතු සමාගම්වල අවුරුදු 5කට තිබුණු බද්ද අවුරුදු 50කට දීර්ඝ කරලා ඉන්දියන් කොම්පැනිවලට භාර දුන්නා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේදී ඇඹිලිපිටිය කඩදාසි සමාගම Australian company එකකට විකිණුවා. සෝමාවතිය චෛත්‍ය වටේ තිබෙන අක්කර 5,000ක් ඇමෙරිකාවේ කෙසෙල් වගා කරන කොම්පැනියකට විකුණා දැමුවා. මාවනැල්ල කුට්ටි රබර් කර්මාන්තශාලාව පෞද්ගලික අංශයට විකුණා දැමුවා. මහවැලියට අයිති මුතුවැල්ල සහ සිද්ධපුර ගොවිපොළවල් දෙක සෝලි කැප්ටන්ට විකිණුවා. ඒ වාගේම බීජ නිෂ්පාදනය කරන ගොවිපොළවල් තුනක් වන පැල්වෙහැර, හිඟුරක්ගොඩ සහ කටුගස්තොට සෝලි කැප්ටන්ට විකිණුවා. සරත් ෆොන්සේකලා ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගත් කිලිනොච්චි ගොවිපොළත් සෝලි කැප්ටන්ට විකිණුවා. මේ ටික දීලා, ඊළඟට අධිආරක්ෂක කලාපයේ තිබෙන Port City එකේ අක්කර 50ක් චීන ආණ්ඩුවට සින්නක්කරව ලියලා දෙනවා. අපි ඒක බලෙන් තමයි ආපහු ගත්තේ. හමුදා මූලස්ථානය චීන සමාගමකට විකුණලා දානවා. [බාධා කිරීම්] ලජ්ජා නැතුව කථා කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, මම අවසන් කරනවා. [බාධා කිරීම්]

ගෝඨාභය රාජපක්ෂ මහත්තයා බලයට ආපු ගමන් අධි ආරක්ෂක කලාපයේ Galle Face Green එකේ අක්කර තුනක් චීනයට විකුණුවා. වරායේ තිබෙන ECT පර්යන්තය ඉන්දියාවට විකුණලා දැන් අධිවේගී මාර්ග නාමයෙන් - [බාධා කිරීම්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට නියමිත කාලයඅවසානයි ගරු මන්ත්‍රීතුමනි.

දැන් ගරු අගමැතිතුමා කථා කරන්න.

[අ.භා. 5.13]

ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் நிதி அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Finance, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing)
ගරු සභාපතිතුමනි, අය වැය දෙවන වර කියැවීමේ විවාදය අවසථාවටයි අපි සම්බන්ධ වෙලා ඉන්නේ. විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. ඒ සියලු අදහස් පිළිබඳව අපි අපේ අවධානය යොමු කරමින්, කළ හැකි සහ ගත යුතු සියලු පියවර ගැනීමට අපි සූදානම් කියන එකත් මතක් කරන්නට ඕනෑ.

2019 වර්ෂයේදී අපි කවුරුත් හිතුවේ නැහැ, මේ කොවිඩ් වසංගතය වාගේ ඛේදවාචකයකට මුළු ලෝකයම මුහුණ දෙයි කියලා. ඒ අනුව අපේ රටටත් ඒ තත්ත්වය ඇති වුණා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ඒ රැල්ල සාර්ථකව පාලනය කරන්න පුළුවන්කම ලැබුණා. කොවිඩ් - 19 දෙවැනි රැල්ල පාලනය කරන්න දැවැන්ත පියවර රැසක් ගනිමින් තිබෙනවා. අදත් ඒ පිළිබඳව සාකච්ඡා කළා. නිරෝධායනයට ලක් කර තිබෙන පවුලකට සති දෙකකට රුපියල් 10,000ක් වටිනා ආහාර මල්ලක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. සති දෙකකට වඩා වැඩි වෙන කොට එය තව තවත් දීර්ඝ කරන්න අපි පියවර අරගෙන තිබෙනවා. ඊට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයේ lock down කිරීම නිසා ජීවනෝපාය අහිමි වූ පවුල්වලට රුපියල් 5,000 ගණනේ දෙපාරක් දුන්නා. අනාගතයේ දීත් ඒ අය වෙනුවෙන් ඒ ආකාරයට කටයුතු කරන්න සූදානම් වෙලා ඉන්නවා.

අපි විශේෂයෙන්ම මුහුණ දීලා තිබෙන තත්ත්වය පිළිබඳව ගත්තොත්, මේ අය වැය ඉදිරිපත් කරන කොට අපි පසුගිය කාලයේ කොරෝනා වසංගතය වෙනුවෙන් රුපියල් බිලියන 70ක් වියදම් කරලා තිබුණා. අය වැය තෙවන වර කියවීමේ දිනය වන අද වන කොට අපි රුපියල් බිලියන 82ක් කොවිඩ් මර්දනය සඳහා වියදම් කරලා තිබෙනවා. දෙසැම්බර් මාසය වන කොට එය රුපියල් බිලියන 90ක් ඉක්මවන්න පුළුවන්. මේ වාගේ දැවැන්ත අභියෝගවලට මුහුණ දෙන්න අපට සිදු වුණා. අපි ලෝකයත් එක්ක කොයි තරම් ගැට ගැහිලා තිබෙනවාද කියන එක තේරුම් ගන්න හොඳම අවස්ථාවක් තමයි මේ අවස්ථාව. ලෝකයේ සිදුවන දේවල් -දේශපාලන, ආර්ථික, සෞඛ්‍යමය වශයෙන් - අපට කොයි තරම් බලපානවාද කියන එක තේරුම් ගන්න පුළුවන් අවස්ථාවක් අද අපට උදා වෙලා තිබෙනවා. ලෝකයේ සිදුවන දේවල් මේ සභාවට පවා ඉතාම තදින් බලපාන බව මම කියන්න ඕනෑ. මේ වාගේ ලෝක අර්බුදයකදී පිටස්තර ලෝකය මත යැපෙන රටවල් ඉතාම අසරණ වෙනවා කියන එක ඔබට අමුතුවෙන් කිව යුතු නැහැ, ගරු සභාපතිතුමනි. අපේ රටේ ආර්ථිකය අපි දේශීය වශයෙන් ගොඩනඟා ගෙන තිබුණා නම්, මේ වාගේ අර්බුදයකට මුහුණ දෙන්න හොඳටම පුළුවන්කම තිබුණා. ඒක තමයි කොවිඩ් - 19 අපට උගන්වපු පාඩම. අපි වේලාසනින් මේ තත්ත්වය තේරුම් අරගෙන තිබුණා. ඒක නිසා තමයි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දේශීය ආර්ථිකයක්, දේශීය කෘෂි කාර්මික දියුණුවක් ගැන අපි හිතුවේ.

මේ අය වැය "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය පදනම් කරගෙන හදපු අය වැයක්. වෙනත් අය වැයවල තිබුණු අරමුණු නොවෙයි මේ අය වැයේ තිබෙන්නේ. වෙනත් අය වැයවල දී, අය වැය හිඟය පියවා ගැනීමට තමයි මූලිකත්වය දුන්නේ. නමුත් මේ අය වැය දේශීය ගොවියා, දේශීය කර්මාන්තකරුවා, දේශීය නිෂ්පාදකයා ගොඩනැංවීම සඳහා, ලෝකයට මුහුණ දෙන්න පුළුවන්, මේ වාගේ ඛේදවාචකවලට මුහුණ දෙන්න පුළුවන් රටක් ගොඩනැඟීම සඳහා සම්පූර්ණයෙන්ම වෙන් කර තිබෙනවා.

අපි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් කෘෂි කර්මාන්තය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ආහාර නිපදවා ගැනීම අප රට නඟා සිටුවන්න තිබෙන හොඳම මාර්ගයයි. මෙතෙක් කාලයක් වී කිලෝ එකකට ගෙව්වේ, රුපියල් 32යි. අපි ඒක රුපියල් 50 දක්වා වැඩි කළා. පොහොර නිකම්ම සහනාධාරයක් හැටියට ලබා දුන්නා. මෙහෙම කළාම ගොවින්ගේ ආදායම දෙගුණ වුණා.

ගරු සභාපතිතුමනි, මේ අය වැයෙන් පොදු ජනතාවට මොනවත් නැහැයි කියලා අපේ විවේචකයෝ චෝදනා කළා. නමුත් මතක තබා ගන්න, අපි කොයි වෙලාවකවත් නිකම් සල්ලි බෙදන ව්‍යාපෘති පටන් ගත්තේ නැහැ කියලා. ඉදිරි මැතිවරණයක් බලාගෙන ලියපු අකුරක්, කොමාවක් මේ අය වැයේ නැහැ. අපි ජනතාවට ඒ ප්‍රෝඩාව කරන්නේ නැහැ. මේ අය වැයෙන් රුපියල්

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

බිලියන 350ක් අපි මහාමාර්ගවලට වෙන් කරනවා. එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගෙන් පස්සේ දැවැන්තම මාර්ග විප්ලවය සිද්ධ වුණේ අපේ කාලයේ දී කියලා අපට නිහතමානි ආඩම්බරයක් තිබෙනවා. මට ඉතාම කනගාටුයි, විදේශිකයකුගේ නමක් රටට සේවයක් කළ අයගේ ගොඩට දමලා කථා කරන්න සිදුවීම ගැන. මේ ක්ෂේත්‍රයට ඔහු කරපු සේවය තරම් සේවයක් විපක්ෂය කරලා නැති නිසායි, මට ඒ නම මතක් කරන්න සිද්ධ වුණේ. 2005-2010 අතර කාලයේදී අපි හදපු පාරවල්වලට බොහෝ දේ කිව්වා. නමුත් අද ඒ පාරවල්වලින් ප්‍රයෝජන ගන්නේ මන්ත්‍රීවරුන්ද, ධනපතියන් පමණක්ද කියලා මා අහන්න කැමැතියි. අද මේ පාරවල්වල එන්නේ ගමේ පොදු ජනතාවයි; පොදු ප්‍රවාහන සේවාවල හිමිකාරයෝයි. කෙහෙල් මලේ ඉඳලා කිරි මුට්ටිය දක්වා බොහොමයක් දේවල් නගරයේ වෙළෙඳ පොළට ගෙන එන්නේ මේ පාරවල් දිගේයි. අවුරුදු 05ක් තුළ කිලෝමීටර් දෙකක් හෝ කිලෝමීටර් තුනක්වත් දුරට පාරක් හදපු නැති අයට මේවා තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ. ණය ගැන බැණ බැණ හිටපු අයට මේවා තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ. අපි මේ වියදම් කරපු රුපියල් බිලියන 350ම පොදු ජනතාවගේ සාක්කුවට දමපු රුපියල් බිලියන 350ක් බව මා කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි මේ වන විට බොන වතුරට රුපියල් බිලියන 135ක් වෙන් කරලා තිබෙනවා. ඒක අපි වෙන් කරන්නේ 2024දී සියලු ජනතාවට, සෑම ගෙදරකටම බොන වතුර ලබාදෙන්නයි.

ගරු සභාපතිතුමනි, ඒ වෙන් කිරීම්වලට අමතරව තවත් ඩොලර් බිලියන 2,000ක ව්‍යාපෘති මේ රටේ ක්‍රියාත්මක කරනවා. මෙගාවොට් 600ක විදුලිබල ව්‍යාපෘතියක් ඒකට අයිතියි. ඒ වාගේම කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ වරාය පුළුල් කරන්නත් අපි ඒ මුදල් යොදා ගන්නවා. මේ සියල්ල ලැබෙන්නේ පොදු ජනතාවටයි. ඒ විතරක් නොවෙයි, අපි පසුගිය කාලයේ විශාල ප්‍රතිසංස්කරණ ගණනාවක් මේ රටේ ඇති කළා.

ඉතිහාසයේ පළමු වතාවට විශේෂ ප්‍රමුඛතා අංශ හඳුනාගෙන අමාත්‍යාංශ සඳහා පැහැදිලි විෂය පථයක් වාගේම කාර්යයන් ගැසට් නිවේදනයක් මඟින් වෙන් කර දුන්නා. ඒ වාගේම ඒවායේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මැන බැලීමට පැහැදිලි නිර්ණායක ලබා දීලා තිබෙනවා.

දැන් අය වැය මඟින් වෙන් කරනු ලබන මුදල් අයත් වන්නේ අපේ රටේ සමස්ත ජනතාවටයි. පළමු වතාවට රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් බවට පත් කිරීම නිසා වෙන් කරන ලද අරමුදල් සඳහා ඔවුන් ඍජු වග කීමට මෙන්ම වග වීමටද බැඳී සිටිනවා. ඒ නිසා රජයේ ප්‍රතිපත්ති පැහැදිලිව, කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 475,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 103, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 5,481,350,000, for Head 103, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 10,640,450,000, for Head 103, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 7,967,000,000, for Head 103, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 475,000,000, for Head 103, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 103, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சு
STATE MINISTRY OF INTERNAL SECURITY, HOME AFFAIRS AND DISASTER MANAGEMENT

පුනරාවර්තන	130,818,002,000
මූලධන	21,647,040,000

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා 2021 විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"15 පිටුවේ, 19,20 සහ 21 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය.

"රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා

'පුනරාවර්තන	38,928,802,000
මූලධන	12,364,800,000'"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම් සඳහා රු. 38,928,802,000ක් දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 12,364,800,000ක් දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 38,928,802,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 12,364,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 38,928,802,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 12,364,800,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

409 වන ශීර්ෂය.- අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.20,924,810,000; මූලධන වියදම, රු.5,165,910,000

தலைப்பு 409.- உள்ளகப் பாதுகாப்பு, உள்நாட்டலுவல்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 20,924,810,000; மூலதனச் செலவு ரூபாய் 5,165,910,000

HEAD 409.- STATE MINISTER OF INTERNAL SECURITY, HOME AFFAIRS AND DISASTER MANAGEMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 20,924,810,000; Capital Expenditure, Rs. 5,165,910,000

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා 2021 විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී, 409වන වැය ශීර්ෂයේ 01වන වැඩසටහන සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"16 පිටුවේ, 2 සහ 3 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

"ශීර්ෂ 409 රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා

'වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන 11,190,810,000 780,300,000
16 පිටුවේ 5,6,9 සහ10 පේළි ඉවත් කරන්න'"

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"409 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 11,190,810,000ක අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

409 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"409 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.780,300,000ක අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

409 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 409, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 11,190,810,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 409, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 409, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 780,300,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 409, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 11,190,810,000, for Head 409, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 409, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 780,300,000, for Head 409, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 409, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்கல் இராஜாங்க அமைச்சு
STATE MINISTRY OF SKILLS DEVELOPMENT, VOCATIONAL EDUCATION, RESEARCH AND INNOVATION

පුනරාවර්තන	9,254,200,000
මූලධන	3,800,000,000

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මුදල් ඇමතිතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2021 කාරක සභා අවස්ථාවේදී නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"33 පිටුවේ, 13 සහ 14 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය.

"පුනරාවර්තන	8,938,200,000
මූලධන	3,312,300,000"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

පුනරාවර්තන වියදම් සඳහා රු. 8,938,200,000ක දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

මූලධන වියදම් සඳහා රු. 3,312,300,000ක දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 8,938,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 3,312,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 8,938,200,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 3,312,300,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

421 වන ශීර්ෂය.- නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරයා

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.1,342,100,000; මූලධන වියදම, රු 2,714,500,000

தலைப்பு 421.- திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்கல் இராஜாங்க அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,342,100,000; மூலதனச் செலவு ரூபா 2,714,500,000

HEAD 421.- STATE MINISTER OF SKILLS DEVELOPMENT, VOCATIONAL EDUCATION, RESEARCH AND INNOVATION

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 1,342,100,000; Capital Expenditure, Rs. 2,714,500,000

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා 2021 විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී, 421වන වැය ශීර්ෂයේ 02වන වැඩසටහන සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"33 පිටුවේ, 18 පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

' වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන 1,026,100,000 2,226,800,000' "

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"421වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,026,100,000ක් දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

421වන ශීර්ෂයෙහි 02වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“421 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,226,800,000ක දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

421 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 421, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 1,026,100, 0 0 0 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 421, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 421, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபா 2,226,800,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 421, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 1,026,100,000, for Head 421, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 421, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 2.226,800,000, for Head 421, Programme 02, Capital Expenditure, be inserted in the Schedule” put and agreed to.

Head 421, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

තාක්ෂණ අමාත්‍යාංශය
தொழில்நுட்ப அமைச்சு
MINISTRY OF TECHNOLOGY

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා 2021 විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී, පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"44 පිටුවේ, 1 පේළියට පෙරාතුව පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය.

'තාක්ෂණ අමාත්‍යාංශය
පුනරාවර්තන 2,271,515,000
මූලධන 8,582,840,000

පහත පරිදි වියදම් සැකසී ඇත:-

ශීර්ෂ 186 තාක්ෂණ අමාත්‍යවරයා
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 77,315,000 7,700,000
වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන 929,000,000 8,364,190,000

ශීර්ෂ 227 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 1,265,200,000 210,950,000

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
පුනරාවර්තන 135,598,970,000
මූලධන 7,004,280,000

පහත පරිදි වියදම් සැකසී ඇත:-

ශීර්ෂ 189 මහජන ආරක්ෂක අමාත්‍යවරයා
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 10,242,650,000 1,556,700,000

ශීර්ෂ 225 පොලිස් දෙපාර්තමේන්තුව
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 80,890,000,000 4,685,680,000

ශීර්ෂ 320 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 19,056,000,000 212,500,000

ශීර්ෂ 334 බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව
වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන 25,410,320,000 549,400,000

(මෙම සංශෝධනවල අභිප්‍රාය වනුයේ අමාත්‍යාංශවලට විෂයයන් බෙදීයාමේ නව සංශෝධනවලට අනුකූලව;

1. පහත සඳහන් උප ව්‍යාපෘති වැය ශීර්ෂ 01 - අතිගරු ජනාධිපති වෙතින් ඉවත් කර අලුතින් ඇති කරන ලද තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කිරීම

   තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පුනරාවර්තන රු.500,000,000 හා මූලධන රු.4,000,000,000

   ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය පුනරාවර්තන රු.100,000,000 මූලධන රු.880,480,000

2. වැය ශීර්ෂ 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිපාදන ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත්කර ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කිරීම

3. අලුතින් ඇති කරන ලද තාක්ෂණ අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන ලබා දීම සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් පුනරාවර්තන රු.107,315,000ක සහ මූලධන රු.12,700,000ක ප්‍රතිපාදන ඉවත් කිරීම.

4. වැය ශීර්ෂ 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වැය ශීර්ෂ 334 - බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත්කර රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයට මාරු කිරීම.

5. පහත සඳහන් ව්‍යාපෘතිය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත් කර, වැය ශීර්ෂ 409 - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කිරීම

   ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය පුනරාවර්තන රු.21,150,000 මූලධන රු.65,400,000

6. පහත සඳහන් උප ව්‍යාපෘති ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත් කර, වැය ශීර්ෂ 409 - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කිරීම

   රණවිරු සේවා අධිකාරිය පුනරාවර්තන රු.90,000,000 මූලධන රු.2,000,000

   ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයනය ආයතනය පුනරාවර්තන රු.14,500,000 මූලධන රු.3,500,000

   ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය පුනරාවර්තන රු.337,000,000 මූලධන රු.30,000,000

   රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය මූලධන රු.11,200,000

   ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යායතනය පුනරාවර්තන රු.16,000,000 මූලධන රු.50,000,000

7. වැය ශීර්ෂ 225 - පොලිස් දෙපාර්තමේන්තුව, සහ අදාළ වන පරිදි පරිපාලන හා ආයතන සේවා වියදම් අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉවත්කර අලුතින් ඇති කරන ලද මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත මාරු කිරීම

8. වැය ශීර්ෂ 227 - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉවත්කර අලුතින් ඇති කරන ලද තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කිරීම

9. පහත සඳහන් උප ව්‍යාපෘතිය වැය ශීර්ෂ 409 - අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉවත්කර අලුතින් ඇති කරන ලද තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කිරීම

   ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මූලධන රු.2,996,010,000

10. පහත සඳහන් උප ව්‍යාපෘති වැය ශීර්ෂ 421 - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉවත්කර අලුතින් ඇති කරන ලද තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කිරීම

   කාර්මික තාක්ෂණ ආයතනය පුනරාවර්තන රු.280,000,000 හා මූලධන රු.80,000,000

   නිනිති තාක්ෂණ වැඩ සටහන මූලධන රු.392,700,000

   ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පුනරාවර්තන රු.36,000,000 මූලධන රු.15,000,000

   තොරතුරු තාක්ෂණ උද්‍යානය - යාපනය පුනරාවර්තන රු.8,000,000

   තොරතුරු තාක්ෂණ උද්‍යානය - මන්නාරම පුනරාවර්තන රු.5,000,000)

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

පළමුවන උපලේඛනය
முதலாம் அட்டவணை
FIRST SCHEDULE

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"පළමුවන උපලේඛනය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය."[මුදල් අමාත්‍යතුමා වෙනුවට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

පළමුවන උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
முதலாம் அட்டவணை திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
First Schedule, as amended, ordered to stand part of the Bill.

දෙවන උපලේඛනය
இரண்டாம் அட்டவணை
SECOND SCHEDULE

මතු පළ වන යෝජනාව සභා සම්මත විය:
தீர்மானிக்கப்பட்டது:
Resolved:

"දෙවන උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය."[මුදල් අමාත්‍යතුමා වෙනුවට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

දෙවන උපලේඛනය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
இரண்டாம் அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Second Schedule, ordered to stand part of the Bill.

තෙවන උපලේඛනය
மூன்றாம் அட்டவணை
THIRD SCHEDULE

අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරකම්වල සීමා
முற்பணக் கணக்குகள் செயற்பாடுகளின் வரையறைகள்
LIMITS OF ADVANCE ACCOUNTS ACTIVITIES

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

"54 වන පිටුවේ, 7 පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:-

"35 ඉඩම් අමාත්‍යවරයා

12201

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 25,000,000 14,000,000 100,000,000

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ ඉංග්‍රීසි පිටපතේ තිබූ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමයි.)"

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

"55 වන පිටුවේ, 9 පේළියට ඉනික්බිතිව පහත සඳහන් අයිතම ආදේශ කළ යුතුය:-

"තාක්ෂණ අමාත්‍යවරයා 18601
රජයේ නිලධාරින්ට අත්තිකාරම් 60,000,000 25,000,000 100,000,000

මහජන ආරක්ෂක අමාත්‍යවරයා 18901
රජයේ නිලධාරින්ට අත්තිකාරම් 700,000,000 375,000,000 1,500,000,000

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අමාත්‍යාංශවලට විෂයයන් බෙදී යාමේ නව සංශෝධනවලට අනුකූලව අලුතින් ඇති කරන ලද වැය ශීර්ෂ 186 තාක්ෂණ අමාත්‍යවරයා සහ වැය ශීර්ෂ 189 මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙත අත්තිකාරම් ගිණුම් සීමාව වෙන් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමයි.)"

"55 වන පිටුවේ, 16 සහ 17 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'51 ග්‍රාමීය 40201 රජයේ 25,000,000 1,500,000 50,000,000'
හා පාසල් නිලධාරින්ට
ක්‍රීඩා යටිතල අත්තිකාරම්
පහසුකම්
ප්‍රවර්ධන
රාජ්‍ය
අමාත්‍යවරයා

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ ඉංග්‍රීසි පිටපතේ තිබූ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමයි.)"

"56 වන පිටුවේ, 10, 11 සහ 12 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'56 පසුගාමී 40701 රජයේ 6,000,000 2,000,000 30,000,000'
ග්‍රාමීය ප්‍රදේශ නිලධාරින්ට
සංවර්ධන අත්තිකාරම්
සහ ගෘහාශ්‍රිත
සත්ව පාලන
හා සුළු ආර්ථික
භෝග වගා
ප්‍රවර්ධන රාජ්‍ය
අමාත්‍යවරයා

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ තැපැල් සේවා හා ජනමාධ්‍යවේදී වෘත්තීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ විෂය අංකය සහ ඊට අදාළ සීමාවන් **අමාත්‍යාංශවලට විෂයයන් බෙදී යාමේ නව සංශෝධනවලට අනුකූලව** අලුතින් ඇති කරන ලද පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමයි.)

"56 වන පිටුවේ, 16, 17 සහ 18 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'58 රාජ්‍ය 40901 රජයේ 1,000,000,000 600,000,000 2,000,000,000'
ආරක්ෂක, නිලධාරීන්ට
ස්වදේශ අත්තිකාරම්
කටයුතු
හා ආපදා
කළමනාකරණ
රාජ්‍ය අමාත්‍යවරයා

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අමාත්‍යාංශවලට විෂයයන් බෙදී යෑමේ නව සංශෝධනවලට අනුකූලව අලුතෙන් ඇති කරන ලද වැය ශීර්ෂ 186- තාක්ෂණ අමාත්‍යවරයා සහ වැය ශීර්ෂ 189- මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙත අත්තිකාරම් ගිණුම් සීමා වෙන් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමයි.)"

"58 වන පිටුවේ, 8 සහ 9 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'71 දහම් 42201 රජයේ 8,000,000 1,500,000 320,000,000'
පාසල්, නිලධාරීන්ට
පිරිවෙන් අත්තිකාරම්
හා භික්ෂු
අධ්‍යාපන
රාජ්‍ය
අමාත්‍යවරයා

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ දෙමළ පිටපතේ තිබූ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමයි.)"

"70 වන පිටුවේ, 2 සහ 3 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'192 මිනුම් 29801 රජයේ 8,000,000 4,500,000 33,000,000'
ඒකක ප්‍රමිති නිලධාරින්ට
සහ සේවා අත්තිකාරම්
දෙපාර්තමේන්තුව

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ දෙමළ පිටපතේ තිබූ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමයි.) "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

තෙවන උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

மூன்றாம் அட்டவணை திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Third Schedule, as amended, ordered to stand part of the Bill.

කල් තබන ලද 2 වන වගන්තිය.- (2021 මුදල් වර්ෂය සඳහා විසර්ජන.)

ஒத்திவைக்கப்பட்ட வாசகம் 2.- (நிதியாண்டு 2021இற்கான நிதி ஒதுக்கீடு.)

POSTPONED CLAUSE 2.- (*Appropriation for financial year, 2021.)*

සම්මත කරන ලද සංශෝධන:

செய்யப்பட்ட திருத்தங்கள்:

Amendments made:

"2021 විසර්ජන පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ 1 වන සහ 2 වන උප වගන්තිවල (1 වෙනි පිටුවේ 10 සහ 11 පේළිවල සහ දෙවන පිටුවේ 18 සහ 19 පේළිවල) දැක්වෙන "රුපියල් දෙදහස් හයසිය හැත්තෑඅට බිලියන හතළිස් මිලියනයක්" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දෙදහස් අටසිය දහඅට බිලියන තුන්සිය අනූ මිලියනයක්" යන වචන යෙදීමෙන් එකී උප වගන්ති සංශෝධනය විය යුතුය. [මුදල් ඇමතිතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(මුදල් අමාත්‍යතුමාගේ මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2021 විසර්ජන පනත් කෙටුම්පතේ පළමුවන උපලේඛනයේ සඳහන් ආණ්ඩුවේ වියදම් වෙනුවෙන් වෙන් කරන ලද රුපියල් 2,678,040,000,000ක් වූ මුදල රුපියල් 2,818,390,000,000ක් දක්වා වැඩි කිරීමයි.)

2021 විසර්ජන පනත් කෙටුම්පතේ 2 වන වගන්තියේ (1) (ආ) උප වගන්තියේ (1 වෙනි පිටුවේ 20 පේළියේ) දැක්වෙන "රුපියල් දෙදහස් නවසිය බිලියනයක්" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දෙදහස් නවසිය අනූහත් බිලියනයක්" යන වචන යෙදීමෙන් එකී උපවගන්තිය සංශෝධනය විය යුතුයි. [මුදල් ඇමතිතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2021 දී ආණ්ඩුවේ ණය ගැනීමේ උපරිම සීමාව රුපියල් 2,900,000,000,000 සිට රුපියල් 2,997,000,000,000ක් දක්වා වැඩි කිරීමයි.)"

කල් තබන ලද 2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட 2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளை யிடப்பட்டது.

Postponed Clause 2, as amended, ordered to stand part of the Bill.

කල් තබන ලද 3 සිට 7 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட 3ஆம் வாசகத்திலிருந்து 7ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளை யிடப்பட்டது.

Postponed Clauses 3 to 7 ordered to stand part of the Bill.

කල් තබන ලද 8 වන වගන්තිය.- (මේ පනතේ තෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයා සතු බලය.)

ஒத்திவைக்கப்பட்ட வாசகம் 8.- (இச்சட்டத்திற்கான மூன்றாம் அட்டவணையில் குறித்துரைக்கப்பட்டுள்ள ஆகக்கூடிய அத்துடன் ஆகக்குறைந்த எல்லைகளை வேறுபடுத்துவதற்கு அமைச்சருக்குள்ள தத்துவம்.)

POSTPONED CLAUSE 8.- (*Power of Minister to vary the maximum and minimum limits specified in the Third Schedule to this Act.*)

සම්මත කරන ලද සංශෝධනය:
செய்யப்பட்ட திருத்தங்கள்:
Amendment made:

"2021 විසර්ජන පනත් කෙටුම්පතේ 8 වන වගන්තියේ (1) උප වගන්තියේ (6 වෙනි පිටුවේ 1 පේළියේ) දැක්වෙන "2021 මැයි මස 31" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "2022 මැයි 31" යන වචන යෙදීමෙන් එකී උප වගන්තිය සංශෝධනය විය යුතුයි." [මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ සිංහල පිටපතේ තිබූ මුද්‍රණ දෝෂය නිවැරදි කිරීමයි.) "

කල් තබන ලද 8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
ஒத்திவைக்கப்பட்ட 8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Postponed Clause 8, as amended, ordered to stand part of the Bill.

කල් තබන ලද 9 සහ 10 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
ஒத்திவைக்கப்பட்ட 9ஆம், 10ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Postponed Clauses 9 and 10 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2021 විසර්ජන පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් කාරක සභාවේදී සලකා බලා සම්මත වූ බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි යෝජනා කරනවා.

විසර්ජන පනත් කෙටුම්පතෙහි භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ සහ අංක දෝෂ නිවැරදි කරගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා ද, විසර්ජන පනත් කෙටුම්පතට අදාළ විස්තරාත්මක ඇස්තමේන්තු ඇතුළත් ලේඛනවල ද ආනුෂංගික සංශෝධන කිරීම සඳහා ද අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වූ පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the division bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! දැන් ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය ප්‍රකාශ කරන්න.

(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තාක්ෂණික දෝෂයක් ඇති බව පෙනී යන හෙයින් ගරු මන්ත්‍රීතුමන්ලාට විද්‍යුත් ක්‍රමයට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එම නිසා අපි පේළියෙන් පේළිය ඡන්දය ලබා ගනිමු.

පාර්ලිමේන්තුව 47 වන ස්ථාවර නියෝගය යටතේ - පක්ෂව 151: විරුද්ධව 54 යනුවෙන් - බෙදුණේය.
பாராளுமன்றம் 47ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 151: எதிராக 54.
The Parliament divided under Standing Order No. 47: Ayes 151; Noes 54.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පතට පක්ෂව ඡන්ද 151යි. විරුද්ධව ඡන්ද 54යි. ඒ අනුව 2021 විසර්ජන පනත් කෙටුම්පත තුන්වැනි වර කියවා සංශෝධන සහිතව සම්මත කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

නත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Bill, as amended, accordingly read the Third time, and passed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ අංක 2 සහ 3 දරන යෝජනා සම්මත කිරීම.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත: නියෝග
காப்புறுதித் தொழிலை ஒழுங்குபடுத்தற் சட்டம்: ஒழுங்குவிதிகள்
REGULATION OF INSURANCE INDUSTRY ACT: REGULATIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 112 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 අප්‍රේල් 08 දිනැති අංක 2118/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

විදේශ විනිමය පනත: යෝජනා සම්මතය
வெளிநாட்டுச் செலாவணிச் சட்டம்: கட்டளை
FOREIGN EXCHANGE ACT: RESOLUTION

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ජූලි 02 දිනැති අංක 2182/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ වලංගු කාලය එකී පනතේ 22(3) වගන්තිය ප්‍රකාරව 2021.01.02 දින සිට මාස හයක කාලයක් සඳහා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ශ්‍රී ලංකා මාතෘ භූමිය ඇතුළු මුළු ලෝකයම කොවිඩ්-19 වසංගත වෛරසය නිසා සෞඛ්‍ය, ආර්ථික හා සමාජයීය වශයෙන් විවිධ අභියෝග ගණනාවකට මුහුණ දෙමින් සිටින මෙවන් අවදානමක් සහිත කාලපරිච්ඡේදයකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු බව සනාථ කරමින් මාසයකට ආසන්න කාලයක් පුරා පැවති 2021 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය සමාප්ත කිරීමේ මොහොතට අපි දැන් එළැඹ සිටිමු.

උණුසුම් වාද විවාදවලින් පිරි මෙම අය වැය විවාදයේදී අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ වැඩි දියුණුව සඳහා ඵලදායි අදහස් හා යෝජනා රාශියක්ම ඉදිරිපත් කරමින් මෙම ව්‍යවස්ථාදායක කාර්ය භාරය සහ වගකීම සාර්ථක කර ගැනීමට නිරන්තරයෙන් සක්‍රිය දායකත්වය ලබා දුන් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු අනෙක් සියලුදෙනාටම පාර්ලිමේන්තුවේ ගෞරවය හා ස්තුතිය පුද කිරීම ඉතාම කාලෝචිත බව මාගේ විශ්වාසයයි.

අය වැය ලේඛනය මුදල් අමාත්‍යවරයා ලෙස මෙම ගරු සභාවට ඉදිරිපත් කළ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ඒ හා සම්බන්ධව වෙහෙස මහන්සි වී කටයුතු කළ මුදල් රාජ්‍ය අමාත්‍යවරයාටත් මාගේ ස්තුතිය ප්‍රථමයෙන් හිමි වෙනවා. මූලාසනයේ කටයුතු යුහුසුළුව මෙහෙයවමින් විශේෂයෙන් මට සහය වූ ගරු නියෝජ්‍ය කථානායකතුමාටත්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාටත්, සභාපති නාමාවලියේ සිටින සියලු සාමාජික ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියන්ලාටත් මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි.

ගරු සභානායකතුමා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා වැඩි කාලයක් සභාව තුළ රැඳී සිටිමින් ලබා දුන් උපරිම සහයෝගය වෙනුවෙන් මාගේ කෘතවේදී ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

සෑම විවාද දිනයකදීම ඊට සහභාගි වෙමින් අදහස් දැක් වූ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සියලු ගරු මන්ත්‍රීවරුන් ලබා දුන් සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද, මා විසින් මෙතෙක් කරන ලද නිරීක්ෂණයන්ට අනුව සහ දෙසැම්බර් 08 වෙනි අඟහරුවාදා පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මතු කරන ලද කාරණා අනුව, සභා ගර්භයේ දී කරනු ලබන වාද විවාදවල දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන් විසින් ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තුවට උචිත නොවන වචන භාවිත කරනු ලබන බව පෙනී ගිය නිසා ඉදිරියේ විශේෂයෙන් 2021 වර්ෂයේ ආරම්භයේ සිටම සභා ගර්භය තුළ ඒක පුද්ගල විවේචනයට වඩා විෂයානුබද්ධ වාද විවාදවලට සාධනීය ලෙස සහභාගි වෙමින් ව්‍යවස්ථාදායකයේ ගරුත්වය සහ අභිමානය ආරක්ෂා වන අයුරින් සභාවේ වැඩ කටයුතුවල නිරතවීම ජනතා නියෝජිතයන් ලෙස සිතට ගත යුතු බව දෙපාර්ශ්වයේ සියලු මන්ත්‍රීවරුන්ට අවධාරණය කිරීමට කැමැත්තෙමි.

මෙම කාලසීමාව තුළදී සභාවේ කටයුතු මෙහෙයවීමට වැදගත් ව්‍යවස්ථාදායක කාර්යභාරයක් ඉටු කරමින් මට නිරන්තරයෙන් සහයෝගය දෙමින් කටයුතු නොපිරිහෙළා ඉටු කළ පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා, නියෝජ්‍ය මහලේකම්තුමිය, සහකාර මහලේකම්තුමා ඇතුළු ලේකම් මණ්ඩලයටත්, සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මගේ හදපිරි ස්තුතිය පිරි නමමි.

තවද, අය වැය විවාද කාලසීමාව අතරතුරදී අභියාචනාධිකරණයේ විනිසුරුවරයකු ලෙස පත්වීමක් ලැබූ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් වශයෙන් පාර්ලිමේන්තුවේ සේවය කළ, නීල් ඉද්දවල මැතිතුමාට මාගේ ස්තුතිය හා ශුභාශිංසනය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

නීතිපතිවරයාත්, නීති කෙටුම්පත් සම්පාදකවරියත්, ඔවුන්ගේ කාර්ය මණ්ඩල නිලධාරීන්ද 2021 විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් දක්වන ලද දායකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරනවා.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ, ගරු සභානායකතුමාගේ, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ සහ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ ලේකම්වරුන්ටත් මුදල් අමාත්‍යාංශය ඇතුළු සියලු අමාත්‍යාංශවල ලේකම්වරුන්ටත් ඔවුන්ගේ සියලු කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන්ටත් මාගේ ස්තුතිය පළ කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ හා මාගේ පෞද්ගලික ලේකම්වරුන් ඇතුළු එම කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

රජයේ මුද්‍රණාලයාධිපතිනිය ඇතුළු එතුමියගේ කාර්ය මණ්ඩලය, පාර්ලිමේන්තුවේ පොලීසිය, තැපැල් කාර්යාලය, ලංකා බැංකුව, පාර්ලිමේන්තුවේ වෛද්‍ය මධ්‍යස්ථාන, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන මණ්ඩලය, ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුව යනාදී පාර්ලිමේන්තුවට අනුබද්ධිත අනෙකුත් ආයතනවල සියලු නිලධාරි මහත්ම මහත්මීන්ටද, පාර්ලිමේන්තු සංකීර්ණයේ ආරක්ෂක සෝදිසි සම්බන්ධයෙන් වෙහෙසෙන පොලිස් විශේෂ කාර්ය බලකාය, දියවන්නා නාවික හමුදා අනු ඛණ්ඩය මේ අවස්ථාවේදී මම කෘතවේදීව සිහිපත් කරනවා. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තු සංකීර්ණයට පැමිණීමට නොහැකි වූ PEO TV හා අනෙකුත් තාක්ෂණික මෙවලම් භාවිතයෙන් සභාවේ වැඩ කටයුතු සමාජගත කිරීමට වෙහෙස මහන්සි වූ සියලු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ගේ සේවය ස්තුති පූර්වකව අගය කරනවා. ස්තුති කළ යුතු, එහෙත් මෙහි නම් සඳහන් නොවූ යමෙකු වේ නම්, ඒ සැම කෙනෙකුටම මගේ අවංක ස්තුතිය පිරිනමනවා.

අවසාන වශයෙන්, තව නොබෝ දිනකින් එළැඹෙන නත්තල, සතුට සාමය පිරි සුබ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරන අතරම, 2021 නව වර්ෂය ශ්‍රී ලංකාවාසී සියලු ජනතාවට රුදුරු කොවිඩ් වසංගතයෙන් මිදුණු, නිරෝගීභාවය රජයන, සෞභාග්‍ය පිරි, සියලු අපේක්ෂා ඉටු වන නව වසරක් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ස්තුතියි.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාටත්, ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමාටත්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා ඇතුළු මෙම අය වැය විවාද කාල සීමාව තුළ මූලාසනයේ කටයුතු මෙහෙය වූ සියලුදෙනාටත් මුලින්ම මගේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම ගරු විපක්ෂ නායකතුමාටත්, ගරු ඇමතිවරුන්ටත්, ගරු මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාටත්, Deputy Secretary-Generalටත්, සහකාර මහ ලේකම්තුමාටත්, පාර්ලිමේන්තුවේ සියලු නිලධාරින්ටත් මම ස්තුතිවන්ත වෙනවා. පාර්ලිමේන්තු භෝජනාගාරයේ සියලු දෙනාටත්, පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන පොලිස් නිලධාරින්ටත් මේ අවස්ථාවේ විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ සම්පූර්ණ අය වැය කාලය තුළ පාර්ලිමේන්තුවේ කටයුතු වාර්තා කරමින් පුවත් පත් ඇතුළු අනෙකුත් මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කළ සියලු මාධ්‍යවේදින්ටත් මගේ ස්තුතිය හා ශුභාශිංසන පුද කරනවා. ඔබ සියලුදෙනාටම සුබ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, 2021 වර්ෂයේ අය වැය පිළිබඳ විවාදය දින 20ක් පුරාවට නොයෙකුත් අභියෝග මැද්දේ, සෞඛ්‍ය ආරක්ෂාවට මුල් තැන දෙමින් පැවැත්වීම වෙනුවෙන් ඔබතුමා ප්‍රමුඛ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත්, ඊට අනුබද්ධ ආයතනවල සියලු දෙනාටත් අපේ ස්තුතිය මේ අවස්ථාවේ පුද කර සිටිනවා. ගරු කථානායකතුමා, පාර්ලිමේන්තු මහ ලේකම්තුමා සහ වේත්‍රධාරිතුමා ප්‍රමුඛ එම කාර්ය මණ්ඩලය, පාර්ලිමේන්තුවට අනුබද්ධ අනෙකුත් කාර්ය මණ්ඩල, ඒ වාගේම කාරක සභා අවස්ථා වැඩසටහන් කෙටි කලක් තුළ මුද්‍රණය කරන්නට උත්සුක වුණු රජයේ මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, පාර්ලිමේන්තු පොලීසිය, විශේෂ කාර්ය බලකාය ඇතුළු ආරක්ෂක අංශ, සියලුම මාධ්‍ය ආයතන, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ප්‍රමුඛ මන්ත්‍රී කණ්ඩායම, සභානායකතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සහ මන්ත්‍රී කණ්ඩායම ඇතුළු එම කාර්ය මණ්ඩලය, විපක්ෂ නායක කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ඒ වාගේම දින 20ක විවාදයක් තුළ අදහස් ඉදිරිපත් කළ සියලුදෙනා ඇතුළුව මේ වැඩ පිළිවෙළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන්න නන් අයුරින් සහයෝගය ලබා දුන් සියලු දෙනාට අපේ ස්තුතිය හා ප්‍රණාමය පුද කර සිටිනවා.

පාර්ලිමේන්තුව වෙනුවෙන් 17 වසරක කීර්තිමත් ප්‍රශස්ත සේවාවක් ඉෂ්ට සිද්ධ කළ, හිටපු නියෝජ්‍ය මහ ලේකම්තුමා සහ කාර්ය මණ්ඩල ප්‍රධානි නීල් පරාක්‍රම ඉද්දවල මැතිතුමා අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු හැටියට දිවුරුම් දීමත් සමඟ පාර්ලිමේන්තුවේ -ව්‍යවස්ථාදායකයේ- සේවා කාලය එතුමා අවසන් කළා. එම සේවා කාලය පුරාවටම ඉතාම කීර්තිමත්, විනිවිදභාවයකින් යුක්ත, ප්‍රශස්ත සේවාවක් ඉෂ්ට කළ නිලධාරියකු වූ එතුමාට අපි සියලුදෙනාගේම ප්‍රශංසාව, ස්තුතිය සහ ප්‍රණාමය පුද කර සිටිනවා.

වාද විවාද කිරීමේදී, දත්තවලින්, සංඛ්‍යා ලේඛනවලින්, අදහස්වලින් අප පෝෂණය කරන පාර්ලිමේන්තු පුස්තකාලයේ වසර 20ක සේවය නිම කරමින් හෙට දවසේ විශ්‍රාම යන හේමා සුදර්ශනී රත්නායක මහත්මිය කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරියක හැටියට ඉෂ්ට කළ ඒ කාර්යක්ෂම සේවාව මතක් කරමින්, එතුමියගේ අනාගතයටත් මම සුබ පතනවා.

ගරු කථානායකතුමනි, 2021 අය වැය පිළිබඳව අපි විවාද කරන අවස්ථාවේ පක්ෂ, විපක්ෂ මහජන නියෝජිතයන් විවිධාකාර අදහස් ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ අදහස් තුළින් මේ විවාදය වඩාත් ප්‍රශස්තව ක්‍රියාත්මක වුණාය කියන කාරණාව අප විශ්වාස කරනවා. ඒ සියලු මහජන නියෝජිතවරුන්ටත් අපගේ ස්තුතිය පුද කරනවා. ඔබතුමා ප්‍රමුඛ, මේ පාර්ලිමේන්තුවේ සේවය කරන සියලුදෙනාට නැවතත් අපගේ ස්තුතිය පළ කරනවා. ලංකාවාසී සියලු දෙනාටම සුබ නත්තලක් වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. අප රටේ ජීවත් වන පුරවැසි පරපුරට 2021 වර්ෂය සෞභාග්‍ය සම්පන්න, නිරෝගී, සෞඛ්‍ය සම්පන්න වසරක් වේවා කියා පතමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමනි, විපක්ෂ නායකතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, ඔබ සියලුදෙනාටම මුලින්ම මගේ ස්තුතිය පුද කර සිටිනවා. ගරු මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යතුමා, මුදල් අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් 2021 වසර සඳහා අය වැය ඉදිරිපත් කළා. රටේ ඉදිරි සංවර්ධනයට කටයුතු කරන එම වැඩසටහන සම්මත කිරීමෙන් අනතුරුව, මෙම දීර්ඝ විවාදය පැවැත්වීමට පාර්ලිමේන්තු සම්ප්‍රදායානුකූලව ගරු කථානායකතුමා විසින් දෙන ලද මහ පෙන්වීමට අප පළමුකොට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාටම ඒ මහපෙන්වීම කිරීම, ආදර්ශයක් ලබාදීම සහ ලබා දුන් උපදෙස්වලට එතුමාට මේ අවස්ථාවේ දී අපේ විශේෂ ගෞරවය, කෘතවේදීත්වය පුද කරන්න ඕනෑ. ඒ වාගේම, මේ අය වැය විවාදය ඉදිරියට ගෙන යෑමට සහාය දුන් විරුද්ධ පක්ෂයේ නායකතුමාටත් අපේ ස්තුතිය පුද කරනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඒ වාගේම, මේ අය වැය ලේඛනය සම්මත වනතුරු මේ විවාදය ඉදිරියට ගෙන යෑමට සහයෝගය ලබා දුන් විරුද්ධ පක්ෂයේ නායකතුමාට අපගේ ස්තුතිය පුද කරනවා.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත්, සභානායක කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත් සුවිශේෂ ස්තුතියක් මම මේ අවස්ථාවේ පුද කරන්න කැමැතියි. ඒ වාගේම විරුද්ධ පක්ෂයේ සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට හා එතුමාගේ කාර්ය මණ්ඩලය දක්වන ලද කැපවීමට හා සහයෝගයට අපි ස්තුතිවන්ත වෙනවා.

පාර්ලිමේන්තු මහ ලේකම්තුමාට, නියෝජ්‍ය මහ ලේකම්තුමියට, සහකාර මහ ලේකම්තුමාට හා එම කාර්ය මණ්ඩලයටත් අපගේ විශේෂ ස්තුතිය පුද කරනවා. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් හැටියට කටයුතු කළ නීල් ඉද්දවල මැතිතුමා අධිකරණ විනිසුරුවරයකු හැටියට පත් වී ගිය අවස්ථාවට සුබ පතන්නට අපට බැරි වුණත්, මේ අවස්ථාවේ ගරු අගමැතිතුමා වෙනුවෙන් අපගේ සුබ පැතුම් එතුමාට පිරිනමන්නට කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමා සඳහන් කළ ආකාරයට, පාර්ලිමේන්තුවේ විවිධ අංශවලටත්, පාර්ලිමේන්තු සභා ගර්භයේ කටයුතුවලට සහාය වූ සෑම නිලධාරියෙකුටමත්, වේත්‍රධාරිතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සපයන ලද පොලීසියේ සියලු නිලධාරින්ටත්, සෑම වෙලාවකම වෙනදාටත් වඩා අභ්‍යන්තර හා බාහිර වශයෙන් සහාය දැක්වූ අපේ වෛද්‍ය අංශයටත්, භෝජනාගාර දෙපාර්තමේන්තුව වාගේම පාර්ලිමේන්තු විවාදය සාර්ථක කරවීමට අපට සහයෝගය ලබා දෙන හැන්සාඩ් දෙපාර්තමේන්තුව, භාෂා පරිවර්තක අංශය හා අනෙක් ප්‍රධාන සේවා අංශ සියල්ලෙහි නිලධාරින්ටත් මේ අවස්ථාවේ අපගේ ස්තුතිය පුද කරනවා. මේ සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ට අපගේ ස්තුතිය යළිත් වරක් පුද කරන්නේ පාර්ලිමේන්තුවේ ජීවය ආරක්ෂා කරගෙන මේ විවාදවලට සම්බන්ධ වෙමින් අය වැය ලේඛනය සම්බන්ධ විවාදය සාර්ථක කර ගැනීමට ලබා දුන් සහාය වෙනුවෙනුයි.

ගරු කථානායකතුමා සඳහන් කළ ආකාරයටම, අග්‍රාමාත්‍යතුමා ප්‍රධාන ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපි ප්‍රකාශ කරනවා, පාර්ලිමේන්තුවේ ගුණාත්මකභාවය ඉහළින් තබා ගැනීමට පුළුවන් කාල පරිච්ඡේදයක් බවට ලබන වසර පරිවර්තනය කර ගැනීමට සියලුදෙනාගේ ආදර්ශය ඇතුව අපට කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා.

ගරු කථානායකතුමනි, අද සභාව කල්තබන අවස්ථාවේ මා සඳහන් කළ යුතුයි, පාර්ලිමේන්තු සභා ගර්භයේ හිස් පුටු දෙකක් තිබෙන බව. මහ මැතිවරණයකින් මහජන මන්ත්‍රී මණ්ඩලයක් තේරී පත් වුණාට, පක්ෂ දෙකක් නියෝජනය කිරීමට මන්ත්‍රීවරුන් දෙදෙනෙකු වෙනුවෙන් තවම පාර්ලිමේන්තුවේ හිස් ආසන දෙකක් පවත්වාගෙන යනවා. අපි විශ්වාස කරනවා, 2021 වසරේදී එම තත්ත්වය වෙනස් වෙයි කියලා. පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට මේ අවස්ථාවේ අපගේ ස්තුතිය පුද කරමින්, ලබන්නා වූ 2021 වර්ෂය ඔබ සියලුදෙනාටම සුබ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, කථානායක නිල නිවසේ පවත්වන සාම්ප්‍රදායික රාත්‍රී භෝජන සංග්‍රහය පිළිබඳව මේ අවස්ථාවේ සියලු මන්ත්‍රීවරුන්ට මම මතක් කරනවා. සියලු මන්ත්‍රීවරුන්ට ඒ සඳහා ආරාධනා කරනවා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 5.00 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.32ට, අද දින සභා සම්මතිය අනුව, 2021 ජනවාරි 05වන අඟහරුවාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.00 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.32க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 2021 சனவரி 05 மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 5.00 p.m., THE HON. SPEAKER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly at 6.32 p.m. until 10.00.a.m. on Tuesday, 05th January, 2021, pursuant to the Resolution of Parliament of this Day.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.